ISSN 1927-5218 Dasatha(Print)
ISSN 1927-5226 Dasatha(Online)

Tel: 416 822 2789
dasathainfo@gmail.com
www.dasatha.com

# දසත Dasatha

සතුට. විනෝදය. දැනුම එකට කැටිවුණු සොඳුරු නවාතැන

Pages 52 MARCH 2017 Issue : 89 මාසික සංග්‍රහය. 2017 මාර්තු 89 කලාපය 50 ¢

Beyond Your Expectations
For ALL Your Real Estate Needs
Gamini Abeysinghe
Sales Representative

RE/MAX Diamond
Tel: 416 822 2789
www.gaminiabeysinghe.com

## දුටුවෙමි ඔබ ප්‍රතිභා ප්‍රභා - සිහල කලාකරුවාණෙනි...!




ප්‍රවීණ චිත්‍ර හා මූර්ති කලා ශිල්පි තිලක අබේසිංහයන්ට නිදුක් නිරෝගී සුභ උපන්දිනයක් වේවා !

# ටොරොන්ටෝ නගරාධිපති ජෝන් ටොරී ශ්‍රී ලංකා සංචාරයක !

වෙළඳ දූත මණ්ඩල නිල සංචාරයක් සඳහා ටොරොන්ටෝ නගරාධිපති ජෝන් ටොරී ශ්‍රී ලංකාවට යෑමට නියමිතව ඇත. දින 10 ක සංචාරයක් සඳහා මාර්තු 15 වෙනිදා පිටත්ව යන ටොරී නගරාධිපතිවරයා ඉන්දියාවේ දිල්ලි, මුම්බායි, හයිද්‍රාබාද් සහ ශ්‍රී ලංකාව වෙත යෑමට නියමිතයි.

නගර සභිකයන් දෙදෙනෙකු, නිලධාරීන් 4 දෙනෙකු ඇතුළු 20 කගෙන් සමන්විත පිරිසක් මෙම වෙළඳ දූත සංචාරයට එකතු වේ. ආර්ථිකය අතින් වේගයෙන් වර්ධනය වන දකුණු ආසියානු රටවල් ලෙස සැලකෙන ඉන්දියාව සහ ශ්‍රී ලංකාවේ සිදුකරන සංචාරයන් තුළින් කැනඩාවේ ඩර්ශ් කලාපය තුළ වෙසෙන ඉන්දු-කැනේඩියානු සහ ශ්‍රී ලංකා-කැනේඩියානු ප්‍රජාව සමග ඇති බැඳීම තවත් ශක්තිමත් කර ගැනීමට ටොරී නගරාධිපතිවරයා බලාපොරොත්තු වේ.

මෙම සංචාරයේදී ටොරොන්ටෝවේ දේශීය සමාගම් සහ දකුණු ආසියානු සමාගම් අතර නව වෙළඳ ප්‍රවර්ධන අවස්ථා ඇතිකර ගනිමින් ඒවායෙහි නව කාර්යාල ටොරොන්ටෝවේ පිහිටුවා ගැනීම කෙරෙහි උත්සාහ කෙරෙනු ඇති අතර මෙහිදී සිනමා කර්මාන්තය, අධ්‍යාපනය, නව නිපැයුම් ආදිය පිළිබඳව විශේෂයෙන්ම අවධානය යොමු කෙරෙනු ඇත.

ශ්‍රී ලංකාවෙන් පිටත ද්‍රවිඩ භාෂාව කතා කරන වැඩිම පිරිසකට නිවහන වී ඇත්තේ තම පරිපාලනය යටතේ

8 වන පිටුව බලන්න

# දේශසීමා මුර තර කරන්න....

ඇමරිකා-කැනඩා දේශ සීමාව හරහා පැමිණෙන සරණාගතයින් සංඛ්‍යාව මේ වන විට විශාල ලෙස වැඩිවෙමින් පවතින බව ඒ පිළිබඳව දිනෙන් දින ලැබෙන වාර්තා තහවුරු කොට සිටී. ඇමරිකාවේ නව ජනාධිපති ලෙස ට්‍රම්ප් දිවුරුම් දීමත් සමගම මේ තත්ත්වය තවදුරටත්

8 වන පිටුව බලන්න

TAX, BOOKKEEPING, PAYROLL
GS Accounting Co.
416-571-4270 / 647-352-1560
Residence : 416-331-8349
For more info - See Page 29


low mortgage RATES
WITH MAJOR BANKS
CALL ME DIR: (647) 933-6548
BUS: (416) 321-2227
FAX: (416) 321-2011
e.mail: kavinda@viafinancial.ca
WinMe
- Purchase/Refinance/Renewal/Switch
- Refinance your Mortgage with extra cash in your hand
- Consolidate your bills and be debt-free
- Mortgage for New immigrants/Self-Employed
Save yourself $2,854.70 per month
AND pay off your new mortgage
as fast as you wish!!!
No Fees for Qualified Clients
Application Approved

කාවින්ද මයිලැව
MORTGAGE BROKER BSc.Mgmt, MBA
VIA FINANCIAL SERVICES INC.
Lic# 10669
* Tablets Raffle ends September 30, 2016. And all deals must be funded on or before September 30, 2016.
* Certain conditions, Broker fees, Interest penalties, CMHC, Genworth or CG Insurance fees may apply. No fees for OAC clients, Interest rates are subject to change without notice.
#109-5805 Whittle Road. Mississauga, Ontario. L4Z 2J1.


ටොරොන්ටෝ
හෙළ මහා අවුරුදු උළෙල
තෙවන වරටත්
2017 අප්‍රියෙල් 15 දින
සවස 2:00සිට
විවාහක අවුරුදු කුමරිය
විවාහක අවුරුදු කුමාරයා
සිඟිති අවුරුදු කුමරිය
සිඟිති අවුරුදු කුමාරයා
වැඩිහිටි විකට ඇඳුම් තරඟය
හොඳම හිනාව
හොඳම ඇඬීම
නොමිලේ
ඉඳිකටුවට නූල දැමීම
සමග තවත් විනෝදාත්මක අංග රැසක්
නටන්න විනෝද වන්න
උළෙල අවසානයේ සංගීත සැදෑව හා එක්වන්න.....
සරම් සහ සාරි වලින් සැරසී පැමිණෙන්න
විමසීම්
647-836-3580
647-290-5978
Korean Cultural Centre, 1133 Leslie St. North York
Free Parking

# ටොරොන්ටෝ දේපළ බද්ද 2% කින් ඉහළට

2017 වසර සඳහා නිවාස හා දේපළ බදු ඉහළ දැමීම සම්බන්ධයෙන් ටොරොන්ටෝ නගර සභාව පැවැත්වූ ඡන්ද විමසීමේදී ඡන්ද 35-8 කින් එම යෝජනාව සම්මත විය. ඒ අනුව ටොරොන්ටෝ නිවාස හිමියන්ට තම දේපළ සඳහා මේ වසරේදී ඩොලර් 100 ක පමණ අමතර වැඩිවීමක් සහිත දේපළ බද්දක් ගෙවීමට සිදුවනු ඇත.

මෙම බදු ඉහළ දැමීමට නගරාධිපති ජෝන් ටොරීගේ පූර්ණ සහාය ලැබී ඇති අතර ටොරොන්ටෝවේ උද්ධමන අනුපාතිකය පහත හෙළීම සඳහා දේපළ බද්ද මෙවැනි 'වගකිව යුතු සාධාරණ' අංකයකින් වැඩි කිරීම සඳහා නගර සභාව ගත් තීරණය පිළිබඳ ආඩම්බර වන බව ඔහු පවසා ඇත. එහෙත් මේ සම්බන්ධයෙන් අදහස් දක්වන විචාරකයන් පවසන්නේ මේ ආකාරයට බදු ඉහළ දැමීම නගර වාසීන්ට අනවශ්‍ය හිසරදයක් ළඟා කර දීමක් බවයි. නමුත් මේ වසරේ ටොරොන්ටෝ නගර සභාවේ අයවැය හිඟය පියවා ගැනීම සඳහා ටොරොන්ටෝ දේපළ බද්ද සියයට 2 කින් ඉහළ නැංවීම කළ යුතුව ඇති බව නගරාධිපති ඇතුළු සභිකයින් බහුතරයකගේ අදහසයි.

ඒ අනුව ඩොලර් 587,471 කට ඇස්තමේන්තුගත කරන ලද නිවසක් සඳහා ඩොලර් 90 කින් පමණ ටොරොන්ටෝ නිවාස දේපළ බද්ද ඉහළ යා හැකි අතර එය සාමාන්‍යයෙන් ඩොලර් 2835 ක් පමණ විය හැක.

# ලේ බැංකුවට ගැටලුවක් !

කාන්තාවන් හට වසරකදී රුධිරය පරිත්‍යාග කළ හැකි වාර ගණන සීමා කරමින් කැනේඩියානු රුධිර සේවාව විසින් හඳුන්වාදෙනු ලැබූ නව මාර්ගෝපදේශන මාලාව නිසා රුධිර පරිත්‍යාගශීලීන් සංඛ්‍යාව අඩුවීමෙන් ජාතික රුධිර මධ්‍යස්ථානය යම් අර්බුදකාරී තත්ත්වයකට මුහුණ පා සිටින බව වාර්තා වේ.

මෙම නව මාර්ගෝපදේශනය පසුගිය වසරේ දෙසැම්බර 10 වනදා සිට කැනඩාව තුළ ක්‍රියාත්මක වේ.

වරක් රුධිරය පරිත්‍යාග කළ කාන්තාවකට සති 8 ක කාල සීමාවකින් පසු (දින 56 කින් පසු) නැවතත් රුධිරය පරිත්‍යාග කළ හැකි ලෙස පෙර පනවා තිබූ සීමාව නව නිර්ණයන් යටතේ සති 12 ක් එසේත් නැතිනම් දින 84 ක් දක්වා දීර්ඝ කොට ඇත. මෙවැනි කාල පරිච්ඡේදයක නොසිට රුධිරය පරිත්‍යාග කිරීමෙන් කාන්තාවන් යකඩ ඌනතාවට මුණ පෑ හැකි බැවින් හෙල්ත් කැනඩා විසින් මෙසේ කාල සීමාව දීර්ඝ කිරීමට කටයුතු කොට ඇත.

කාන්තාවන්ට පමණක් නොව, 2017 මාර්තු 5 වන දින සිට රුධිරය පරිත්‍යාග කරන පිරිමින්ද බලපාන නව නිර්ණයන් ක්‍රියාත්මක කිරීමට සෞඛ්‍ය බලධාරීන් කටයුතු යොදා ඇත. ඒ අනුව රුධිරය පරිත්‍යාග කිරීමට අදහස් කරන්නන් ඊට පෙර පවත්වනු ලබන විධිමත් හිමොග්ලොබින් පරීක්ෂණයකින් සමත් විය යුතු වේ. එහිදී ඔවුන්ගේ හිමොග්ලොබින් මට්ටමේ අවම සීමාව 130 g/L අගයෙහි පැවතිය යුතු වේ. මෙම මට්ටම පෙර පැවතියේ 125 g/L ලෙසිනි.

මෙම නව නිර්ණයන් ක්‍රියාත්මක වීමත් සමග වසරකදී රුධිර පරිත්‍යාගශීලීන් 35,000 කින් පමණ අඩු විය හැකි බව කැනඩා රුධිර මධ්‍යස්ථානය පවසයි. සාමාන්‍යයෙන් කැනඩාව තුළ නිරන්තරයෙන් රුධිර පරිත්‍යාග කරන්නන් වැඩි පිරිසක් නොමැති අතර මෙම නව නිර්ණයක නිසා එම ප්‍රමාණය තවදුරටත් අඩුවන තත්ත්වයක් පෙන්නුම් කෙරේ. මෙහිදී අලුත් රුධිර පරිත්‍යාග ශීලීන් කෙරෙහි අවධානය යොමු කිරීමට රුධිර මධ්‍යස්ථානයට සිදුවනු ඇත.

කැනඩාවේ සමස්ත ජනගහනයෙන් සියයට 3.4 ක පමණ ප්‍රමාණයක් මේ වන විට රුධිරය පරිත්‍යාග කිරීමට සුදුසුකම් ලබාගෙන සිටින අතර සෑම වසරකම කැනේඩියානුවෝ 400,000 ක් පමණ රුධිරය පරිත්‍යාග කරති. මෙම සංඛ්‍යාව ගැහැණු-පිරිමි වශයෙන් 50-50 ලෙස පවතී. පෙර තිබූ ආකාරයටම මේ පිරිස විසින් රුධිරය පරිත්‍යාග කළහොත් රට පුරා සිටින රුධිරය ලබා දිය යුතු රෝගීන් හට අඩුවක් නොමැතිව රුධිරය සැපයිය හැකි වුවත් නව නිර්ණයන්වලින් පසු ඇතිවන රුධිර හිඟයත් සමග එම සැපයුම කෙසේ කළ හැකි වේදැයි කිව නොහැකි බව රුධිර මධ්‍යස්ථානය පවසයි.

# විෂ සහිත ආහරණ

කැනඩාවේ වෙළඳපොළ තුළ ඇති කෘත්‍රිම ආහරණ රැසක සෞඛ්‍යයට අහිතකර කැඩ්මියම් ලෝහය අඩංගුව ඇති බව 2016 ජනවාරි මාසයේදී සිදුකළ සමීක්ෂණයකින් හෙළිදරව් වී තිබුණි. එහිදී අනාවරණය වූයේ ඒ වන විට වෙළඳපොළෙහි තිබූ ත්‍රිකෝණාකාර නිල් පැහැති පෙන්ඩනයක කැඩ්මියම් සියයට 99.6 ක ප්‍රතිශතයක් අඩංගුව තිබූ බවයි. මෙය එතෙක් කැනඩාවෙන් සොයාගත් වැඩිම කැඩ්මියම් ප්‍රතිශතය සහිත ආහරණය ලෙසද එහි දක්වා තිබුණි.

මේ පිළිබඳව සිදුකළ පරීක්ෂණවලදී Ardene, Aldo වෙළඳසල් තුළින් කැඩ්මියම් බහුල විසිතුරු ආහරණ සොයාගෙන තිබුණි. මිලෙන් අඩු මෙම ආහරණ චීනයෙන් ආනයනය කරන ලද ඒවා වූ අතර විශේෂයෙන් දරුවන්ද මෙම ආහරණ භාවිතයට හුරුවී ඇති නිසා සෞඛ්‍යයට දැඩි තර්ජන එල්ල විය හැකි බව පැවසුණි.

කැඩ්මියම් යනු ශරීරයට අහිතකර බැර ලෝහයක් බව කවුරුත් දන්නා කරුණකි. කැඩ්මියම් ස්පර්ශ කිරීම මගින් එතරම් දරුණු ප්‍රතිඵලයක් අත් නොවුණත් හැපීම, ගිලීම වැනි අවස්ථාවකදී තත්ත්වය භයානක විය හැක. මේ පිළිබඳව සැලකිල්ලට ගනිමින් ෆෙඩරල් රජය විසින් 'සැලකිය යුතු සෞඛ්‍ය අවදානමක් සහිත' ද්‍රව්‍යයක් ලෙස කැඩ්මියම් හඳුන්වා දී ඇත.

සෞඛ්‍ය අංශ විසින් සිදුකළ මෙම හෙළිදරව්වෙන් පසු මහජන සෞඛ්‍යට තර්ජනයක් එල්ල වන මෙම ආහරණ පිළිබඳව Ardene වෙළඳ ආයතනය විශේෂ අවධානයක් යොමු කර ඇති බව පැවසේ. එහි අලෙවියට තබා ඇති විසිතුරු ආහරණ තුළ විෂ සහිත ලෝහ වර්ග ඇත්දැයි නිරීක්ෂණය කොට නිසි ප්‍රමිතිගත කිරීමක් සඳහා විශේෂ වැඩ පිළිවෙළක් මේ වන විට ක්‍රියාත්මක කොට ඇතැයිද පැවසේ.

ෆෙඩරල් රජයේ නීති රෙගුලාසිවලට යටත්ව කැඩ්මියම්වලින් තොර ආහරණ හඳුන්වා දීමටත් බාල ලෝහ වර්ගවලින් යුත් ආහරණ වෙළඳපොළට නොදැමීමටත් ඉදිරියේදී වගබලා ගන්නා බව ඒ පිළිබඳව අදහස් දැක්වූ ආර්ඩීන් හි ප්‍රකාශකයෙකු පවසා තිබුණි.

කෙසේ වුවත් වෙළඳ පොළ තුළ ඇති මිලෙන් අඩු ආහරණ වර්ග මිල දී ගෙන පැළඳීමට පෙර ඒවායේ තත්ත්වය පිළිබඳව සොයා බැලීම කළ යුතු බව මේ අනුව වටහාගත යුතු වේ.

# ටොරොන්ටෝ පාසලක සෙල්ෆෝන් තහනම්

ටොරොන්ටෝවේ Earl Grey Senior Public School හි සිසුන් හට පාසල් පන්ති කාමර තුළ සෙල්ෆෝන් භාවිත කිරීම තහනම් කර ඇත. ඒ අනුව පසුගිය පෙබරවාරි 21 වෙනි දින සිට මෙම නියෝගය ක්‍රියාත්මක කිරීමට පාසල් බලධාරීන් පියවර ගෙන ඇත.

සිසුන්ගේ දිවා විවේක කාලයේදී සෙල්ෆෝනය භාවිත කිරීමේ අවස්ථාව ලබා දී ඇතත් එහිදී පහත දැක්වෙන සීමාවන් යටතේ සෙල්ෆෝන පරිහරණය කළ යුතු වේ. සමාජ ජාල වෙබ් අඩවි තුළ සැරිසැරීම, ටෙක්ස්ට් පණිවිඩ යැවීම, දුරකථනයෙන් ඡායාරූප ගැනීම හෝ වීඩියෝ දර්ශන ගැනීම සිසුන්ට සපුරා තහනම් වේ.

පන්ති කාමර තුළදී සිසුන්ගේ පූර්ණ අවධානය අධ්‍යාපන කටයුතු වෙත යොමු කිරීම සඳහා පාසල විසින් මෙවැනි පියවරක් ගෙන ඇති බව පැවසේ. ටොරොන්ටෝ දිස්ත්‍රික්කයේ පාසල් මණ්ඩලය (TDSB) මෙහිදී පවසා ඇත්තේ, ඇතැම් දෙමවුපියන්ගේ ඉල්ලීම් පිළිබඳවත් ගුරුවරුන්ගෙන් ලබාගත් තොරතුරු මතත් පදනම් වී මෙවැනි තහනමක් සිදුකිරීමට අවසර ලබාදුන් බවයි.

ටොරොන්ටෝ පාසල් තුළ සෙල්ෆෝන් තහනම් කිරීම අලුත් දෙයක් නොවන අතර ඇපල් iPhones ප්‍රථම වරට හඳුන්වා දුන් 2007 වසරේදීද TDSB මගින් සෙල්ෆෝන් තහනම ක්‍රියාත්මක කොට තිබුණි. එම තහනම ක්‍රම ක්‍රමයෙන් ඉවත් වී ගොස් ඇත්තේ 2011 වසරේදීය.

අර්ල් ග්‍රේ පාසල තුළ සෙල්ෆෝන් තහනම පිළිබඳව ඇතැම් දෙමවුපියන් අප්‍රසාදය පළ කරතත් බහුතරයක් ඊට දැඩි කැමැත්තක් දක්වති. කෙසේ වුවත් පාසලේ සිසුන් නම් මේ පිළිබඳව දැඩි ලෙස කණස්සල්ල පළ කර සිටියි. මෙහිදී ඔවුන් පවසන්නේ මෙය දැඩි අසාධාරණ ක්‍රියාවක් බවයි.

# වෛද්‍යවරයෙකු හමුවීමට වැඩිම වේලාවක් ගතවන රට

ලොව දියුණු රටවල සෞඛ්‍ය සේවාවන් හා සැසඳීමේදී එම සේවාවන් ලබාගැනීම සඳහා වැඩිම කාලයක් බලා සිටිය යුතු රට කැනඩාව බව ඒ පිළිබඳව එළිදැක්වුණු නවතම වාර්තාවක් පෙන්වා දේ.

ඒ ආකාරයට දීර්ඝ බලා සිටීමකින් පසු සේවා ලබා ගැනීමේ අවස්ථාව හිමි වුවත් රෝගීන් සඳහා වඩාත්ම තෘප්තිමත් සෞඛ්‍ය සේවාව ලබාගත හැකි රට වන්නේද කැනඩාව බව එම වාර්තාවෙහිම පැවසෙයි.

Canadian Institute for Health Information මගින් 'How Canada Compares' යන ශීර්ෂය යටතේ නිකුත් කළ මෙම වාර්තාව සැකසීම සඳහා රටවල් 11 ක වැඩිහිටියන් යොදාගෙන සිදුකළ සමීක්ෂණවල ප්‍රතිඵල පදනම් කොට ගෙන ඇත. මේ සඳහා කැනඩාව, ඇමරිකා එක්සත් ජනපදය, ජර්මනිය, නෝර්වේ, නෙදර්ලන්තය, ස්විඩනය, නවසීලන්තය, ස්විස්ටර්ලන්තය, එක්සත් රාජධානිය, ඕස්ට්‍රේලියාව, ප්‍රංශය යන රටවල පුද්ගලයින් සැපයූ දත්ත එක් කොට ඇත.

කැනඩාව තුළ වෛද්‍යවරුන්, විශේෂඥ වෛද්‍යවරුන් සහ හදිසි වෛද්‍ය සේවා ලබා ගැනීමේදී අනෙකුත් බොහෝ රටවලට වඩා වැඩිකාලයක් බලා සිටීමට සිදුවන බව එහිදී වාර්තාව පැහැදිලි කර දේ.

මේ සඳහා එක් කරගත් කැනේඩියානුවන් හට තම පවුලේ වෛද්‍යවරයා හෝ නිත්‍ය සත්කාරක ඒකකයට හෝ යාමට අවශ්‍ය වුවහොත් ඒ සඳහා එදිනම හෝ පසුදින කැඳවුම් ලැබෙන්නේ සියයට 43 ක ප්‍රතිශතයකට පමණක් බව සමීක්ෂකයන් තහවුරු කරයි.

වාර්තාවට තොරතුරු සැපයූ කැනේඩියානුවන්ට අනුව සෑම රෝගීන් පස් දෙනෙකුගෙන්ම එක් අයෙකුට තම පවුලේ වෛද්‍යවරයා මුණගැසීමට අවශ්‍ය වුවහොත් ඒ සඳහා දින 7 ක් හෝ ඊට වැඩි කාලයක් බලා සිටීමට සිදුවේ.

එදිනම හෝ පසුදින වෛද්‍යවරුන් හමුවීමට කැඳවුම් ලැබෙන රටවල් අතර පෙරමුණ ගෙන ඇත්තේ නෙදර්ලන්තයයි. එහි සියයට 77 ක ප්‍රතිශතයක වහාම වෛද්‍යවරු හමුවීමේ අවස්ථාව ලැබේ. නවසීලන්තයේ සියයට 76 කට එම අවස්ථාව හිමි වන අතර අන්තර්ජාතික වශයෙන් මෙවැනි ඉක්මන් කැඳවුම් ලැබීමේ සාමාන්‍ය ප්‍රතිශතය සියයට 57 කි.

කැනඩාවේ හදිසි වෛද්‍ය සේවා සැපයුම් තුළ රැඳී සිටීමේ කාල වේලාව බහුලව ගතවන අතර එම මධ්‍යස්ථාන වෙත යන රෝගියකු හට වෛද්‍යවරයකු මුණගැසීමත් අවශ්‍ය ඖෂධ ලබාගැනීමත් සඳහා ඉතාමත් දීර්ඝ කාලයක් බලා සිටීමට සිදුවන බව වාර්තාව තහවුරු කර සිටී.

# කැනඩාවේ නිවාස මිල දී ගන්නා චීනුන්

පාලනයකින් තොරව කැනඩාවේ නිවාස මිල ඉහළ යාමට විදේශීය ගැණුම් කරුවන්ද හේතු වී ඇති බව පැහැදිලි කරුණකි.

ඒ අතරිනුත් චීන ගැණුම් කරුවන් නිවාස වෙළඳපොළට විශාල බලපෑමක් එල්ල කරමින් සිටී.

චීන ජාතිකයන් කැනඩාවේ දේපළ මිල දී ගැනීමට මේ ආකාරයට පෙළඹී තිබීම පිළිබඳව විශේෂ අධ්‍යයනයක් සිදුකරනු ලැබ ඇති අතර එහිදී හෙළිදරව් වී ඇත්තේ ඔවුන් බහුතරයකගේ මූලික ඉලක්කය ආයෝජන නොවන බවයි.

මේ පිළිබඳව විශේෂ වාර්තාවක් චීන වෙබ් අඩවියක් වන Juwai.com හි පළ කොට ඇති අතර එයට අනුව චීන ජාතිකයන් කැනඩාවෙහි නිවාස ගැනීමේ ප්‍රමුඛතම පෙළඹවීම තම දරුවන්ගේ අධ්‍යාපන කටයුතු වේ.

2016 වසරේ කැනඩාව තුළ චීන ජාතිකයන් විසින් මිල දී ගත් දේපළ පිළිබඳ සවිස්තර වාර්තාවක්ද එහි ඇතුළත් කොට ඇත. එහිදී චීන ජාතිකයන්ගෙන් සියයට 46 ක පිරිසක් මොන්ට්‍රියල් පළාතෙහිද, සියයට 44 ක් වැන්කුවර් පළාතෙහිද, සියයට 41 ක් ටොරොන්ටෝවෙන්ද නිවාස මිල දී ගෙන ඇත.



# ළමා කවිය සහ භාෂා සංකල්ප සාධනය

■ ආචාර්ය ස්වර්ණා චන්ද්‍රසේකර

ළමයාගේ අධ්‍යාපන ක්‍රියාවලියෙහිලා සංකල්ප සාධනය ඉතා වැදගත් ස්ථානයක් ගනී. බිළිඳු අවධියේ සිටම ඉන්ද්‍රිය අත්දැකීම් මගින් ළමයා ඇතිකර ගන්නා සංකල්ප අර්ථාන්විත කර ගැනීමට ඇති ප්‍රබලතම මාධ්‍යය භාෂාවයි. සංකල්ප ඇතිවීමෙහිලා ද වර්ධනය වීමෙහිලා ද පදනම වන්නේ භාෂාවයි. එය සෑම භාෂාවකටම පොදු වූ මූලධර්මයකි. ප්‍රාථමික අධ්‍යාපන ක්‍රියාවලියෙහිලා ළමයා තුළ භාෂා සංකල්ප ගොඩනැංවීම අත්‍යවශ්‍ය කාර්යයක් බව අධ්‍යාපනඥයෝ අවධාරණය කරති.

ළමයා ඇස, කන, නාසය වැනි ඉන්ද්‍රියයන් මගින් 'ඉන්ද්‍රිය ප්‍රතිබිම්බ' ඇතිකර ගනියි. කල්යාමේ දී එකී ප්‍රතිබිම්බ ස්ථාවර චිත්ත රූප බවට පත් වෙයි. නිදසුනක් වශයෙන් ළමයා තම නිවසෙහි වූ 'පුටුවක්' දකියි. එහි හිඳගනී. එයින් ළමයාගේ මනස තුළ පුටුවෙහි හැඩය, ප්‍රමාණය ආදිය ගැන චිත්ත රූපයක් මැවෙයි. ළමයාගේ වැඩීමත් සමගම පුටුව සහ නිවසෙහි අනෙකුත් ගෘහභාණ්ඩ අතර වෙනස හඳුනා ගනියි. අනතුරුව පුටු අතර වෙනස, ළමා පුටු, විසිත්ත කාමරයේ පුටු, පන්ති කාමරයේ පුටු ආදි පුටුවල වෙනස හඳුනාගනී. අත්දැකීම් පුළුල් වීමත් සමගම මනෝරථා ද පුළුල් වෙයි.

ඇපල් ගෙඩියක් දුටු විට මුලින්ම එහි හැඩය හා වර්ණය ළමයාගේ ඇසට ගොදුරු වෙයි. අතට ගත්විට එහි දැඩි බව දැනෙයි. නාසයට ළං කළ විට සුවඳ දැනෙයි. ආහාරයට ගත්විට රස දැනෙයි. මෙසේ ඉන්ද්‍රිය ප්‍රතිබිම්බ දෘශ්‍ය, ශ්‍රව්‍ය, ආඝ්‍රාණ, රස හා ස්පර්ශ යනුවෙන් පස් වැදෑරුම් වෙයි. ඒවා හැඳින්වීමට ද්‍රව්‍යය හා වචනය අතර සම්බන්ධය ගලපා ගනී. මෙම සංකල්ප ඇති වීම සහ වර්ධනය ඒකාබද්ධ ක්‍රියාවලියකි.

ළමයා පුද්ගලයන් පිළිබඳව ඉන්ද්‍රිය ප්‍රතිබිම්බ ඇතිකර ගන්නේ ද එලෙසමය. මුලදී හැඬීමෙන් තම අවශ්‍යතා සපුරාගන්නා ළමයා, තමා ආදරයෙන් තුරුළු කරගෙන තම අවශ්‍යතාවන් සපුරාලන මව පිළිබඳව ඉන්ද්‍රිය ප්‍රතිබිම්බ ඇතිකර ගනී. පියා, සොයුරු සොයුරියන් ආදීන් පිළිබඳව ද එසේමය. ඔවුන් හැඳින්වීමට ව්‍යවහාර කෙරෙන වචන ඇසීමෙන් පුද්ගලයන් හා වචන, නොඑසේනම් නාමය ගළපා ගනියි.

බිළිඳු අවධියෙහි සිටම ළමයා භාෂාව ඉගෙන ගන්නේ තමාගේ සමීප පරිසරයෙහි වෙසෙන පුද්ගලයන්ගේ කතාබහට සවන් දීමෙනි. කතාබහ කරන ආකාරය, වචන ප්‍රකාශන විධි සහ වාග්මාලාව ළමයාගේ භාෂාවට බලපාන බව වැඩිහිටියන්ගේ සැලකිල්ලට භාජන විය යුතුය. මුලින්ම ළමයා යම් යම් ශබ්ද සමූහයක් තම ස්මෘති සන්තානයෙහි එකට ඈඳා ගනියි. යම්කිසි අරමුණු සමූහයක් 'අම්මා' යන ශබ්දය සමග ඈඳා ගනියි. ළමයාගේ වැඩීමත් සමගම අම්මා පිළිබඳව ඔහු තුළ ඇතිවන්නේ සංකීර්ණ හැඟීම් සමුදායකි. එය 'මාතෘ ප්‍රේමය' නමින් හැඳින්වෙයි. අකාරුණික පුද්ගලයා පිළිබඳව ඇතිකර ගන්නේ අප්‍රසන්න හැඟීම්ය. භාෂාව ද මනුෂ්‍යයාගේ විවිධ අත්දැකීම් සමග සම්බන්ධ වී පවතින්නකි. ළමා මනසට භාෂාව ඈඳෙන්නේ මෙම අත්දැකීම්ද සමගය.

පාසල් අධ්‍යාපනය බිහිවීමට පෙර සිටම 'භාෂා සංකල්ප සාධන ක්‍රියාවලිය' පිළිබඳව මනා අවබෝධයක් තිබූ බවට නැළවිලි ගී, ඔංචිලි කවි, රබන් පද, තේරවිලි කවි ආදිය ප්‍රබල සාධකයන් ලෙස දැක්විය හැකිය. කවිය යනු 'රසවත් වැකියකි' (වාක්‍යම් රසාත්මකම් කාව්‍යම්) යයි විශ්වනාථයෝ පැවසූහ. කවිය රස වින්දනාත්මක අගයකින් යුක්තය. රසාස්වාදයට බාල, තරුණ, මහලු සියල්ලෝම කැමැත්තෝය. 'රසය' යනු වින්දනයකි. භාවමය ආස්වාදයකි. කවියේ අදහස නොදැන වුවඉද තාලයකට ගායනා කිරීමට ළමයින් කැමතිය. ළමයාගේ පරිකල්පන ශක්තිය හා නිර්මාණ ශක්තිය වර්ධනය කිරීමට ද කවිය මහඟු ආධාරකයකි. මුල් අවධියේදී භාෂා භාවිතය නිසා ලැබූ රස වින්දනය පසු අවධියේ දී භාෂා දක්ෂතාවට පදනමක් වෙයි.

**අතට වෙරළු ඇහිඳ ගෙනේ**
**ඉණට පළා නෙලා ගෙනේ**
**බරටම දර කඩාගෙනේ**
**එයි අම්මා විගසකිනේ**

දරුවාගේ සමාජයෙහි ඉඩ වැඩි වශයෙන්ම අයත්වන්නේ අම්මාටය. මෙම නැළවිලි ගීය තුළින් මව පිළිබඳ සංකල්ප සාධනයක් ඇති කෙරෙයි. මවගේ ආදරය පමණක් නොව නිවසෙහි ඇයට තිබෙන කාර්යභාරය පිළිබඳ සංකල්පයක් ද ජනිත වෙයි.

පුංචි අම්ම සීදේවී - ඇඳුම් ජෝඩුවක් දේවී
අතේ වළල්ලක් දාවී - කරට මාලයක් දේවී

'පුංචි අම්මා' පිළිබඳ ළමා මනසෙහි මැවෙන්නේ තෑගි බෝග ද රැගෙන එන සමීප ඥාතිවරියකගේ චිත්ත රූපයයි. ඉංග්‍රීසි සාහිත්‍යයේ නැළවිලි ගීත ද බොහෝ දුරට මෙයට සමානය.

**Sleep my baby on my bosom**
**Warm and cozy will it prove**
**Round thee mother's arms are folding**
**In her heart a mother's love.**

නූතන සිංහල ළමා පද්‍ය රචකයන් ද මේ පිළිබඳව අවබෝධයෙන් යුතුව ළමා පද්‍ය රචනය කළ බව මුනිදාස කුමාරතුංගයන්ගේ 'නැළවිල්ල' පද්‍ය රචනයෙන් පැහැදිලි වෙයි. දැඩි නිහඬතාවෙන් යුතු පරිසරයක් මැවීමට ඔහු උපයෝගී කොටගන්නේ දරුවාගේ 'නින්ද' යි.

**සිසිල් වෙතියි සඳ ඉතා - සාවා එහි පැන ගතා**
**රසින් අඩක් නොනවතා - සිටී ද ඒ හොඳ සතා**
**සඳපානේ වැලිතලා - සුර කුමරියො මල්සලා**
**නටති මෙදෙස බලබලා - ගිගිරි වළළු පය නොලා**

කවියා මවන පරිසරය ළමයා සිතින් මවන සුරංගනා ලෝකය හා බෙහෙවින් ගැළපෙයි. අවට පරිසරය ගිලගත් නිශ්ශබ්දතාවෙහි දැඩි බව පිළිබඳ සංකල්ප රූප මැවෙයි. ලෙනාඩ් ජයසේකරගේ 'තොටියා' නමැති පද්‍ය රචනය පුද්ගලයන් පිළිබඳව සංකල්ප රූපණය කෙරෙන්නකි.

**සුදු අරලිය මල් අරගෙන - අම්මල නංගිලත් එක්ක**
**පෝයදාට කැලණි යන්නෙ - ඔරුවෙ නැගීලා**

බිළිඳු වියෙන් බහ තෝරන අවධියට සම්ප්‍රාප්ත වන දරුවා පිළිබඳව ද ආදියෙහි සිටම මව තුළ අවබෝධයක් තිබූ බව පෙනේ. එදා 'බහ තෝරනවා' යනුවෙන් හැඳින්වූයේ අර්ථ සහිතව වචන කීපයක් ගළපා කියන අවස්ථාවයි. ළමයා පහසුවෙන් ඉගෙන ගන්නේ යම්කිසි දෙයක් හා බැඳුණු වචන සහ ඇසට ගොදුරු වන, නිරීක්ෂණය කළහැකි ක්‍රියාවන් කියැවෙන වචනයි.

**හබුං කටයි බත් දෙකටයි**
**මගේ පුතා ඔක්කොම කයි**

ළමයාගේ කතාබහට හවුල් වීම භාෂාව ඉගෙනීමට මහඟු ආධාරකයක් වන අතරම බත් කටවල් කිහිපයක් ද ළමයාගේ මුවට වැටෙයි. කුස ද පිරෙයි. තම පරිසරය හඳුනාගැනීමට ද ළමයා උදවු කරගන්නේ භාෂාවයි. තමා අවට ඇති සෑම දෙයකටම නමක් ඇති බව ළමයා ඉගෙනගන්නා මුල්ම පාඩමයි.

**කපුටු කාක් කාක් කාක්**
**ගොරක ඩේං ඩේං ඩේං**
**දොරකඩ ගහේ පුවක් පුවක්**
**බට පඳුරේ බුලත් බුලත්**

එකම වචන නැවත නැවත රිද්මයට ගායනා කිරීම හා ශබ්ද ධ්වනියෙන් ජනිත වන රස වින්දනය හේතු කොටගෙන ළමයාට පරිසරයේ දෑ සහ ඒවාට භාවිත වන නම් එකට ඈඳාගැනීම පහසු වෙයි.

**උඩින් උඩින් වර පෙත්තප්පු**
**බිමින් බිමින් වර පෙත්තප්පු**
**උඩින් උඩින් වර - බිමින් බිමින් වර**
**පිට්ටු කන්න වර - පෙත්තප්පු**

රබන් පද ළමයාගේ භාෂා වර්ධනයට හා භාෂා සංකල්ප සාධන ක්‍රියාවලියට ආධාරකොට ගතහැකි පද්‍ය විශේෂයකි. 'පෙත්තප්පු' යන සුරතල් නමින් හැඳින්වෙන්නේ ගිරවාය. ඔවුන්ට ආරාධනා කරන්නේ තමා ප්‍රිය කරන පිට්ටු කන්නටය. මෙයින් සත්ව කරුණාව ද ළමයා තුළ ඇති කරවයි. මෙසේ රිත්මික වචන භාවිත කෙරෙන ඉංග්‍රීසි ළමා ගීතයක් පහත දැක්වෙයි.

**Lavender's blue, dilly dilly,**
**Lavender's green**
**When you are King, dilly dilly,**
**I shall be Queen.**

සංකල්ප සාධන ක්‍රියාවලියට පමණක් නොව ළමයාගේ සදාචාර වර්ධනය සඳහා ද ජනකවි උපයෝගී කොටගෙන ඇති බව පැහැදිලිය. ඔංචිලි පැදීම වැටි වැටී ඇවිදින අවධියෙහි වූ දරුවන් ඉතා ප්‍රිය කරන ක්‍රීඩාවකි. ඔංචිලි පදින්නේ ගීත ද ගායනා කරමිනි.

**අත්ත උසං උසං උසං**
**ජම්බු පොකුරු සිලිං සිලිං**
**ලොකු අක්කේ පදිං පදිං**
**ජම්බු කඩං බෙදං බෙදං**

ඔංචිලි පදින්නේ අක්කාය. ඔංචිල්ලාව බැඳ තිබෙන්නේ ජම්බු ගසේය. ඔංචිල්ලාව ඉහළ පහළ යන විට ජම්බු කැඩිය හැකිය. 'උසං', 'සිලිං', 'පදිං', 'බෙදං' ආදී ශබ්ද ධ්වනිය කුළු ගැන්වෙන වචනවලින් රසවින්දනය කුළුග ැන්වෙයි. අක්කාට ආයාචනා කරන්නේ තනියම ජම්බු නොකා අනෙක් අයටත් බෙදන ලෙසටය. කවියෙන් උපදෙස් දෙන්නේ අණ කිරීමෙන් නොව ව්‍යංගයෙනි. එවිට ළමයා එය මනාව ධාරණය කරගනී.

**Baa, baa, black sheep,**
**Have you any wool?**
**Yes, sir, yes, sir,**
**Three bags full;**
**One for the master,**
**And one for the dame,**
**And one for the little boy**
**Who lives down the lane.**

මෙම පද්‍යයෙන් ද ගම්‍යවන්නේ මෙම උපදේශයයි.

**මේ ගසේ බොහෝ - පැණි දොඩම් තිබේ**
**පැහිල ඉදිල බිමට නැමිල - බරවෙලා අතු**
**නංගිටයි මටයි - ගෙඩි දෙකක් ඇතී**
**වැඩිය කඩන නරක ළමයි - එහෙම නොවේ අපී**

ගෙඩි පිරී ඉතිරී අතු බිමට නැමුණු පැණි දොඩම් ගසක සංකල්ප රූපයට අමතරව කෙතරම් දොඩම් ප්‍රමාණයක් තිබුණ ද අවශ්‍ය ප්‍රමාණයට පමණක් එනම් දොඩම් ගෙඩි දෙකක් පමණක් කඩා ගතයුතු බවට උපදේශයක් ලැබෙයි.

ගණිත සංකල්ප වර්ධන ක්‍රියාවලියෙහිලා ද ජනකවි උපයෝගී කොටගෙන ඇති ආකාරය වැදගත්ය. මෙය රස වින්දනයත් සමගම ළමයාගේ බුද්ධි වර්ධන ද කරවන සුළුය.

**අප්පුඩි පුඩි පුවත්තා - කැවුම් දෙකක් දෙයත්තා**

ළමයාට හුරු පුරුදු රසවත් කෑමක් වන කැවුම් දෙකක් සහ දෙඅත් සමාන කරමින් 'දෙක' යන ගණිත සංකල්ප සාධනය කරයි. අනතුරුව තම නිවසෙහි වසන පුද්ගලයන් සහ අසල්වාසීන් උපයෝගී කොටගෙන ගණිත සංකල්ප නිර්මාණය කෙරෙයි.

**අපේ ගෙදර තුන්දෙනයි - උඩහ ගෙදර තුන්දෙනයි**
**පහළ ගෙදර තුන්දෙනයි - තුන් පොලේම නවදෙනයි**

පහත සඳහන් පද්‍යයෙන් අවධානය යොමු කෙරෙන්නේ පරිසරයටයි. පරිසරයේ වෙසෙන සතුන්ටයි.

**රන් රඹුටන් ගස් දෙකයි**
**ගිනි කුකුළන් පස්දෙනයි**
**උන්ගෙ කරේ බොත්තමයි**
**බලන්න හරි ලස්සණයි**

**වවුල් දහයි දහයි දහයි**
**කොක්කු දහයි දහයි දහයි**
**අහසේ උඩ නගියි නගියි**
**පදිමු අපිත් එහෙයි මෙහෙයි**

ළමයා මනා අවධානයෙන් යුතුව කවි රස විඳිමින් දෙකේ සිට දහස දක්වා ගණිත සංකල්පය උගනියි. ඉංග්‍රීසි භාෂාවේ ද ගණිත සංකල්ප සාධනය කෙරෙන්නේ මේ ආකාරයටමය.

22 වන පිටුව බලන්න

# ඉඩම් ලියාපදිංචි කිරීම පරිගණක ගත කෙරේ

ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව හා ඉඩම් අමාත්‍යාංශය ඒකාබද්ධව ක්‍රියාවට නංවා තිබෙන ශ්‍රී ලංකාවේ ඉඩම් ලියාපදිංචි කිරීම පරිගණක ගත කිරීමේ කටයුතු සාර්ථකව සිදුකෙරෙමින් පවතින බව වාර්තා වේ.

මෙම වැඩපිළිවෙළ නිසා කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාල බල ප්‍රදේශයේ ඉඩම් පිළිබඳව සිදුකරන කටයුතු වඩාත් කාර්යක්ෂමව හා විධිමත්ව කිරීමේ හැකියාව ලැබී ඇත. ඉඩමක අයිතිය තහවුරු කර ගැනීම, ගොඩනැගිලි ඉදිකිරීමේ බලපත්‍ර නිකුත් කිරීම, පාරිසරික තත්ත්ව පරීක්ෂණ වාර්තා නිකුත් කිරීම ආදි කටයුතු සිදුකිරීමේදී අදාළ පළාත් පාලන ආයතනවලට මෙන්ම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලවලටද මෙමගින් පහසුව සැලසේ.

ඉඩම් ලියාපදිංචි කිරීම පරිගණක ගත කිරීම නිසා ඉඩම් හිමිකරුවන්ටද විශාල වාසි රැසක් හිමිවන අතර පෞද්ගලික ඉඩම් හිමිකම් නිරවුල් කරගැනීම, බිම් සවිය, ඉඩම් හිමිකම් සහතිකපත් කිරීම ආදිය වඩාත් කාර්යක්ෂමව සිදුකර ගත හැකි වේ. ඉඩම් පත්ඉරු ස්කෑන් කර පරිගණකගත කිරීමත් ඒවායේ තොරතුරු දත්ත පද්ධතියට ඇතුළත් කිරීමත් නිසා ඉඩම් පිළිබඳ පැරණි තොරතුරු, අතීත තොරතුරු සියල්ල දැනගැනීමේ අවස්ථාව හිමිවේ. පරිගණක දත්ත තුළට යැවූ තොරතුරු ස්වභාවික අපාදාවලදී විනාශ නොවන අතර කූට ලෙස තොරතුරු විකෘති කිරීම, විනාශ කිරීම කළ නොහැකි වේ.

ලංකාව පුරා ඉඩම් අලෙවි කිරීමේදී හා මිල දී ගැනීමේදී සිදුවන විවිධ අක්‍රමිකතා දූෂණ අවම කර ගැනීමේ හැකියාව මෙමගින් ලැබීමද අත්වන විශාලතම වාසියකි.

බැංකු ඇතුළු මූල්‍ය ආයතවලට ඉඩම් තක්සේරු කිරීම්වලදී හා ඉඩම් සම්බන්ධ නීතිමය කටයුතු සිදුකරන අවස්ථාවලදී අවශ්‍ය තොරතුරු ඉක්මනින් සපයා ගැනීමද මෙමගින් පහසු වේ.

# පාසල් නිල ඇඳුමට වෙනසක්

ශ්‍රී ලංකාවේ එක් එක් පළාතේ පවතින දේශගුණ තත්ත්වයන්ට ගැළපෙන පරිදි පාසල් නිල ඇඳුම වෙනස් කිරීම කළ යුතු බව අධ්‍යාපන ඇමති අඛිල විරාජ් කාරියවසම් පවසා ඇත. මෙහිදී නිල ඇඳුමේ ආකෘතිය හා වර්ණය පිළිබඳව අමාත්‍යවරයාගේ අවධානය යොමු වී ඇත.

දැනට සුදු පැහැයෙන් ඇති පාසල් නිල ඇඳුම කිලිටි කර නොගෙන සිටීමට සිසු සිසුවියන්ට බොහෝ වෙහෙසක් දැරීමට සිදුවී ඇති බවත් සිසුන්ගේ මනස නිදහස් වන ආකාරයට ඇඳුම සකස් විය යුතු බවත් ඇමතිවරයා පවසා සිටී. පාසල් සිසුන් මෙවැනි දැඩි අපහසුතා මධ්‍යයේ අධ්‍යාපනය ලැබිය යුතු නැති බව ඇමතිවරයාගේ අදහසයි.

සීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයේ අනාගතය ජය ගැනීමට නම් සිදුකළ යුතු වෙනස්කම් අදම සිදුකළ යුතු බවත් විශේෂයෙන්ම අධ්‍යාපන ක්ෂේත්‍රයේ වෙනස්කම් වර්තමානයේ සිදුනොකළහොත් අනාගතයේ දරුවන් දොස් පවරනු ඇති බවත් ඇමතිවරයා පවසයි.

එසේම ඉදිරි කාලයේදී ගර්භනී ගුරුවරියන්ට පහසු ඇඳුමක් හඳුන්වා දීමට අදහස් කර ඇති බවත් මෙහිදී ප්‍රායෝගිකත්වයට මුල්තැන දී කටයුතු කිරීමට අවශ්‍ය බවත් අධ්‍යාපන ඇමතිවරයා පවසා ඇත.

# දහස් ගණනින් සිදුවන ළදරු මරණ

ශ්‍රී ලංකාව තුළ වසරකදී ළදරු මරණ 2500 ත් 3000 ත් අතර ප්‍රමාණයක් සිදුවන බව Perinatal Society of Sri Lanka හි සභාපති වෛද්‍ය කපිල ජයරත්න පවසයි. මාර්තු 3 වන දිනට යෙදී තිබුණු ලෝක උපත් දෝෂ දිනය (World birth defects day) වෙනුවෙන් පැවත්වුණු සම්මන්ත්‍රණයකදී වෛද්‍ය ජයරත්න මේ තොරතුරු අනාවරණය කොට තිබුණි. එහිදී වැඩිදුරටත් කරුණු දැක්වූ වෛද්‍යවරයා පැවසුවේ,

මෙසේ ළදරුවන් බහුතරයක් මරණයට පත්වන්නේ උපත් ආබාධ නිසා බවයි. ඒ අතරින් අඩකටත් වැඩි ළදරු මරණවලට හේතුව ලෙස ඔහු පෙන්වා දී ඇත්තේ හෘදය ආශ්‍රිත රෝගී තත්ත්වයන්ය. එසේ හෘදයේ ආබාධ නිසා වසරකදී සියයට 56 ක පමණ ළදරු මරණ සංඛ්‍යාවක් සිදුවන බවත් 2014 වසරේදී හෘදයාබාධ නිසා සිදුවූ ළදරු මරණ සංඛ්‍යාව 324 ක් බවත් පැවසේ. විවිධ සංකූලතා නිසා වසරකදී නොමේරූ ළදරුවන් 25.000 ක් පමණ උපදින අතර මෙය බරපතල සෞඛ්‍ය ප්‍රශ්නයක් බවට පත් වී ඇති බව වෛද්‍ය ජයරත්න පෙන්වා දේ. ශ්‍රී ලංකාවේ දරු උපත් දහසකින් ළදරු මරණ 5 ක් සිදුවන අතර උපත් දහසකින් උපතට පෙර ළදරු මරණ අටක් සිදුවන බව සංඛ්‍යාලේඛන පවසයි. ශ්‍රී ලංකාව් තුළ දැනට ගැටලුවක්ව පවතින උපත් ආබාධ සහිත දරුවන් බිහිවීම පිළිබඳව විමර්ශනය කිරීම සඳහා විශේෂ වැඩපිළිවෙළක් ආරම්භ කිරීමට අදහස් කර ඇති බව වෛද්‍ය ජයරත්න පවසා සිටී.

# ශ්‍රී ලංකාවේ විදේශ සංචිත පහළට

රටෙහි ඇති සම්පූර්ණ විදේශ සංචිත ප්‍රමාණය ඉක්මවා ගෙවීමට ඇති කෙටි කාලීන ණය වගකීම් ප්‍රමාණය ඉහළ යෑමත් සමගම ශ්‍රී ලංකාවේ විදේශ සංචිත මට්ටම අවදානම් ලෙස පහතට වැටී ඇති බව මහ බැංකුවේ අලුත්ම ආර්ථික දර්ශක වාරතා හෙළිදරව් කොට සිටී. මෙම දත්තයන්ට අනුව පසුගිය දෙසැම්බර් 30 වන දින වන විට තිබූ නිල සංචිත වත්කම් ප්‍රමාණය ඇමරිකානු ඩොලර් බිලියන 6.06 කි. එදින වන විට පැවති කෙටි කාලීන විදේශ ණය වගකීම් ප්‍රමාණය ඇමරිකානු ඩොලර් බිලියන 7.52 කි. ඒ අනුව කෙටි කාලීන ණය වගකීම්වලට සාපේක්ෂව ලංකාවේ ඇති විදේශ සංචිත ප්‍රමාණය සෘණ අගයක් ගෙන තිබේ.

පසුගිය වසර දෙකක කාලය පිළිබඳව සැලකීමේදී ශ්‍රී ලංකාවේ විදේශ සංචිත ප්‍රමාණය ඇමරිකානු ඩොලර් බිලියන තුනකින් පමණ පහත වැටී ඇති බව පැවසේ. 2014 වසර අගදී ඇමරිකානු ඩොලර් බිලියන 8.2 ක් වූ විදේශ සංචිත ප්‍රමාණය මේ වන විට 5.4 දක්වා පහත වැටී ඇති බව මහ බැංකු වාර්තා පවසයි.

රටට ප්‍රමාණවත් ලෙස විදේශ විනිමය ගලා නොඒමත්, මහ බැංකුව ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව රුපියල රැක ගැනීමට විදේශ විනිමය වෙළඳපොළ තුළ ඩොලර් විකිණීමත් වැනි කරුණු මෙවැනි තත්ත්වයක් ඇති වීමට ප්‍රධාන වශයෙන් බලපා ඇති බව ආර්ථික විශේෂඥයෝ පවසති.

පසුගිය වසරේදී (2016) ශ්‍රී ලංකා රුපියල ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව සියයට 3.8 ක් පිරිහී ඇති බවත් මේ වසරේ (2017) පෙබරවාරි 07 වැනි දින දක්වා කාලය තුළ ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල සියයට 0.6 කින් පිරිහී ඇති බවත් මහ බැංකුවේ ආර්ථික පර්යේෂණ අධ්‍යක්ෂ ආචාර්ය යූතිකා ඉන්ද්‍රරත්න පවසා සිටියි.

මේ අතර ශ්‍රී ලංකා ඉතිහාසයේ ප්‍රථම වරට ඇමරිකානු ඩොලරයේ ඉහළම අගය 2017 පෙබරවාරි 22 වෙනි දින වාර්තා වී තිබුණු අතර එහි ඇමරිකානු ඩොලරයක විකුණුම් අගය රුපියල් 154.21 ක් ලෙස සඳහන් විය.

# කරුවලගස්වැවට වෙනස්ම විශ්වවිද්‍යාලයක්

සාම්ප්‍රදායික අධ්‍යාපනය මූලික කරගනිමින් උපාධිධාරීන් බිහිකිරීම වෙනුවට වෘත්තියක් ඉලක්ක කරගනිමින් උපාධිධාරීන් බිහිකරන විශ්වවිද්‍යාලයක් බිහිකිරීමට රජය කටයුතු සකස් කරමින් පවතී. ආණමඩුව කරුවලගස්වැව ප්‍රදේශයේ ඉදිකිරීමට යෝජිත මෙම විශ්වවිද්‍යාලයේ ඉදිකිරීම් කටයුතු මේ වසර තුළදී ආරම්භ කිරීමට නියමිත වේ.

මූලිකව මෙම විශ්වවිද්‍යාලය මගින් පාඨමාලා 08 ක් යටතේ උපාධි පිරිනැමීමට යෝජනා වී ඇති අතර 2019 වසරේදී මෙහි අධ්‍යයන කටයුතු ආරම්භ කිරීම රජයේ අපේක්ෂාවයි.

ලෝක බැංකුවේ හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රතිපාදන හා නියමයන් මත පදනම්ව මෙම විශ්වවිද්‍යාලයේ වැඩ කටයුතු සිදු කෙරෙයි.

# සීගිරියට ඔන්ලයින් ටිකට්

යුනෙස්කෝව මගින් ලෝක උරුමයක් ලෙස නම් කර ඇති ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක වටිනාකමින් යුක්ත සීගිරිය නැරඹීම සඳහා අවශ්‍ය ප්‍රවේශපත්‍ර අන්තර්ජාලය ඔස්සේ මිල දී ගැනීමේ පහසුකම් දැන් සලසා තිබේ. මධ්‍යම සංස්කෘතික අරමුදල හා ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය ඒකාබද්ධව මෙම ඊ-ටිකට් සේවාව ක්‍රියාත්මක කර ඇත. ඒ අනුව දෙස් විදෙස් සියලුම සංචාරකයන්ට මෙම ඊ-සේවාව මගින් ටිකට් මිල දී ගැනීමේ අවස්ථාව සැලසේ. www.ccf.gov.lk/ හෝ www.gov.lk යන වෙබ් අඩවිවලට පිවිසීමෙන් ප්‍රවේශ පත්‍ර ලබාගත හැකි අතර අන්තර්ජාලය ඔස්සේ ලබාගන්නා ප්‍රවේශ පත්‍ර මාස තුනක කාලයක් සඳහා වලංගු වේ.

# ගුරු හිඟයක් ! විදුහල්පතිවරුන්ට හමුදා පුහුණුව !

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන කටයුතු පවත්වාගෙන යාම සඳහා ගුරුවරුන් 21,000 ක අඩුවක් පවතින බව අධ්‍යාපන රාජ්‍ය අමාත්‍ය වී. රාධක්‍රිෂ්ණන් මහතා පවසා සිටී.

සමස්ත ශ්‍රී ලංකාව තුළ මේ වන විට ගුරු සේවයේ නියුතු වූවන් 235,000 ක් පමණ සේවය කළත් එම පිරිස ප්‍රමාණවත් නොවන බව ඔහු පවසයි. ඒ අනුව අධ්‍යාපනය විධිමත්ව හා ක්‍රමවත්ව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ගුරු හිඟය පියවීමට ගුරුවරුන් 21,000 ක් කඩිනමින් බඳවා ගැනීමට කටයුතු සැලසුම් කර ඇති බව පැවසේ.

නිදහස් අධ්‍යාපන ක්‍රමයක් පැවතුනද එය රටට ගැළපෙන ආකාරයට ක්‍රියාත්මක නොවීම නිසා මෙවැනි පුරප්පාඩු ප්‍රමාණයක් ඇති වී පවතින බව නියෝජ්‍ය ඇමතිවරයාගේ අදහසයි.

රට පුරා ගුරු හිඟය එසේ පවතිද්දී විදුහල්පතිවරුන් වෙත හමුදා පුහුණුව ලබාදීම කෙරෙහි රජයේ අවධානය නැවතත් යොමු වී ඇති බව වාර්තා වේ.

පසුගිය රජය විසින් ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ පළමු පන්තියේ නිලධාරීන්ගෙන් තෝරාගත් පිරිසකට ශිෂ්‍ය භට පුහුණුව ලබාදුන් ආකාරයටම මේ රජය විසින්ද විදුහල්පතිවරුන්ට එම පුහුණුව ලබා දීමට සැලසුම් කර ඇති බව වාර්තා වේ. පසුගිය රජය විසින් එසේ තෝරාගත් ප්‍රාදේශීය අධ්‍යාපන නිලධාරීන් සහ විදුහල්පතිවරුන් ඇතුළත් පිරිසකට සතියක පුහුණුවකින් පසු ශිෂ්‍ය භට බලකායේ කර්නල් පදවි පවා ලබා දී තිබුණි. එය නැවතත් ක්‍රියාත්මක කරමින් මාර්තු මස 22 වෙනිදා සිට දකුණු පළාතේ පාසල් විදුහල්පතිවරුන්ට මෙම පුහුණුව ලබාදීමට සැලසුම් කර ඇති බව පැවසේ.

# කල්පිටිය කොරල් පරය විනාශයට

කල්පිටිය වැලිපර අභය භූමියේ විශාලතම කොරල් පර දෙක මේ වන විට විනාශ වී ඇති බව වාර්තා වේ. මිනිස් ක්‍රියාකාරකම් හා සාගර උෂ්ණත්වය ඉහළ යාම නිසා මෙවැනි තත්ත්වයක් මතුවී ඇති බව ඒ පිළිබඳව කර ඇති අධ්‍යයනයකින් හෙළි වී ඇත.

ශ්‍රී ලංකාවේ විශාලතම හා සුන්දර කොරල් පර දෙකක් සහිත වූ මෙම ස්ථානය, වන සත්ව හා වෘක්ෂලතා ආඥා පනත යටතේ 1992 අප්‍රේල් මස 03 වන දින අභය භූමියක් ලෙස ප්‍රකාශයට පත් කෙරුණි. හෙක්ටයාර 306.7 ක විශාලත්වයකින් යුක්ත කල්පිටිය වැලිපර අභය භූමි කලාපය කල්පිටිය කුඩාව වෙරළේ සිට මුහුදු සැතපුම් 12 ක පමණ දුරින් මහ මුහුදේ පිහිටා ඇත. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන මෙම වැලිපර අභය භූමියෙහි මෘදු හා දෘඪ ලෙස කොරල් වර්ග දෙකක් පවතී.

කෙසේ වුවත් මේ වන විට මෙම කොරල් පර විනාශ වී ඇති බව පැවසෙන අතර මෙම වැලිපර අභය භූමි කලාපය ආසන්නයේ ලයිලා හා සුරුක්කු තහනම් දැල් යොදා ගනිමින් හා ඩයිනමයිට් යොදා ගනිමින් මසුන් මැරීමත්, කොරල් පර උඩ සිට මසුන් මැරීමත්, සංචාරකයන් නිතරම කොරල් පර මත ඇවිදීමත් නිසා කොරල්පරවලට දැඩි හානි සිදුවී ඇත. එසේම සාගර උෂ්ණත්වය ඉහළ යෑමද මෙම විනාශයට දැඩිව බලපා ඇති බව පැවසේ.

දසත Dasatha

2017 මාර්තු March 2017

Published by Dasatha Publications
Publisher - Gamini Abeysinghe
Consultant Editors - Sirisena Vithanage
Editor in Chief - Chamari Abeysinghe
Associate Editors - Nandana Prasadh
Graphic Design & Layout - Sampath Ranaweera
Creative graphics - Jagath Hewapanna
Web Master - Dhanushka Bandara

114 Chatfield Dr. Woodbridge
L4H 0Z7. Ontario. Canada

Telephone : 416 822 2789
Fax : 289 553 5668
E-Mail : dasathainfo@gmail.com
www.dasatha.com

Canada We acknowledge the [financial] support of the Government of Canada.
«Nous reconnaissons l'appui [financier] du gouvernement du Canada'
www.canada.ca

# සයිටම් ගැටලුව

මේ දිනවල ශ්‍රී ලංකාවේ පුවත්පත්වල හා විද්‍යුත් මාධ්‍යවල නිරතුරුවම දකින්නට අසන්නට ලැබෙන, මහාමාර්ග පෙළපාලිවලින් පිරී පවතින, තාප්ප පෝස්ටර්වලින් වැසී ගොස් ඇති පුවතක් නම් මාලඹේ 'සයිටම්' වෛද්‍ය විද්‍යාලය පිළිබඳ පුවතයි. කැනඩාවේ වෙසෙන ශ්‍රී ලාංකික බොහෝ දෙනාට සයිටම් යනු කුමක්දැයි වටහා ගැනීම සඳහා ඒ පිළිබඳව කෙටි සටහනක් පළමුව තැබීම සුදුසු යැයි කල්පනා කරමි. සයිටම්හි නිර්මාතෘවරයා වන දොස්තර නෙවිල් ප්‍රනාන්දු මහතාම 2017 පෙබරවාරි 19 වන දින ඉරිදා ලංකාදීප පුවත්පත සමග කළ සාකච්ඡාවකදී පළ කළ අදහස් ඒ සඳහා ප්‍රමාණවත් වනු ඇත.

"දෙලක්ෂ පනස්දහසක් උසස්පෙළට වාඩි වී ලක්ෂයක් ඉන් සමත් වී විශ්වවිද්‍යාලයකට යාමේ සුදුසුකම් ලැබුවා වුවත් පහසුකම් මත බඳවා ගන්නේ දහඅට දාහයි. ඒ නිසා පෞද්ගලික අංශයේ මුදල් තිබෙනව නම් කවුරුන් හරි මුදල් ආයෝජනය කරන්න කියල එදා උසස් අධ්‍යාපන ඇමතිව සිටි විශ්වා වර්ණපාල මහතා කිව්ව. එදා මම මගේ ආශා සෙන්ට්‍රල් රෝහල මිලියන 1600 කට විකුණා පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයක් ආරම්භ කරන්න කැමති බව කිව්වා. එතුමා ඒ ගැන සතුට පළ කළහම මම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමෙන් අවසර ඉල්ලුවා. විශ්වවිද්‍යාල පනත යටතේ පෞද්ගලික විශ්වවිද්‍යාලයකට අවසර දෙන්න බෑ යයි කිව්වා. ඒ පාර මම ආයෝජන මණ්ඩලයේ සභාපතිගේ අවසරය ඉල්ලුවා. ඔහු අවසර දුන්නා. මම පටන් ගත්තා."

ඒ ආකාරයෙන් පටන්ගත් සයිටම් වෛද්‍ය විද්‍යාලයෙන් මේ වන විට වෛද්‍ය උපාධිධාරීන් 50 ක් බිහිකර ඇතැයිද දැනටමත් සිසුන් කණ්ඩායම් 10 ක් එහි ඉගෙනුම ලබමින් සිටිතැයිද ඔහුම එහිදී ප්‍රකාශ කොට තිබිණි. සයිටම් ආරම්භ වී ඇත්තේත් එය ක්‍රියාත්මක වී ඇත්තේත් ඒ ආකාරයෙනි.

මේ අතර මේ ආයතනයටත් එහි උපාධි පිරිනැමීමටත් එරෙහිව රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය, විශ්වවිද්‍යාල ශිෂ්‍ය සංගම් සහ ජනතා විමුක්ති පෙරමුණ ආදි දේශපාලන පක්ෂ කීපයකුත් විරෝධතා පළකරන්නට පටන් ගෙන තිබේ. රජයට මෙම ආයතනය හා එහි උපාධි නොපිළිගත යුතු බවට එම විරෝධතා මගින් බල කෙරෙයි.

මෙම ආයතනයට එරෙහි උද්ඝෝෂණවලට මූලික වී ඇති කරුණු අතර නිදහස් අධ්‍යාපනය කප්පාදු කිරීම, නිදහස් සෞඛ්‍යයට බලපෑම් එල්ල කිරීම, මෙම උපාධි ආයතනය නීත්‍යනුකූල පදනමකින් තොරව ආරම්භ කිරීම, එම උපාධිවල වලංගු තත්ත්වයක් නොතිබීම, රජයේ වෛද්‍ය විද්‍යාලයට සමගාමීව සිසුන් බඳවා ගැනීමේදී අඩු සුදුසුකම් සහිත සිසුන් බඳවා ගැනීම, අඩු සුදුසුකම් සහිත මහාචාර්යවරුන් කතිකාචාර්යවරුන් ලවා ඉගැන්වීම, සිසුන්ගේ සායනික පුහුණුව සෑහීමකට පත්විය නොහැකි වීම ආදිය වේ.

මේ පිළිබඳව සයිටම් ආයතනය විසින් අධිකරණයට යොමු කරන ලද නඩුවකට අනුව එම සිසුන්ට ජයග්‍රහණයද හිමි වී ඇත.

මෙම ආයතනයේ නිර්මාතෘවරයාම ප්‍රකාශ කරන අන්දමට මෙය ආරම්භ කර ඇත්තේම රටේ පවත්නා නීති රීතිවලට අනුගත නොවෙමින් බව පැහැදිලි වෙයි. මේ සඳහා ආයෝජන කොමිසමේ මිස උසස් අධ්‍යාපන කොමිසමේ අනුමැතිය ඔහුට ලැබී නැත. ආයෝජන මණ්ඩලයේ අනුමැතිය සෞඛ්‍ය අධ්‍යාපනය පිළිබඳව නොව මුදල් ආයෝජන කරන ව්‍යාපාර පිළිබඳ වූවකි. සෞඛ්‍යයත් ව්‍යාපාරත් අතර ඇත්තේ විශාල පරතරයකි. ඒ අතරම ශ්‍රී ලංකාවේ මෙවැනි ආයතනයක් පිළිබඳව තීරණයක් දිය හැකි එකම ආයතනය වන වෛද්‍ය සභාවේ විශේෂ තාක්ෂණික කමිටුවක් සයිටම් ආයතනය තුළට ගොස් කළ සමීක්ෂණයකින් පසු ලබාදුන් නිර්දේශයෙහිද සඳහන් වන්නේ ඒ සඳහා මෙම ආයතනයෙහි ප්‍රමිතියක් නොමැති බවයි. එවැනි ආයතනයකින් උපාධි ලබා පිටවන්නන් වෛද්‍යවරුන් වශයෙන් සේවයේ යෙදවීම ජනතාවට කරන බලවත් අසාධාරණයකි. තවමත් දෙපසට වැනෙමින් සිටින රජය මේ පිළිබඳව කෙබඳු තීරණයකට එළඹේදැයි කිව නොහැකිය.

දැනටත් ලක්ෂ ගණන් මුදල් ගෙවා උපාධි ගෙන සුදුසුකම් ඇතිව සිටින සිසුනටත් ආයතනය තුළ ඉගෙනුම ලබන සියලුම සුදුසුකම් නැති සිසුනටත් අසාධාරණයක් නොවන පරිදිත් මෙම අයට වෛද්‍ය උපාධිය ලබාගත හැකිවන පරිදි කටයුතු කිරීමටත් වගබලා ගත යුතු බව නම් සඳහන් කළ යුතුය. මේ අය අතර ලක්ෂ ගණන් ඇති අය මෙන්ම ගේ දොර උගසට තබා පැමිණි අයද සිටිය හැකි බැවිනි. ඒ සමගම රටේ සිදුවන දේ පිළිබඳව රජය නිසි නිරීක්ෂණයක් නොකොට මෙවැනි ආයතන බිහිවන්නට හැරීම නිසා මෙම සිසුන් මුලාවට පත්වූවා මිස ඔවුන් බලහත්කාරයෙන් මේ ආයතනවලට ඇතුළු වූවන් නොවන හෙයිනි.

සයිටම් ආයතනයේ නිර්මාතෘ නෙවිල් ප්‍රනාන්දු මහතා කියන පරිදි උසස්පෙළ සමත් වෙන සිසුන් බහුතරයකට විශ්වවිද්‍යාලයට ඇතුළු වීමට හැකි වන පරිදි නිසි වැඩපිළිවෙළක් සැකසීමද රජයේ වගකීම වෙයි.

මේ ප්‍රශ්නය අවුල් වී ඇති තරම දෙස බලන විට ආවාට ගියාට කුමන හෝ තීන්දුවක් ගෙන නිමාවකට පත් නොකොට ඉදිරිපත්ව ඇති සියලු කරුණු සලකා බලා නිසි පරිදි තීන්දුවක් ගැනීමද රජයේ වගකීම වෙයි.

# ව්‍යවස්ථාව ජනමත විචාරණය සහ ජනතා අපේක්ෂාව

■ දූරදර්ශී විසිනි

'දසත' මින් පෙර අවස්ථා කීපයකදීම ශ්‍රී ලංකාවේ ජනතාවට පසුගිය ජනාධිපතිවරණයේදීත් මහ මැතිවරණයේදීත් රජය දුන් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ඇති කිරීම පිළිබඳ වූ පොරොන්දුව කල් නොයවා ඉටු කළ යුතු බවටත් කල් ගියහොත් එය ඉටු නොවන බවටත් වූ සඳහන නැවතත් සිහි ගැන්වීමට සිදුවී තිබේ. ඒ අප කී පරිදිම ජනාධිපතිවරණය ගත වී අවුරුදු දෙකහමාරකට ආසන්න වෙමින් පවතින මේ මොහොතේ එය ඉටු නොවන තැනට විවිධ කරුණු සැලසුම් වෙමින් පවතින බව පෙනෙන්නට තිබෙන හෙයිනි.

බලයට පත්වූ වහාමත් ඉන් ටික කලක් ගතවන තුරුත් ජනාධිපතිතුමාත් රනිල් වික්‍රමසිංහ අගමැති තුමාත් රජයේ වගකිව යුතු මැති ඇමතිවරුත් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගෙන ඒමේ පොරොන්දුව කඩිනමින් ඉටුකරන බවට නිතිපතා ප්‍රකාශ කරමින් සිටි අතර කල් යත්ම ඒ හඬ තරමක් බාල වී ගියේය. ඉන්පසු එය ප්‍රශ්නයක් මතු වූ විට පමණක් සිහියට නැගෙන ප්‍රකාශයක් බවට පත් වූයේය. මුලදීම ඒ සඳහා පත් කෙරුණු ජයම්පති වික්‍රමසිංහ ව්‍යවස්ථා සංශෝධන කමිටු වාර්තාවද නිකුත් වූ නමුත් එයද පුවත්පත් හා රූපවාහිනී වාර්තාවලට සීමා වූවා මිස ඉන් ඔබ්බේ කතාබහකට ලක් නොවූයේය.

මුලදී නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ඇති කිරීම පිළිබඳව පාර්ලිමේන්තුවේද කිසිවෙකුගේ විරෝධයක් පළ නොවූ අතර එහි අඩංගු කරුණු පිළිබඳව ඉඳ හිට බොල් හඬවල් මතුවූවා පමණි. එහෙත් දැන් දැන් ඇතැමුන් විවිධ ආකාරයේ මත පළ කරමින් ව්‍යවස්ථාව යටපත් වන ආකාරයෙන් කටයුතු කරන්නට හෝ සැහැල්ලු සංශෝධනයක් පමණක් බවට පත් කරන්නට පටන්ගෙන තිබීම කණගාටුවට කරුණකි.

එහි අලුත්ම පියවර මතුවී ඇත්තේ වර්තමාන ආණ්ඩුවේම සිටින මැති ඇමතිවරුන්ගෙනි. විශේෂයෙන්ම මහින්ද රාජපක්ෂ පාලනය තුළ ගෙන ආ ජනාධිපතිගේ වාර ගණන දික් කරගැනීම පිළිබඳ 18 වැනි සංශෝධනයට අත ඔසවා 'තමන්ට කුමන ව්‍යවස්ථාවක් තිබුණත් එකයි. ඇමතිකම් පමණක් තිබුණොත් ඒ ඇති' යන මතයෙහි සිට පවතින ව්‍යවස්ථාව වඩාත් කැත කළ ඇමතිවරුන්ගෙනි. ජනමත විචාරණයක් මගින් ඇතිකරන නව ව්‍යවස්ථාවකට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විරුද්ධ යැයි එස්.බී. දිසානායක, ඩිලාන් පෙරේරා, සුසිල් ප්‍රේමජයන්ත, ජෝන් සෙනෙවිරත්න ආදි ඇමතිවරු දැනටමත් ප්‍රකාශ කොට තිබේ. එයට හේතු සාධක වශයෙන් ඔවුන් දක්වන්නේ ජනතාව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට එවැන්නක් සඳහා බලයක් දී නැත යන්නයි. මේ 'වහෙන් ඔරෝ භාෂාවෙන් කියන්නේ මෛත්‍රිපාල සිරිසේන ජනාධිපතිතුමාටත් වර්තමාන ආණ්ඩුවටත් මේවා කරන්නට බලයක් නැත' යන්න නොවේද? මෙය ඉතා පටු තර්කයක් බව ඔවුන්ට නොපෙනීම අවාසනාවකි.

ජනාධිපතිවරණයේදීත් මහ මැතිවරණයේදීත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් තරග කළ මහින්ද රාජපක්ෂ මහතා ඇතුළු මේ ඇමතිවරුන්ට එවැනි බලයක් නොදුන් බව සැබෑය. ඔවුන්ට ජනතාව බලය ලබා නොදුන්නේද එවැන්නක් ප්‍රකාශ නොකළ බැවිනි. ඒකාධිපති වියරුවට අනුබල දෙන විධායක ජනාධිපති ධූරය, දූෂිත මැතිවරණ ක්‍රමය ඇතුළු රටට අහිතකර කරුණුවලින් පිරී රටේ ජනයා බෙදා නොමනා සටන්වලට පොළඹවන පවත්නා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මුළුමනින්ම වෙනස් කොට නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් රටට හඳුන්වා දෙන බවට වර්තමාන ජනාධිපතිවරයාත් රජයත් පුන පුනා ජනතාවට දුන් පොරොන්දුව පිළිගත් ජනයා හැට දෙලක්ෂයක් වන වැඩි ඡන්ද ප්‍රතිශතයකින් එය අනුමත කර ඇති බව පිළිගන්නට තරම් ඉවසීමක් හෝ කල්පනාවක් ඔවුන්ට නොතිබීම පුදුමයකි. අදත් වර්තමාන රජය තුළ ඇමතිවරු ලෙස සිටිතත් ඔවුන් තවමත් පැරණි හැඟීමෙහි හා දැනීමෙහිම සිටීම එයට හේතුවයි.

ජනාධිපතිවරණයේදී මෛත්‍රීපාල සිරිසේන මහතා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකයා නොවූ බව නැවත නැවතත් මතක් කර දීම අවශ්‍ය නැත. එහෙත් ජනාධිපති වීමත් සමග ඔහුට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකත්වය භාර දී හිටපු නායකයා ඉවත් වූවේ ඔහු ඊට සුදුස්සා බව පිළිගනිමිනි. එසේනම් කළ යුත්තේ ඔහු වටා සිටින වර්තමාන පිරිස් ඔහු නායකයා ලෙස පිළිගෙන ඔහු කරන්නට යන හරි දේට (වැරදි දේට නොවේ) අනුබල දීම නොවේද? මේ ඇමතිවරුන් ව්‍යවස්ථාව පිළිබඳ කරුණේදීත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයක් ගැන කතා කිරීම තවමත් තම නායකයාත් ආණ්ඩුවේ නායකයාත් මහින්ද රාජපක්ෂය යන සිහිනෙන් නැගිට කරන ප්‍රකාශයක් නොවන්නේද?

ජනාධිපතිවරණයට පෙර වර්තමාන ජනාධිපතිවරයා කොළඹ විහාරමහාදේවි උද්‍යානයේදී මාදුළුවාවේ සෝභිත හිමියන් ප්‍රධාන පිරිස් සමග අත්සන් කළ ගිවිසුමෙහි මූලික කරුණ වූයේද නව ව්‍යවස්ථාවක් පිළියෙල කිරීම බැවින් ඔහුට එය ඉටුකිරීමට පෙර කී ඇමතිවරුන් උදවු කිරීම යුක්ති සහගත නොවන්නේද? එසේම පොරොන්දු දී ආණ්ඩුවක් දිනාගෙන බලයට පත් වී පරාජය වූ තමන්ට එරෙහිවද කටයුතු කළ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සිටි මැති ඇමතින්ට තනතුරු දුන් පමණින් ජනතාවට දුන් ඉහත කී පොරොන්දු කඩ කරන්නැයි ඉල්ලීමට ඔවුන්ට ඇති අයිතිය කුමක්ද? එසේම එය පිළිගන්නට ජනාධිපතිවරයාට ඇති අයිතිය කුමක්ද?

මේ සමගම තවත් දෙයක් කිව යුතුව තිබේ. වර්තමාන ජනාධිපතිවරයාටත් රජයටත් ජනමත විචාරණයකින් හෝ ඉන් තොරව නව ව්‍යවස්ථාවක් සම්මත කරන බවට අමුතුවෙන් ජනාධිපතිවරණයේදී හෝ මැතිවරණයේදී කිය කියා යෑමේ අවශ්‍යතාවක් තිබේද? 'අප විසින් බිහිකරනු ලබන රජයකින් තිබෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනුවට නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් බිහිකරන්නෙමු' යි ජනතාවට ප්‍රකාශ කිරීම ප්‍රමාණවත් නොවන්නේද? ව්‍යවස්ථාවක් සැකසීමේදී පදනම් කොට ගන්නේ තිබෙන ව්‍යවස්ථාවේ ඒ සඳහා වන ප්‍රතිපාදන මිස ජනාධිපතිවරණයේදී හෝ මැතිවරණයකදී පක්ෂවල මැතිවරණ ප්‍රකාශනවල කියා ඇති දේ හෝ ඡන්ද රැස්වීම්වල කිය කියා යන දේ නොවන බව අවධාරණය කළ යුතුය. ඒවායේ 'අපි නව ව්‍යවස්ථාවක් පිහිටුවන්නෙමු' යි දෙන ප්‍රතිඥාව පවත්නා ආණ්ඩුක්‍රම

20 වන පිටුව බලන්න

# කාන්තාව කෙරෙහි සමාජයේ ආකල්පය කුමක් විය යුතුද?

■ රාජා කටුගම්පොළ

කාන්තාව කෙරෙහි ඔබගේ ආකල්පය කුමක්ද? කාන්තාව කෙරෙහි සමාජයේ ආකල්පය කුමක් විය යුතුද? දෙවියන් යනු කුමක්ද සහ දෙවියන් යනුවෙන් සැබෑ ලෙසම අර්ථය වශයෙන් එළඹෙනුයේ, අත්කර ගන්නේ කුමක්ද?

ප්‍රථමයෙන්ම දෙවියන් පිළිබඳ සිතේ කැමැත්තක් හෝ හැඟීමක් ඇතිකර ගැනීමට අපට ඉඩ දෙන්න. දෙවියන් කියා කෙනෙක් නැහැ. එම නිසා ඔහු පිළිබඳ ප්‍රශ්නයක් පැන නගින්නේ නැත. කිසිවෙකු ඔහු පිළිබඳව පිළිගැනුමට එළඹෙන්නේ නම් හෙතෙම ඔල්මාදකාරයෙක් බවට සරලව ඔප්පු කෙරේ. කාන්තාව යනු දෙවියන්ට වඩා ඉතාමත් වැදගත්කමකින් යුත් කාරණයකි. කාන්තාව සෑම මගකින්ම පිරිමියාට සමානය. බොහෝ මාර්ග යන්ගෙන් ඇය ටිකක් උත්තරීතරය. දිළිඳු කතුන්ට ප්‍රශ්නයක්ව ඇත්තේද එයමය. එනම් ඇයගේ උත්තරීතර භාවයයි.

උදාහරණයක් වශයෙන්, පුරුෂයා විඳිනුයේ අඩුවෙනි. දරුවෙකුට උපත ලබාදීමට ඔහු සමත් වන්නේ නැත. නමුත් කාන්තාවට එය කළ හැක. එහිලා පුරුෂයාගේ භූමිකාව සුළු කොට ගණන් ගැනේ. වස්තියකින් කළ හැකි වැනි හැඟීමක් තරම් වේ. කොහොම නමුත් පුරුෂයා උත්පාදනයට අත්‍යවශ්‍ය නොවන සහ එම හැඟීම හේතු කොට කාන්තාවට ජීවිතයක් නිර්මාණය කළ හැකිය යන හැඟීම පුරුෂයා තුළ අභ්‍යන්තරිකව නිර්මාණය කිරීමටත් දායක වී තිබේ. එම උත්සාහය බැඳෙනුයේ පහත්භාවය අඩු කරමින් ස්වයං උත්තරීතරත්වය තහවුරු කිරීමට හෝ සනාථ කිරීමටය. සියලු පුළුවන් මාර්ගවලින් කාන්තාවන් පහත් හෝ බාල ලෙසින් සැලකීමට බලපෑම් කිරීමත්, පහත දැමීමට දායක වීමත් සිදු කෙරේ. අධ්‍යාපනයක් නැති, ආගමික අධ්‍යාපනයක් නැති, සමාජය තුළ පහසුවෙන් එහා මෙහා යා නොහැකි, සියලු මාර්ග යන්ගෙන් වැළකුණු, කපා දැමුණු, කුඩු කළ අයෙක් බවට පත්වීම එමගින් පෙන්වා දේ. එමගින් පිරිමියා තුළ බිය සැක දුරු කරයි.

නමුත් ඔබ බියෙන් මිදී හැසිරෙන්නේ නම් සහ එමගින් කාන්තාවගේ නිදහස විනාශ කරයි නම් එයට ඇයද ප්‍රතිචාර දක්වයි, සහ ස්වභාවයෙන් ඇය බැල්ලියක් බවට පත් වේ. සියලුම කාන්තාවන් බැල්ලියන් බවට පත් කිරීමට අප (පිරිමි) දායක වේ. ඔවුන් සියලු දෙනාම නිතර සෙල්ලම් කරනුයේ එය ඔබව වධ හිංසාවට ලක් කිරීමේ මාර්ගය හෙයිනිග ඔබ ඔවුන්ගේ නිදහස උදුරා ගෙන තිබේග එයට පළිගැනීමක් වශයෙන්, ඔවුන් ඔබව වැඩකට නැති, හැකි තරම් බලාපොරොත්තු රහිත වූ හෝ අපේක්ෂා භංගත්වයට පත් වූ කෙනෙකු බවට පත් කරයි. ඉතින් සමස්ත මනුෂ්‍ය ප්‍රජාවම ජීවත් වනුයේ හිතේ හෝ කයේ බලවත් වේදනාව සංතාපය තුරුළු කොටගෙනය.

පළමු කාරණය වනුයේ කාන්තාව පරිපූර්ණ ලෙසින් විමුක්තිය, නිදහස ලැබිය යුතුය. මිනිසාට ලබාදෙන සියලුම අවස්ථාවන් ඇයට ලබාදිය යුතුය. එමෙන්ම ඇයට පුංචි උත්තරීතරභාවයන් තිබෙන බවත් පිළිගත යුතුය.

උදාහරණයක් වශයෙන් පිරිමි දරුවන් 110ක් උපත ලැබුව හොත්, එවිට ගැහැනු දරුවන් 100ක් උපත ලබති. ඒ මක්නිසාද යත්, විවාහයට පෙර පිරිමි දරුවන් දසදෙනෙක් මරණයට පත් වෙති. නමුත්, එම ගැහැනු දැරිවියන් සිය දෙනා සුරැකිව ජීවත් වෙති. වසංගත රෝගවලට පිරිමි දරුවන්ගේ ප්‍රතිචාර දැක්වීමේ ශක්තිය ගැහැනු දැරිවියන් තරම් නොමැත. එමනිසා තුලනාත්මකව පැවැතීම උදෙසා ස්වභාවය විසින් ගැහැනු ළමයින්ට වඩා පිරිමි ළමයින් පිරිසක් නිපදවයි. ඒ මක්නිසාද යත්, විවාහ කාලය වන විට දෙපාර්ශවයම සමාන තත්ත්වයට පත්වන හෙයිනි.

දැන්, එය භාර ගැනීම මගින් හානියක් සිදු නොවීම එක් කාරණයකි. පහත් හෝ බාල හෝ අප්‍රධාන වැනි හැඟීමක් ඇතිවීමට කිසිදු ප්‍රශ්නයක් නැත. කාන්තාව පිරිමියාට වඩා වැඩි කාලයක් ජීවත් වේ. එය වසර 05 ක දිගු කාලයකි. පිරිමියා වයස අවුරුදු 75 දී මිය යයි නම්, කාන්තාව මරණයට පත් වනුයේ වයස අවුරුදු 80 දීය. දැන් එය ඉතාමත් සරල කාරණයකි. ඒ සම්බන්ධයෙන් ඔබට කිසිවක් කළ නොහැකිය. එමෙන්ම ඒ සම්බන්ධයෙන් බාල හෝ පහත් හඟීමක් ඇති කර ගැනීමට අවශ්‍ය නැත.

කාන්තාව ඔල්මාද තත්ත්වයට පත්වීමේ හැකියාව පිරිමියාට වඩා බෙහෙවින් අඩුය. කාන්තාවට වඩා දෙගුණයකින් පිරිමියා ඔල්මාද තත්ත්වයට පත් වේ. අපට දේවල් භාර ගැනීමට සිදුවනුයේ ඔවුන්ට අනුවය. හේතුව කුමක් වුවද හැඩය හෝ රූපය ඉවත යයි. යටපත් කිරීම හෝ මර්දනය කිරීම හැර ඔවුන් සම්බන්ධයෙන් කළ හැක්කේ කුමක්ද? උදාහරණයක් වශයෙන් කාන්තාවන්ට දීර්ඝ ජීවිතයකට ලබාදෙන සුළු හෝර්මෝන එහි තිබිය හැකිය. එම හෝර්මෝනයන් පිරිමින්ටත් ලබාදිය හැකිය. එහි තවත් හෝර්මෝන සුළු ප්‍රමාණයක් තිබිය හැකිය. ඒවායින් කාන්තාවන්ට රෝග ාබාධයන්ට එරෙහිව සටන් කිරීමට හැකිය. ඒවාත් පිරිමින්ට ලබාදිය හැකිය. තවත් හෝර්මෝන සුළු ප්‍රමාණයක් කාන්තාවන් ඔල්මාද තත්ත්වයට පත්වීම අඩු කිරීමට දායක වේ. ඔවුන් කථා කරනුයේ වඩාත් ඔල්මාද තත්ත්වයට පත්වීම හෝ යෑම පිළිබඳවයි. නමුත් ඔවුන් යන්නේ නැත. ඔවුන් සියදිවි නසාගැනීම ගැන වඩාත් කථා කරති. නමුත් ඔවුන් සියදිවි නසා ගන්නේ නැත. ඉතින්, එම හෝර්මෝන පිරිමින්ටත් ලබාදිය හැකිය. කාරණාව බාල හෝ පහත් වැනි හඟීමක් ඇතිකර ගැනීමට හේතුවක් නැතිකමය. එය එසේ වන්නේ පිරිමියා සහ ගැහැනු වෙනස්වීමයග වෙනස්කම් එසේනම්, ආධාර හෝ උපකාර කරගත හැකිය. එවිට එය එකිනෙකාට ආධාර කර ගැනීමට යහපත් දායකත්වයක් ලබාදේ.

මිනිසා සතු ගුණාංග එහි ඇතග ඔහු සතු ශක්තිමත් සිරුර, කාන්තාවන්ට වඩා වන සතුන්ගේ ශක්තිය බඳුය. වඩා පුළුල් අවකාශයකින් යුත් ඔහු කාන්තාවන්ට වඩා සිතීමේ හැකියාවෙන්ද යුක්තය. කාන්තාව අසල්වාසීත්වය පිළිබඳ වඩාත් ඇලුම් කරයිග කාගෙ බිරිඳ කා සමග අඟර කරනවාද, ඇය ඇයටත් වඩා ඇලුම් කරනුයේ දුර ඈත අවකාශයේ ඇති තරු කෙරෙහිය. ඒවාට සිදුවනුයේ කුමක්ද? ඒවාට මොනවා වුනත් කවුරු ගණන් ගනීද? ඒවාට එසේ සිදුවීමට ඉඩදෙන්න. කාගේ හෝ බිරිඳ පළා යයිද?. ඇයගේ සිතීමේ ඉඩකඩ වඩාත් සමීප වේග පිරිමියාගේ අවකාශය වඩාත් පුළුල්යග ඔවුන් දෙදෙනාටම එකිනෙකාට එකතු කළ හැකියග ඒ මක්නිසාද යත් ඔවුන් දෙදෙනාම අවශ්‍ය හෙයිනි.

එය සිදුවූයේ ලොව සුපතළ විද්‍යාඥයෙකු වූ ආර්කිමිඩීස්ටය. ඔහු තාරකා විද්‍යාඥයෙකුද විය. එක් රාත්‍රියකදී, පැහැදිලි රැයක තරු දෙස නෙත් යොමා ගෙන මාර්ගයේ ගමන් කරමින් සිටියදී ළිඳකට ඇද වැටුණි. එය හුදකලා මාර්ගයකි. එක් පැලක් පමණක් එහි විය. එහි සිටි එක් මහලු කාන්තාවක් ඔහුව බේරා ගත්තාය. අනතුරු එම කාන්තාව ඇමතූ ආර්කිමිඩිස්, "ඔබ දන්නෙ නැහැ මම කවුද කියලා. මම තමයි මහා තාරකා විද්‍යාඥ මහා විද්‍යාඥයා. යුරෝපය පුරා සිටින රජවරුන් පවා ඉගෙනීමටත්, මගෙන් දේවල් පිළිබඳව අවබෝධය ලබා ගැනීමටත් එනවා. ඔබ මගේ ජීවිතය බේරුවා. ඔබට පුළුවනි හෙට එන්ට, සහ මට පුළුවනි ඔබේ වේලාපත්කඩය (Life Chart) බලා ඔබේ අනාගතය කෙසේදැයි බලා කියන්න"

මහලු කාන්තාව සිනාසුනි. "අමතක කරන්න ඒවා

20 වන පිටුව බලන්න



# ගුරාගේ කොළම

...මට හිතෙන හැටිය

මිනිසුන් විවිධාකාරය. ඇසුරු කිරීමේදී ඒ ඒ පුද්ගලයන්ගේ ස්වභාවය අනුව හැඩගැසීම අත්‍යවශ්‍ය වේ. සමහරු කුනකටුවන් වාගේය. කොයි වෙලාවේදී දෂ්ට කරයිද නොදනී. සමහරු නයිපොළඟුන් වැනිය. කෝපය වෛරය සිතේ තබාගෙන සිට අවස්ථාව ලැබුණු වහාම පළි ගනියි. මේ අතර තවත් සමහරු ප්‍රචලිත වීමට, සමාජ තත්ත්වය ගොඩනගා ගැනීමට, නොයෙකුත් කුහකකම් කරයි. සමහර මිනිසුන් තුළ ඉහත කී සියලුම තත්ත්වයන් දැකිය හැක. තමන්ගේ පෞද්ගලික එදිරිවාදිකම්, තරහ මරහ එසේත් නොමැතිනම් තමන්ගේ අසම්මත අදහස් ආදි විවිධ පෞද්ගලික දේ පොදු අදහස් හෝ පොදු විරෝධතා බවට පත්කිරීමට යත්න දරන එසේ කර සැතුටු වන කුහකයන් අද වනවිට සමාජයේ නොයෙකුත් අවස්ථාවලදී දක්නට ඇත. මොවුන් තමන්ගේ පෞද්ගලික අමනාපකම් හෝ විරෝධතා පෞද්ගලික මට්ටමෙන් විසඳා ගැනීමට උත්සාහ නොකරයි. සමහරවිට ඒ සඳහා කොන්දක්ද නැත. ඔවුන් කරනුයේ තමන්ගේ පෞද්ගලික අමනාපය සඟවාගෙන යම් දෙයකට හෝ කෙනෙකුට ඇති අමනාපය පොදු විරෝධතාවක් බවට පත්කිරීමය. "අර යකා මෙහෙමයි..., අරව කරනව මේව කරනව, අතන කරන්නේ හොර වැඩ" ආදි ලෙස කියමින් පුද්ගලයන් හෝ ආයතන පිලිබඳව මුළු සමාජයම කලකිරවයි. තරහ කරවයි. ඇත්තෙන්ම තිබෙන්නේ පෞද්ගලික තරහකි.

මෙසේ කිරීම සඳහා අවශ්‍ය සමාජ බලය ඔවුන් බොහෝවිට ලබාගනුයේ විවිධ සංවිධාන, ආයතන තුළ තම ප්‍රතිරූපය ගොඩනගා ගනිමිනි. මොවුන් යම් ආයතනයක සමාජ වැඩක, සුහඳ හමුවක හෝ පොදු සමාජය තුළ යම් බලයක් මුලින් ලබාග නී. එහෙත් මොවුන් ඉදිරියට පැන වැඩ කිරීමක් නැත. වැඩේ දෙන්නේ යටින්ය. හැංගිලාය. තමන් තරහ පුද්ගලයන්ට ඉදිරියට පැමිණීමට ඉඩ නොදෙයි. වැඩක් කිරීමට ඉඩ නොදෙයි. අමනාප පුද්ගලයන් හෙමින්ම කපාදමයි. තමන් අමනාප කෙනා සමග මුළු සමාජයම තරහ කිරීමට අවශ්‍ය ක්‍රියාවන් ඇඟට නොදැනී සිදුකරයි. තමන් යම් දෙයකට ඇකැමති නම් බලන්නේ තමන් ඇසුරු කරන සියුලුදෙනාම ඒ වැඩයට අකැමති කරගැනිමටය. මූනිච්චාවට පන දෙන්න කතා කරයි. දිය යටින් ගින්දර ගෙන යයි.

මොවුන්ට මෙලෙස කිරීමට හැකිවී ඇත්තේ අප තුළ ඇති හිත හොඳ කම හා ඉවසීම නිසාය. සමහර අවස්ථාවලදී මොවුන් කරන්නේ තමන්ගේ පෞද්ගලික අදහස් ඉස්මතු කිරීම බව දැන දැනත් පවතින ආයතනයේ වැඩසටහනේ සුහඳ හමුවේ වැඩකටයුතු කඩාකප්පල් වේ යැයි ඇති බය නිසා මොවුන්ගේ වැරදි වැඩවලට අනුමැතිය දෙයි. විරුද්ධ නොවෙයි. මොවුන්ගේ ඇති දක්ෂතාවය නම් යම්තැනකදී කෙසේ හෝ යම් බලයක් ගොඩනගා ගැනීමට ඇති හැකියාවයි. එහෙත් ඔවුන් එම දක්ෂතාවය යොදාගන්නේ ලබාගත් බලය තුළින් අනුන්ට වින කැටීමටයි. මොවුන් කැපී පෙනෙන්න දක්ෂයෝය. 'මම අහවලා අඳුනනවා. අහවල් තැන වැඩකරන්නේ. මට බැරි දෙයක් නෑ' කියමින් නියමෙට රඟපායි. ඕනෑම වැඩකදී 'කොට අදින අලින් ලෙස නොව පෙරහැරේ යන අලින්' ලෙස ක්‍රියා කරයි. වැඩකදී කරන කෙහෙල්මලක් නැත. එහෙත් තමන් තරම් වැඩකාරයන් නැතයි පෙන්වයි. රඟ දක්වයි. තමන්ගේ විරුද්ධවාදීන්ගෙන් පළිගැනීමට ඕනෑම ජඩ වැඩක්, කුඩුකේඩුකමක්, නොපනත්කමක් සිදුකරයි. හැබැයි ඒ සියල්ල රහසිගතවය. නමුත් ඔවුන් එසේ කරන බව නියම ගඳයන් බව සමාජයම දනියි. ඔවුන්ගේ වැඩවල නිරුවත සමාජයම දකියි. හැමදාමත් ලියන පරිදි විවිධ වූ විෂම වූ මෙවැන්නන් අපට සැමදා හමුවෙයි. අප කළයුත්තේ ඔවුන්ගේ වැරදිවලට උදව් නොදී අප හිතනා පරිදි හොඳ දේ කිරීමයි. තමන්ගේ පෞද්ගලික තරහවල් මුළු සමාජයටම අහිතකර වන සේ ඉස්මතු නොකිරීමයි.

මේ මට හිතෙන හැටිය.
මේ වගට
**ගුරා**

පාඨක ප්‍රතිචාර එවීමට : gura.kolama@gmail.com

# ජීවීන්ට හිතකර ග්‍රහලෝක 7 ක් !



පෘථිවියේ සිට ආලෝක වර්ෂ 39 ක් ඈතින් පෘථිවියට සමාන ප්‍රමාණයේ ග්‍රහලෝක හතක් සොයාගත් බවට නාසා තාරකා විද්‍යාඥයින් පසුගියදා නිවේදනය කොට තිබුණි. මෙම ග්‍රහලෝක 7 ම එකම තරුවක් වටා භ්‍රමණය වන බවත් ජීවයට හිතකර ජලය, වාතය වැනි සාධක එම ග්‍රහලෝක තුළ පැවතිය හැකි බවත් ඇමරිකාවේ ජාතික ගගනගාමී හා අභ්‍යවකාශ පරිපාලන ආයතනය (NASA) පවසා සිටී.

ආකාශ විද්‍යාඥයින් විසින් කරන ලද නිරීක්ෂණයන්හි ප්‍රතිඵල ලෙස මින් පෙරද විවිධ ග්‍රහලෝක සොයාගෙන ඇතත් එකම තරුවක් වටා කක්ෂගතව කැරකෙන ග්‍රහලෝක 7 ක්ම එකවර සොයාගත් ප්‍රථම අවස්ථාව මෙය වීම විශේෂත්වයකි. ග්‍රහලෝක 7 ට මග පෙන්වන මේ එකම තාරකාව TRAPPIST 1 ලෙස හඳුන්වා දී ඇත. මෙම තාරකාව අපගේ සූර්යයාට වඩා දස ගුණයකින් පමණ කුඩා වන අතර එයින් හතරෙන් එකක් පමණ වූ උෂ්ණත්වයකින් යුක්ත බව පැවසේ. කෙසේ වුවත් ට්‍රැපිස්ට් 1 අපේ සූර්යයාට සම කළ නොහැකි බවත් එය කුඩා අඳුරු රතු වාමන තරුවක් (Dwarf Star) බවත් පැවසේ. පෘථිවියට සමාන වූ ග්‍රහලෝක පද්ධතිය පිළිබඳ මෙම අනාවරණය නාසා ආයතනය විසින් පසුගිය වසරේ මැයි මාසයේදී සිදුකොට තිබුණු අතර එහිදී ඔවුන් පවසා තිබුණේ එකම තරුවක් වටා කැරකෙන පෘථිවියේ විශාලත්වයට සමාන ග්‍රහලෝක 3 ක් සොයා ගැනීමට ලැබුණු බවයි. ඉන් අනතුරුව ප්‍රබල දුරේක්ෂ හා නවීන තාක්ෂණ ක්‍රම යොදාගනිමින් ඒ පිළිබඳව වැඩිදුරටත් කළ පර්යේෂණවල ප්‍රතිඵලයක් ලෙස එම තාරකාව වටා ග්‍රහලෝක 7 ක්ම භ්‍රමණය වන බව තහවුරු කර ගැනීමට ලැබී ඇත. මෙම නිරීක්ෂණ කටයුතු සඳහා චිලි රාජ්‍යයෙහි පිහිටි VLT දුරේක්ෂයත්, නාසාහි Spitzer දුරේක්ෂයත්, Transiting Planets and Planetesimals කුඩා දුරේක්ෂයත් යොදාගෙන ඇත.

මෙම ග්‍රහලෝක පිළිබඳව වැඩිදුර අධ්‍යයනය කරන බෙල්ජියම් ලීජ් සරසවියේ (University of Liege) තාරකා විද්‍යාඥ මයිකල් ගිලන් පවසා ඇත්තේ, ට්‍රැපිස්ට් 1 වටා ඇති ග්‍රහලෝක අතරින් තුනක හෝ මතුපිට සාගර කලාප පැවතිය හැකි බවයි. එහිදී එම ග්‍රහලෝක පිහිටා ඇති ස්ථාන පිළිබඳව විශේෂ අවධානයක් යොමුකොට ඇත. ට්‍රැපිස්ට් 1 තරුවට කිට්ටුවම පිහිටා ඇති ග්‍රහලෝක 3 තුළ අධික උෂ්ණත්වයක් පැවතිය හැකි නිසා ජලය නොරැඳීමෙන් ජීවීන්ගේ පැවැත්මක් සිතිය නොහැකි බවත් ඈතින්ම පිහිටි 7 වෙනි ග්‍රහ ලෝකය අධික සීතලෙන් යුක්ත නිසා එහිද ජීවීන් ඇතැයි සිතිය නොහැකි බවත් ඔවුහු පවසති. එහෙත් 4, 5, 6 යන ග්‍රහලෝක ත්‍රිත්වයෙහි ජීවීන්ගේ පැවැත්මට හිතකර නියමිත වායුගෝල හා පරිසර පද්ධතියක් තිබිය හැකි බව අනුමාන කෙරේ. එසේ වන්නේ නම් පෘථිවියේ මෙන්ම සාගර, විල් හා ගංගා ආදිය මෙම ග්‍රහලෝක තුළ තිබිය හැකි බව විද්‍යාඥයින්ගේ අදහසයි.

ට්‍රැපිස්ට් 1 වටා පවතින ග්‍රහලෝක 7 හි විශාලත්වය පිළිබඳවද විවිධ අදහස් පළ කෙරෙන අතර එම ග්‍රහලෝකවලින් 5 ක්ම විශාලත්වය අතින් පෘථිවියට බොහෝදුරට සමාන වන බවත් අනෙක් ග්‍රහලෝක දෙක තරමක් කුඩා බවත් පැවසේ. එමෙන්ම තරුවට ආසන්නයේ පිහිටි ග්‍රහලෝක 7 ම පාෂාණවලින් සෑදී ඇති බවත් තරුවට ඈතින් ඇති අනික් ග්‍රහලෝකය අයිස්වලින් සෑදී ඇති බවත් විද්‍යාඥයින්ගේ අදහසයි.

# නීති කඩන සංක්‍රමණිකයන් පිටුවහල් කෙරේ

ට්‍රම්ප් ජනාධිපති ධුරයට පත් වීමත් සමග ඇමරිකාවෙහි රැඳී සිටින නීති විරෝධී සංක්‍රමණිකයන්ට අසුභ කාලයක් උදා වී ඇති බව ඒ පිළිබඳව ලැබෙන වාර්තා පවසා සිටී.

ඉකුත් පෙබරවාරි මාසයේදී ට්‍රම්ප් පරිපාලනය විසින් නිකුත් කරනු ලැබූ සංක්‍රමණිකයන් සඳහා වූ උපදේශන මාලාවට අනුව නීති විරෝධීව රට තුළ රැඳී සිටින ඕනෑම පුද්ගලයකු පිටුවහල් කිරීමකට යටත් කළ හැකි වේ. ඒ අනුව මෙම නීති විරෝධී සංක්‍රමණිකයන් සුළු වරදකට හෝ හසු වුවහොත් (සුළු සොරකමක්, මාර්ග නීති කඩ කිරීමක් වැනි වරදක් සඳහා වුවත්) ඔවුන්ට කිසිදු සමාවක් හිමි නොවන අතර පිටුවහල් කිරීමේ බලය හිමිවේ.

අභ්‍යන්තර ආරක්ෂක දෙපාර්තමේන්තුවේ ලේකම් ජෝන් කෙලී විසින් මෙම උපදෙස් මාලාව ඇතුළත් ලියවිල්ලට අත්සන් තබා ඇත.

මේ වන විට එක්සත් ජනපදය පුරා නිසි ආගමන ලියකියවිලි නොමැතිව මිලියන සංඛ්‍යාත (මිලියන 11 ක් පමණ ඇතැයි පැවසේ.) වූ පිරිසක් වෙසෙන අතර ට්‍රම්ප් රජය විසින් මේ පිරිස ඉලක්ක කොට ගෙනම මෙම ලියවිලි සකසා ඇති බව ඒ පිළිබඳව අදහස් දක්වන්නෝ පවසති. මෙම අලුත් උපදෙස් මාලාව මගින් එක්සත් ජනපද ආගමන නීති රීති වෙනස් කිරීමකට භාජන කර නැතත් මෙමගින් එක්සත් ජනපදයේ ජාතික ආගමන බලාත්මක ප්‍රමුඛතා නැවත ලිවීමක් සිදුකර ඇති බව බොහෝ දෙනෙකුගේ අදහසයි.

2012 වසරේ ඔබාමා පාලන සමය තුළ අරඹනු ලැබූ Deferred Action for Childhood Arrivals (DACA) වැඩ සටහන මගින් ළමා වියේදීම සංක්‍රමණිකයන් ලෙස එක්සත් ජනපදයට පැමිණි 750,000 ක පමණ වූ පිරිස කෙරෙහි මෙම නව උපදෙස් මාලාව ක්‍රියාත්මක නොවන බව පැවසෙන අතර ඔවුන් වෙත රට තුළ රැඳී සිටීමට ඇති අයිතිය එලෙසින්ම වලංගුව පවතී. එහෙත් DACA මගින් ආ අයෙකු වුවද සාපරාධී ක්‍රියාවකට හෝ වෙනත් ආකාරයක නීති කඩකිරීමකට වරදකරු වුවහොත් හෝ රාජ්‍ය හෝ ජාතික ආරක්ෂාවට තර්ජනයක් වන කටයුත්තක නියැලුණහොත් ඒ අය වෙනුවෙන් පිටුවහල් කිරීමේ නියෝගය ක්‍රියාත්මක කිරීමට ට්‍රම්ප් රජය පසුබට නොවන බව පැවසේ.

ඇමරිකාව තුළට නීති විරෝධීව සංක්‍රමණය වන්නන් නිරීක්ෂණය කිරීම සඳහා ආගමන හා රේගු බලාත්මක ඒජන්සිය වෙත නියෝජිතයින් සහ නිලධාරීන් 10,000 කුත් රේගු හා දේශ සීමා ආරක්ෂණ ඒජන්සිය වෙත නියෝජිතයින් 5,000 කුත් බඳවා ගැනීමේ කටයුතු මේ දිනවල සිදුකෙරෙමින් පවතී.

## 1 වන පිටුවෙන්

### කැනඩා නගරාධිපති......

ඇති ටොරොන්ටෝව බව ටොරී නගරාධිපතිවරයා පවසයි. එහිදී ඒ පිරිස පිළිබඳ වැඩිදුර තොරතුරු දැනගැනීම තම කැමැත්ත බවත් ශ්‍රී ලංකාව වෙත යන සංචාරයේදී එම ප්‍රජාව මෙහි පැමිණ ඇත්තේ කොහි සිටද?, ඔවුන්ට ශ්‍රී ලංකාවෙන් පිට වීමට සිදුවූයේ ඇයි?, පශ්චාත් යුද සංවර්ධනය සිදුවන ආකාරය, පවතින ආර්ථික අවස්ථා ආදිය පිළිබඳව සොයා බැලීමත් ද්‍රවිඩ ජනතාවගේ සංස්කෘතික හා ප්‍රජා මධ්‍යස්ථාන නැරඹීමට යෑමටත් නගරාධිපතිවරයා බලාපොරොත්තු වේ.

### දේශ සීමා මුර....

වර්ධනය වී ඇති අතර පසුගිය මාස කීපය තුළ ඇමරිකාවේ සිට පවුල් පිටින් පයින්ම දේශ සීමාව තරණය කොට පැමිණ ඇති පිරිස සිය ගණනකි. ඉදිරියේදී පැමිණෙන උණුසුම් කාලගුණ තත්ත්වයත් සමග එහෙන් මෙහෙට සංක්‍රමණය වන්නන් සංඛ්‍යාව බොහෝ සෙයින් වැඩිවිය හැකි බව මේ පිළිබඳව තොරතුරු දැක්වෙන වාර්තා පෙන්වා දේ.

මෙසේ ඇමරිකාවේ සිට පැමිණෙන දේශපාලන රැකවරණය පතන්නන් සංඛ්‍යාව ඉහළ යෑමත් සමගම එයින් මතුවන ප්‍රායෝගික හා දේශපාලන පීඩනය පිළිබඳව ගැඹුරින් සාකච්ඡා කළ යුතු බව ෆෙඩරල් රජයේ බහුතරයකගේද අදහස වී ඇත. ඒ සඳහා විශේෂ කැබිනට් මණ්ඩල හමුවක්ද පැවැත්වීමට මේ දිනවල කටයුතු යොදමින් පවතින බව වාර්තා වේ.

කැනඩාව සහ එක්සත් ජනපදය අතර දේශසීමා 117 ක් පවතින අතර එයින් කිලෝමීටර් 9000 ක පමණ ප්‍රමාණයක් අනාරක්ෂිතව පවතී. පසුගිය වසර 2 ක තුළ පමණක් සරණාගතයින් දහස් සංඛ්‍යාත සංඛ්‍යාවක් දේශ සීමා පැන මෙරටට පැමිණ ඇත. Canada Border Services Agency වාර්තාවලට අනුව 2016 වසරේදී පමණක් 7000 කට අධික පිරිසක් පැමිණ ඇත. බහුතරයක් පිරිස මැනිටෝබා සහ ක්විබෙක් දේශ සීමාවන් හරහා පැමිණෙන අතර එසේ පැමිණි ඇති සංඛ්‍යාව 3000 ඉක්මවා ඇත.

මේ පිළිබඳව අදහස් දක්වන කැනඩා රේගු සහ ආගමන සංගමය පවසන්නේ, දේශ සීමාව හරහා නීතිවිරෝධීව කැනඩාවට ඇතුළු වන මෙම පුද්ගලයින් පිළිබඳව දැඩි ලෙස අධ්‍යයනය කළ යුතු බවත් ඒ පිළිබඳව ට්‍රෑඩෝ රජයේ අවධානය යොමු විය යුතු බවත්ය. කැනඩාව සරණාගතයින් පිළිගැනීම පිළිබඳව ගැටලුවක් නැති වුවත් මෙසේ පැමිණෙන පුද්ගලයින් සමග මත්ද්‍රව්‍ය, අවි ආයුද ආදි විවිධ බරපතල අවස්ථාවන්ද මතුවිය හැකි බව ඔවුන් පෙන්වා දේ. මේ පිළිබඳව අවධානය යොමු නොකළහොත් එය දැඩි අර්බුදයක් විය හැකි බවත් රටෙහි දේශසීමා ආරක්ෂා කිරීම අනිවාර්යයෙන්ම කළ යුත්තක් බවත් ඔවුන්ගේ අදහසයි.

# රෝහලේ නොසැලකිල්ලෙන් ඒඩ්ස් !

චීනයේ Hangzhou's Zhejiang Provincial රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටි රෝගීන් 5 දෙනෙකුට රෝහලේ නොසැලකිල්ල නිසා ඒඩ්ස් රෝගය ආසාදනය වී ඇති බව බී.බී.සී. ආසියානු පුවත් සේවය පසුගියදා වාර්තා කොට තිබුණි.

එහිදී එම රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටි එච්.අයි.වී ආසාදිතයකු සඳහා භාවිත කළ උපකරණ වෙනත් රෝගීන් පිරිසක් වෙතද යොදා ගැනීම නිසා එම පිරිසට මෙම වෛරසය ආසාදනය වී ඇතැයි පැවසේ.

වෙනත් රෝග සඳහා ප්‍රතිකාර ලබමින් සිටි මෙම රෝගීන් 5 දෙනාට ඒඩ්ස් වෛරසය ආසාදනය වූ බව පසුගිය ජනවාරි මස 26 වන දින දැනුම් දී ඇති බව පළාත්බද සෞඛ්‍ය නිලධාරීන් සඳහන් කොට සිටී. එහෙත් මෙම 5 දෙනාට අමතරව තවත් කොපමණ රෝගීන් සංඛ්‍යාවක් සඳහා එම උපකරණ භාවිත කර ඇත්ද යන්න පිළිබඳව කිසිදු තොරතුරක් හෙළිදරව් වී නොමැත.

මෙය දැඩි ආන්දෝලනාත්මක සිද්ධියක් වීමත් සමගම එම රෝහලේ වෙබ් අඩවියද අත්හිටුවා ඇති අතර සිදුවීම පිළිබඳව කිසිදු තොරතුරක් අනාවරණය කොට ගත නොහැකි තත්ත්වයක් උද්ගත වී ඇත.

චීනයෙහි ඒඩ්ස් රෝගය පැතිර යෑම වේගයෙන් සිදුවෙමින් පවතින අතර සෞඛ්‍ය අංශයන් මගින් සිදුකරන මෙවැනි නොසැලකිලිමත් ක්‍රියා නිසාද ජනතාව ඊට ගොදුරු වීම ඉතා කණගාටුදායක තත්ත්වයක් බවට පත්ව ඇත.

2001 වසරේදී චීනයෙන් වාර්තා වූ එච්.අයි.වී ආසාදිතයන් අතරින් 20,000 ත් 50,000 ත් අතර පිරිසකට එම වෛරසය වැළඳී තිබුණේ රුධිර පාරවිලනය මගිනි. චීනයෙහි ලේ විකිණීම ජාවාරමක් ලෙස පවතින අතර කිසිදු සෙවිල්ලක් බැලිල්ලක් නොමැති සිදුකරන රුධිරය මිල දී ගැනීම් නිසා මෙම තත්ත්වය ඉතාමත් භයානක ලෙස වර්ධනය වී ඇත.

2006 වසරේදී පුද්ගලයන් 19 දෙනෙකු චීනයේ රෝහලකට විරුද්ධව නඩු පවරා තිබුණේ අපරීක්ෂාකාරී රුධිර පාරවිලනය මගින් තමන්ට ඒඩ්ස් වැළඳුනු බව පවසමිනි. එහෙත් මෙහි භයානකම තත්ත්වය වන්නේ එච්.අයි.වී ආසාදිත වූවන් එවැනි රෝගයක් තමන්ට වැළඳී ඇති බව හෝ නොදැනම මරු වැළඳ ගැනීමයි. එහිදී එම පිරිසගෙන් තවත් අය වෙත වෛරසය පැතිර යෑමෙන් මෙම රෝගය පාලනය කළ නොහැකි සෞඛ්‍ය ගැටලුවක් වී ඇති බව චීන සෞඛ්‍ය බලධාරීන් පවසයි.

2014 වසරේ වාර්තාවලට අනුව චීනය තුළ 501,000 ක පමණ වූ එච්.අයි.වී හා ඒඩ්ස් රෝගීන් ප්‍රමාණයක් වාර්තා වී ඇත. එහෙත් චීන ජනගහනය හා සැසඳීමේදී වාර්තා නොවූ රෝගීන් සංඛ්‍යාව පිළිබඳව කෙසේවත් සිතාගත නොහැකි බව සෞඛ්‍ය බලධාරීන් පවසා සිටී.


SRI LANKA'S NO.1
TRICO
TRICO MARITIME
(Sole Authorized Agent of
Trico Meritime (Pvt) Ltd. Sri Lanka)
The first Customs Bonded Warehouse for Personal
Effects and gift items clearance in Sri Lanka
Serving People Worldwide Reliably for 35 Years
SRI LANKA'S BEST AND
LARGEST CLEARING
FACILITIES IN THREE
MAJOR CITIES SINCE 1980
COLOMBO
GALLE
KURUNEGALLA
DOOR TO DOOR SERVICE
to any part of Sri Lanka
special service to
Colombo, Jaffna,
Kilinochchi, Batticaloa,
Trincomalee, Vavuniya
& Mannar
TRICO
SINCE 1975
TRICO MARITIME FREIGHT FORWARDING CANADA INC.
CONTACT : DERRICK ANTON
647.833.3020 | 416.335.8800
Our Canadian Agents
OTTAWA : 613 513 6106 (SAMAN) • MONTREAL: 514 884 8550 (VICKIE / NOEL)
CALGARY: 403 971 6721 (SAMAN) • ALBERTA : 587 708 5665 (TONY) • WINNIPEG: 204 800 2364 (MANGALIKA)
Trico Maritime Customer Services & Warehouses in Sri Lanka
HEAD OFFICE
Trico Maritime (Pvt) Ltd
50K Cyril Perera Mawatha
Colombo 13
Tel: 2345580 / 2345581
Fax: 2432000
COLOMBO WAREHOUSE
Trico Maritime (Pvt) Ltd
414/17 K. Cyril Perera Mawatha
Colombo 13
Tel: 2448270 / 2440114
Fax: 2432000
KURUNEGALA WAREHOUSE
Trico Maritime (Pvt) Ltd
Humbara Road Sandagala
Uhumeeya
Tel: 073 2238924 / 037 2238925
Fax: 037 2238967
GALLE WAREHOUSE
Trico Maritime
Pro Cargo Distribution (Pvt) Ltd
No. 331 Matara Rd, Kangoda, Galle
Tel: 091 2234842
Fax: 2234841
Trico Maritime Freight Forwarding Canada Inc.
151 Nashdene Rd, Unit #5, Scarborough On. M1V 4B9
Intersection: Markham Road/Nashdene Road
Tel: 413 335 8800
Fax: 416 335 8848
email: info@tricomaritime.ca
www.tricomaritime.ca



# තරහ යෑම සහ ඒම

## ඔබට නැතිනම් තරහ යනවද? එනවද?

■ ගෝණදෙණියේ සීවලී හිමි

තරහ යනවා නම් හොඳයි. නමුත් තරහ එන එක නරකයි. තරහව යන වචනය සමාජයේ නිරන්තරව අසන්නට ලැබෙන වචනයකි. කඩ පිලේ, බස් නැවතුම්පොළේ, ආයතනයේ, නිවසේ යනාදී සෑම ස්ථානයකම කිසිදු භේදයක් නැතිව එම වචනය අසන්නට ලැබෙනවා.

'තරහ' යන වචනය කැඩී බිඳී ඇවිත් තිබෙන්නේ 'ද්වේශය' යන වචනය ඇසුරෙනි. ද්වේශය යන වචනය කරණකොටගෙන 'ක්‍රෝධය, වෛරය, පළිගැනීම, බද්ධ වෛරය' යනාදී වචන රාශියක් දක්නට ලැබෙනවා. ඒ කුමන වචනය තිබුණත් 'තරහව' යන වචනය තමයි හැමදෙනාම භාවිත කරන්නේ.

තරහ එන්නේ කුමන අවස්ථාවලදීද? ඔබට තරහ ආපු අවස්ථා ගැන සිතුවොත් සමහරවිට පුදුම වෙන්නත් පිළිවන්. විශේෂයෙන් තමන් අකමැති දෙයක් සිදුවේ නම් එහිදී මේ තරහ ක්‍රියාත්මක වෙනවා. සමහර පුද්ගලයන් තමාට හමුවූ විට ඉබේටම තරහක් ඇතිවන අවස්ථාද තිබෙනවා. ඒ පුද්ගලයා මීට පෙර දැකලවත් නැතිවෙන්න පිළිවන්. නමුත් දුටු දිනයේ සිට අප්‍රියතාවක් හෝ අකමැති ස්වභාවයක් පෙන්නුම් කෙරෙනවා. එවැනි ආකාරයෙන් ඔවුනොවුන් අප්‍රියවන්නට අමනාප වන්නට හේතුව සාංසාරික වශයෙන් දෙදෙනා තුළ පැවතුණු යම් ගැටලුවක් නිසා විය හැකිය.

ඒ හේතු කාරණා නිසා කෙනෙකු දුටු පමණින් තරහ එන තත්ත්වයක් තිබෙනවා. එසේම සමහර ද්වේශ චරිත ඇති අය ඉන්නවා. ඔවුන්ට හොස්ස ළඟින් මැස්ස යන්න බැහැ. ද්වේශ චරිත පුද්ගලයා නිරන්තර සිටින්නේ තරහෙන්ය. කෙනෙක් ආවත්, ගියත් තරහයි. යමක් දුන්නත් තරහයි. නුදුන්නත් තරහයි. සිනාසුනත් තරහයි. සිනහ නොවුනත් තරහයි. කථා කළත් තරහයි. කථා නොකළත් තරහයි. මේ අනුව තරහව සිතේ නිරන්තර පැලපදියම් වෙලා තිබෙනවා. එසේම තරහ ගැනීමට කුමන හෝ කාරණයක් හේතුකර ගන්නට උත්සහ කරනවා.

ද්වේශ විෂ සහිත සර්පයෙක් වැනිය. කොයි මොහොතක හෝ එම විෂෙන් කෙනෙකු හානියට පැමිණිය හැකිසේම, තරහෙන් පිරුණු කෙනෙක් සමග කථාබහ කිරීම වුවද ඉතා අනතුරු දායකය. මන්ද? එම කථාව කෙනෙකු පහත හෙළන්නට හෝ කෙනෙකු නැති භංගස්ථාන කරන්නට හෝ හේතුවන නිසාය. එම කථාව අසාගෙන සිටීමෙන් පසුව පැමිණෙන ප්‍රශ්නවලදී වගඋත්තර සපයන්නට අසා සිටි හැමදෙනාටමත් සිදුවනු ඇත. එවැනි තරහ සිතක් ඇති කෙනෙකු සමග වැඩිවේලාවක් කථාකිරීමටද නොහැක. උපරිම විනාඩි 10 ක් හෝ 15 ක් සුහදව කථාකළ හැකිය. ඊට වඩා කතා කළහොත් සමහරවිට බැණගෙන ගහගෙන කෝලහල කරගෙන ජීවිත හානිකර ගන්නන් පිළිවන්.

මේ තරහව, ක්‍රෝධය ජීවිතයක් විනාශ කරන්නට තරම් දරුණු ක්ලේශයෙකි. 'කුද්ධෝ අත්ථං නජානාති, කුද්ධෝ ධම්මං න පස්සති' යනුවෙන් 'කිපුණු පුද්ගලයා අර්ථය හා යහපත නොදනී. කිපුණු පුද්ගලයාට ධර්මය වැටහෙන්නේද නැත' යයි සඳහන් වේ.

යම් කාරණයක් මුල්කරගෙන ක්‍රෝධය හටගත් විට ඒ පුද්ගලයාට සත්‍යය පැහැදිලි කළද එය වැටහෙන්නේද නැත. අණක් - ගුණක් නොමැතිව කටයුතු කරයි. කිපෙනසුළු තැනැත්තාගේ මුහුණ නිරන්තරයෙන් රෞද්‍රව පවතී. කිසිදු සිනහවක් නැත. ආදරයෙන් කථාකිරීමක්ද නැත. වචනයක් වැරදුණොත් දින ගණනාවක් ඉන් පළිගන්නටම මාන බලයි. නිරන්තර තරහෙන් සිටින පුද්ගලයාගේ මුහුණේ කිසිදු ප්‍රියමනාප බවක් නොමැත. ඒ නිසා ඔහු දුර්වර්ණ වේ. ශරීරයේ පැහැය අඳුරු පාටක් ගනී. කිසිදු සතුටක් නැත. මේ බව සමාජයේ සමහර අයගේ චරිතයෙන් මනාව පෙනේ. ඔවුන්ගේ මුහුණ නිරන්තර අප්‍රසන්නව පවතී. නිරන්තර දුකින් වාසය කිරීමට සිදුවේ. ක්‍රෝධයෙන් යුත් පුද්ගලයා සෑම අවස්ථාවකදීම කුමන හෝ කාරණයක් නිසා සිත නරක් කරගෙන සිටියි. එනිසා ඔහුට සතුටක් ඇත්තේම නැත. මේ පුද්ගලයාගේ තවත් ලක්ෂණයක් නම් කිසියම් යහපත් දෙයක්තමාට ලැබුණොත් එයද යහපත් නොවන අනර්ථයක් සේ සලකා ඉවත් කරයි. සමහර අයට හොඳ දේශනයක් අහන්නත් අමාරුයි. හොඳ වැඩක් කිරීමටද අපහසුයි. ඒ බව මේ ගාථාවෙන් දක්වා ඇත.

කෝධනෝ දුබ්බන්නෝ හෝති - අථෝ දුක්ඛම්පි සේතිසෝ

අථෝ අත්ථං ගහෙත්වාන- අනත්ථ අධිගච්ඡති

ක්‍රෝධයෙන් යුක්ත පුද්ගලයා නිරන්තරයෙන් කාට හෝ හිරිහැරයක් වනසේ ජීවත් වේ. කොතැනක සිටියත් ප්‍රශ්න ගැටලු ඇතිකර ගනියි. සුළු කාරණයකට වුවද ගහ-මරා ගන්නට සැරසෙයි. ඒ නිසා කයෙන් හා වචනයෙන්ද විවිධාකාර ප්‍රාණඝාථ කර ධන හානියටද පැමිණේ.

බුදුරජානන් වහන්සේ 'කායප්පකෝපං රක්ඛෙය්‍ය' යනුවෙන් දේශනා කළේ තමන්ගේ කයේ සංවර භාවය ඇතිකර ගතයුතු බවයි. එසේ නොවුනහොත් තමා ලැබූ මනුෂ්‍යත්වය සුළුමොහොතකින් වල පල්ලට දමාගැනීමට හැකිවන බවය. බන්ධනාගාරගතව සිටින බොහෝ දෙනෙක් ඒ දරුණු ක්‍රියාවන් කර ඇත්තේ ක්ෂණික කෝපය නිසාය. ඒ ක්ෂණික කෝපය දරාගත නොහැකිවූ නිසා මුළු සංසාරය පුරාම දුක් විඳින්නට අවස්ථාව උදාකරගෙන ඇත.

මේ තරහව කෙනෙකුට උපදින්නට හේතුකාරණා 09 ක් දක්වා ඇත. ඒවා 'නව ආඝාථ වස්තු' ලෙස දක්වා ඇත.

1. මොහුමට අනර්ථයක් කළේය, 2. දැන් අනර්ථයක් කරයි, 3. මතු අනර්ථයක් කරන්නේය, 4. මොහු මගේ මිතුරාට අනර්ථයක් කළේය, 5. දැන් කරයි, 6. මතු අනර්ථයක් කරන්නේය, 7. මොහු මගේ හතුරාට යහපතක් කළේය, 8. දැන් කරයි, 9. මතු යහපතක් කරන්නේය. එසේම ගලෙක මුලෙක පා වැදුනත් අච්චට වැස්සට පින්නට අසුවූවත් සමහරු කිපෙති. ඒ අස්ථාන කෝපයයි. ඒ සමගින් දහයක් වෙනව. එවිට 'දසවිධ ආඝාථ වස්තු' ලෙස මේවා හඳුන්වනු ලබයි.

ක්‍රෝධය සිත කෙලෙසන පළිබෝධයකි. ඒ බව 'කෝධෝ චිත්තස්ස උපක්කෙලේසෝ' යන්නෙන් දැක්වේ. තරහ සිත ඇති විට කිසිඳු යහපත් දෙයක් කිරීමට හැකියාව නැත. සිතේ දුවන්නේ වෛරයයි. කෙනෙක් පිළිබඳව ක්‍රෝධයක් හටගත්තොත් එය ආත්මයෙන් ආත්මයට ගෙන යෑමට සිදුවෙනවා. බද්ධ වෛරය යනු පළිගැනීමේ උපරිම අවස්ථාවයි. රන් තලියක් නිසා බෝසතාණන් වහන්සේ කෙරෙහි ඇතිකර ගත් වෛරය නිසා දේවදත්ත හිමියන් මුළු සංසාරයටම අන්ත දුකකට පත්වූ ආකාරය සෑම දෙනෙක්ම දන්නා කාරණයකි. නිරන්තර තරහෙන් සිටින පුද්ගලයන් සමග එකට වැඩකරන්නට ලැබීම මහත් අවාසනාවකි. මන්ද? නිරන්තර සිතේ අමනාප ස්වභාවය ඇති හෙයිනි. එවැනි අය ළඟ වැඩකරන මිනිසුන් පවා බොහෝ කාලයක් රඳා සිටින්නේ නැත. කරුණාවක් මෛත්‍රියක් නැති කිසිවෙකු ළඟ රැඳෙන්නට කිසිවෙක් කැමති නැත. මේ කාරණාවන් සමාජයේ කොතෙකුත් දකින්නට ඇත.

බුදුරජාණන්වහන්සේ කිපෙනසුළු පුද්ගලයා සොහොන් පෙනල්ලකට උපමාකොට ඇත. සොහොන් පෙනෙල්ල යනු දෙපැත්තෙන් දැවීගිය මැදින් අසූචි තැවරුණු ලී කැබැල්ලකි. එය කිසිදු දේකට පාවිච්චියට ගත නොහැකිය. එලෙසින් කිපුණු පුද්ගලයා කිසිඳු වැඩකට ගැනීමට අපහසුය. සමහර පුද්ගලයන් කෑම බීමට වඩා අනුන්ට දුක් දීලා, අනුන්ව රිදවල, ආස්වාද ලබන අවස්ථාද ඇත. නමුත් එහි විපාක දරුණුය.

කෝපය ආහාර කොටගත් යක්ෂාවේශ දුර්වර්ණ අඟුටුමිටි දෙවියෙක් දිනක් ශක්‍රාසනයේ වාඩිවිය. මේ දැක අනෙක් දෙවිවරු මොහුට නොයෙක් ආකාරයෙන් එතැනින් ඉවත්වන්නට කීහ. ඔවුන් සැර වචනයෙන් කථා කළහ. ඒ නිසා අඟුටුමිටි යක්ෂයා තවත් ශක්තිමත්ව නැගී සිටියේය. මේ පුද්ගලයා ශක්‍රාසනයෙන් කෙසේවත් ඉවත් කිරීමට නොහැකි වූ තැන, සක් දෙවිඳුන්ට මේ බව කීහ. එතුමා පැමිණ ඒ යක්ෂයාගේ ස්වරූපය දැක යටහත් පහත්ව, එම ආසනයෙන් බහින්න කියා කීවේය. එවිට අඟුටුමිටි යක්ෂයා එතැනින් අතුරුදහන් විය. තව්තිසා වැසි දෙවිවරු සතුටු කරමින් සක්දෙව් රජ මෙසේ කීය. "මම මෙලෙසින් ගැටෙන සිත් ඇත්තෙක් නොවෙමි. ක්‍රෝධය නමැති දිය සුළියෙන් ලෙහෙසියෙන් ගසාගෙන යන්නේද නොවෙමි. බොහෝ කලක් නොකැපී සිටිමි. මා කෙරෙහි ක්‍රෝධය පැලපදියම් වී නොමැත" යනුවෙනි. මේ කථාව හැමදෙනාටම වටිනා පාඩමකි. මෙහිදී සක්දෙව් රජතුමාට ඉහළින් සිටීමට කිසිවෙකු නැත. නමුත් එතුමා කෙතරම් ඉවසිලි වන්තව ක්‍රියාකළ කෙනෙක්ද යන්න ඉන් පැහැදිළි වෙනවා.

සමහර අය යම් යම් අනතුරුවලට පත්වූවාම සියලු දෙනාම තමාගේ අණසකට යටත්ව සිටිය යුතු යන මානසිකත්වයේ ජීවත්වන අය සිටිති. ඔවුන්ට ඉවසීම ගැන කිසිදු දැනුමක් නැත. කෙනෙක් තරහින් ක්‍රෝධයෙන් බණින විට අනෙක් පුද්ගලයාත් එකට බැණගැනීමට ගියහොත් කුමකින් කුමක් වේදැයි කිව නොහැකිය. නමුත් බණින කෙනෙකුට ටිකක් සවන්දිය හැකි නම් ඔහු කියන දේත් සාවධානව ඇසිය හැකි නම් ඒ සඳහා නිසි පිළිතුරු ඒ පුද්ගලයාට ලබාදිය හැකිය. එයට වටිනා නිදර්ශනයක් ලෙස අක්කෝසක භාරද්වාජ බමුණා බුදුරජාණන්වහන්සේට නොයෙක් අසභ්‍ය වචනවලින් බණින විට උන්වහන්සේ නිශ්ශබ්දව අසා සිටි ආකාරය දැක්විය හැකිය.

ක්‍රෝධ සිතින් කරන කිසිදු වැඩක් සාර්ථක වන්නේ නැත. තරහ සිතින් නිදාගන්නත් අපහසුය. තරහ සිතින් පාඩම් කරන්නත් අපහසුය. කෑම ගත්තත් බඩේ වේදනාව ඇතිවෙනවා. තරහ සිතින් යමක් කළද එය අසම්පූර්ණය. තමන් යම් දෙයක් කිරීමේදී වුවත් අනුන් ලවා යමක් කරවීමේදී වුවත් තරහෙන් ක්‍රෝධයෙන් එය නොකළ යුතුය. නිරන්තර ක්‍රෝධයෙන් කටයුතු කරන්නා අන් අයට පිළිකුල් සහගත කෙනෙක් වනු ඇත. ඔහු ළඟ සිටීම පවා අප්‍රිය කරනු ඇත. ඔබ යම් ස්ථානයක පාලකයෙක් නම් යම් යම් අවස්ථාවලදී එක් එක් පුද්ගලයන්ට දොස් පැවරීමටත්, සිදුවිය හැකිය. නමුත් නිරන්තර තරහෙන් අනෙක් අයට බණින්නට යෑමෙන් ඔබේ ගෞරවයට හානිවිය හැකිය. අනෙක් අයට ඔබ එපාවනු කෙනෙක් වනු ඇත. එපමණක් නොව ඔබගේ නිරෝගී කමටත් බාධාවක් විය හැකිය. ඒ නිසා ද්වේශය නමැති ක්ලේශය හඳුනාගත යුතුමයි. එසේ නොමැති නම් තමා නොදැනී නොයෙක් කරදර බාධක වලට ලක්වනු ඇත. තරහව ක්‍රෝධය යන ක්ලේශයන් හැර, කරුණාව දයාව මුසුවුණු සිනහවෙන් තමාටත් අනුන්ටත් විශාල යහපතක් උදාකර ගැනීමට හැකියාව ලැබෙනු ඇත.


ANTON
DHARMASEELAN
MORTGAGE AGENT
Available Till Midnight
Including Weekends & Holidays
CALL ME FIRST
FOR ALL YOUR MORTGAGE NEEDS
PURCHASE
REFINANCE
SELF EMPLOYED
RENEWAL
BAD CREDIT
INVESTMENT PROPERTY
416 704 1200
MAJOR BANKS-BEST RATES
MORTGAGE ALLIANCE
BROKER #10530



**බසයක නැගී ඇමෙරිකානු මහ නගර බලා .....!**

# ප්‍රංශයෙන් ඇමෙරිකාවට ලැබුණු නිදහසේ කාන්තාව බලන්නට යමු.

විස්තර සහ සේයාරූ
■ අනුරුද්ධ වැලිගමගේ

ඇමෙරිකානු විප්ලවය සහ වහල් මෙහෙය අවසන් කිරීම අගය කරනු වස් ඇමරිකාවට නොමැකෙන සිහිවටනයක් ප්‍රංශයෙන් තෑගි ලැබෙන්නේ 1886 දී. ප්‍රවීණ මූර්ති ශිල්පී ෆෙඩ්රික් ඔගස්ටේ බර්තෝල්ඩි විසින් සැලසුම් කළ අඩි 151 ක් උස මෙම තඹ ප්‍රතිමාව නිර්මාණය වුණේ, ලෝ ප්‍රකට පැරිසියේ අයිපල් කුළුණ නිර්මාණය කළ ශ්‍රේෂ්ඨ ඉංජිනේරු ගුස්ටාව් අයිපල්ගේ අධීක්ෂණය යටතේ. අද ලෝකයේ මුල්පෙළ සංකේතයක් වන මෙය ලිබර්ටි ප්‍රතිමාවයි. දකින්නට ලැබෙන්නේ ඇමෙරිකාවේ නිව්යෝර්ක් නුවර වරායට යාබදව පිහිටි ලිබර්ටි දූපතේදී.

සංචාරයක මතකය ලිපි පෙළ කලක් තිස්සේ ඔබ කියවා තිබෙනවා. ඔබට මතක ඇති, නාසා සහ ඩිස්නි ලෝකය වෙත ෆ්ලොරිඩා ප්‍රාන්තයට අප ගමන් කළේ ගුවනින්. කැනඩාවේ නෝවා ස්කොෂියා සහ නිව් බ්‍රවුන්ස්වික් පළාත් වෙත අප ගමන් කළේ දිගු රථ ධාවනයක යෙදෙමින්. සංචාරයේදී අපට විවිධ මාධ්‍ය භාවිත කරන්නට වෙනවා. ඒ වාගේම ඒ සඳහා අපට දරන්නට හැකි මුදලත් වෙන්කළ හැකි කාලයත් ගැන සලකා බලන්නට වෙනවා. මෙවර සංචාරය සදහා අප යොදා ගත්තේ අන්තර්ජාල පහසුකම්, වැසිකිලි පහසුකම් සහිත සුවපහසු සංචාරක බසයක්. පළපුරුදු සංචාරක සමාගම් මගින් සංවිධානය කරන මෙවැනි ගමනකට එක්වීමේ වාසි මෙන්ම අවාසිත් තිබෙනවා

ඔවුන් පුරුද්දක් සේ නිතර මේ ගමන්වල යෙදෙන නිසා දේශ සීමා හරහා(Border crossing) යාමේදී, රථ ධාවනයේදී, ඉන්දන පිරවුම්වලදී, වැසිකිලි යෑම සඳහා මෙන්ම වාහන නවත්වන්නට තැන් සොයාගැනීමට අනවශ්‍ය ලෙස විනාශ කරන කාලය ඉතිරි කරගන්නවා. විශාල පිරිසක් සඳහා හෝටල් වෙන්කරවා ගැනීම් කෙරෙන බැවින් සහ නරඹන තැන් සදහා ප්‍රවේශ පත්‍ර ගැනීමේදී වැඩි වට්ටමක් ඔවුනට ලැබෙන බැවින් හොඳ නවාතැනක් සේම ප්‍රවේශ පත්‍ර අඩු මිලකට ලබා දෙන්නට ඔවුනට පිළිවන්. සමහර දිනවල උදෑසනින්ම නැගිටින්නට වීමත් සමහර දිනවල පමා වී රාත්‍රී ආහාර ගැනීම මෙන්ම ලබාදී ඇති සීමිත කාලයේදී පරිශ්‍රයක් නරඹා ආපසු බසයට ඒමත් වැනි නිදහස සීමාවීමත්, තමාගේ රුචියට නොව ඔවුන්ගේ තේරීමට අනුව සංචාර ආකෘතිය අත්විඳින්නට සිදුවීමත් නිසා සමහරු මේ සඳහා වැඩි ප්‍රියතාවයක් දක්වන්නේ නැහැ .

එහෙත් මහා නගරවල සහ තදාසන්න කලාපයේ ඇති දැඩි වාහන තදබදයෙන් සහ වාහන නැවැත්වීමේ අපහසුතාවයෙන් මිදී නිසි තැනට පහසුවෙන් ගොස් කළ අපේක්ෂිත සංචාරයක් ලෙසින් අප තෝරාගත් ගමන අප අත්විඳි බව කිව යුතුයි. මේ ලිපි යුගලයෙන් අපි යන්නේ බොස්ටන්, නිව්යෝර්ක්, ඇමෙරිකන් අගනුවර වොෂින්ටන් ඩී සී සහ පෙන්සිල්වේනියාව වෙතයි. මේ මහ නගර එකිනෙකට යාබද ප්‍රාන්තවල පිහිටා තිබෙනවා. අප ගමන් කළ බසය ටොරොන්ටෝවෙන් ගමන් අරඹා නැවත ටොරෝන්ටෝවෙන් ගමන් අවසන් කළේ දින 4 තුළදී.

**බොස්ටන් (Boston)**

අත්ලාන්තික් සාගරයට මුහුණලා පිහිටි ජනාකීර්ණ වරාය නගරයක් වන බොස්ටන් නව එංගලන්තය ලෙස හඳුන්වන ඇමෙරිකානු ප්‍රදේශයේ ඇමෙරිකානු විප්ලවයේදී මහත් මෙහෙයක් කල නගරයක්. අද එය වඩාත් ප්‍රකට වන්නේ ලොව පතල හාවර්ඩ් සරසවිය නිසා. කීර්තිමත් ඇමෙරිකානු ජනාධිපතිවරුන් වූ තියොඩෝර් රූස්වෙල්ට්, ජෝන් එෆ් කෙනඩි, බරක් ඔබාමා මෙන්ම තාක්ෂණික ලෝකයේ ප්‍රකට ලෝක ධනවතා ලෙස සැලකෙන බිල් ගේට්ස් හා සමාජජාල සමාජගත



කළ ෆේස්බුක් නිර්මාතෘ මාර්ක් සකර්බර්ග් වැන්නවුන් හාවර්ඩ් සරසවියෙන් ලොවට දායාද කළ සම්පත්. මෙම සංචාරයේදී අපේ මග පෙන්වන්නා අපව හාවර්ඩ් සරසවිය සහ වටපිටාව පෙන්වීමට රැගෙන ගියේ දිගු ගමනකින් පසු පළමු දින හවස් යාමයේදී.

බොස්ටන් වරාය අසබඩ පොදු විනෝද ප්‍රදේශය සහ එදා පොදු ජනතාව එක්රැස් වූ ප්‍රදේශය (Faneuil Hall) අද අවන්හල් සහ පදික වෙළඳසලින් පිරි සංචාරක ආකර්ෂණයක් ලෙසින් ප්‍රකටයි. සමරු ආයිත්තම් මිල දී ගැනීමට එය හොඳ ඉසව්වක්. එය දුටු මගේ මතකය දිව ගියේ ලංකාවේදී අප ගිය කොටුව දුම්රිය ස්ථානය අසබඩ පිහිටි ලෝක වෙළඳපොළ වෙතටයි .

**නිව් යෝර්ක් (NewYork)**

අපගේ දෙවන දිනය වෙන් වුයේ ලෝකයේ ප්‍රබල ආර්ථික මධ්‍යස්ථානය වන නිව්යෝර්ක් හි සරන්නටයි. බොස්ටන් සිට නිව්යෝර්ක් කරා යාමේදී ඇති අධික වාහන තදබදයෙන් මිදෙන්නට අප දවස අරඹා සිටියේ උදෑසනින්මයි. හඩ්සන් ගඟ අත්ලාන්තික් සාගරය හමුවන මුවදොරේ පිහිටි මෑන්හැටන් දූපතේ වඩාත් වැදගත් වාණිජ ගොඩනැගිලි පිහිටා තිබෙනවා. සැප්තැම්බර් 11 (9/11) වැනිදා ප්‍රහාරයෙන් විනාශ වූ ලෝක වෙළඳ මධ්‍යස්ථානය (World Trade Centre) කලක් ලොව උසම ගොඩනැගිල්ලේ කිරුළ දැරූ එම්පයර් ස්ටේට් (Empire State) සහ එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය (United Nations) රැස්වන ප්‍රධාන කාර්යාලය ඇත්තේත් මෙහියි.



බෘක්ලින් (Brooklyn) මෑන්හැටන් (Manhattan) ක්වීන්ස්බොරෝ (Queensboro) ජෝර්ජ් වොෂින්ටන් (George Washinton) වැනි පාලම්වලින් ගඟ තරණය කොට මෙහි වූ ප්‍රධාන වාණිජ වීදිය වන වෝල් ස්ට්‍රීට් (Wall Street) වෙත යා හැකියි.

**ටයිම් චතුරශ්‍රය (Times Square)**

1945 දී දෙවන ලෝක සංග්‍රාමය නිමාකර නිව්යෝර්ක් වරායෙන් සිය රට පැමිණි නාවිකයෙකු ටයිම් චතුරශ්‍රයේදී හෙදියක සිප වැළඳ ගන්නා සේයාරුව V-J Day in Times Square, a photograph by Alfred Eisenstaedt, was published in Life in 1945, ලෝකයේම ජනප්‍රිය මතකයක්. චිත්‍රපට සහ සේයාරූ තුළින් පමණක් දැක තිබූ අතිවිශාල රූපවාහිනී



තිරවලින් පිරි ඒ පරිශ්‍රය හැබැහින් දැකගන්නට මේ සංචාරයේදී අපට ඉඩ ලැබුණා. මිල අධික ප්‍රකට වෙළඳසල් කිහිපයක (Window Shopping) සරන්නටත් එය අවස්ථාවක් වූ බව කිව යුතුයි.

**රොකෙෆෙල්ලේර් කුළුන (Rockefeller Tower)**

එම නගරයටම ආවේණික කහ පැහැති කුලී රථවලින් (Yellow Cab) පිරි නිව්යෝර්ක් නගරයේදී අපට බොහෝ අරුම පුදුම දෑ එක් රැස් කළ රිප්ලිස් (Ripley's Believe or not Museum) කෞතුකාගාරය බලන්නට හැකිවුණා. අහස පරයා නැගෙන සුවිසල් ගොඩනැගිලි මැද පිහිටි තට්ටු 70 ක් උස රොකෙෆෙල්ලර් මුදුනට යන්නටත් ඉඩක් මේ සංචාරයේදී සලසා තිබූ බව සටහන් කළ යුතුයි. එම්පයර් ස්ටේට් ගොඩනැගිල්ල අසලම පිහිටි මේ මුදුන නිව්යෝර්ක් නගරයේ කෙතරම් උස ගොඩනැගිලි ඇත්දැයි සාක්ෂි පෙන්වන සේයා රූ මවන තැනක්. අවන්හල් රැසක්, සාප්පු සංකීර්ණයක් සහිත ඒ පරිශ්‍රයේ සීලිමේ සහ පසුපස බිත්තියේ ඇඳ ඇති සුවිසල් චිත්‍ර ලෝක ප්‍රසිද්ධ නව ලොව නිර්මාණ වෙනවා. එහි ඇති ප්‍රොමිතස් සහ ඇට්ලස් ප්‍රතිමා අන් තැනකදී දැකගත නොහැකි අගනා නිමවුම් බව සේයා රූ තවමත් මට කියනවා.



**ලිබර්ටි ප්‍රතිමාව (Statue of Liberty)**

මේ සංචාරයේදී අප වඩාත්ම අත්විඳි චාරිකාව වුයේ නිව්යෝර්ක් වරාය සංචාරයයි. (New York Harbour Cruise) සුවපහසු යාත්‍රාවක නැගී කළ ඒ සංචාරයේදී නිව්යෝර්ක් නගරයේ සියලු සංකේත (Landmarks) සහ එලිස් දූපතේ නිදහසේ ගිනි සිළුව අතින් ගත් ලිබර්ටි ප්‍රතිමාව (Statue of Liberty) දකින්නට ලැබුණා. අප කළ සංචාරයේදී අප එම දූපත තුළට ගියේ නැහැ. ඔබට අවශ්‍ය නම් පෞද්ගලික සංචාරයකදී එයට යන්නටත් පුළුවන්.

විශේෂයෙන්ම නිව්යෝර්ක් නගරයේ වාහන නැවැත්වීමේ අපහසුතා සංචාරක බස්රිය නිසා අපට දැනුණේම නැහැ. පළපුරුදු රියදුරුවරිය අපව වාහන තදබදයද අවම කරවමින් අදාල ස්ථානය ඉදිරිපිටම බස්වනු ලැබූ නිසා වැඩි දුරක් ඇවිදින්නට වුයේත් නැහැ. බොහෝ කැනේඩියානුවන් කරන ලෙසින් නිව්ජර්සි ප්‍රාන්තයේ හෝටලයක නැවතී පොදු ප්‍රවාහන මාධ්‍යයන් මගින් සුවිසල් ඇපල් ගෙඩිය (Big apple) ලෙසින් හඳුන්වන නිව් යෝර්ක් නගරයට යන්නට වුවෙත් නැහැ.

හිස අතගෑමෙන් වාසනාව උදාවෙනවා යැයි විශ්වාසයක් ඇති දැවැන්ත වෘෂභයාගේ ප්‍රතිමාවත් (Charging Bull) නිව්යෝර්ක් කොටස් වෙළඳපළ (NewYork stock exchange) ඇතුළු ලෝකයේම අවධානයට ලක්වුණු වාණිජ වීදිය වන වෝල් ස්ට්‍රීට් (Wall street) හි කුඩා දුරක් ඇවිදින්නටත් මේ සංචාරයේදී ඉඩ සලසා තිබුණා .

ඇමෙරිකාවේ අග නගරය වන වොෂින්ටන් ඩී.සී. (Washington, D.C) සහ පෙන් ගුහාව (Penn's Cave) බලන්නට ගිය හැටි කියවන්නට ලබන මාසයේදී හමුවෙමු.

anuruddhawe@yahoo.com



# රාස්සිගේ ශාපය

ඉස්සර කාලෙ එක්තරා රාජධානියක රජ මාලිගයක ලස්සන කුමාරිකාවක් සිටියා. මේ කුමාරිකාවගේ කොණ්ඩය හරිම දිගයි. ලස්සනයි. රතු පැහැයෙන් යුක්තයි. ඇය හරිම කැමතියි රෝස මල්වලට. ඒ නිසාම හැමෝම ඇයට කිව්වෙ රෝස කුමාරි කියල. රෝස කුමාරි හැමෝටම කරුණාවන්තයි. ආදරෙයි. මේ රාජධානියේ හැමෝමත් ඇයට ආදරෙයි. රටේ හැම කෙනෙක්ම සතුටින්, සැපෙන් සිටියා. ඒ අය සෑම උදෑසනකම හරිම ප්‍රබෝධයෙන් අවදි වී කඩිසරව තම රාජකාරිවල යෙදුණා. ජනතාව මේ විදියට උදෑසන ප්‍රබෝධමත්ව අවදි වීමට හේතුව රෝස කුමාරියි.

මේ රෝස කුමාරිට හොඳ අපූරු යාළුවෙක් හිටියා. ඒ තමයි රන් පැහැ කුරුල්ලෙක්. රෝස කුමාරි සෑම සන්ධ්‍යාවකම මාලිගාවේ සඳළුතලයට ඇවිත් අත්පොඩියක් ගසනවා. එතකොටම රන් කුරුල්ලා කොහේදෝ සිට පියඹා ඇවිත් කුමරියගේ උරහිසේ වසනවා. ඒ එක්කම රෝස කුමාරිගේ රතු පැහැ දිග කොණ්ඩය දීප්තිමත් එළියක් විහිදවමින් තව තවත් රතුපාටින් දිළිසෙන්නට පටන් ගන්නවා. මේ දීප්තිය මැදම රත්තරන් කුරුල්ලා මිහිරි හඬින් නාද නිකුත් කරනවා කරනවා. කුමරියත් කුරුල්ලාගේ නාදයට අනුව ලස්සනට ගී ගායනා කරනවා. මේ දෙන්නගේ ගී හඬ රාජධානිය පුරාම ගලාගෙන යනවා. ඒ සුමියුරු නාදයට කන් දීගෙන රටේ හැම කෙනෙක්ම සන්සුන්ව නින්දට යනවා. ඒ හැම කෙනෙක්ටම නින්දේදී ලස්සන සුභ සිහින පමණයි පෙනුණේ.

වසර කීපයක්ම මේ විදියට ගත වුණා. හැමෝම සතුටින් හිටියා. ඒත් එක දවසක් හරිම නපුරු දෙයක් සිදුවුණා. කොහේදෝ ඈත දේශයක හිටපු නපුරු රාක්ෂියකට මේ ලස්සන කුමාරිකාව ගැන දැනගන්න ලැබුණා. මේ රාජ්‍යයේ මිනිස්සු ඇය නිසා සතුටින් සිටින බව දැනගන්නට ලැබුණා. දුෂ්ට රාස්සියට හරිම ඊර්ෂ්‍යාවක් ආවා. ඇය රෝස කුමරියට ශාප කළා.

රාස්සියගේ ශාපය වැදීමත් සමගම රෝස කුමාරිගේ ලස්සන රතු පැහැති කොණ්ඩය අවලස්සන කළු පැහැයට හැරුණා. කුමාරිට හරිම දුක හිතුනා. ඒත් ඇය එදා සවසත් සුපුරුදු විදියටම සඳළුතලයට ඇවිත් අත්පොඩියක් ගැසුවා. ඒ හඬට රන් කුරුල්ලා පියඹා ආවා. ඒත් රාස්සියගේ ශාපය වැදී තිබුණු නිසා කුමාරිගේ ලස්සන කොණ්ඩය රතු පාටින් දිළිසුණේ නෑ. අවලස්සන කළු පාටින් තිබුණා. ඒ ගැන නොසිතා කුරුල්ලා ලස්සන මිහිරි හඬ අවදි කළා. කුමරියත් ඒ තාලයට ලස්සනට ගී කිව්වා.

ඒ හඬ අසාගෙන හිටිය මිනිසුන් නින්දට වැටුණා. ඒත් එදා ඒ රටේ හැම කෙනෙක්ම දැක්කේ හරිම අසුන්දර සිහින. ඒවා දුක හිතෙන බය හිතෙන සිහින. පහුවදා උදේ හැම කෙනෙක් තුළින්ම දකින්නට ලැබුණෙ නොහෙට්ටු දුක්මුසු ගතියක්. කිසිම සතුටක්, ප්‍රබෝධයක් ඒ මුහුණුවල තිබුණේ නෑ.

තමන්ගෙ රටේ මිනිස්සු ඒ විදියට දුකින් දවස ආරම්භ කරපු එක ගැන කුමරියටත් දුකයි. ඇය ඒ ගැන රත්තරන් කුරුල්ලත් එක්ක කතා කළා.

"රන් කුරුල්ල, කියන්න... මගේ මිනිස්සුන්ව නැවතත් සතුටින්, සැනසිල්ලෙන් තියන විදියක් මට කියන්න..."

"කුමරිය කළු හිස කෙස් රෝස වතුරෙන් සෝදන්න" කුරුල්ලා පැවසුවා.

කුරුල්ලා දුන් උපදෙස ගැන කුමරියට පුදුමයි. ඒත් ඇය එම උපදෙස පිළිපැද්දා. රෝස පෙති කඩා වතුර බේසමකට දමා එම රෝස වතුරෙන් හිස සේදුවා. එතෙක් රාස්සියගේ ශාපය වැදී කළු වී තිබූ හිසකෙස් පෙර තිබූ පරිදිම රතු පැහැයට හැරුණා.

එදා සවස කුමරිය හරිම සතුටින් සඳැල්ලට ආවා. අත්පොඩි ගැසූ සැණින් කුරුල්ලා ඇගේ උරහිසේ වැසුවා. වෙනදා වගේම දෙදෙනාම ප්‍රීතියෙන් ගී කිව්වා. රටේ ජනතාව ගී හඬ අසාගෙන ලස්සන සුන්දර සිහින බලමින් නිදාගත්තා. පසුවදා හරිම ප්‍රබෝධයෙන් නැගිටලා තම වැඩකටයුතු පටන් ගත්තා.

නැවතත් ඒ රටේ මිනිසුන් සතුටින් සිටින බව රාස්සියට ආරංචි වුණා. තදින්ම තරහ ගියා. කුමරියගේ බලය බිඳී යන ලෙස නැවතත් ශාප කළා. රෝස කුමරියගේ හිස කෙස් නැවතත් කළු පැහැ වුණා. රෝස පෙති දැමූ වතුරෙන් නැවතත් හිස සේදුවොත් කුමරියගේ ශාපය ඉවත්ව යන බව දැනගත් රාස්සිය ඒ රටේ තිබුණු සියලුම රෝස මල් කඩා විනාශ කර දැම්මා.

කලින් වගේම එදා ඉඳන් හවසට කුමරිය ගී කිව්වත් මිනිස්සු නිදාගත්තෙ නපුරු හීන බලමින්. පසුවදා අවදි වුණේ අලස කමින්, නොසතුටින්. කුමරිය නැවතත් කුරුල්ලාගෙන් කළ යුත්තක් ගැන විමසුවා.

කුරුල්ලා පෙර පරිදිම "කුමරිය කළු හිස කෙස් රෝස වතුරෙන් සෝදන්න" යැයි කිව්වා. එවිට කුමරිය ඇසුවා, "මම කොහෙන්ද රෝස පෙති සොයාගන්නෙ. රාස්සිය සියල්ල විනාශ කරලා" එහෙත් කුරුල්ලා දිගටම කිව්වෙ එකම දෙයයි. ඒ, "ඔබගේ කළු හිස කෙස් රෝස වතුරෙන් සෝදන්න" යන්නයි.

කුමක් කරන්නේදැයි කුමරියට හිතාගැනීමටවත් බැරි වුණා. ඇය සඳළුතලයට ඇවිත් හඬා වැටුණා. ඇයගේ කඳුළු සඳළුතලය පාමුලට වැටුණා. මෙන්න මේ වෙලාවෙම ඒ සඳළුතලය පාමුලට ලස්සන තරුණ කුමාරයෙක් ආවා. ඒ කුමාරයා අතේ පුංචි මංජුසාවක දාපු රතු කෙස් රොදක් තිබුණා. ඒ වෙන කාගෙවත් නොවෙයි. මේ කුමරියගේ කෙස් රොදක්. සඳළුතලය උඩ ඉඳගෙන අඬන කුමරියගේ කඳුළු මේ කෙස් රොදට වැටුණා. කුමාරයා ප්‍රවේසමෙන් ඒ කෙස් රොද අරන් බිමින් තැබුවා. හරිම පුදුමයක්. ලස්සන රෝස මලින් පිරුණු රෝස පැලයක් එතන මතු වුණා. එය දැක්ක හැටියෙම කුමරියට හරිම සතුටුයි. ඇය වහාම පහතට දුවගෙන ඇවිත් රෝස මල් කඩා වතුර පිරුණු බේසමකට දමා හිස සේදුවා. රාස්සියගේ ශාපය ඉවත් වී ගොස් කුමරියගේ කොණ්ඩය නැවතත් ලස්සන රතු පැහැයට හැරුණා.

මේ සිදුවුණ දේ හැමෝටම පුදුමයි. කුමරියගේ පිය රජතුමාටත් පුදුමයි. ඔහු අර තරුණ කුමාරයව කැඳවා මෙසේ ඇසුවා.

"ඔබ කවුද? ඔබට කොහෙන්ද කුමරියගේ රතු හිස කෙස් රොද සහිත මංජුසාව ලැබුණේ?"

කුමාරයා මෙසේ කිව්වා.

"මම කුමරියව කුඩා කාලයේ සිටම දන්නවා. පුංචි කාලයේ අප සෙල්ලම් කරද්දි අපගේ හිතවත් කම වැඩිකර ගැනීමට ඇයගේ ලස්සන හිස කෙස් රොදක් අරගෙන මේ මංජුසාවේ දමාගත්තා. ඇයත් ඒ විදියටම මගේ කෙස් රොදක් ඇය ළඟ ඇති මංජුසාවක තබාගත්තා"

"මොනවා... කුමරිය මෙය ඇත්තක්ද?" රජතුමා ඇසුවා.

"එය සැබෑවක් පියාණනි," කුමරිය පැවසුවා. එය සනාථ කිරීමට ඇය ළඟ ඇති කුමාරයාගේ හිසකෙස් රොද සහිත මංජුසාව පෙන්නුවා. රජතුමාට හරි සතුටුයි. තමන්ගේ දියණිය විවාහ කර දීමට මේ තරුණ කුමාරයා සුදුසු බව ඔහු තීරණය කළා. එදිනම ඒ කුමරියත් කුමාරයාත් විවාහ වුණා.

රාස්සිය තේරුම් ගත්තා කුමරියට ශාප කිරීමෙන් පළක් නොවන බව. ඇය ඈත කැළෑවකට පළා ගියා. ඒ එක්කම මුළු රටම ලස්සන රෝස මල්වලින් පිරී ඉතිරී ගියා. කුමරිය හැමදාම රන් කුරුල්ලා සමග එක්ව සවසට ගී කිව්වා. ජනතාව සතුටින් ප්‍රීතියෙන් නින්දට ගිහින් පසුවදා ප්‍රබෝධයෙන් අවදි වී වැඩ කටයුතු කළා.

## ළමා කවි

### ලෝ වැඩ සඟරාව

| | | | |
|---|---|---|---|
| මුන් හැම අඹු දරුවන් උපදි | න්නේ | නොලදත් අහරක් සා දුක් දුරු | කොට |
| පින් බලයෙන් බෝකල් පවති | න්නේ | නැතුවත් කඩ රෙද්දක් එක පට | කට |
| උන් කළ පින්මය උන් රඳව | න්නේ | බලවත් නිරයේ තද දුක් සිහි | කොට |
| ඉන් සිත ලොබමය තොප පවති | න්නේ | මඳකුත් පසු නොබසිව් තෙපි පින | කට |
| ශීල ගුණේ පිහිටාගෙන නොයි | දේ | නසතොත් සිත ලොබ අනුවණ දොස | මය |
| ආලය කර රකිනා තොප නිබ | දේ | වසතොත් සැදැහැත්තන් ඇති දෙස | මය |
| බාල පියඹූ දරුවෝ නම් මෙස | දේ | දෙසතොත් සඟමොක් දෙන උපදෙස | මය |
| බාල කලට කෙළිනා උතු වළ | දේ | අසතොත් මුනිඳුන් වදහළ බස | මය |
| දුක් ගෙන රැස් කළ දන හැර | කැමතී | වැනුවා නම් බුදු ගුණ වැනුවා | මය |
| නික් මෙන නිරයට නරයන් | සිරිතී | තැනුවා නම් තම සිත තැනුවා | මය |
| දුක් දෙන අඹු දරුවන් නිති | රකිතී | දෙනුවා නම් දන් පින් දෙනුවා | මය |
| මොක් දෙන පිරිසිදු සිල් නොම | රකිතී | දිනුවා නම් පරලොව දිනුවා | මය |

**විදාගම මෛත්‍රිය හිමියන් විසින් රචනා කරන ලද 'ලෝවැඩ සඟරාව' කෝට්ටේ යුගයේදී ලියවුණු වටිනා ග්‍රන්ථයකි. ජීවිතය යහපත්ව පවත්වා ගැනීමට වුවමනා දහම් කරුණු රැසක් මනරම් ලෙස කාව්‍යාකාරයෙන් මෙහි ඉදිරිපත් කර ඇත.**

## ළමා ගී

### අප ජන්ම භූමි ලංකා

**මා සාර භූමි ලංකා**
**මා විජය භූමි ලංකා**
**මා පුණ්‍ය භූමි ලංකා**
**අප ජන්ම භූමි ලංකා..... ලංකා**
**මා සාර භූමි ලංකා**

**නදී ඇළ දොළ අහස් දිය කඳ**
**සදා තෙතමන සෙවණ දෙරණයි**
**කරල් බර වූ කුඹුරු යායයි**
**මේ බිමෙන් අප රට නිධානයි**

**මා සාර භූමි ලංකා.....**

**සතුරු එඩි මැඩ හෙළා ලේ කඳ**
**නැංවූ නිවහල් විජය දෙරණයි**
**වීර හෙළයන් පුදා ජීවය**
**නැගූ නිදහස රටට උරුමයි**

**මා සාර භූමි ලංකා.....**

**බුදුන් සිරිපා පියුම් නැමඳූ**
**මගේ මේ ලක් පුණ්‍ය දෙරණයි**
**සදාකාලෙන් සදාකාලෙට**
**අපට දළදා සමිඳු පිහිටයි**

**මා සාර භූමි ලංකා.....**

**ගායනය - සමූහ ගායනයක්**
**පද රචනය - පාලිත පෙරේරා**
**තනුව - රෝහිත විජේසූරිය**

දසත Dasatha

චරිතයකින් බිඳක්

# රට සවාරි ගිහිල්ලා නැති, නිල නිවාසවල පදිංචිවෙලා නැති ජනපති දියණිය



■ වාසනා සුරංගිකා විතානගේ

**අද වන විට අපේ ශ්‍රී ලංකාවේ දේශපාලනඥයන් පිළිබඳව කතා කරනවාටත් වඩා වැඩියෙන් කතා කෙරෙන්නේ ඔවුන්ගේ දූ දරුවන් ගැනය. ජරාජීර්ණ වී ඇති ශ්‍රී ලාංකේය දේශපාලන මඩගොහොරුව තව තවත් අප්‍රසන්න ස්ථානයක් කිරීමට මේ දූ පුතුන් අද ඉමහත් කාර්යභාරයක් ඉටුකරමින් සිටී. එහෙත් මඩ ගොහොරුවලත් සුවඳැති පියුම් පිපේ. ඒ බව සනාථ කරමින් ආදර්ශවත් ජීවිතයක් ගත කළ ජනාධිති දියණියකගේ වියෝව පිළිබඳව පසුගියදා අපට අසන්නට ලැබුණි. සාමාන්‍ය මිනිසෙකු මෙන් ඉපිද සාමාන්‍ය දරුවෙකු මෙන් හැදී වැඩී සාමාන්‍ය කාන්තාවක මෙන් ජීවත් වී සාමාන්‍ය මිනිසෙකු මෙන්ම මිය පරළොව ගිය මේ දියණිය ශ්‍රී ලංකාවේ තුන්වෙනි විධායක ජනාධිපති ඩී. බී. විජේතුංග මහතාගේ එකම දරුවා විය. නමින් චිත්‍රාංගනී කුමාරි විජේතුංග නම් වූ ඇය පසුගියදා ඇතිවූ හදිසි රෝගී තත්ත්වයක් නිසා මිය යන විට 60 හැවිරිදි වියේ පසුවිය.**

**2017 ජනවාරි මාසයේදී චිත්‍රාංගනී මෙනෙවිය සමග www.he.lk වෙබ් අඩවියේ වාසනා සුරංගික විතානගේ විසින් සිදුකළ මෙම සාකච්ඡාව ඒ සුන්දර නිරහංකාර ජනපති දියණියගේ සරල බවට උපහාරයක් වේවා.**

## අප්පච්චිගේ පුතා....

අප්පච්චි ආවද? තවම නෑ.. දුව නිදියන්න.. අප්පච්චි එනතුරු මග බලා සිටින මට නින්ද යන්නේ අත්තම්මා ළඟ. ඊට පසු මම අවදිවන්නේ අප්පච්චි තුරුල්ලේ නිදියගෙන සිටියදී. 'අම්මා... මම පුතාව අරගන්නවා...' මෙහෙම කියන අප්පච්චි නින්දේදීම මා ඔසවාගෙන එයාලගේ කාමරයට අරගෙන යනවා. මම පාසල් අධ්‍යාපනය ලැබුවේ මහනුවර උසස් බාලිකාවෙන්. පාසල් අධ්‍යාපනය ලබන වයස උදා වූවාට පසු අප්පච්චිට මා සම්බන්ධයෙන් පෙරටත් වඩා උනන්දු වන්නට සිදුවුණා. පුතාගේ හිස බැලුවද? නිය කැපුවද? ආදි පිරිසිදුකම සම්බන්ධ බොහෝ දේ අප්පච්චිගේ අවධානයට ලක් වුණා. පාසල් ඇඳුමේ කෙළවරක ලේන්සුවක් එල්ලනා තැන සිට මා සම්බන්ධයෙන් ඔහු තුළ වූයේ පුදුමාකාර උනන්දුවක්. කෙදිනකවත් අප්පච්චී මට දුව කියා ආමන්ත්‍රණය කර නැහැ. ඔහු මියෙන තුරුම ඔහුට සිටි එකම පුතු වූයේ මම.

අප්පච්චි කිසිම දවසක මට අතක්වත් තියලා නැහැ. ඉඳහිට අම්මාගෙන් ටොක්කක් කාලා තිබුණත් අප්පච්චි මට කවදාකවත් දඬුවමක් කරලා නැහැ. එලෙස දඬුවමක් කරන තරමට මම අකීකරු වෙලත් නැහැ. අප්පච්චි හුස්ම යනකල්ම මං ගැන හොයලා බැලුවේ චූටි දරුවෙක් ගැන හොයනවා වගේ. මම බාත්රූම් එකට ගියත් 'පුතා තවම නාලා ආවේ නැද්ද? කතා කරලා බලන්න....' කියලා අම්මට කියනවා.

## අප්පච්චිගේ දේශපාලනේ

අප්පච්චිගේ දේශපාලන ජීවිතය සම්බන්ධයෙන් මගේ මතකය 1965 ඡන්දය දක්වා දිව යනවා. එතකොට මට වයස අවුරුදු 6 ක් විතර. එදා තමයි මම ඉස්සෙල්ලාම ඡන්දයක් දකින්නේ. අපේ ගෙදර ගොඩාක් සෙනඟ පිරිලා හිටියා මතකයි. ඒත් මම අප්පච්චිගේ දේශපාලනය ගැන වැඩිය මොනවත් දන්නේ නැහැ. මොකද ඔහු කිසිම දවසක ගෙදර ඇතුළට දේශපාලනය අරගෙන ඇවිත් නැහැ. ඔහුගේ දේශපාලනයට අම්මාවත් මමවත් පොඩ්ඩක්වත් ගාව ගත්තේ නැහැ. 1960 ගණන්වල ඉඳලාම අප්පච්චි සිරිකොතේ, පාර්ලිමේන්තුවේ එක එක වැඩවලට ගිහිල්ලා හවසට අනිවාර්යයෙන්ම ගෙදර එනවා. ඒ පුරුද්ද තාත්තා දේශපාලනයෙන් විශ්‍රාම ගන්නා තුරුම ඒ විදියටම තිබුණා. තාත්තාට එන්න බැරි දවස් නොතිබුණා නෙමෙයි. ඒත් එහෙම දවස්වලට අනිවාර්යයෙන්ම දුරකථනයෙන් අම්මටයි මටයි කතා කරනවා. අප්පච්චිට ඇමැතිකම් ලැබුණාට පස්සෙත් අපි නිල නිවාසවල පදිංචියට ගියේ නෑ. අපි ජීවත් වුණේ පිළිමතලාවේ මේ දැන් ඉන්න ගෙදරමයි. අප්පච්චි කෝල් කළාම අනිවාර්යයෙන්ම අහන ප්‍රශ්න තුනක් තිබුණා. 'පුතා කෑවද? අසනීපයක් එහෙම නෑ නේද? ඔහෙට වහිනවද?' අප්පච්චිට ඕනේ අපි හොඳින්ද කියලා දැනගන්නම විතරයි. ඒ හැරෙන්න දේශපාලන ජීවිතයේ මොනතරම් කැළඹිලි තිබුණත් ඔහු ඒ කිසිවක් අපි සමඟ කියන්නෙ නැහැ. 'පුතා කෑවද? අම්මා කෑවද?' කියන ප්‍රශ්න දෙක අහගෙන තමයි අප්පච්චි ගෙට ගොඩවෙන්නේ. ඒ නිසා ළමා කාලයේ මගේ අප්පච්චිව මට මතක අප්පච්චි විදියටම විතරයි.

## කෙදිනකවත් විදෙස්ගත වී නැති මුල් පුරවැසි දුව

අප්පච්චි අමාත්‍යවරයෙක් අග්‍රාමාත්‍යවරයා සහ ජනාධිපතිවරයා සිටි කිසිදු වකවානුවක අපිව විදෙස් සංචාරයකට එක්කරගෙන ගොස් නැහැ. මේ වනතුරුත් මම කිසිදු රටක සංචාරය කරලා නැහැ. අප්පච්චි අසාමාන්‍ය විදියට මමත් අම්මාත් පිළිබඳව සොයා බලන කෙනෙක්. ඉතිං අම්මයි මමයි නිතරම හිතුවේ අපි අප්පච්චිගේ සංචාරවලට සහභාගි වුණොත් ඒවාට බාධාවක් වෙයි, ඒ නිසා ඔහුට නිදහසේ රාජකාරිය කරන්න ඉඩදිය යුතුයි කියලා. මම දන්න කාලෙක අප්පච්චි කවදාකවත් විනෝද සවාරි ගිහිල්ලා නැහැ. ඔහු ගියානම් ගියේ රාජකාරී ගමනක් විතරයි. නමුත් මමත් අම්මාත් ඉඳහිට කොහේ හරි ගියොත් අපිව ඇරලවන්න වගේම එක්කරගෙන යන්නත් තාත්තා එනවා. එහෙම අම්මයි මමයි යන්නෙත් ඉතිං වන්දනා ගමනක් තමයි. එකම එක වතාවක් අම්මයි මමයි දඹදිව යන්න සූදානමින් හිටියා. නමුත් ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ හදිසියේ වියෝව නිසා අපිට ඒ ගමන නතර කරන්න සිදුවුණා.

## නිල නිවාස කියන්නේ අම්බලම්..

අම්මයි මමයි කවදාකවත් අප්පච්චිගේ නිල නිවාසයක පදිංචියට ගිහිල්ලා නැහැ. අප්පච්චිට රාජකාරි කටයුතු නිසා සමහර වෙලාවට නිල නිවාස පාවිච්චි කරන්න සිදු වුණත් අපි ඒවට ගිහිල්ලම නැති තරම්. අප්පච්චි අග්‍රාමාත්‍ය ධුරයට පත් වුණාට පස්සේත් හිටියේ කලින් සෞඛ්‍ය අමාත්‍යවරයා අවදියේ පාවිච්චි කළ නිල නිවසෙමයි. කොයිතරම් රාජකාරි තිබුණත් අප්පච්චි හැම සති අන්තයකම අම්මයි මමයි ජීවත්වුණු පිළිමතලාවෙ ගෙදරට ආවා. ඒ ඇවිල්ලත් ඉතිං රාජකාරි වැඩ තමයි. එදාට ගමේ මිනිස්සුන්ගෙන් මේ ගෙදර පිරෙනවා. දවසක් අප්පච්චිට කකුලේ අමාරුවක් හැදුණා. අප්පච්චි මේ අමාරුව පිටින්ම පිළිමතලාවෙ එන්න සූදානම් වුණා. එදා මමයි අම්මයි අප්පච්චිව බලන්න නිල නිවසට යනවා. 'පුතා.. කැමති නැද්ද නිල නිවාසේ පදිංචියට එන්න..?' අප්පච්චි මගෙන් අහනවා. 'අනේ ඕවා අම්බලම් වගේ තැන් අප්පච්චි... අපි අපේ ගෙදර ඉමු..' මම අප්පච්චිට කියනවා. මට මතකයි ඒ කාලේ සමහර ඇමැතිවරුන්ගෙන් නිල නිවාස නැවත ලබාගන්න සෑහෙන කරදර වෙන්න සිදුවුණා කියලා. මොකද එයාලා තමන්ට උරුම ගෙවල් වහලා දාලා තමයි නිල නිවාසවල පදිංචි වෙන්නේ. අන්තිමට නිල කාලය ඉවර වුණාම අර හිටපු ගෙවල් පදිංචි වෙන්න බැරිතරම් ජරාවාස වෙලා. මම අප්පච්චිට කිව්වේ තාවකාලික තැන්වලට වඩා අපිට අපි ජීවත්වෙන ගෙදර හොඳයි කියලා. ඒ දේවල් ගැන මට කිසිම දවසක කිසිම ආසාවක් ඇතිවෙලා නැහැ. නිල නිවාස, මන්දිර කියන දේවල්වල වටිනාකමක් මටවත් අම්මාටවත් පොඩ්ඩක්වත් දැනිලා නැහැ.

මං පුංචි කාලේ අප්පච්චිට තිබුණේ හිල්මන් කාර් එකක්. ඒක තමයි හුඟක් කල් යනකල්ම අපේ ගෙදරට තිබුණ එකම වාහනය. ඊට පස්සේ වෑන් එකක් ගත්තා. තාත්තගෙ රාජකාරි කටයුතුවලට නිල වාහන තිබුණට අපි ඒවා පාවිච්චි කරලා තිබුණේ නැහැ. අප්පච්චිට ඕනේ වුණේ මාව ළඟින්ම තියාගෙන ඉන්න. අද ජීවතුන් අතර හිටියා නම් අදත් මං දිහා අර පුංචි කාලේ බලපු විදියටම බලයි. ඉතිං මම රස්සාවල් කරන්න ඕන කියලාවත් අප්පච්චි හිතුවේ නැහැ. දවසක් අප්පච්චිගෙන් කවුරුහරි අහලා තිබුණා දුවව පෞද්ගලික ලේකම් කරගන්නේ නැත්තේ ඇයි කියලා. ඊට පස්සේ අප්පච්චි ඕක මගෙන් ඇහුවා. 'අපිට හැමදේම තියෙනවානේ අප්පච්චි. තවත් පවුලක් නඩත්තු කරන්න පුළුවන් කෙනෙක්ට අපි ඔය රස්සාව දෙමු..' අප්පච්චි මගේ කීමට එකඟවුණා මිසක ඊට වඩා වචනයකින්වත් බලපෑමක් කළේ නැහැ.

## ජනාධිපති දුවගේ චිත්‍රපට පිස්සුව

අප්පච්චි සාමාන්‍ය මන්ත්‍රීවරයකුගේ කාලයේ පටන්ම හරිම කාර්යබහුලයි. ජනතාව වෙනුවෙන් දිවා රෑ නොබලා කැපවුණා. ඒ නිසා අපි විනෝද ගමන් ගිහිල්ලා නැහැ. කවදාකවත් ප්‍රභූ වරප්‍රසාද පාවිච්චි කරලා හෝටල්වල නතරවෙලා ඉඳලා නැහැ. අප්පච්චි කරන්නේ තමන්ව මුණගැහෙන්න එන මිනිස්සුන්ගේ ඕනෑ එපාකම් ඉටුකරන එක. අම්මයි මමයි ඒවාට සහයෝගය දීලා ඉතාම සරල සාමාන්‍ය ජීවිතයක් ගතකළා. අප්පච්චිට ඕනේ හැම වෙලාවෙම මිනිස්සු එක්ක රැඳෙන්න. හැබැයි ඒ මොන රාජකාරිය තිබුණත් හැම සිකුරාදාවකම තාත්තා ගෙදර එනවා. ඉස්සර මම හරි ආසයි චිත්‍රපට බලන්න. හින්දි චිත්‍රපට තමයි වැඩිපුරම බලන්නේ. එන හැම චිත්‍රපටයක්ම වගේ බලනවා. 'අප්පච්චි.. ලස්සන චිත්‍රපටයක් ඇවිල්ලා තියෙනවා.. බලන්න යන්නද?' 'පුතා යන්න. අම්මත් යනවා නේද?' අප්පච්චි එහෙමයි. කවදාවත් එපා කියලා නැහැ. ඒ වගේම කවදාකවත් මාව තනියම කොහේවත් යවලත් නැහැ. අප්පච්චි ඒ වගේ දේවල්වලට එන්නේ නැති වුණත් මට අම්මා එක්ක යන්න අවසර දෙනවා.

## හුදකලා ජීවිතේ

අප්පච්චි අගමැති විදියට දිව්රුම් දෙන දවසේ අම්මයි මාවයිත් එක්කරගෙන ගියා. මොකද ප්‍රේමදාස ජනාධිපතිතුමා අප්පච්චිට කියලා තිබුණා දුවවයි කුමාරිහාමිනෙයි දෙන්නම එක්කරගෙන එන්න කියලා. එදා තමයි බොහෝ දෙනෙක් ඩී. බී විජේතුංග කියන්නේ කසාද බැඳපු දරුවෙක් ඉන්න කෙනෙක් කියලා දැනගත්තෙත්. ඒ තරමට අපි දේශපාලනයෙන් ඈත්වෙලා හිටියේ. අප්පච්චි රටේ ජනාධිපතිවරයා දක්වාම පැමිණුනත් මට ලොකු සමාජ ඇසුරක් තිබුණේ නෑ. මැති ඇමැතිවරුන්ගේ දරුවන් සමඟ ලොකු සම්බන්ධතා තිබුණේ නැහැ. මොකද මම ජීවත්වෙන්නේ පිළිමතලාවේ අපේ ගෙදර. ඒ නිසා මට කිසිම කෙනෙක් මුණගැහිලා නැහැ. ඉම්ටියාස් බාකීර් මාකර්ගේ දරුවන් සමඟ නම් මට කිට්ටු සම්බන්ධයක් තිබුණා. ඇතැම් උත්සවවලදී ප්‍රේමදාස මහත්තයාගේ දුවවත් මුණගැහිලා තියෙනවා. ඒ හැරෙන්න මට ලොකු යාළු මිත්‍ර ඇසුරක් තිබිලා නැහැ.

## අපේ අප්පච්චිට ඡන්දෙ දෙන්න. ඈ...

මං හුඟක්ම චූටි කාලේ... එකම එක දවසක් ඡන්දය වෙනුවෙන් අප්පච්චියි අම්මයි එක්ක ගෙන් ගෙට ගියා. එතකොට තිබුණේ කොට්ඨාස ක්‍රමයනේ. තමන්ගේ කොට්ඨාසය තුළ පදිංචි වී සිටින හැම නිවසකටම යන්න ඕනේ. අපි ගියේ එක්තරා මුස්ලිම් ගම්මානයකට. අප්පච්චිගේ කාර් එක ගමට ඇතුළු වුණා විතරයි ගැහැනු පිරිමි සියලුම දෙනා ඇවිත් තාත්තව වටකර ගන්නවා. මාව දැකලා ඒ අය වාහනේ ළඟටත් එනවා. 'පුතේ...අත්දෙක එකතුකරලා වැඳලා අප්පච්චිට ඡන්දෙ දෙන්න කියන්න' අම්මා මට උපදෙස් දෙනවා. මමත් අත් දෙක එකතු කරගෙන 'අපේ අප්පච්චිට ඡන්දෙ දෙන්න ඈ...' කියනවාලු. ඊට පස්සේ එතන හිටපු අම්මලා මාව උස්සගෙන එහෙ මෙහෙ යනවාලු. අම්මා ඔය විත්තිය තාත්තට කිව්වට පස්සේ 'මීට පස්සේ කවදාකවත් ඔයාලා මේ වැඩවලට සම්බන්ධ වෙන්න එපා' කියලා අප්පච්චි අම්මට කියලා තිබුණා.

## ජනපතිගේ ඇස්වල කඳුළු

අපේ අප්පච්චි දේශපාලනයෙන් පැරදුණා කියලා කවදාකවත් කලකිරීමෙන් ඉඳලා නැහැ. 1970

**20 වන පිටුව බලන්න**

# ඓතිහාසික කළුතර පුරවරය



■ ජී. විනී ලයනල්

සමනොළ ගිරින් බුදු සමිඳුන්ගේ සිරිපද පහස ලබමින් නා නා මිණිරුවන් දොවා රුවන්පුර හරහා ගලා ගොස් කළු ගංගා ලාලනිය සමුදුරට වැටෙන මෝය අසල රමණීය පුලින තලාවක බුදු සමිඳුන්ගේ පූජනීයත්වය දෙගුණ තෙගුණ කරන ඉපැරැණි පුරවරයක් වෙයි. ඒ අනෙකක් නොව 'කාලතිත්ථ' හෙවත් 'කළුතර' පුරවරයයි. මෙය ඓතිහාසික හා ආගමික වශයෙන් වැදගත් නගරයකි.

අතීතයේ ශ්‍රී ලංකාව පාලනය කිරීමේ පහසුව සඳහා රට රුහුණු, පිහිටි හා මායා යනුවෙන් කොටස් තුනකට බෙදා තිබිණි. රුහුණ හා මායා දෙරටෙහි සීමාව වූයේ කළු ගඟයි. එකල කළුතර පුරවරය 'දේශාස්ත්‍ර කළුතර' හා 'වේලාපුර කළුතර' යනුවෙන් කොටස් දෙකකට බෙදා තිබිණි.

දේශාස්ත්‍ර කළුතර මායා රට පසු කොට රුහුණු රටට එතෙර වන ස්ථානයෙහි පිහිටි හෙයින් දේශාන්තර යන වචනයෙන් බිඳී ඇති අතර වේලාපුර යන්න සොලීන් විසින් මෙහි වැල්ලේ නුවරක් ඉදිකර තිබූ හෙයින් එය (වැල්ලේපුරය) වේලා වී යයිද විද්වතුන්ගේ මතයකි.

තවත් දක්ෂ විද්වතුන් දේවත්‍රෑ හෙවත් දෙවියන්ට සතුරු වූ විභීෂණාට අයිති ප්‍රදේශය වේලාපුර කළුතර යැයිද පවසති.

කළුතර බෝධීන් වහන්සේට නුදුරු වේලාතොට නම් ස්ථානයේදී සිදු වූ සුර-අසුර යුද්ධයක් ගැන ජන කතාවන්හි සඳහන් වේ. ඒ අනුව කතරගම දෙවියන් ප්‍රධාන සුරයන් හා විභීෂණ ප්‍රධාන අසුරයන් අතර යුද්ධයක් සිදු වී ඇතග මේ මහා සටනින් අසුරයන් පැරදී පලා ගිය බව කියවේ. සුරයන් ජයග්‍රහණය ප්‍රකාශ කර ඇත්තේ සැවුලෙකු වැනි පක්ෂියකුගේ රුව සහිත කොඩියක් එසවීමෙන් බව පැවැසේ. ජයග්‍රාහී වූ සුරයන් අසුරයන්ගෙන් පැහැර ගත් රන්මුවා අසිපතක් බෝධිරාජයාට දකුණු පසින් දැනට කළුතර නගර සභාව පිහිටා තිබෙන භූමි ප්‍රදේශයේ නිධන් කොට ඇතැයි ජන වහරේ සඳහන් වේ.

දකුණු දිග වෙරළේ පිහිටි අනිකුත් ස්ථානත් කළුතරත් අතර දේශගුණයේ ප්‍රධාන වෙනස්කම් දක්නට නොලැබුණත්, කළුතර ආශ්‍රිතව සුවදායක හිතකර දේශගුණයක් ඇත. ඒ බවට අතීත සාධකයන්ද ඇත. 5 වැනි සියවසේ අරාබි සංක්‍රමණික වෙළෙඳුන් නිරිතදිග මෝසම් සමයේදී දෙමසක පමණ කාලයක් කළුතර කලපුව අසල කුඩා නැව් නවතා විවේකය ගත කර ඇතග කලපුවට ඔවුන් සෙරන්ඩිබ් දේවාලය කියා හඳුන්වා ඇත. ඒ අනුව කළුතර අතීතයේ සිට ජනාවාසයක් හා කුඩා නැව් තොටක් ලෙස භාවිතයට ගෙන ඇති බව පැහැදිලිය.

රජරට චෝල ආධිපත්‍යයට යටත්ව පැවැති වකවානුවේ (ක්‍රි. ව. 993 - 11070) කළුතර පැරැණි රාජධානියකි. කළුතර බෝධිරාජයාට නුදුරුව රාජ මාලිගාවක් තනා ක්‍රි. ව. 1052 සිට රජවරුන් තිදෙනෙක් රජ කළ බව මහාවංශයේ සඳහන් වේ. ක්‍රි. ව. 1052 සිට වික්‍රම පාණ්ඩ්‍ය රජතුමා අවුරුදු එකක්ද, ක්‍රි. ව. 1053 සිට ජගත්පාල රජතුමා අවුරුදු හතරක්ද, ක්‍රි. ව. 1057 සිට මහ පැරකුම්බා රජතුමා කළුතර රාජධානිය කොට විසූ බව සඳහන් වේ. එයින් වික්‍රම පාණ්ඩ්‍ය රජු රුහුණු ජනපදයට අයත් කාලටිත්ථ අගනුවර කොට සිට ඇති බව සඳහන් වේ. වික්‍රම පාණ්ඩ්‍ය රජුගේ පාලනයෙන් පසු දඹදිව අයෝධ්‍යාහි සිට පැමිණි ජගත් පාල මොහු මරා රාජ්‍ය ලබාගත් බව කියවේ.

දෙවැනි පැරකුම්බා (1236 - 1271) රජතුමාගේ නියමය පරිදි දේව පතිරාජ ඇමැති විසින් කළුතර ප්‍රදේශයේ පාලම්, මංමාවත් තැනවී යැයිද දෙවන පැරකුම්බා රජතුමා කළුතර සිට බෙන්තොට දක්වා පොල් උයනක් කළ බවද චූලවංශයේ සඳහන් වේ.

## උඩමළුවේ බෝධිය

කළුතර උඩමළුවේ බෝධිය රෝපණය කර ඇත්තේ වික්‍රම පාණ්ඩ්‍ය රජතුමා බව සඳහන් වේ. එයට පසු කලෙක සීදුරුවැල්ලේ මේධංකර නම් හිමිනම විසින් එම බෝ රුකෙන් අංකුරයක් ගෙන බටහිර දෙසින් රෝපණය කර ඇත. දැනට පුද පූජාවලට පාත්‍ර වී ඇත්තේ එම බෝධියයි. එහි ගංගාරාමය කරවා ඇත්තේ සංඝබෝධි රජතුමාගේ රාජ්‍ය සමයේදී බව පැවසේ. ඇතමුන් මෙය ගංගාතිලකය නමින්ද හඳුන්වයි.

ක්‍රි. ව. 5 වැනි සියවසට අයත් සෙල්ලිපියක 'කලක මහ විහර' නම් වෙහෙරක් වූ බව සඳහන්ව ඇත. එය වූ කලී කළුතර පැවැති පුරාණ විහාරයයි. කළුතොට යනුවෙන්ද මයුර, තිසර, පරෙවි හා ගිරා සංදේශයන්හිද කළුතර ගැන සඳහන් වේ.

කළුතර අරාජික වුවද මෙහි වූ රජ මාලිගාව විනාශ වුවද බෝධිරාජයා අසල වූ විහාරස්ථානය ශීඝ්‍රයෙන් දියුණු වී ඇත. එහෙත් 16 වන සියවස මුල් භාගයේදී පෘතුගීසීන් විසින් ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ අල්ලා ගැනීමත් සමගම මෙම පූජනීය ස්ථානයට පිරිහීමේ යුගය ආරම්භ විය. ආක්‍රමණිකයෝ එම විහාරස්ථානය විනාශ කර දමා එහි තිබූ වස්තූන් පැහැර ගත්හ.

## කළුතර බලකොටුව

අනතුරුව පෘතුගීසී ඉංජිනේරුවකු වන ජෝග් ඩී ඇලබකර් මේ කුඩා කඳු ගැටය ගැන සිත යොමු කර බලකොටුව ගොඩ නැගූහ. ඒ වන විට ශ්‍රී ලංකාවේ පැවැති බලකොටු දොළොස අතර කළුතර බලකොටුව ගැන සඳහන් කර තිබීමෙන් පෙනෙනුයේ එම වර්ෂයන්ට පෙරාතුව එය නිම කොට තිබුණු බවය. පැරැණි තෝම්බුවකින් හෙළිවන පරිදි 1634 වන විට කළුතර සිටින ලද්දේ පෘතුගීසීන් පනහකට (50) අඩු සංඛ්‍යාවකි.

මෙම බලකොටුව කොළඹ, ගාල්ල අතර ඇති ප්‍රධාන ආරක්ෂිත ස්ථානයක් වේග කන්ද උඩරටින් එන තර්ජන වළක්වාලීමට මධ්‍යස්ථානය මෙය විය. මෙම ප්‍රදේශය මුලින්ම පාලනය වූයේ ආගමික පූජකවරයකු හා කපිතාන් වරයකු ද ඇතුළුව සොල්දාදුවන් 10 දෙනකුගෙන් යුතු කණ්ඩායමකිනි. කළුතර පුරවරයේදී පෘතුගීසීන්ගේ ආධාර ලැබූ ධර්මපාල රජුගේ සේනාංකයන් හා මායාදුන්නේ

21 වන පිටුව බලන්න

Alumni Association of the University of Peradeniya
Greater Toronto Area and Suburbs



The Alumni Association of the University of Peradeniya-GTA & Suburbs proudly presents

"Muditha"
Children-for-Children
Art Workshops & Exhibition

An exclusive and fascinating opportunity for children to expand creativity and artistic talents with guidance from a team of inspiring young artists and proudly exhibit their artwork to the public

- Participants: Children from 4 to 18 years of age under the categories of:

Junior (ages 4-7 years) | Middle (ages 8-12 years) | Senior (ages 13 – 18 years)

- Media: Chalk Pastel, Oil Pastel, Conté, Watercolour, Colour Pencil, Charcoal
- Developing artwork for exhibition: Each participant is expected to develop a piece of art at two (2) workshops guided by talented young artists; each workshop is of 3-hour duration.
- Workshop structure:
  - Workshops will be conducted on March 25 and April 8 (both Saturdays), from 3:00p.m. to 6:00 p.m. Location to be announced based on participation spread
  - Few themes will be announced at the 1st workshop; participants will choose one theme
  - Participants will be guided by young artists to improve their art work
  - Participants are expected to complete their art at the two workshops
  - All materials required for artwork will be provided at workshops
  - Refreshments/snacks will be provided to children at workshops
- Public Art Exhibition: Art completed by participants will be displayed at a public exhibition
- Exhibits: Exhibits will be offered to the parents of participants at the end of the exhibition
- Recognition: Each participant will be awarded a certificate of participation

**Exhibition is planned for convenient date after May 2017.**

Parents are kindly requested to contribute $10.00 per child to assist covering part of the expenses.

Please submit completed online enrollment form available at www.peradeniyalumnigta.com to confirm participation of your child/children on or before March 10, 2017.

This is a rare opportunity to unearth and showcase hidden talents of your children and usher them to become future citizens with an artistic sense.

The Alumni Association of the University of Peradeniya – GTA and Suburbs



# බටහිර වෛද්‍ය විද්‍යාවට අනුව ආහාර වල

# සීතල - උෂ්ණ කියල භේදයක් නෑ !

▪ **ආචාර්ය ආනන්ද චන්ද්‍රසේකර**

සමහර ආහාර සමහරුන්ට විෂයි. සමහරුන්ට අසාත්මිකයි. සමහරුන්ට අපත්‍යයි... ඒක ඒ ඒ ඇඟවල්වල රසායනික ක්‍රියාකාරීත්වය අනුව වෙන දෙයක් විතරයි.

ශ්‍රී ලාංකිකයන් වන අපි ආහාර ගැනීමේදී අනුගමනය කරන ආහාර පුරුදු, විශ්වාස හා මත විවිධය. ඒ හැම එකක්ම එක්කෝ අත්දැකීම් මත පදනම් වූ ඒවාය. එක්කෝ විශ්වාසය මත පදනම් වූ ඒවාය. එහෙමත් නැත්නම් අපේ චිරන්තන සම්ප්‍රදායානුකූල ගති සිරිත් හෝ විවිධ වෛද්‍ය ගුරුකුල මත පදනම් වූ ඒවාය.

ඒ අනුව අපි සමහර ගුණාත්මක හෝ ඉහළ මාංශ ජනක ආහාර ගණනාවක්ම 'උෂ්ණ ආහාර' ලෙස සලකා ප්‍රතික්ෂේප කරන්නට පුරුදුව සිටිමු. ඒ අයුරින්ම තවත් ආහාර වට්ටෝරුවක් 'ශීතල ආහාර' ලෙස පිටු දකින්නටත් අපි සූදානම්ය. තවත් සමහර ඒවා 'විෂ' සහිත බව කියමින් ගන්නේ නැත. තවත් ජාති කිහිපයක් නොකන්නේ 'සෙම බහුල' යැයි කියාය. ඔය අතර 'පිළිකා කාරක' යැයි කියමින් අහලකට වත් නොගන්නා ආහාර වර්ගද කිහිපයකි.

**සැබැවින්ම මේ මතවාදවලට හා විශ්වාසවලට පදනමක් තිබේද? අද අපි ආචාර්ය ආනන්ද චන්ද්‍රසේකර සමග කතාබහ කරන්නේ අපේ ආහාර රටාව හා ආහාර පුරුදු තුළ ගැබ්ව ඇති මේ විශ්වාස හා මතවාදවලට විද්‍යාත්මක පදනමක් තිබේද යන කාරණයයි.**

මේ ගැන කතා කරනකොට අපිට සමාජ, ආර්ථික, සංස්කෘතික හා දේශපාලනමය කරුණු ගණනාවක් අපේ ආහාර රටාවන් හැඩ ගස්වන්න හේතු වෙනවා. සමහර ආහාර වර්ග අපිට ගන්නත් නොගන්නත් මේ හේතු වැදගත් වෙන බව ඇත්ත වගේම... ආර්ථිකය කියන එක හරි වැදගත්. සමහරුන්ට සමහර ආහාර වර්ග ගන්න බැරි, මිල අධික නිසා... ඒ වගේම තමයි සංස්කෘතික හේතු. ආගම හෝ විශ්වාස මත පදනම් වෙලත් සමහර අය මස් මාංශ ගන්නේ නැහැනේ. ඔන්න ඔය සාධක අපිට වෙනස් කරන්න බැහැ. ආහාරවලට තමන්ගේ සමාජ තත්ත්වය, ආර්ථික හැකියාව, ආගම, විශ්වාස, පන්ති පසුබිම, දේශපාලන පසුබිම ආදියත් බලපානවා. ඒත් අපි අද කතාබහ කරන්නේ ඒ එකක්වත් ගැන නොවෙයි. ආහාර ගැන අපේ සමාජයේ තිබෙන වැරදි ආකල්ප, මතවාද හා විශ්වාසයන් ගැන ටිකක් කතා කරන්නයි අපි අද උත්සාහ දරන්නේ.

මම මේ සංවාදයට එළැඹෙන්නේ බටහිර වෛද්‍ය විද්‍යාව මත පදනම් වුණ විද්‍යාත්මක හා පර්යේෂණාත්මක පදනමක ඉඳගෙන. පළමුවෙන්ම කිව යුතුයි මේ තුළින් මම කිසිවිටෙකත් ආයුර්වේදයේ හෝ වෙනත් දේශීය වෛද්‍ය විද්‍යාවක උගන්වන විශ්වාසයක් හෝ මතවාදයක් ගැන කතා කරන්නේ නැති බව. මොකද, ඒ පිළිබඳ මට දැනුමක් නැහැ. මම කතා කරන්නේ අපේ බටහිර වෛද්‍ය විද්‍යාව හෝ විද්‍යාත්මක මතවාද මත පදනම් වුණ පෝෂණ විද්‍යාව මත ඉඳගෙන විතරයි.

ඒ මතවාදවලට අනුව යමෙකුට සමහර ආහාර ගන්න බැරි අවස්ථා 3 ක් අපට හමුවෙනවා. ඒ තමයි,

- ආහාර විෂ වීම (Food poisoning)
- ආහාර අසාත්මිකතාව (Food allergy)
- ආහාර අපත්‍යවීම හෝ අසහනය (food intolerance)

සමහර අය තුළ විවිධ මත තියනවා ආහාර ගැන. අපි අහල තියෙනවානේ සමහරු බල මාළු කන්න එපා කියනවා උෂ්ණයි කියලා. දැල්ලෝ හා ඉස්සෝ ගැනත් සමහරු කියන්නේ කන්න එපා හරි උෂ්ණයි කියලයි. ඒ වගේම සමහර දරුවන්ට අම්මලා තාත්තලා එළකිරි බොන්න දෙන්නේ නැහැ ශීතලයි කියලා. ඇඹුල් කෙසෙල් කෑවාම සෙම හැදෙනවා කියනවා. කොළකැඳ ශීතලයි කියල සමහර අයට දෙන්නේම නැහැ. තක්කාලි කන්න එපා කියනවා උෂ්ණයි කියලා. එක්කෝ ඇසිඩ් කියනවා. අපි අද සලකා බලන්නේ මෙන්න මේවා ගැන. ඒත් එක්කම මුදවපු කිරි කෑවාම බඩේ අමාරු හැදෙනවා කියලත් කියනවානේ. පාන් පිටි බහුලව කෑවම බඩ දනවානේ සමහරුන්ට.

අපි කතා කරමු ඇත්තටම ඇයි මේවා මෙහෙම වෙන්නේ කියලා. බලමු මේවා මෙහෙම වෙන්න පුළුවන්ද කියලා. මේවා ඇත්තද... මේවා බොරුද... පදනමක් තියනවද... අපි කතා කරමු.

මේ ඔක්කොම ගත්තාම විශ්වාස. හැබැයි අපි ඉහත කියපු කාරණා තුන ඇතුළේ මේ ඕනම විශ්වාසයක් ගැන හොඳ විද්‍යාත්මක පදනමක ඉඳල කතා කරන්න පුළුවන්. දැන් අපි ඒ තුළින් මෙතෙක් කලක් අපි තුළ ආහාර වර්ග ගැන තිබ්ච්ච වැරදි ආකල්ප හා සැක සංකා දුරු කරගන්න උත්සාහ කරමු.

අපි පළමුව බලමු කොහොමද ආහාර විෂ වන්නේ කියලා. යම් ආහාරයක් විශේෂයෙන්ම මස්, මාළු, බිත්තර වර්ගයක් ඊට අදාළ හෝ ආවේණික නියමිත කාලය ඉකුත් වුණාට හෝ නිසි ආරක්ෂණ ක්‍රමවේදයකට ඇතුළත් නොවුණාම හෝ කල්තබා ගැනීමේ ක්‍රමවේදවල අඩුපාඩු වුණාම විවිධ අහිතකර බැක්ටීරියා හා දිලීරවල බලපෑමට එය නතු විය හැකියි. එබඳු පිටස්තර විෂකට බැක්ටීරියාවකට දිලීරයකට විවෘත වුණ ආහාරයක් ගත්තාම එය ශරීරයට අහිතකර බලපෑම් ඇති කරනවා. සමහරුන්ට වමනය යනවා. සමහරුන්ට බඩඑළිය යනවා නොනවත්වාම. එය ඒ රෝගියාගේ ඇඟේ ශක්තිය හා ප්‍රතිශක්තිය අනුව වෙනස් විය හැකියි. මෙය අපි ආහාර විෂ වීම හැටියටයි සලකන්නේ.

ආහාර අසාත්මිකතාව (Food allergy) කියන්නේ ආහාරවල තිබෙන යම් යම් රසායනික සංයෝග අපේ සමහර අයගේ ශරීරයේ තිබෙන රසායනික සංයුතිය සමග ප්‍රතික්‍රියා නොකරන විට ඇතිවන තත්ත්වයක්. විශේෂයෙන්ම සමහර ප්‍රෝටීන් වර්ග තිබෙනවා සමහර ශරීරවලට පමණක් ඔරොත්තු නොදෙන. එහෙම ශරීරවලට එක එක අසහනයන් ඇති වෙනවා. සමහරුන්ට හිස කකියනවා. සමහරුන්ට වමනය යනවා. සමහර අයට ඇඟ කසල පලු දානවා. තව සමහර අයට ඇදුම වගේ හුස්ම ගැනීමේ අපහසුතා ඇති වෙනවා. කලාතුරකින් සමහරු හුස්ම ගැනීම අපහසු වී මරණයට පවා පත්වන අවස්ථා තියනවා. සමහර අය 'කරප්පන්' කියල කියනවා. එබඳු ආහාර හඳුනාගෙන නොකා ඉන්න එක තමයි හොඳ. පිටින් එන බාහිර දේවල්වලින් ශරීරය ආරක්ෂා කරන්න ශරීරය තුළ හැදිල තියන රසායනික ආරක්ෂණ පද්ධතියක් නිසා තමයි එහෙම වෙන්නේ. හරියට කොම්පියුටරයක වෛරස් ගාඩ් එකක් වගේ.

තුන්වන එක තමයි වැඩියම දක්නට ලැබෙන්නේ. ආහාර අසහනය. ආහාර අපත්‍යවීම (Food intolerance) කියල කිව්වාම පැහැදිලියි. මෙතනදී වෙන්නේ සමහරක් ආහාර වර්ගවල තිබෙන රසායනික කොටස් ශරීරය තුළදී පරිවෘත්තීය ක්‍රියාවලියට අවශ්‍ය කරන රසායනික ද්‍රව්‍ය එම ශරීරයේ නොමැති නම් එම ආහාර ප්‍රතික්ෂේප කිරීමයි. ශරීරය එතනදී සංවේදී වනවා. එවිට විවිධ රෝග තත්ත්වයන් ඇති වනවා. පාන් පිටි වල තිබෙන ග්ලූටන් කියන රසායනිකය ශරීරයේ නැති වුණාම බඩේ ගෑස් පිරෙනවා. බඩ දනවා. බඩඑළිය යනවා. විවිධ සංකූලතා ඇති වෙනවා. කිරිවල ලැක්ටෝස් කියන සීනි නිසාත් සමහර ශරීරවලට මේ සංකූලතාව ඇති වෙනවා.

කිරි බොන විට සමහර අයට බඩ පුරවල දානවා. සමහරුන්ට බඩඑළිය යනවා. ඒකට හේතුව කිරි ශීතල නිසා නොවෙයි. කිරිවල තියන ලැක්ටෝස් දිරවන්න අවශ්‍ය රසායනික සංයෝගය ඇඟේ නැති නිසයි.

සමහරු කියනවා කිරි හොඳ නැහැ කිරිවල සෙම කියලා. මේකත් මිථ්‍යාවක්. සමහර අයට කිරි බිව්වාම උගුරේ සෙම ගතියක් ඇති වෙන්නේ අසාත්මිකතාව නිසා. නැත්නම් ආහාර අසහනය නිසා. මෙය හැමෝටම තියන තත්ත්වයක් කියල ගන්න හොඳ නැහැ. එක එක ශරීරවල ඔරොත්තු දීමේ හැකියාව එක එක ආහාරවලට වෙනස් නේ.

මෙන්න මේ තත්ත්වයන් තුන මත තමයි ආහාරයක් ඇඟකට ඔරොත්තු නොදෙන්නේ, ආහාරයක් ඇඟකින් ප්‍රතික්ෂේප වන්නේ. හැබැයි හැමෝටම මේ තත්ත්වය තියනවා කියල හිතන්න නරකයි.

දැන් ඇඹුල් කෙසෙල් වුණත් සමහර අයට සෙම වගේ එන්නේ එය ජීර්ණය කිරීමේදී ඇඟ තුළ ඇතිවන අසාත්මිකතාවක් නිසයි.

සමහර අය කියනවානේ ඉස්සෝ, දැල්ලෝ, බලමාළු උෂ්ණයි කියලා. ඒ උෂ්ණ වන්නේ ඒවායේ තියෙන ප්‍රෝටීන් ශක්තිය ඉහළ නිසා ශරීරයේ ඇතිවන ප්‍රතික්‍රියාව නිසායි.

සමහර වේලාවට මාළු, ඉස්සෝ, දැල්ලෝ වගේ කෑමවල තිබෙන ප්‍රෝටීනවල ක්ෂුද්‍ර ජීවී ක්‍රියාකාරීත්වය හරි ඉහළයි. මේ ඉහළ බව නිසා හිස්ටමින් කියන රසායනික සංයෝග යක් ඇති වෙන්න පුළුවන්. එය සමහර ශරීරවලට විෂයි. හිස්ටමින් වැඩි වුණොත් ඇඟ කසන, පලු දමන, කබ ගලන, දහඩිය දමන, ඇඟ රත් කරන ගතිය වැඩියි. සමහර දකුණේ අය බල මාළු කනකොට, ඉස්සෝ දැල්ලෝ කනකොට පොල් ගාලා අරන් ඒවත් එක්ක කනවා. ඒ තුළින් මේ රසායනික ක්‍රියාකාරීත්වය අඩු කරනවා කියල කියනවා.

අලුත් මාළුවල හිස්ටමින් අඩුයි. මාළු පරණ වන විට හිස්ටමින් ක්‍රියාකාරීත්වය වැඩියි. දකුණේ ඇඹුල්තියල්වල හිස්ටමින් ක්‍රියාකාරීත්වය නසන ප්‍රතික්‍රියාවක් ඇඹුල්තියල් මිශ්‍රණය තුළ තිබෙනවා.

කැඳ වර්ග ශීතලයි, සෙම තියෙනවා කියල කියන්නේත්, කෙසෙල් ගෙඩි වර්ග ශීතලයි කියල කියන්නේත් බොරුවක්. මේක තියෙන්නේ සමහර ශරීරවලට විතරයි. ඕනම ශරීරයක තියෙනවා ආරක්ෂක පද්ධතියක්. අලුත් ආහාර වර්ග ශරීරයට ගන්න කොට ඒ ආරක්ෂක පද්ධතිය විසින් චෙක් කරනවා මෙය ශරීරයේ පරිවෘත්තිය ක්‍රියාවලියට ගැලපෙනවද නැද්ද කියලා. එම ආහාර ජීර්ණයට අවශ්‍ය රසායන ද්‍රව්‍ය නැත්නම් ඔන්න යම් යම් ප්‍රශ්න ඇති කරනවා. හරියට වෛරස් ගාඩ් එකක් කම්පියුටරයක ක්‍රියා කරනවා වගේ දෙයක් තමයි මේ. මේක හැම ශරීරයකටම පොදු දෙයක් නොවෙයි.

ආහාරවල ශීතලයි කියල දෙයක් හෝ උෂ්ණයි කියල දෙයක් බටහිර වෛද්‍ය විද්‍යාව අනුව නැහැ. හැබැයි සමහර අයට අසාත්මිකතා තියනවා කියල විතරක් තේරුම් ගත්තාම ඇති.

ඒත් එක්කම ආහාර ගන්න කොට ගෙදර හැමෝම එකට එක්වෙලා ආහාර ගැනීම හරිම වැදගත්. ටී.වී. බල බලා කෑම කන එක නරක ආහාර පුරුද්දක්. මොකද මිනිස්සු සතුටු වන ක්‍රම තියෙනවා. ටී.වී. වල නාට්‍ය නිසාත් මිනිස්සු සතුටු වෙනවා. ආහාර ගන්න කොටත් මිනිස්සු සතුටට පත්වෙනවා. ටී.වී.වල නාට්‍ය බල බල කෑම කනකොට සතුටට පත් වන්නේ කෑම නිසාද, ටී.වී. එක නිසාද කියලා තේරුම් ගන්න මොළයට බැරි වෙනවා. වැරදි සංඥාවක් ගියොත් ආහාර නිසා සතුටට පත්වෙනවා කියලා මිනිස්සු ආහාර ගන්න තරම වැඩි කරනවා. ඒක නරක පුරුද්දක්. ටී.වී. බල බලා කෑම කන්නේ නැතුව ගෙදර ඔක්කොම එකට කෑම මේසෙ කෑම කනවා නම් සෞඛ්‍යයටත් හොඳයි. නිවසේ සාමයටත් හොඳයි.

**සාකච්ඡා කොට සකස් කළේ බුලිත ප්‍රදීප් කුමාර**

# HAVE A BUSINESS IDEA !

**If you're thinking of starting a business, we can help you with developing and preparing your business plan.**

**Not only do we write business plans, but we also guide you through registering your business and helping your with accounting and taxation needs.**

**We provide a full range of accounting, tax and business advisory services for all types of businesses.**

## Accounting & Bookkeeping services

- Financial statement preparation
- General ledger preparation
- Cash flow projections
- Invoicing and billing
- Budget and forecast reports
- Audit assistance
- Payroll services

## Tax

- Corporate Tax Preparation
- Personal Tax Preparation
- Payroll tax
- HST/GST
- Filing and Assistance with CRA

## Business Advisory

- Business plan preparation
- Business name registration
- Business Incorporation
- Feasibility report preparation

**For friendly, reliable and confidential services.**

**Please contact Anura or Yacintha**

**PYNAX ACCOUNTING AND BUSINESS SOLUTIONS**

Phone - 416- 264- 6850
647-789-7990
18 Bedle Avenue, Toronto, ON, M2H 1K8
www.Pynax.com
Email: yp@bell.net

## Silvy Fernando, LL.B.

**Barrister, Solicitor & Notary Public**



Lawyer for:

- Personal Injury
- Home Refinance, Purchase, and Sale
- Family Law
  (Legal Aid Certificates Are Accepted)
- Debt Recoveries/Debt Settlement
- Immigration
- Landlord/Tenant Issues
- Power of Attorneys and Affidavits
- Wills
- Notarizing and Commissioning

Unit 111 – 7800 Woodbine Avenue, Markham, ON L3R 2N7

Tel: 416-272-6587 Email: silvy@sflegal.ca

EVERYTHING MORTGAGES
LIC#12755
www.everythingmortgages.ca



**We'll Target The Best Rates!**

Why won't your bank give you the best interest rate? Call our team today or apply online and learn how we can negotiate a better rate than your banks can offer you! We work hard to give you the best options so you can make an informed decision.

**Mortgage Renewals and Refinancing**

First Time Homebuyer? Mortgage coming up for renewal? We can help you save money!

**Investment Properties**

Looking to invest in a second piece of property? Thinking about a vacation or recreational property? We can help!

**Safe and Secure Application**

Use our easy to comlpete online mortgage application form if you're looking to buy, renew, refinance or need a pre-approval for your next property purchase.

**Manzeel Patel**
Mortgage Broker - M11002628

**Direct: 647-272-8355**

Suite 704 – 1500 Don Mills Road,
Toronto, ON M3B 3L7

T 416 - 840 - 6368
F 416 - 850 - 5153

info@everythingmortgages.ca
www.everythingmortgages.ca

Attrell TOYOTA Brampton Auto Mall



Lease or Finance from 0%

Selected 2017 Vehicles

ඉක්මන් කරන්න ඉක්මන් කරන්න මේ අවස්ථාව ඔබටයි

ඔබ කැමති වාහනය ඉතා විශ්වාසවන්තව, හොඳ වට්ටම් සහිතව
ලබා ගැනීමට සිංහල භාෂාවෙන් කතා කරන ජේ (JAY) හමුවන්න.
ඔබට විශේෂ ත්‍යාගද හිමිකර ගැනීමට අවස්ථාව සැලසෙනු ඇත.



Call Jay : 647 - 893 - 9661
110 Canam Crescent Brampton ON L7A 1A9




■ සිරිසේන විතානගේ

# අව්‍යය පද හා විශේෂණ පද

ව්‍යය යනු වෙනස් වීමයි. අව්‍යය යනු වෙනස් නොවීමයි. නාම පද හා ක්‍රියා පද විභක්තීන් හි වර නැගීමෙන් හෝ ඒකවචන, බහුවචන භේද ගැනීමෙන් හෝ ප්‍රථම, මධ්‍යම, උත්තම යන පුරුෂ ගැනීමෙන් හෝ ස්ත්‍රී ලිංග, පුරුෂ ලිංග ගැනීමෙන් හෝ අතීත, අනතීත යන කාල ගැනීමෙන් හෝ වෙනස්කම්වලට භාජන වෙතත් අව්‍යය පද එබඳු වෙනසකට භාජන නොවීම නිසා ඒවාට එම නම ලැබී ඇත. 'සමඟ' යනු අව්‍යය පදයකි. එය ඉහත කී කිසිදු වෙනසකට භාජන නොවේ.

### මෙබඳු අව්‍යය පද දෙවර්ගයකි.

1. නිපාත පද
2. උපසර්ග පද යනුවෙනි.

### නිපාත පද

වාක්‍යයක මුල, මැද, අග යන කවර තැනක හෝ යෙදී විවිධ අර්ථ ප්‍රකාශ කරන පද නිපාත පදයි. පහත කළු අකුරු පද යෙදී ඇති සැටි බලන්න.

- **යළි** නුඹ මෙහි එන්නෙහිද? (මුල)
- හමුදාව යාපනය **තෙක්** ගමන් කළහ. (මැද)
- නියඟය කෙත් වතු පාළු කළේ **ය.** (අග)

මේ නිපාත පද විවිධ අර්ථ හැඟවීම සඳහා යෙදෙයි. පහත වගුව බලන්න.

| අර්ථය | නිපාත |
|---|---|
| කාලය | නිතර, නැවත, ඉඳහිට, කලාතුරකින්, සැණින්, වහා, පෙර, පසු |
| සීමාව | තුරු, දක්වා, තෙක්, පටන්, සිට, අතර |
| ප්‍රමාණය | තරම්, පමණ, සා, විතර |
| සංසන්දනය | ම, තමා, ල, ලු |
| නැත යන්න | නො |
| පද සම්බන්ධ කිරීම | ද, ත්, යි, හා, සහ, සමග, කැටුව |
| විකල්ප අරුත් ගැළපීම | නොහොත් |
| අනියමාර්ථය | නම්, හොත් |
| වෙන්වීම | විනා, මිස, හැර, මුත් |
| භාවාර්ථය | අනේ! අහෝ! අයියෝ! අහා! |
| සමාන බව දැක්වීම | හෙවත් |
| ආමන්ත්‍රණය | එම්බල, එම්බා |
| වාක්‍ය අලංකාරය | වනාහී, වූකලී |
| වාක්‍ය සමාප්තිය | ය |
| උපමා දැක්වීම | සේ, වැනි, බඳු, අයුරු, මෙන්, වගේ, ලෙස |

පහත නිපාත, වැකිවල යෙදෙන අයුරු බලන්න. සෑම වැකියකම නිපාත පද තද පැහැ අකුරින් දැක්වෙයි.

- ඔහු **නිතර** එහි ගියේ **ය.**
- අපි **නැවත** හමුවෙමු.
- සූර්යග්‍රහණ සිදුවන්නේ **කලාතුරකිනි.**
- ශිවා **ඉඳහිට** ලංකාවට පැමිණෙයි.
- සඳ නැඟී **සැණින්** හිරු පළා ගියේය.
- අම්මාට අමාරුයි. **වහා** ගමට එන්න.
- බසය **එනතුරු** බලා සිටින්න.
- මේ දුම්රිය බදුල්ල **දක්වා** නවත්වන්නේ නැත.
- මම මරදාන **තෙක්** පයින් ගියෙමි.
- මා රෝගී වූයේ එතැන් **සිට** ය.
- වෙහෙසීම **ම** අසනීපයට හේතු විය.
- කමල් **ද** පියල් **ද** පළමු වන තැන ගැනීමට තරග කළහ.
- ඔබ**ත්** මම**ත්** එකට ගමන් කරමු.
- කොළඹ **සහ** මාතර **අතර** අධිවේගී මඟක් ඇත.
- ඔබ නොයන්නේ **නම්** මම යමි.
- පාලකයන් අවංක **වුවොත්** රට දියුණු වේවි.
- ජයගෙන **මිස** ආපසු **නො** එමු.
- තමන්ට තමන් **මුත්** අන් කවුරුන්ද?
- **අනේ !** ඔහුට සිදු වූ දේ.
- **අහෝ !** අපට කාගේ පිහිටද?
- **අයියෝ !** මා නැති වුණා.
- ඇගේ මුවමඬල සියපතට **හෙවත්** පියුමට සම කළ හැකිය.
- එම්බා **මිනිසුනි**, තෙපි අසරණයන්ට පිහිට වව්.
- කැලණි ගඟ **වූකලී** අසිරිමත් ගංගාවකි.
- කෝප වූ ඔහුගේ මුහුණ මේකුළක **අයුරු** දැක්වීය.

### උපසර්ග පද

නාම පදයක හෝ ක්‍රියා පදයක මුල, මැද, අග යෙදී අරුත් ගැන්වෙන නිපාත පද මෙන් නොව මුල පමණක් යෙදී අර්ථ ගැන්වීම උපසර්ගවල විශේෂත්වයයි. මෙසේ උපසර්ග මුලට යෙදී නාමපදවල විරුද්ධ අර්ථ ගැන්වීම ක්‍රියාපද හෝ නාමපදවල අර්ථය වැඩි කිරීම හෙවත් බැබළවීම, අර්ථය වෙනසකට පත් කිරීම යන කරුණු සිදුකරයි.

1. ඇතැම් විට නාම පදයේ විරුද්ධ අර්ථය දෙයි.

| උපසර්ගය | නාමපදය | උපසර්ගය එක්වූ විරුද්ධ පදය |
|---|---|---|
| අව | ගුණ | අවගුණ |
| අව | මඟුල් | අවමඟුල් |
| පර | සිරිත් | පරසිරිත් |
| පර | දේශ | පරදේශ |
| නි | කෙලෙස් | නිකෙලෙස් |
| නි | දුක් | නිදුක් |
| අ | පමණ | අපමණ |
| අ | සත්‍ය | අසත්‍ය |
| අප | කීර්ති | අපකීර්ති |
| දු | සිරිත් | දුසිරිත් |

2. ඇතැම් විට නාම පදයේ හෝ ක්‍රියා පදයේ අර්ථය බබළවයි. අර්ථය වැඩි කරයි.

| උපසර්ගය | නාම/ක්‍රියා පදය | උපසර්ගය එක්ව අර්ථය බැබළවූ පදය |
|---|---|---|
| සු | මිහිරි | සුමිහිරි |
| සු | දන | සුදන |
| උ | දුල | උදුල |
| උ | ගැනීම | උගැනීම |
| ප | බල | පබල |
| ප | බඳ | පබඳ |
| ස | සල | සසල |
| සු | පිරි | සුපිරි |

3. ඇතැම් විට නාම පදයේ හෝ ක්‍රියා පදයේ අර්ථය වෙනස් කරයි.

| උපසර්ගය | නාමපදය | උපසර්ගය එක්ව අර්ථය වෙනස් කළ පදය |
|---|---|---|
| පිළි | වදන් | පිළිවදන් |
| පිළි | රුව | පිළිරුව |
| අබි | රහස | අබිරහස |
| අබි | දම් | අබිදම් |
| අබි | නික්මන | අබිනික්මන |
| අනු | බුදු | අනුබුදු |

ඉහත දැක්වූ උපසර්ග පදවලට අමතරව දක්නට ලැබෙන තවත් උපසර්ග හා ඒවා එක්ව සැදුණු පද පහත දැක්වේ.

- දු - දුදන, දුබල, දුසිරිත්, දුගඳ
- වි - විදෙස්, විමල, විපුල
- අදි - අදිටන්, අදිරද
- පිරි - පිරිපුන්, පිරිසිදු, පිරියත්
- උප - උපවන, උපගුරු, උපචාර
- අප - අපවාද, අපකීර්ති, අපගමන
- ඔ - ඔවදන්
- ඉ - ඉමහත්, ඉමිහිරි, ඉපැරණි
- නිර් - නිර්නාමික, නිර්වාණ, නිර්මල
- සං - සංවේදී, සංතාප, සංදර්ශන
- ප්‍රති - ප්‍රතිගාමී, ප්‍රතිවේද, ප්‍රතික්‍රියා
- අති - අතිමහත්, අතිධාවන, අතික්‍රම

ඉහත උපසර්ග එක්ව පදයන්හි විරුද්ධාර්ථ ප්‍රකාශ කරන්නේද? අර්ථය වැඩි කරන්නේද? අර්ථය වෙනස් කරන්නේද? යන්න වාක්‍යවල යෙදීමෙන් වටහා ගත හැකිය. පහත වැකි දෙස බලන්න.

- දු - **දුසිරිත්** හැර දමව්.
- වි - **විදෙස්** බලවේග හොල්මන් කරයි.
- පිරි - **පිරිසිදු** ජලය බීමට ගනිමු.
- උප - සමන්ත **උපගුරු** තුමෙකි.
- අප - බීමත්කම නිසා ඔහු **අපකීර්තියට** පත් විය.
- ඔ - වැඩිහිටියන්ගේ **ඔවදන්** ගරු කරමු.
- ඉ - ඒ සුවඳ **ඉමිහිරිය.**
- නිර් - මිනිසුන් **නිර්ලෝභී** විය යුතුය.
- නිඃ - වගාවට හොඳ ජල**නිඃශ්‍රිත** බිමිය.
- සං - කලාකරුවාට **සංවේදී** මනසක් අවශ්‍යය.
- අති - **අතිධාවනය** පරිහානියට මුලයි.
- ස්ව - දැන් අපි **ස්වතන්ත්‍ර** පාලනයක් ගෙන යන්නෙමු.

### විශේෂණ පද

නාම පදයක හෝ ක්‍රියා පදයක විශේෂ ගුණයක් ගැන විස්තර කෙරෙන පද 'විශේෂණ පද' යනුවෙන් හැඳින්වේ. 'ළමයා' යන්න නාම පදයකි. එයට 'හොඳ ළමයා' යි 'හොඳ' යන ගුණය එක් කිරීමේදී එය විශේෂණ පදයකැයි කියමු. මෙලෙසම 'නරක ළමයා, ලස්සන ළමයා, කීකරු ළමයා' ආදි වශයෙන් විශේෂණ පද යොදා ළමයාගේ ස්වභාව විස්තර කළ හැකිය. එපරිදිම 'දිව්වේය' යන්න ක්‍රියා පදයකි. දිවූ ආකාරය විස්තර කර දැක්වීම සඳහා එයට 'වේගයෙන්, හෙමින්' ආදි විශේෂණ පද එක් කළ හැකිය.

1. නාම විශේෂණ
2. ක්‍රියා විශේෂණ යයි විශේෂණ පද වර්ග දෙකකි.

### නාම විශේෂණ

නාම පදයක විශේෂත්වය දැක්වීම සඳහා යෙදෙන විශේෂණ පද නාම විශේෂණ පදයි. ඉහත දැක්වූ හොඳ, ලස්සන, කීකරු ආදි විශේෂණ පද ළමයා නමැති නාම පදය හා එක්ව යෙදෙන බැවින් ඒවා නාම විශේෂණයි. යෙදෙන ආකාරය අනුව නාම විශේෂණ කොටස් හතරකි.

1. ගුණ නාමයන් වශයෙන් යෙදෙන විශේෂණ
   උදා - උස ළමයා, පරණ පොත, ලස්සන ගවුම
2. තද්ධිත නාමයක් වශයෙන් යෙදෙන විශේෂණ
   උදා - රසවත් ආහාරය, දිරිමත් මිනිසා, සෙල්මුවා පිළිමය
3. කෘදන්ත නාමයක් වශයෙන් යෙදෙන විශේෂණ
   උදා - ඉදුණු ගෙඩිය, පිපුණු මල, නටන ළමයා
4. සංඛ්‍යාවක් වශයෙන් යෙදෙන විශේෂණ
   උදා - දස පාරමිතා, පස්පව්, සිව් වේද, සත් පියුම්

### ක්‍රියා විශේෂණ

ක්‍රියා පදයකට විශේෂත්වය දැක්වීම සඳහා යෙදෙන විශේෂණ පද ක්‍රියා විශේෂණ පදයි. මුලදීම දැක්වූ වේගයෙන්, හෙමින් ආදි විශේෂණ පද 'දිව්වේය' යන ක්‍රියා පදය හා එක්ව යෙදී ඇති බැවින් ඒවා ක්‍රියා විශේෂණයි.

උදා- ගුරුතුමා කරුණාවෙන් උගන්වයි.
අම්මා තම පුතු සෙනෙහසින් සිප ගත්තාය.
ළමයි පන්තියේ නිශ්ශබ්දව සිටියහ.

### අභ්‍යාස

1. උපසර්ග පද එක් කොට පහත වගුව සම්පූර්ණ කරන්න.
2. උපසර්ග පද 20 ක් තෝරාගෙන ඒවායේ අරුත් පැහැදිලි කරන්න.

| නාමපදය | උපසර්ගය | උපසර්ගය සහිත නව පදය |
|---|---|---|
| මිහිරි | .................................... | .................................... |
| විස්තර | .................................... | .................................... |
| රහස් | .................................... | .................................... |
| මානය | .................................... | .................................... |
| පවන | .................................... | .................................... |
| නම්බුව | .................................... | .................................... |
| හඬ | .................................... | .................................... |
| ශිෂ්ට | .................................... | .................................... |
| පුත් | .................................... | .................................... |
| රාග | .................................... | .................................... |

3. පහත දැක්වෙන නිපාත පද අර්ථය පැහැදිලි වන සේ වාක්‍යවලට යොදන්න.

යළි, වනාහී, සඳහා, හෙවත්, කැටුව, අහෝ, විනා, ද, සා, එම්බල, සහ, නොහොත්, වූකලී, මෙන්, වහා, හැර, පිණිස, නො, බඳු

4. නාම විශේෂණ විස්සක් දක්වා ඒවා වාක්‍යවල යොදන්න.
5. ක්‍රියා පද සමග ක්‍රියා විශේෂණ දහයක් ලියන්න.

**ලබන කලාපයෙන් සිංහල පාඩම තවදුරටත් හදාරමු**

# රට සවාරි ගිහිල්ලා නැති,...

14 වන පිටුවෙන්

ඡන්දෙන් අප්පච්චි සුළු ගණනින් පැරදුණා. 'පුතා.. මං පැරදුණානේ...' කියාගෙන එදා ගෙට ගොඩවුණු තාත්තා කොස්ස අරගෙන ගේ අතුගාන්න පටන් ගත්තා. ඒත් 89 කලබල කාලේ අප්පච්චි හුඟාක් කලකිරීමට පත්වුණා. මට මතකයි එක දවසක් පාන්දරම උඩුනුවර ඒ ජී ඔෆිස් එකට ගිනි තියලා කියලා අපට ආරංචි වුණා. එදා අප්පච්චි පොල්ගහවෙල අත්තම්මා (අම්මාගේ මව) නැතිවුණා හා සමානව ඇඬුවා. මට මතක ඇති කාලයක අප්පච්චි හුඟක්ම දුක්වුණු සිදුවීම තමයි ඒ.

## විධායක ජනාධිපතිවරයකුගේ වත්කම්

අපේ අප්පච්චි දේශපාලනය කරලා ලැබුණ වැටුප වියදම් කරලා අද අපි ජීවත්වන නිවස හැදුවා. මේ මුළු භූමියේ ප්‍රමාණය පර්චස් 24 යි. අපිට විදෙස් ගිණුම්වල මුදල් තැන්පතු නැහැ. ඒ වගේම රට වටේම ගෙවල් නැහැ. අප්පච්චි එයාගේ වැටුපෙන් මට කියලා යම් ප්‍රමාණයක් එකතු කළා. දැන් මම ජීවත් වන්නේ ඒ මුදලට ලැබෙන පොලියෙන්. අම්මා මියගියාට පස්සේ තාත්තාගේ විශ්‍රාමික වැටුප ලැබෙන්නේ නැහැ. අදත් මට ජීවත්වෙන්න අවශ්‍ය මුදල් ලබෙන්නේ මගේ අප්පච්චි එදා මං වෙනුවෙන් සුළු මුදලක් ඉතිරි කළ නිසයි. අදටත් ඩී. බී විජේතුංගගේ දුව නිසා මට විශාල පිළිගැනීමක් ලැබෙනවා. කොහේ ගියත් තාත්තට ආදරය කරන කවුරුන්ම හෝ මුණගැසෙනවා. එහෙම සැලකිලිවලින් නම් අඩුවක් නැහැ.

## අම්මයි අප්පච්චියි මමයි කියන්නේ උණ ගහක පුරුක් වගේ

චූටි කාලේ ඉඳන්ම මම කවදාකවත් අම්මගෙන් වෙන්වෙලා නැහැ. අම්මා මියයන තුරුම අම්මා එක්ක එකම ඇඳේ නිදාගත්තේ. අසනීප වෙලා අම්මව ඉස්පිරිතාලේ එක්කරගෙන ගියාම අම්මා මිය යයි කියලා අපි හිතුවේ නැහැ. ඒ වෙද්දි අම්මට වඩා හුඟක් අසනීප තත්ත්වෙන් හිටියේ අප්පච්චි. අම්මට අමාරුයි කියලා දැනගන්න ලැබුණාම මම හිතුවේ මටත් ඒ එක්කම මොනාහරි වෙයි කියලා. අම්මයි අප්පච්චියි මමයි කියන්නේ උණ ගහක පුරුක් වගේ. පුදුම බැඳීමක් තිබුණේ. ඒත් අම්මා නැති වුණා කියන ආරංචිය ලැබුණ සැණින් මට මතක් වුණේ අප්පච්චිව. අප්පච්චි හිටියේ අසනීපෙන්. එයාව බලාගන්න ඕනේ මම. අප්පච්චිට මම මේ කම්පනය දැනෙන්න දෙන්නේ නෑ කියලා මම හිතා ගත්තා. ඇත්තටම ඊට පස්සේ ගෙවුණු අවුරුදු 3 අප්පච්චි ජීවත් වුණේ මං හින්දා කියලා මට හිතෙනවා. චූටි දරුවෙක්ව බලාගන්න අම්මා කෙනෙක් වගේ මම අප්පච්චිව බලාගත්තා. අප්පච්චිගෙයි අම්මාගෙයි අවසාන කාලයේ මම ඒ දෙන්නා ළඟ හිටියා කියන අප්‍රමාණ සතුට අද මට තියෙනවා. සමහර විට විවාහ ජීවිතයට ඇතුළත් වෙලා හිටියා නම් මට මේ කැපකිරීම කරන්න බැරිවෙයි. ඕන රෑක 'දුව...' කිව්වම මම අම්මා ළඟ. අප්පච්චි මාව දැක්කේ නැති වුණාම 'පුතා...' කියනවා. මම මහ රෑ 3 ට විතර දුවගෙන යනවා අප්පච්චිගේ කාමරේට. 'පුතා තවම නිදිය ගත්තේ නැද්ද? පුතා නිදා ගන්න. මාත් එහෙනම් නිදා ගන්නවා' තාත්තට අවුරුදු 90 ව සම්පූර්ණ වුණාට පස්සෙත් මේ වගේ මං ගැන පුදුමාකාර විදියට හොයා බැලුවා. හදිසියකින්වත් මම විවාහ වෙලා හිටියා නම් දෙමාපියන්ට මෙහෙම සලකන්න ලැබෙන්නේ නැහැ.

## බුලත් හෙප්පුවට සීමා වුණු ඇමැති ආදරේ

විවාහ යෝජනා නම් හිසේ කෙස් ගානට ඇවිල්ලා ඇති. ඉස්කෝලෙ කාලේ නම් කොහොමටත් එහෙම දේවල්වලට කැමතිවෙන්නේ නැහැනේ. ඉස්කෝලෙන් අස්වෙච්ච දවසේ ඉඳලම යෝජනා ආවා. බුලත් හෙප්පු දෙන්නත් දෙක තුනකටම ගිහින් තියෙනවා. ඇමැති කෙනෙකුත් ආවා. එයාට බුලත් හෙප්පුවකුත් දුන්නා. ඒත් ඇයි දන්නේ නැහැ. මගේ හිත ගියේම නැහැනේ. අප්පච්චි ඒකට කැමති වෙන්න කියලා නම් හුඟක් කිව්වා. අප්පච්චිට මේ ගැන දුකක් තිබුණා. 'අපි නැති කාලෙක පුතා තනිවෙයි' කියන දුක අප්පච්චිට තිබුණා. කොහොමහරි මම අම්මාට තේරුම් කරලා දුන්නා. මගේ හඳහන 100% ක් හරි. ඉතිං මම අම්මාට කිව්වා මගේ හඳහනට 100% ක් ගැලපෙන කෙනෙක්ව හොයන්න කියලා. අපි දන්න හඳහන් බලන කෙනෙක් ඉන්නවා බෙන්තර පැත්තේ. එයාට හඳහනක් දුන්නම හඳහන පැත්තකින් තියලා බුලත් කොළ ටික දිහා බලාගෙන පලාපල කියනවා. ඉතිං ඒ ගෑනු කෙනා මගේ පලාපලේ හරියටම කීවලු. එදා පලාපල විස්තරේට අප්පච්චි ගැන තමයි කියලා තිබුණේ. 'මේ කේන්ද්‍රේට අනුව මේ දරුවාගේ පියා මේ රටේ දෙවැනි පුරවැසියා වෙනවා'. කියලා කේන්ද්‍ර බලපු කෙනා කියලා තිබුණා. අපි හීනෙකින්වත් හිතලා නැහැ අප්පච්චිට අගමැතිකම ලැබෙයි කියලා. එතකොට මට අවුරුදු 30ක් විතර ඇති. ඊට පස්සේ ඒ කෙනා කියලා තිබුණේ 'මේ දරුවට බලෙන් විවාහයක් කරලා දෙන්න එපා. මෙයාගේ හඳහන පිනට බරයි. මේ පිනට ගැලපෙන කෙනෙක් හොයන්න අමාරුයි' කිව්වා.

## විවාහ වෙන්නයි යුද්ධෙට යන්නයි කාටවත් බලකරන්න එපා

අප්පච්චිට හිතවත් කෙනෙක් දවසක් යෝජනාවක් අරගෙන ඇවිත් තියෙනවා. ඒ ආපු කෙනා 'ඔහොම කියලා බැහැනේ. දුව තනි වෙනවානේ. එයා විවාහයක් කරගන්න ඕනේ' කියලා අප්පච්චිට කියලා තිබුණා. 'විවාහ වෙන්නයි යුද්ධෙට යන්නයි කාටවත් බලකරන්න එපා' කියලා අප්පච්චි ඒ පුද්ගලයට කියලා තිබුණා. ඉතිං මම තේරුම් ගත්තා අප්පච්චිත් මේ දේ වටහාගෙන ඉන්නවා කියලා. ඒක මට ලොකු සැනසීමක් වුණා.

## සෙල්ලම් බතට දානේ උයපු පුංචි උපාසක අම්මා

ඒ දවස්වල අපේ ගෙදරට නෑයන්ගේ ළමයින් එනවා. අපි ඔක්කොම එකතුවෙලා සෙල්ලම් කරනවා. හැමෝම කඩ දානවා. සෙල්ලම් ගෙවල් දානවා. කෝම්පිට්ටු හදනවා. මාත් සෙල්ලම් ගෙයක් හදාගන්නවා. හැබැයි මම උයන්නේ කෝම්පිට්ටු නෙමෙයි. මම පන්සලට දානේ උයනවා. චූටි චූටි වළන්වලට දානය හදාගෙන ඒවත් ඔළුව උඩ තියාගෙන පන්සල් යනවා. පන්සල තිබුණේ අපේ ගේ ළඟින් ගලාගෙන යන වතුර පාරක් ළඟ. එතන ගුහාවක් හදලා වෙසක් කාඩ් එහෙම තියලා පන්සලක් හදනවා. ඔතනට ගිහින් හාමුදුරුවන්ට දානෙ බෙදන එක තමයි මගේ රාජකාරිය. මේක දැකලා අම්මට හිතුණාලු මේ දරුවා නම් සාමාන්‍ය දරුවෙක් නෙමෙයි. සෙල්ලම් බතටත් දානය උයනවා කියලා.

## පුතා දේශපාලනයට කැමතිද?

අප්ච්චි දවසක් මගෙන් ඇහුවා පුතා දේශපාලනයට කැමතිද කියලා. ඒත් මං කරබාගෙන හිටියා. එතකොට අප්පච්චි මගේ මූණ දිහා බලාගෙන කිව්වා ඉස්සර කරපු දේශපාලනය දැන් කරන්න බැහැ. පුතාට මේක ගැළපෙන්නේ නෑ කියලා. අප්පච්චිලාගේ කාලේ එයාලා තනතුරු බැබළවූවා මිසක් තමන් බැබලුණේ නැහැ. මෑතකදිත් මට දේශපාලනයට එන්න කියලා ආරාධනා ලැබුණා. ඒත් තාත්තා දේශපාලනය කළා කියලා දේශපාලනය මගේ බූදලයක් නෙමෙයි. එහෙම දේශපාලනයට එන්න මේ කාලය හරි නැහැ. මට සියයට සියයක් දේශපාලනික පසුබිම තියෙනවා. නමුත් දැන් කරන දේශපානය කරන්න මට සුදුසුකම් නැහැ. මොකද මට කවදාකවත් බොරුවක් කියන්න බැහැ. මට කවදාකවත් තැන තැන කාටවත් අපහාසවන ආකාරයට කතා කරන්න බැහැ. මිනිස්සු රවටන්න බැහැ.

## අප්පච්චි හීනෙන් ඇවිත් කියපු රහස

අප්පච්චි මියගියාට පස්සේ විටින් විට මට හීනෙන් පෙනිලා තියෙනවා. මම මානසික තැවුලක ඉන්නවා නම් අප්පච්චි ඇවිත් මට විසඳුම් ලබා දුන් අවස්ථා තියෙනවා. අප්පච්චිගේ ආශීර්වාදය මට අදටත් ලැබෙනවා. පහුගිය ජනාධිපතිවරණයට කලින් දවසක මම මහා පුදුම හීනයක් දැක්කා. අපේ ගෙදර සෙනඟ පිරිලා හිටියා. අප්පච්චියි අම්මයි එහෙට මෙහෙට දුව දුවා ඒ සෙනඟට සංග්‍රහ කරනවා. මහා විශාල කැවුම් වගයක් අපේ ගෙදර හදලා තිබුණා. ඒ වෙලාවේ මම අප්පච්චි ළඟට ගිහින් අහනවා 'මේ පාරත් අපි පරදියිද අප්පච්චි' කියලා. 'නෑ පුතා මේ පාර මංගලයි කරුයි ඉන්නවානේ. බයවෙන්න දෙයක් නැහැ පක්ෂය නැඟිටිනවා' මේ ප්‍රකාශය හරිම පැහැදිලිව අප්පච්චි හීනෙන් ඇවිත් කිව්වා. ඊට පහුවදා මෛත්‍රීපාල මහත්තයා පොදු අපේක්ෂකයා විදියට එකතුවුණා. අප්පච්චිට ලොකු හීනයක් තිබුණා ප්‍රධාන පක්ෂ දෙක එකතු වෙලා රටට යමක් කරන්න. අද මේ තියෙන දේශපානලය අප්පච්චිගේ හීනයක් සැබෑවීමක්.

## සසර මග..

මම ප්‍රාර්ථනා කරන්නේ හැකි ඉක්මනින් මේ සංසාර ගමන කෙළවර කරන්න ලැබෙන්න කියලා. ඒ ප්‍රාර්ථනාවෙන් තියපු අඩිය ආපස්සට නම් තියන්නේ නැහැ. අපේ ගෙදර කොහොමටත් එදා ඉඳලාම තිබුණේ බෞද්ධාගමික පරිසරයක්. මම ධර්මානුකූල ජීවිතයකට හුඟක් නැඹුරු වුණා. මට ජීවිතේ තනිකමක් කියලා දැනෙන්නේ නැහැ. මේ නිදහසට මම හරිම කැමතියි. මට අම්මයි අප්පච්චියි ළඟ මැරෙනකල්ම හිටියා කියල සතුට තිබෙනවා. පුළු පුළුවන් හැටියට මම සමාජ සේවා කටයුතු කරගෙන යනවා. අප්පච්චි දේශපාලනය කළේ කුලය මලය පක්ෂය ජාතිය වගේ දේවල් බලලා නෙමෙයි. අද වනතුරු අප්පච්චිට පක්ෂ විපක්ෂ කිසිම කෙනෙක් බනින්නේ නැහැ. එවැනි දේශපාලනයක් ගැන හිතනවා මිසක මේ දේශපාලනය කරන්න නම් මං ළඟ සුදුසුකම් නැහැ. කලාතුරකින් ලැබෙන දුර්ලබ මනුෂ්‍ය ජීවිතය ආගමානුකූලව ගතකරලා සසර ගමන කෙළවර කර ගැනීම තමයි මගේ අවසන් අරමුණ.

---

# ව්‍යවස්ථාව ජනමත...

6 වන පිටුවෙන්

ව්‍යවස්ථාව ප්‍රකාර ප්‍රමාණවත් වන බව කිව යුතුය. ඒ හැරත් නිදහසේ සිට මෙතෙක් ශ්‍රී ලංකාවේ පැවති කිසිදු ව්‍යවස්ථා වෙනසකදී ජනමත විචාරණයකට ගොස් නැති බවද සිහිපත් කළ යුතුය.

මෙවැනි කරුණු ඉදිරිපත් කරමින් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගෙන ඒම වළක්වා ලන්නට ඔවුනට අවශ්‍යව ඇත්තේ එහි අන්තර්ගත විධායක ජනාධිපති බලතල අහෝසි කිරීම නිසාම පමණක් නොවේ. මෙහි ඇති මැතිවරණ ක්‍රමය සංශෝධනය කිරීම වැනි කරුණුද ඊට බලපා තිබේ. යෝජිත නව මැතිවරණ ක්‍රමය ක්‍රියාත්මක වූ විට පෙර පැවති ආසන මට්ටමට ගොස් ආසන දිනා ගැනීමද තමන්ට එතරම් පහසු නොවන බව මොවුහු දනිති.

කෙසේ වෙතත් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පිළිබඳව ජනාධිපතිවරයාට හෝ රජයට හුඹස් බියක් ඇතිකර ගැනීමටද අවශ්‍ය නොවන්නේ ජනමත විචාරණයකදී අන් කුමන කරුණු ගැනවත් නොසිතා මේ දූෂිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කටු ගා නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් බිහිකර ගැනීමට ජනතාව අනිවාර්යයෙන්ම කැමැත්ත පළ කරන බැවිනි. එහිදී දේශපාලන පක්ෂ ආදි සෙසු කරුණු කිසිවක් ජනතාවට වැදගත් නොවන හෙයිනි. පසුගිය ජනාධිපතිවරණයේදීත් නව ජනාධිපතිවරයාට ඡන්දය දුන්නේ අන් කිසිදු දෙයක් බලාගෙන නොව දූෂිත විධායක ජනාධිපති ක්‍රමය හා මැතිවරණ ක්‍රමය ඇතුළු රටට අහිතකර කරුණු ඇතුළත් පවත්නා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් කොට නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගෙන එන බවට ඔහු දුන් පොරොන්දුව නිසා බව නොදන්නෝ කවුරුද?

යම් හෙයකින් එසේ නොවී නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ඉදිරිපත් නොකොට විධායක ජනාධිපති ධුරය හා පවත්නා ඡන්ද ක්‍රමය එලෙසම තබාගෙන යළි ජනාධිපතිවරණයකට හෝ මැතිවරණයකට ඉදිරිපත් වීම නම් අන්තරාදායක බව කිව හැකිව තිබේ.

# කාන්තාව කෙරෙහි...

7 වන පිටුවෙන්

ඔක්කොම. ඔබට බැහැ එක පියවරක් ඉදිරියෙන් ළිඳක් ඇති බව දැකගන්න. එවැනි ඔබ අනාගතයේ කුමක් දකින්නදැ" යි ඇය ආර්කිමිඩීස් අමතා පැවසුවාය.

නමුත් දෙදෙනාම හෝ දෙකම අඩුව සම්පූර්ණ කරන හෝ ඌනපූරක අංග වෙති. ඇතැමෙකුට අහසේ දිස් වන තරු දැක ගැනීමේ අවශ්‍යතාවයය. ළිඳට ඇද වැටීමේ අවදානම, අනතුර තිබියදී පවා, ඇතැමෙකුට ළිඳ දෙස බැලීමට අවශ්‍යය. අනිත් කාරණය, ජීවිතය ව්‍යාකූල විය හැකිය. ඉතින්, මාගේම හැඟීම් හෝ ආකල්පය වන්නේ පිරිමියා සහ කාන්තාවන් ඌනපූරක හෝ සංපූරක සහ ඔවුන්ව උත්තරීතරත්වයේ හා අභ්‍යන්තරිකව ප්‍රභේදයන්ට බෙදා හෝ වෙන්කොට දැක්වීම නොකළ යුතුයග ඔවුන් අඩුව සම්පූර්ණ කරන සත්ත්ව කොටසක් විය හැකිය.

නිසැකයෙන්ම පිරිමියා හුදකලා වී ඇත්තේ කාන්තාව හුදකලා වී ඇති අයුරින්මය. ඔවුන් එකට එක්වනුයේ සනීපයෙන් සිටින හෝ සමස්ත නියමිත වූ ක්‍රියා කරන අවයවයන්ගෙන් යුත් අය ලෙසිනි. ඒ මක්නිසාද යත්, මම බෙහෙවින්ම ආදරයට ගරු කරන කෙනෙක්මිග ආදරය යනු මිනිසා සහ ගැහැනිය එක් නොබෙදූ, සාකල්‍යයෙන්ම ඔවුන්ගේ තනි තනි ස්වභාවය හෝ පුද්ගලිකත්වය අහිමි කර ගැනීම මෙන්ම ඔවුන්ගේ ආත්ම සහ ප්‍රථමවරට එහි පිරිමියෙකුත් නැති, ගැහැනියකුත් නැති, ශක්තියක් පමණක්ම සහ පිදුම් ලැබිය යුතු සුපිරිසිදු ශක්ති ප්‍රභේදයක් නිර්මාණය වීමය. එතැනදී නිතැතින්ම වඩාත් බලවත් හෝ වැදගත් හෝ සැලකීම් ලැබිය යුත්තේ පිරිමියාද නොඑසේ නම් කාන්තාවද යන ගැටලුව මත ආදරය නිර්මාණය නොවීමත් විශේෂයෙන් කැපී පෙනේ.

Osho Book ˙ ‘ The Last Testament, Vol ˙ 04’

■ ආර්. සී. චතුහේන

## බින්දුවේ හාස්කම්

නස්රුදීන් පිටරටක වරායක් ළඟ ඉන්නකොට ඒ රටේ මිනිස්සු එතන මහා වාදයක් වගේ කතාවකට පැටලිලා. ඒ අය තම තමන්ගෙ දැනුම අවබෝධය ඉගෙනීම ගැන මහා කතාවක්. මේ කතාවලට මහාද්වීප පහේම රටවල් ඇතුළත් කරනවා නිදසුන්වලට. සියල්ලෝම යහළුවෝ නිසා නස්රුදීන් අහගෙන ඉන්නවා. එක් අයෙක් හිටිගමන් නස්රුදීන්ගෙන් ඇහුවා.

"සහෝදරය, ඔයාලගෙ රටේ අය නේද ගණන් ශාස්ත්‍රයයි, බින්දුවයි ලෝකෙට හඳුන්වලා දුන්නේ"

ඒක අහල නස්රුදීන් මෙහෙම කීවා

"ගණන් සාස්තරේ ගැන නම් මං කියන්න දන්නෙ නැහැ. හැබැයි බින්දුව නම් හොයාගත්තෙ අපේ අය තමයි"

"ඒ කොහොමද එහෙම වුණේ...." එතන සිටි අයෙක් ඇහුවා.

"මේකනේ, අපේ අය කරන්නේ අනුන්ගේ දෙයක් අනුන්ට විකුණලා ගාන හොයාගන්න එකනේ...."

"ඉතිං අනුන්ගේ දේවල් විකුණන අය බින්දුව හොයා ගත්තේ කොහොමද?"

"මෙහෙමයි...." නස්රුදීන් උත්තර දුන්නා.

"අපේ අය මොනවා හරි ගන්නකොට බින්දුව මුලට දාල ගන්නෙ. හැබැයි මොනවා හරි දෙනකොට දෙන්නෙ බින්දුව අගට දාලා. ඔන්න ඔහොමයි බින්දුව හම්බ වුණේ..."

## දර්ශනවාදයේ උපත කොතනද?

එකල සිටි දර්ශනවාදීන් අතර නස්රුදීන්ට හිමිවුණේ ඉහළ නැනක්. ඒ වගේම නස්රුදීන් මදි නොකියන්න ගැහැනියයි මී විතයි ආශ්‍රය කළා. ඔහු ඉහළ පවුල්වල ලස්සන තරුණියො සමග මධුසාදවලට සහභාගි වුණ වාර ගණන නිමක් නැහැ.

දිනක් පුවත්පත්වල පළවෙලා තිබුණ පුවතක් දැකල නස්රුදීන්ගෙ පියාගේ කෝපයේ රතු කට්ට පැන්න. පුවත වුණේ නස්රුදීන් මුහුදු වෙරළේ රූමත් නළඟනකගේ තුරුළේ නැළවුණා කියන සිද්ධියක්. පියා වහාම තමා හමුවන ලෙස නස්රුදීන්ට පණිවිඩයක් යැව්වා. නස්රුදීන් පණිවිඩ ප්‍රකාර පියා හමුවට පැමිණියා පමණයි පුපුරණ කෝපයෙන් පියා නස්රුදීන්ට දොස් තබන්න පටන් ගත්තා. කාන්තාවන් සමග එසේ ප්‍රසිද්ධියේ හැසිරීම් තදබල වරදක් බවත් දර්ශනවාදියෙක් වැනි රට පිළිගත් අයෙක් එසේ හැසිරීම ගැන හිතාගන්නවත් බැරි බවත් පියා දොස් පවරමින් කීවා. තවදුරටත් කතා කළ පියා කීවේ එසේ කාන්තාවන් සමග මධුවිතත් අරන් හැසිරෙන්න ගියොත් අනාගතයේදී දර්ශනවාදී හැඟීම් පහළ වෙන්න කොහෙත්ම ඉඩක් නොලැබේවි යන්නයි.

මෙතෙක් වේලා බිම බලාගෙන පයින් පොළවේ ඉරි ඇඳ ඇඳ උන්න නස්රුදීන් හිස නොඔසවාම මෙහෙම කීවා.

"මම ඔය සියලු දර්ශන පහල කර ගත්තේ ගැහැනියයි මී විතයි තුළින්. මේ දෙක නොතිබුණා නම් නස්රුදීන්ට මොන දර්ශනවාදද...?"



# නස්රුදීන් කියවමු

## බියකරුම පාපය

මේ කාලය වනවිට නස්රුදීන් හිටියෙ දේශකයෙක් ලෙසට. ඔහු ගමක් ගානේ දේශන පවත්වමින් ගියා. මෙහෙම යනකොට එක ගමකදී ඔහු දැක්ක නීතියෙන් වරදකරු වෙලා මරණයට නියම වුණ වරදකරුවෙක් ඝාතන ස්ථානයට කැඳවාගෙන යනවා.

නස්රුදීනුත් ඝාතන ස්ථානයට ඇදෙන මිනිසුන් සමග ගියා මේ මරණය ගැන බලාගන්න. යන ගමන් ඔහු මේ අවාසනාවන්ත වරදකරු දිහා බැලුවා. ඔහුගේ ශරීරය සම්පූර්ණයෙන්ම වදමල්වලින් සරසල හිසෙත් වදමල් ඔටුන්නක් පළඳවලා. ඔහු ගියේ හරිම අපහසුවෙන්. ඔහු දැඩි ලෙස වේදනාවෙන් පෙළෙන බව දකින ඕන කෙනකුට තේරුම් ගන්න පුළුවන්. නස්රුදීන් කල්පනා කළේ මේ අසරණයා එකපාරටම මරණයට පත් නොකර ඇයි මේ විදියට වද දෙන්නෙ කියල.

වධක ස්ථානයේදී කීපදෙනෙක්ම දේශනා පැවැත්තුවා. හැමදෙනාම පාපේ පව්කාරයට ගල් ගහන්නත් අත හෝදගන්නත් පසුබට වුණේ නැහැ. ඒත් දේශකයෙක් ලෙසට ප්‍රසිද්ධ නස්රුදීන් කළේ ඝාතනය ගැන විග්‍රහයක් ඉදිරිපත් කිරීම පමණයි.

"මිනී මැරීමේ ක්‍රම කීපයක්ම තියෙනවා. එක ක්ෂණික කෝපය නිසා, දෙක ආත්මාරක්ෂාවට කියල බයටම කරන ඒවා, තුන කුමන්ත්‍රණය කරල කරන ඒවා, හතර උසාවියක් මගින් නඩු අහල. මේ කොයි ක්‍රමයට කළත් ඒ හැම එකක්ම ඝාතනයක්"

"එතකොට ඔය හතරෙන් වඩාත්ම භයානක එහෙම නැත්නම් වැඩිදෙනෙක්ම ප්‍රාණඝාත පාපය සිදු කරගන්න ක්‍රමය මොකක්ද?" කෙනෙක් ඇහුවා.

"නඩු අහල මරණ එක....." නස්රුදීන් උත්තර දුන්නා.

## අස්වාභාවිකත්වයේ ස්වභාවය

දිනෙන් දින ලෝකයේ ජනගහනය අධික වීම ගැනත් ඒ නිසාම සම්පත් හිඟයකට මුහුණ පෑමට වීමක් ගැන රාජ්‍ය ලේඛනාගාරයේ දේශනා පෙළක් තිබුණා. එක් එක් දේශකයා ආහාර, ඇඳුම්, සෞඛ්‍යය, නිවාස, අධ්‍යාපනය, ජලය වැනි එක් එක් කරුණුගෙන මේ තත්ත්වය විග්‍රහ කළා.

ඊළඟට එළඹුනේ නස්රුදීන්ගෙ කතා වාරය. ඔහුත් කීවේ මේ ලෙසට ලෝකය ගමන් ගත්තොත් නම් ප්‍රශ්නය එන්න එන්නම උග්‍ර වේවි කියල. හැබැයි එසේ තත්ත්වය උග්‍ර වෙන්න හේතුවත් ඔහු පෙන්නුවා.

මිනිසා අස්වාභාවික විදියට කෑම බීම, ඇඳුම් පැළඳුම්, ඉඳුම් හිටුම්, යාම් ඊම් කරන නිසයි මේ ඔක්කෝම. මනුස්සයින් අස්වාභාවිකත්වය අත් හැරල ස්වභාවික වුණොත් දැනුත් ලෝකය ස්වයං පෝෂිතයි.

# ඓතිහාසික...

15 වන පිටුවෙන්

සේනාංක අතර ගැටුම් ඇති වූ බව ලිත ඉතිහාසයේ සඳහන් වේ.

ක්‍රි. ව. 1640 දී අවසන් භාගය වන විට පෘතුගීසීන් හා ලන්දේසීන් අතර මුලික ගැටුම් ඇති විය. මේ නගරය අත්පත් කර ගැනීම සඳහා දරුණුතම යුද්ධය ඇති වී ඇත්තේ කළුතර කලුවාමෝදරදී ය.

පෘතුගීසීන් පළවා හැර රට එක්සේසත් කිරීමට සිංහල රජවරු ලන්දේසීන්ගෙන් සහාය පැතූහ. එයින් සිදුවූයේ ඉඟුරු දී මිරිස් ගැනීමකි. මේ නිසා පෘතුගීසීන්ගෙන් ලත් ගැහැටට වඩා ගැහැටක් ලන්දේසීන්ගෙන් සිංහලයන්ට සිදුවිය.

ක්‍රි. ව. 1645 දී මේජර් ජනරාල් හල්ෆ්ස් (HULFT) ප්‍රධාන ලන්දේසි හමුදාව විසින් පෘතුගීසි බලකොටු ආක්‍රමණය කර ඔවුන් පලවා හැර පාලනය සියතට ගත්තේය. ඒ අවස්ථාවේ බලකොටුව තුළ පෘතුගීසි පදිංචිකරුවන් 225 දෙනකු හා ප්‍රැන්සිස්කාස් නිකායේ දිස්ත්‍රික් ආගමික නායකයකුද විය.

ක්‍රි. ව. 1656 දී පෘතුගීසි පාලනය ලන්දේසීන්ට මුළුමනින්ම නතුවීමෙන් අනතුරුව බලකොටුවද ලන්දේසීන් සතු විය. එසේ යටතට ගත් පෘතුගීසි බලකොටුව ලන්දේසීන් නව සැලසුමක් යටතේ පාලන මධ්‍යස්ථානයක් ලෙසට පත් කෙරිණ.

ලන්දේසි පාලනයේ මුල් කාලය පිළිබඳ තොරතුරු දැන ගැනීම සඳහා ජර්මන් ජාතික ක්‍රිස්තොෆ් ස්කිපයර් (CHRISTOPH SCHWEITZER) මහතාගේ දින පොතද උපකාරී වේ. ඔහු පෙරදිග වෙළෙඳ සංගමය යටතේ සේවය කළ අයෙකි. පහතින් දැක්වෙන්නේ ඔහුගේ දින පොතෙන් උපුටා ගත් කොටසකි.

'1677 අප්‍රේල් 22 වැනි දින කොළඹ සිට ලිග් 08 ක් දුරින් පිහිටි කළුතරට බළකොටුවේ හේවායින් 30 දෙනකු මා යටතේ දිවා සේවයේ යෙදුන අතර රාත්‍රි කාලයේ ඔවුන් ආරක්ෂිත සේවයේ යෙදෙව්වේය. එම අවුරුද්දේ අප්‍රේල් මාසයේ සිට සැප්තැම්බර් මාසය දක්වා අප එහි රැඳී සිටියේය. එහි ප්‍රධාන නිලධාරියා ඇඩම්ස් සෙලෙක්ය. එකල ආණ්ඩුකාරයා වූයේ රයිට් ලොක් වෑන් ගුන්ස් මහතාය'

ලන්දේසීන් යටතේ කළුතර පිළිබඳ පළමු සටහන ලෙස දැක්වෙනුයේ ලන්දේසි පෙරදිග ඉන්දියා සමාගමේ සේවය කළ කිස්ටෝපර් ස්වේට්ෂර් නමැති සංචාරකයකු විසින් 1677 අප්‍රේල් 22 වැනිදා තිබූ සටහනකිනි.

'හමුදා භටයන් 30 ක් සමඟ මා කළුතර කොටුවට යවන ලදී. අපගේ රාජකාරිය වූයේ තිබෙන කොටු පවුරට අලුතෙන් තව පවුරු එකතු කිරීමයි. මෙය පෘතුගීසීන් විසින් අටවන ලද කොටු පවුර නැවත සකස් කිරීමකි. මේ බලකොටුව සෑදීම සඳහා ගල් ගෙනාවේ පෙරදිගින් කුරුඳු තෙල් සහ අනෙක් කුළුබඩු වර්ග ගෙන ගොස් ඕලන්දයේ සිට හිස්ව එන නැව්වලිනි. ඒ නැව් හිස් නිසා ඒ මේ අත සැලීමට පටන් ගනී. ඒ නිසා ඒ නැව් බර කිරීම සඳහා මෙම ගල් පටවාගෙන විත් තිබෙන බව කියැවේ'

ලන්දේසීන්ගේ ප්‍රධාන ගමන් මාර්ග වැඩි වශයෙන් යොදා ගෙන තිබුණේ ජල මාර්ගය ඔස්සේය. එයට හේතුව ප්‍රවාහනය සඳහා යන අධික වියදම් අඩුකර ගත හැකි වීමයි. මේ අනුව ඔවුහු සාමාන්‍ය ගමනාගමනය හා භාණ්ඩ ප්‍රවාහන ක්‍රම කළු ගඟේ සිට බොල්ගොඩ වැව දක්වාත්, මොරටු ඇළ සම්බන්ධ වන සේ ඇළවල් කපා ඇත. කළුතර සිට සබරගමුවේ ඇති බළකොටුවලට ගමනාගමනය හා වෙළෙඳ කටයුතු සඳහා යොදා ගැනුනේද කළු ගඟ ඔස්සේ පැමිණිය හැකි ජලාශ්‍රිත මාර්ගයයි. මෙමගින් ඇත්දල, කුළුබඩු, පුවක්, කුරුඳු වැනි වෙළෙඳ ද්‍රව්‍යයන් ප්‍රවාහනය කෙරුණි.

කළුතර ලන්දේසි පාලනය පිළිබඳව තවත් වාර්තාවක මෙසේ සඳහන් වේ.

'අලුත්ගම (ඇලිකාවෝ) සිට කළුතරට (ලිග් 04 ක්) දුරින් පිහිටා තිබේ. එම සිංහල යාත්‍රා නැවැත්වීමට සුදුසු තොටකි. එහි ඇති සැලැස්මේ 08 ක් පමණ ගැඹුරු සුළු යාත්‍රා නැවැත්වීමට ප්‍රමාණවත්ය. සැලැස්මෙහි දැක්වෙන පරිදි එය පිහිටා ඇත්තේ උස් බිමක වන අතර එය ශක්තිමත් වූත්, ආරක්ෂිත වූත් තත්ත්වයක පවතී. එය වඩා හොඳින් සාදන ලද පැති බැම්මකින් (තාප්පයක්) ඇත. සියලුම උපකරණවලින් සමන්විත වූ කාලතුවක්කු හා සුළු ප්‍රමාණයේ කාලතුවක්කු දෙකක් (2) සවි කරනු ලැබූ ආරක්ෂිත බැම්මකින් යුක්ත වේ. ආරක්ෂිත උපකරණවලින් සමන්විතය. බලකොටුවේ සොල්දාදුවන් නොමැති අතර පෘතුගීසි ආරක්ෂකයන් දහයක් (10) පමණ වාසය කරති.

මෙහි පාලනය ලිග් 10 ක වපසරියක පැතිර ඇති අතර ක්‍රිස්තියානි ආගමික කටයුතුද මෙහෙයවනු ලබන්නේ ප්‍රැන්සිස්කාස් නිකායේ දේවගැතිවරුන් විසිනි. මෙම බලකොටුව ගොඩනගා ඇත්තේ ජෙනරාල් ජෝ ගේ ලී ඇල්බියුකර් විසිනි'

ක්‍රි. ව. 1796 පෙබරවාරි මාසයේදී ජෙනරාල් ස්ටුවට්ගේ නව නායකත්වයෙන් යුත් බ්‍රිතාන්‍ය හමුදාව මෙම ලන්දේසි බලකොටුව අල්ලා ගන්නා ලදී. ඒ අවස්ථාවේ ලන්දේසි කොඩිය බිම දා ඉංග්‍රීසි කොඩිය ඔසවා ඇත. මුළු රටම ඉංග්‍රීසීන්ට යටත් වූ විට ඉංග්‍රීසීන්ගේ කඳවුරක් වශයෙන් මෙම බලකොටුව ප්‍රයෝජනයට ගැනුණි. ඔවුන්ගේ පාලන කටයුතු හා වෙළෙඳ කටයුතු පහසුකර ගැනීම සඳහා රටේ මංමාවත් තැනීමට බ්‍රිතාන්‍යයෝ උත්සුක වූහ. කන්ද උඩරට මාර්ගය කැපීමට පෙරාතුව ඔවුන් විවේක ගැනීමට ගොස් ඇත්තේ කළුතර ආශ්‍රිතව ඇති ප්‍රදේශයකට බව වාර්තා වේ.

18 සියවස වන විට කළුතර පුරවරය නිවාස සංකීර්ණයක් වූ අතර පාලමකින් යුත් බලකොටුව වඩාත් ආරක්ෂිත විය. පෘතුගීසි, ලන්දේසි, ඉංග්‍රීසි හා සිංහලයන් සම්මිශ්‍රණය වී ආගමික සංස්කෘතික, අධ්‍යාපනික, සමාජීය හා ආර්ථික වෙනස්කම් රැසකට කළුතර පුරවරය පත්විය. ඒ අනුව සමාජීය ආගමික උත්සව හා විවිධ ඇඳුම් විලාසිතා මෙම පුරවරයේ දැකිය හැකිව තිබිණි.

මුහුදුබඩ මාර්ගය තැනීම ආරම්භ කළ ඉංග්‍රීසිහු කළුතර බෝධිය විනාශ කිරීමට වැඩපිළිවෙළක් සකසන බව සැලවූ බෞද්ධ ජනතාව නොසන්සුන් වූහ. බෞද්ධයින්ගේ දැඩි විරෝධය මත බෝධිය කැපීමේ අදහස ඔවුන් අතහැර දැමූහ. මෙහි විහාරස්ථානය මිෂනාරිවරුන්ගේ ප්‍රහාරයන්ට ලක්වී විනාශ වී ගිය නමුදු බෝධි වෘක්ෂ දෙකම නිරුපද්‍රිත විය.

මේ අනුව බලන කල කළුතර පුරවරය ඉපැරැණි ඉතිහාසයක් ඇති ප්‍රදේශයක් වන නමුදු වර්තමානයේදී මෙම යටගියාව පිළිබඳ සාධක සපයන නෂ්ටාවශේෂයන් පැහැදිලිව දක්නට නොහැකි තත්ත්වයක් උදා වී ඇත.

# ළමා කවිය...

4 වන පිටුවෙන්

**One, two, three, four, five,**
**Once I caught a fish alive,**
**Six, seven, eight, nine, ten,**
**Then I let it go again.**
**Why did you let it go?**
**Because it bit my finger so.**
**Which finger did it bite?**
**This little finger on the right.**

විද්‍යාත්මක සංකල්ප සාධනය සඳහා ද ජනකවි ආදිය උපයෝගී කොටගත හැකිය. බහ තෝරන වියෙහි වූ දරුවෙකුට අව්ව, වැස්ස සහ සුළඟ ගැන කී කවියක් මෙසේය.

**අව්වයි වැස්සයි නරියගේ මගුලයි**
**දොරකඩ පොල් ගහ ඩාං ඩෝං**

මුදවන ලද කිරි දරුවා රුචි කරන ආහාරයකි. සෞඛ්‍යයට ද හිතකර වූවකි. 'කිරි මිදෙන්නේ කෙසේද?' යන ප්‍රශ්නය නැගීමට මනස මෙහෙයවනසුලු පද්‍යයකි මේ.

**සඳපතිගෙන් කිරි දෝලා - සඳවත සේ මුදවාලා**
**අනේ නෑනො නැත නොකියා - මට දීකිරි දීපන්නේ**

දරුවා 'සඳ' සහ 'කිරි' හට්ටිය අතර සමානතාවක් දකියි. කිරිපැණි ඉල්ලන්නේ ද හඳ මැද සිටින හාවාගෙනි. එමෙන් යමක් ඉල්ලනවිට ඉතා ආචාරශීලිව කළ යුතු බවට උපදේශයක් ද දෙයි.

**සසඳ සසඳ දියපල්ලේ තිබෙයි අල**
**සසඳ සසඳ දිය මතුපිට තිබෙයි කොල**
**වැස්සට පිනිබබා මෝරන කැකුළු මල**
**මස්තකයින්ට මුතු කුඩයකි නෙළුම් මල**

ජලාශයක් උඩ පිපී තිබෙන නෙළුම් මල වැඩෙන ආකාරය පිළිබඳ අවබෝධයක් ළමයාට ලැබෙයි. අපූර්ව වූ චිත්ත රූපයක් ද මැවෙයි. 'සසඳ' යන වචනය යොදා තිබෙන ආකාරය ළමා රුචිය වර්ධනය කරවනසුලුය. මෙයට සමාන ඉංග්‍රීසි ළමා කවියක් මෙසේය.

**I'm a little teapot**
**Short and stout**
**Here is my handle**
**Here is my spout**
**When I get all steamed up**
**Hear me shout**
**Tip me over and pour me out.**

තේ පෝච්චිය පිළිබඳ ක්‍රියාකාරකම් සහිතව ගායනා කළ හැකි ඉහත සඳහන් පද්‍යය සංකල්ප රූප දනවන අයුරින් ජලයෙහි උෂ්ණත්වය, වාෂ්පවීම ආදි විද්‍යා සංකල්ප සාධනය කිරීමට ද පොහොසත්ය.

තම පරිසරය හඳුනා ගැනීමට ළමයාට ආධාර වන්නේ භාෂාවයි. පරිසරය පිළිබඳ අවබෝධය සහ පරිසරයට ආදරය කිරීම ළමයින් තුළ අවශ්‍යයෙන්ම ඇති කළ යුතු ගුණාංගයකි. භාෂා වර්ධනයට හා සංකල්ප සාධන ක්‍රියාවලියට ආධාර වන ආකාරයට ළමා කවි රචනා කිරීමට බොහෝ කවීන් දස්කම් දක්වන බව කිව යුතුය. ආනන්ද රාජකරුණාගේ 'තාරකා' කවි පන්තිය මෙයට කදිම නිදසුනකි.

**දිලිහි දිලිහි - ආකාසේ**
**බබළන මල් - තාරකා**

**බැබළි බැබළි - ආකාසේ**
**දිලිහෙන මල් - තාරකා**

අහස පුරා විසිර ගිය තාරකා දැකීමෙන් ප්‍රබෝධයට පත් වූ දරුවෙකුගේ සිත තුළ ඇති වූ හැඟීම් මෙයින් නිරූපණය වෙයි. ළමයාගේ අත්දැකීම් සීමිතය. තමා නිතර දෙවේලේ දකින මල් සහ තාරකා අතර සමානත්වයක් දකියි. සමාන පද සංඝටනයෙන් අපූර්ව වූ ධ්වනියක් ගම්‍ය වෙයි.

**Twinkle, twinkle, little star,**
**How I wonder what you are!**
**Up above the world so high,**
**Like a diamond in the sky.**

ළමයින්ගේ ප්‍රියතම ගීතයක් වූ ඉහත සඳහන් ඉංග්‍රීසි පද්‍යයද මේ ගනයට වැටෙයි.

**රන් පිඟාන ලෙස වටකුරු - දිලිහි දිලිහි තිබෙන අපුරු**
**හඳහාමියෙ ! හඳහාමියෙ ! - කිරිත් පැණිත් දියෝ ! දියෝ !**

ආනන්ද රාජකරුණාගේම නිර්මාණයක් වූ 'හඳ' නමැති කවි පෙළෙහි කවියකි, ඉහත සඳහන් වූයේ. කුඩා දරුවා 'සචේතනික' හා 'අචේතනික' වශයෙන් වෙනසක් නොදකී. ඔහුට 'හඳ' ද සචේතනික වස්තුවකි. 'හඳහාමී' යයි අමතමින් කිරි පැණි ඉල්ලන්නේ එහෙයිනි. කවියා ළමා මනස පිළිබඳව මනා අවබෝධයෙන් යුක්තව සංකල්ප රූප සාධනයට හිතකර වූ චමත්කාරජනක කාව්‍යයක් නිර්මාණය කිරීමට සමත් වී තිබේ. එස්. මහින්ද හිමියන්ගේ 'රාත්‍රිය' නමැති කවිපෙළ ද රසවින්දනය තීව්‍ර කරමින් චිත්තරූප නැංවීමට සමත් සාර්ථක නිර්මාණයකි.

**සමන් පිච්ච මල් ඉහිරුණු - නිල් තණකොළ පිට්ටනියක්**
**වගෙයි අහස අන්න බලනු - කොච්චර ලස්සන ද රෑට**

**බකමූණෝ පියාඹතී - අනික් කුරුල්ලෝ නිදතී**
**බෝ අතුවල එල්ලීගෙන - මා වවුලෝ කෑගසතී**

**අහසේ තරු වැල් පිරිලා - පොළවේ සුදු මල් පිපිලා**
**මගුල් ගෙවල් දෙකක් වගෙයි - මේ දෙපළම හැඩ ගැහිලා**

කුඩා දරුවා දිවා භාගයෙහි දුටු තණකොළ පිට්ටනියත්, නිල් අහසත්, තාරකා හා සමන්පිච්ච මල් අතර සමානත්වයක් දකියි. අහසේ තරුවැල් සහ පොළවේ සුදු මල් ළමයා දුටු මගුල් ගෙවල් දෙකක් මෙන් සුන්දරය. එමෙන්ම රාත්‍රියට නිදන කුරුල්ලන් සහ අවදියෙන් සිටින කුරුල්ලන් පිළිබඳව ද අවබෝධයක් ලබයි.

ළමයාගේ වචන දැනුම අල්පය. පෙර පාසල් අවධිය වනවිට වාං මාලාව පොහොසත් කරවීම අවශ්‍යයෙන්ම කළ යුත්තකි. මෙහිලා වාක්‍ය ගෙතීම පිළිබඳ අවබෝධය ද වැදගත්ය. වචන දැනුම පුළුල් වූ තරමට වාක්‍ය නිර්මාණය කිරීම ද පහසු වෙයි. පසු අවධියේ දී මෙම දැනුම නිර්මාණාත්මක ලිවීමට සහ කථන වර්ධනයට උපකාරී වෙයි. පුද්ගලයන්ට පමණක් නොව සෑම වස්තුවකටම 'නමක්' ඇති බව මේ වනවිට ළමයා අවබෝධ කරගෙන සිටියි. එම වස්තූන් වෙන්කොට හඳුනාගැනීම ද අත්‍යවශ්‍යය. මේ සියලුම දෑ රසවින්දනයත් සමග කිරීමට 'කවියට' හැකියාව ඇත. ආනන්ද සමරකෝන්ගේ 'ජාති ජාති මල්' කවිපෙළ මල් වර්ග සහ එයට භාවිත වන නම් ඉගැන්වීමට සමත් වෙයි.

**කැළේ පිපෙන මල් - ඉද්ද මූන මල්**
**විලේ පිපෙන මල් - ඕලු නෙලුම් මල්**

**මිදුලෙ පිපෙන මල් - රෝස සමන් මල්**
**වත්තෙ පිපෙන මල් - නිදිකුම්බා මල්**

විවිධ මල් වර්ග දකින ළමයාට තමා සමීපයෙහි ඇති වස්තූන් සිහිපත් වන ආකාරය මුනිදාස කුමාරතුංගයන්ගෙන් 'මල් බස්' නමැති කවි පන්තියෙන් කදිමට නිරූපණය වෙයි. එමෙන්ම සංකල්ප සාධන ක්‍රියාවලියට ද උපකාරී වෙයි.

**ගස අගනා - අර රඳනා**
**මලට මනා - බොහොම හිනා**

**සුපිපුණ බුත් - සරණ පෙළෙත්**
**දේදුන්නෙත් - කිය වෙනසැත්**

**ගස වතුසුදු - වී පිරිසිදු**
**පොහොය නැතිදු - සිල්ගත් බඳු**

බුත්සරණ මල් විවිධ වර්ණ මිශ්‍රිතය. එය දුටු විට ළමයාට සිහිපත් වන්නේ දේදුන්නයි. සුදු පැහැයෙන් බබලන වතුසුදු මල් පොහොය නැතුව ද සිල්ගත් උවසු උවැසියන් මෙනි. යෝග්‍ය උපමා රූපක භාවිත කෙරෙන්නේ චිත්ත රූප දනවන ආකාරයටය.

**Yellow yellow daffodil, dancing in the sun..**
**oh yellow , yellow daffodil,**
**you tell me spring has come.**
**I can hear a blue bird sing,**
**and hear a robin call.**
**but yellow yellow daffodil**
**I love you most of all.**

ඩබ්. ඒ. අබේසිංහගේ 'අවුරුදු' නමැති කවි පන්තිය අවුරුදු කාලයේ ස්වාභාවික සෞන්දර්යයක් ළමයා තුළ ජනිත වූ සතුටක් නිරූපණය කෙරෙන්නකි.

**අඹ රඹුටන් ජම්බු ඉදෙන අවුරුදු කාලේ**
**ජමනාරන් දොඩම් පැහෙන අවුරුදු කාලේ**
**දොඹ ගස් යට මල් වැටිලා අවුරුදු කාලේ**
**අපේ ගමට ඔන්න ඇවිත් අවුරුදු කාලේ**

පෙර පාසල් අවධියේ සිටම 'රචනය' පිළිබඳ අවබෝධයක් ලබාදීම වැදගත්ය. පසු අවධියේ දී නිර්මාණාත්මක ලිවීමට උපකාරීවන නිසාය. ගද්‍ය, පද්‍ය රචනා නිර්මාණයට බෙහෙවින් ඉවහල් වෙයි. මෙහිලා 'ළමා කවි කතා' උපයෝගී කොටගත හැකිය. එය ළමයාගේ පරිකල්පන ශක්තිය වර්ධනය කිරීමට ද උපකාරී වෙයි. පහත සඳහන් ජන කවි මෙයට නිදසුනකි.

**ටිකිරි ටිකිරි ටිකිරි ලියා**
**කළෙත් අරන් ළිඳට ගියා**
**ළිඳ වට කර කබර ගොයා**
**කකුළ කාපි දිය බරියා**

**Jack and Jill went up the hill**
**To fetch a pail of water.**
**Jack fell down and broke his crown,**
**And Jill came tumbling after.**

ආනන්ද රාජකරුණාගේ 'රෝසමල' නමැති කවි පන්තිය 'කවි කතා' ගනයට වැටෙයි.

**රෝස මලේ - නටුවෙ කටු**
**වන බමරෝ - ඔහොම හිටු**

**නටුව නොවේ - මල සිඹිමී**
**මම ළමයෝ - පැණි උරමී**

**වන බමරෝ - මෙහෙම මලක්**
**පැණි තොපටයි - මල අපටයි**

හිමිදිරියේ සුපිපුණ රෝස කුසුමක් දෙස බලාගෙන සිටින ළමයාට මලට ඇදෙන බමරෙකු පෙනේ. සැණෙකින් ළමයා බියපත් වෙයි. ඒ රෝස කටු සිහිවීමෙනි. බමරාට එදෙසට නොයන ලෙස පැවසූ විට ඔහු සිනාසෙයි. මන්ද? බමරා එන්නේ පියාඹාගෙනය. ළමයා ඒ බව නොදනියි. බමරාගේ වදනින් ඔහු පුදුම වෙයි. වචන ස්වල්පයකින් රස ජනනය කරවන කතන්දරයක් නිර්මාණය කළ සැටි අපූරුය. මුනිදාස කුමාරතුංගයන්ගේ 'හාවාගේ වග' කවි පන්තිය ද 'කවිකතාවට' කදිම නිදසුනකි.

**හා හා හරි හාවා - කැළේ මැදින් ආවා**
**හිටගෙන ගඟ ගාවා - වටපිට ඇහැ ලෑවා**

**කොළ දෙකටක් කෑවා - පැන් උගුරක් බීවා**
**තණබිස්සේ බාවා - ඇඟපත සැතපූවා**

**බිරුම් හඬක් ආවා - ඉහළ වීසි වූවා**
**කොඳු ඇට හිටවූවා - කන්දෙක දිග පෑවා**

මෙම පැදි පෙළෙහි භාවිත කර ඇති යෙදුම්වලින් ළමයාගේ සිතෙහි සුරතල් හාවෙකුගේ ක්‍රියා කලාපය පිළිබඳ වාග් චිත්‍රයක් මැවෙයි. බිරූ හඬත් සමගම හාවා තිගැස්සුණු අයුරුත්, බියවූ අයුරුත්, විමසුම් ඇසින් අවට බැලූ අයුරුත් රමණීය ලෙස චිත්‍රණය වෙයි. මෙම ලිපියෙහිලා උපයෝගී කොටගෙන ඇත්තේ පද්‍ය ස්වල්පයක් පමණි. සම්පූර්ණ පැදිපෙළ අධ්‍යයනයෙන් පාඨකයාට මනා අවබෝධයක් ලබාගත හැකිය. පහත දැක්වෙන ඉංග්‍රීසි පද්‍යය විමසා බලන්න.

**The itsy bitsy spider climbed up the waterspout.**
**Down came the rain**
**and washed the spider out.**
**Out came the sun**
**and dried up all the rain**
**and the itsy bitsy spider climbed up the spout again.**

අපට කෙමෙන් අමතක වීගෙන යන 'තේරවිලි කවි' ළමයාගේ භාෂා සංකල්ප සාධන ක්‍රියාවලියට පමණක් නොව බුද්ධි වර්ධනයට ද උපකාරී වන කාව්‍ය විශේෂයකි. කොස් ගෙඩිය පිළිබඳ තේරවිල්ලකි, මේ.

**අත්තක් උඩ බුම්මාගෙන**
**කටු රෙද්දක් පොරවාගෙන**
**එල්ලී ඉන්නේ කවුදෝ ?**

එවැනි තේරවිලි කවි රාශියක් ජන සාහිත්‍යයෙහි අන්තර්ගතය. සිංහල භාෂාවේ පමණක් නොව ඉංග්‍රීසි භාෂාවේ ද තේරවිලි කවි දක්නට ලැබෙයි.

**I gave my love a chicken**
**That had no bone**
**I told my love a story**
**That had no end**
**I gave my love a baby**
**With no crying.**

**A cherry when it's blooming**
**It has no stone**
**A chicken when in the shell**
**It has no bone**
**The story of how I love you**
**It has no end**
**A baby when it's sleeping**
**It's no crying.**

භාෂා සංකල්ප සාධන ක්‍රියාවලියෙහිලා ජනකවි සහ නූතන ළමා කවි උපයෝගී කොටගත හැකි ආකාරය විමංශනයට භාජන කරන ලද ඉහත කී සිංහල හා ඉංග්‍රීසි පද්‍ය කෘතීන්ගෙන් පැහැදිලි වෙයි. මෙහිලා ළමයාගේ ඒ ඒ සංවර්ධන අවධිවලට ගැළපෙන කවි තෝරා ගැනීම පිළිබඳව විශේෂ අවධානය යොමුවිය යුතුය. දරුවාගේ වයස, වචන සීමාව පිළිබඳ මනා අවබෝධයක් තිබීම ද වැදගත්ය. ළමා මනසට යෝග්‍ය වන සාර්ථක පද්‍ය කෘතීන්ගෙන් රසවින්දනයට අමතරව විද්‍යා, ගණිත, භාෂා අධ්‍යයනයට මෙන්ම පරිකල්පන ශක්තිය හා නිර්මාණ ශක්තිය ද වර්ධනය කළ හැකිය. ප්‍රාථමික අධ්‍යාපන ක්‍රියාවලියට වැදගත්වන ශ්‍රවණය, කථනය, කියවීම සහ ලිවීම යන හැකියාවන් වර්ධනය කිරීමට ද උපකාරී වෙයි.



## Affordable solutions to protect your family

Focus on taking care of your family. Let's talk about the customized life insurance options I can offer to protect you today, with the flexibility you need for tomorrow.



**Kasun Kirtisinghe**
416-708-4000
kasun.kirtisinghe@sunlife.com
www.sunlife.ca/kasun.kirtisinghe
365 Front Street North
Bell Tower Market Place
Belleville, ON K8P 5A5

Sun Life Financial
Life's brighter under the sun

Sun Life Assurance Company of Canada is a member of the Sun Life Financial group of companies.
© Sun Life Assurance Company of Canada, 2017.



TB
TISSA BOYAGODA, LLM

KNOW YOUR RIGHTS



## TISSA BOYAGODA, LLM

Barrister, Solicitor & Notary Public
Former Staff Lawyer in Criminal and Family Law with Manitoba Legal Aid, Former Judge, Sri lanka

**Areas of Practice**

- Criminal Law
- Family Law
- Real Estate
- Immigration Matters
- Civil Litigation
- Small Claim Court Matters
- Power of Attorneys
- Last Wills
- Notarizations

GET ALL YOUR LEGAL QUESTIONS ANSWERED

**1965 Britannia Road West, Suite 208**
**Mississauga, ON, L5M 4Y4**

**100 Consilium Place, Suite 200**
**Scarborough, ON, M1H 3E3**

**TEL: 416.627.6090**
**FAX: 289.997.3426**
**EMAIL: tboyagoda@gmail.com**

**www.tissaboyagodalaw.com**

# දැනුම සමග කටට රසට

## Lemon Souffles



■ තිසරි ශිබා

දෙහි අපේ ජීවිත හා බැඳී පවතින අරුම පුදුම ගෙඩි ජාතියක් බව මට වැටහුණේ කුඩා කල ගමේ ජීවත් වූ අවදියේය. නා නා විද කඩචෝරුවලටත්, ගඩා ගෙඩිවලටත් හුරු වූ අප, ඇතැම් දිනවල දුව පැන ඇවිදිමින් ගම පුරා සැරිසරණ විට අහුවුණු දේ කටේ දා ගත්තත්, ඇතැම් දිනවල මහ රාත්‍රියේදී හැදෙන බඩේ අමාරුවෙන් පීඩා විඳින විට පිහිට වන එකම දේ කුස්සියේ ඇති දෙහි ගෙඩියයි. "ඉක්මනට දෙහි ගෙඩියක් මිරිකල දෙන්න...." එවැනි දිනක ආත්තම්මා චම්මෙක් ලවා සාදන දෙහි ඉස්ම අමාරුවෙන් ගිල දැමූ විට බඩේ අමාරුව සැනෙකින් හොඳ වන්නේ එහි ඇති කුමන බලයක් නිසාදැයි එකල මා සිතූවාර බොහෝය.

වැසි දිනවල මඩ කඩිති සොය සොයා වත්තේ දුව පනින අපි වැස්ස ඇද වැටෙන විටම කුමන හෝ හේතුවක් සොයාගෙන එළියට දුවන විට කිසිවකු නොදැක්කොත් නිවසට එන්නේ දියබරියකු මෙන් තෙත් බත් වූ විටය. එවැනි දිනක අම්මාගෙනුත් චම්මලාගෙනුත් අසන බැනුම්වල නිමක් නැත.



වැස්සට තෙමී හැදෙන උණ-හෙම්බිරිස්සාවට එකල පැනඩෝල් පෙත්ත පසු පස නොගිය අප වෙනිවැල් ගැට - කොත්තමල්ලි වැනි අත් බෙහෙත්වලින් සහනය ලැබූහ. "අර දෙහි ගහේ කොල ටිකක් කඩල තම්බල හුමාලය අල්ලන්න. ඔය හෙම්බිරිස්සා ගතිය ඇරිල යයි" එවැනි දිනක ආත්තම්මා අම්මාට උපදෙස් දෙන්නීය. විශාල මුට්ටියකට දෙහි බෑයවල් කිහිපයක් සහ දෙහි කොල දමා තම්බන වතුරෙන් අල්ලන හුමාලයෙන් හෙම්බිරිස්සාව නිසා ඇතිවන සියලු අපහසුතා මග ඇරී යන්නේ දෙහි ගෙඩියේ ඇති අපමණ ගුණය නිසා බව එකල ආත්තම්මා කියන්නීය. බඩේ අමාරුවට, හෙම්බිරිස්සාවට පමණක් නොව ඇතැම් දිනවල සෑදෙන හිසරදේටත් පිහිට වන දෙහි ගෙඩිය එකල ආත්තම්මාගේ කුස්සියේ හිඟ වුණේ නැත.

ඉරිදා දිනවල දහම් පාසල් යෑමට උදෑසන නැගිටීමට කම්මැලි වූ විට මා හිස සිටම රෙද්දක් පොරවා ගෙන තව තවත් ගුලි ගැසී නිදා ගන්නා විට කිසිදු ගැලවීමක් නැත්තේ චූටි චම්මාගෙනි.

"හා හා නැගිටිනවා නැගිටිනවා අද දහම් පාසල් යන්නෙ නැද්ද....?"

"චූටි චම්මා, අද මගේ ඔලුව පැලෙන්න වගේ රිදෙනවා...."

"අනේ චූටි දෝණී මේ..... නිකම් බොරු කියන්නෙ නැතිව නැගිටිනවා" කියමින් කකුල් දෙකෙන් ඇද, ඇඳෙන් බිමට දාන මම තව තවත් සීතල පොලව මත ගුලි ගැහෙන විට චූටි චම්මා දෑස් විසල් කර ගනිමින් මා තුරුලු කර ගන්නීය.

"ඇත්තමයි ඇඟත් හොඳටම රස්නෙයි නෙ" එවැනි දිනක ආත්තම්මා වෙද මාමා ලවා ගෙන්වා ගන්නා බෙහෙත්වලින් සුවයක් නොලැබෙන කල කට්ටඩි මාමාගේ පිහිට ලබන්නේ ගැමියෙක්ගෙන් ලැබෙන ඇතැම් උපදෙස් නිසාය.

"දවස් ගානක් මේ උණ නගිනවා බහිනවනෙ ඉස්කෝලෙ හාමිනේ. චූටි මැණිකෙ මේ දවස් ටිකක ඇදිල ගිහින්. නරකද කට්ටඩි උන්නැහේ ගෙනත් දෙහි ගෙඩියක්වත් මැතිරුවොත්...."

ඉන්පසුව නිවසට එන කට්ටඩි මාමා දෙහි ගෙඩියක් මතුරමින් තෙල් ගා ඔලුව පිරිමදින වට ඇතිවන සුවය මෙතකැයි කිව නොහැකි තරම්ය. ඉන් දවස් කිහිපයකට පසුව සුවය ලැබෙන විට එකල ඔවුන් විශ්වාස කළේ එය දෙහි මැතිරීමෙන් සිදු වූ ආශ්චර්යයක් සේය.

ගලේ අඹරා සාදන පොල් සම්බෝලෙට, කොච්චි සම්බෝලෙකට, වංගෙඩියේ කොටා සාදන උම්බලකඩ සම්බෝලෙකට විතරක් නොව මඳ ගින්නේ පිසෙන පොලොස් ඇඹුලකට, අඹ ආනමකට, කලවම් පලා මැල්ලුමකට දෙහි ඉස්ම ටිකක් එකතු කරන ආත්තම්මා පවසන්නේ ඒ නිසා එහි රසය වඩාත් ඉස්මතු වන බවයි.

කාලය බොහෝ දේ අපගෙන් උදුරා ගෙන ඇති නිසා අද මට දෙහි ගෙඩිය බොහෝ දුරස්තව ඇත. දෙහි ගෙඩියට වඩා ලෙමන් සොයා ගැනීමට පහසු ඉස්සව්වක තිබෙන නිසා සම්බලට මැල්ලුමට මා එකතු කරන්නේ දෙහි ඉස්ම නොව ලෙමන් ගෙඩියේ ඉස්මයි. ඉන් වඩාත් මා ඇලුම් කරන්නේ ඇඹුල් රසැති Lemon Souffles අතුරුපසටය. බොහෝ දිනවල අප නිවසේ සාදන Lemon Souffles ඔබත් කැමති නම් සාදා රස බලන්න.

## Lemon Souffles හදමු

### අවශ්‍ය දේ

ලෙමන් යුෂ කෝප්ප 1/2
බිත්තර 6 ( සුදු මදය සහ කහ මදය වෙන් කර ගන්න
සීනි කෝප්පයක් ( වඩාත් පැණි රසට අකමැති අයට සීනි ප්‍රමාණය අඩු කර ගන්න පුළුවන්)
පාන් පිටි තේ හැඳි 4
අයිසින් ෂුගර් තේ හැඳි 2 ක් පමණ

### සාදා ගන්නා ආකාරය

උෂ්ණත්වයට ඔරොත්තු දෙන බාජනයක් ගෙන එයට බිත්තර කහමද 6 ක්, සීනි කෝප්ප බාගයක්, ලෙමන් යුෂ සහ පාන් පිටි මේස හැඳි 4 ක් එකතු කර හොඳින් කලවම් කරගන්න. දැන් උණුවතුර බාජනයක් ලිප තබා එයට උඩින් බිත්තර කහමද මිශ්‍ර කර ගත් බාජනය තබා මඳ ගින්නේ (ඩබල් බොයිල් ක්‍රමයට) ඉහත මිශ්‍රණය විනාඩි 10 ක් පමණ තියන්න. ඒ අතරතුර බිත්තර ගැසීමේ උපකරණයක් (whisk) ආධාරයෙන් මිශ්‍රණය හොඳින් ගසා ගන්න. ටික වෙලාවක් යනවිට බිත්තර කහ මද මිශ්‍රණය ඝනකම් වීගෙන එන බව දැනේවි. එවිට උණුවතුර බඳුනෙන් අයින් කර එය තවත් විනාඩි 10 ක් පමණ හොඳින් බීට් කර ගන්න. පැත්තකින් තියන්න. තවත් බඳුනක් ගෙන එයට බිත්තර සුදු මද 6 සහ ඉතිරි සීනි කෝප්ප භාගය එකතු කරන්න. දැන් එයත් හොඳින් ඝන වෙනකම් බීට් කර ගන්න. කලින් බීට් කර ගත් කහමද මිශ්‍රණය සහ සුදු මද මිශ්‍රණය එකට එකතු කර ලී හැන්දකින් හොඳින් කලවම් කරන්න. අවන් (oven) එකේ තැබිය හැකි කුඩා බාජන කිහිපයකට මේ මිශ්‍රණය පුරවා 350 F (175 C) උෂ්ණත්වයෙන් විනාඩි 20 ක් පමණ බේක් කරගන්න. උඩින් අයිසින් ෂුගර් ඉස උණුවෙන් පිළිගන්වන්න (මෙය උණුවෙන් පිළිගන්වන අතුරුපසක් බව මතක තබාගන්න)

* මිශ්‍රණය ලෙමන් ගෙඩියේම දමා බේක් කරන්න එපා. ඒ සඳහා සුදුසු බාජන ගන්න.

**Shikifood**
thisu.shika@gmail.com



NOVA Immigration Solutions Inc.
A CANADIAN IMMIGRATION CONSULTANCY FIRM
100% PARENTAL SUPER VISA AND 98% STUDENT VISA SUCCESS RATES
416 298 0990
shani.hanwella@novaim.ca
SHANI HANWELLA
Registered Canadian Immigration Consultant, CEO,
Former Visa Officer, Canadian High Commission,
Colombo, Sri Lanka
1585 Markham Road, Suite 407, Scarborough, ON M1B 2W1
www.novaim.ca

# එතෙර අපි සංවිධානයේ කැනඩා ශාඛාවේ

# මහා සභාව සහ සංස්කෘතික ප්‍රසංගය

## "Ethera api" General assembly and cultural show



හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී

**රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**



එතෙර අපි සංවිධානයේ සභාපති,
ජ.වි.පෙ. පාර්ලිමේන්තු මන්ත්‍රී
කෝප් කමිටුවේ සභාපති

**සුනිල් හඳුන්නෙත්ති මහතා**

පාර්ලිමේන්තු මන්ත්‍රී සහ කෝප් කමිටු සභාපති සුනිල් හඳුන්නෙත්ති මහතාගේ සහ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී රාමලිංගම් චන්ද්‍රසේකර් මහතාගේ ප්‍රධානත්වයෙන්

**2017 මාර්තු 26 වන ඉරිදා සවස 1.00 ට**

**Sunday, march 26, 2017 at 1:00 p.m.**

**At Hilton Garden Inn Toronto Vaughan hotel**

Address: 3201 Highway 7 west, Vaughan, ON L4K 5Z7 (Hwy 400/ Hwy 7)

**Inquiries: Toronto-6472108771, Brampton- 6476097476, MIssissauga-6475352131, Scarborough-4168992834, Guelph-2269798000, Kitchener-2268082763**

"එතෙර අපි" සංවිධානය - කැනඩා ශාඛාව

"அக்கரையில் நாம்" அமைப்பு - கனடா கிளை

"Ethera Api" Organization - Canada Branch

# IMPERIAL MORTGAGES INC.



**Residential Mortgages, Commercial Mortgage, Refinancing, Second Mortgage, First Time Home Buyers**

Refinancing: consolidate your debts to improve cash flow turn your home equity into cash when you need it most (home repairs and renovations, education financing); earn a return on your home equity through investments

Self-employed Non-income verifiers Credit issues New immigrants

**Abby Sri Haran**
**Senior Mortgage Specialist**

Tel: 416 818 1633 Fax: 905 888 6201
Email: abby.residentialmortgages@gmail.com
Licence # 10782

# ANOMA PERERA

Barrister, Solicitor & Notary Public
(Attorney-at-Law, Sri Lanka)

- REAL ESTATE - Residential & Commercial
- WILLS & POWERS OF ATTORNEY

EVENING & WEEK END CONSULTATIONS
AVAILABLE BY APPOINTMENT



## ANOMA PERERA LAW OFFICE

2985 Drew Road , Suite 216, Mississauga, Ontario. L4T 0A4
Telephone: (905) 673-5665 Fax: (905) 673-1682
e-mail : anomaperera01@gmail.com

# නිව් වන්නි මාර්කට් ඉන්ක්.

# NEW VANNI MARKET INC.

40 Bristol Rd E. Unit 7. Mississauga, ON. L4Z 3K8

Tel: 905 566 5550



BECOME A MEMBER AT NEW VANNI MARKET AND RECEIVE POINTS FOR EVERY PURCHASE AND REDEEM THEM FOR FREE ITEMS.

New Vanni Market
புதிய வன்னி சந்தை
POINTS CARD
SVM GROUP CANADA

අලුත්ම අලුත් මාලු, නැවුම් එළවළු පළතුරු, කුළුබඩු සහල්
ඇතුළු ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත සියලුම ආහාර වර්ග වඩාත්
පහසුවෙන් ඔබේ සිතැඟි පරිදි තෝරා ගැනීමට
**නිව් වන්නි මාර්කට් ඉන්ක්** වෙත එන්න.

වියළි හාල්මැස්සන්
සියලුම කරවල වර්ග
උම්බලකඩ

පොල්, රතුළූණු, කෙසෙල් කොළ, බුලත්
ගොටුකොළ, මුකුණුවැන්න, කතුරුමුරුංගා
අලුත් එළවළු සහ පළතුරු වර්ග රැසක්

SEND MONEY TO SRI LANKA, INDIA OR OTHER COUNTRIES

* all prices are subject to change without prior notice

ගෙදර යන ගමන් අතේ ඇති මුදලට හිතේ හැටියට ඔබට අවශ්‍ය සියලුම ශ්‍රී ලාංකේය නිෂ්පාදන එකම තැනකින් ලබාගන්න **NEW VANNI MARKET INC.** වෙත පැමිණෙන්න.



Dasatha

සතුට, විනෝදය, දැනුම එකට කැටිවුණු සොඳුරු නවාතැන

# වෙළඳ දැන්වීම් සඳහා විමසන්න

## Gamini - 416 822 2789

All Ads & Classified Ads are also Published in the ONLINE Edition at

**WWW.DASATHA.COM**

For NO ADDITIONAL CHARGE

Tell: 416 822 2789 Fax: 289 553 5668 Email: dasathainfo@gmail.com

# Buy / Sell Commercial and Residential Real Estate

"List your Home with Professionals & Save Money!"

**For Quick Results Call Now!**

- **Excellent** Personalized Service
- **Free** Market Evaluation
- Best negotiations
- $3000 Cashback for clients who sell and buy (someconditions apply)



**Raj Sinnathamby**
Sales Representative
Sinnaraj5@hotmail.com
Cell: **647-981-7892**

HOMELIFE
HIGHER STANDARDS



**Kuddithamby Yogeswaran**
Sales Representative
Yoges797@gmail.com
Cell: **416-356-7814**

Home Life Today Realty Ltd., Brokerage*
Toll Free : **1 - 888 - 777 - 0191**
Tel : **416 - 298 - 3200** / Fax : **416 -298 - 3440**

*Independently Owned and Operated *Not intended to solicit clients currently under contact with another brokerage.

Century 21
Leading Edge Realty Inc. Brokerage

invis
Canada's Mortgage Experts™

## THUSITH WEERASURIYA

REAL ESTATE SALES REPRESENTATIVE / MORTGAGE AGENT

416 616 2402
THUSITH.WEE@ GMAIL.COM
WWW.THUSITH.COM

"HELPING YOU GET MORE FOR YOUR REAL ESTATE"



Bus: 905-405-8484 Fax : 905-405-8881
www.Century21LeadingEdge.ca
7071 Airport Rd Suite 201, Mississauga, ON L4T 4J3

*Independently owned and operated.

| | | | |
|---|---|---|---|
| **Markham** 165 Main St N. | **Scarborough** 1825 Markham Rd. | **Ajax** 527 Kingston Rd. W | **Toronto North** 1053 McNicoll Ave. |
| **Yorkville** 1300 Bay St. | **Stouffville** 6393 Main St. | **Whitby** 408 Dundas St. W | **Don Mills** 801 York Mills Rd. |

**You Focus on Your Business.**
**Leave the burden of Accounting & Tax on us.**

# GS ACCOUNTING CO.

## සාධාරණ අයකිරීම් මිත්‍රශීලි සේවය සහ උපදෙස් සමගින්

- සිංහලෙන් පැහැදිලි කිරීම්
- 100% නිවැරදිතාව සහ රහස්‍යභාව
- සාකච්ඡා මගින් උපරිම බදු වාසි ලබා දීම
- ගිණුම් සහ බදු ක්ෂේත්‍රයේ උපරිම සුදුසුකම් සහ පළපුරුද්ද ලබා ඇති දෙදෙනෙකුගේ දායකත්වය

- New Business Registration
- Payroll, T4,T4 Summary, ROE
- Bookkeeping & Accounting
- Income Tax
- HST Remittance

Sole proprietorship
Partnership
Corporation
Non for Profit Organization

## Siri / Sriyani Gamage

**Office:**
# 210 - 1560 Brimley Road, Scarborough ON M1P 3G9
**Tel: 416-571-4270 / 647-352-1560**
**Fax - 647 352 1561**

**Residence :**
1274 Warden Avenue, Scarborough, On. M1R 2R6
**Tel: 416 331 8349**

**Email: gsaccounting@ymail.com** **Web: www.gsaccounting.ca**

**Minimize Your Taxes / Maximize your Refund**


"Committed To Turning Your Dream Home Into Reality"
Dissa
Dissanayake Danapala Mudiyanselage
B.A., PGDIP in Urban Development
Sales Representative
Committed to meeting your real estate services.
Let us discuss your requirements.
Contact me @ 416- 697 9925, no obligation
dissahomes@gmail.com
Century 21
Percy Fulton Ltd.
Brokerage* Office:416-289-8200
2911 Kennedy Rd, Toronto, M1V 1S8
AIR MILES
MLS MULTIPLE LISTING SERVICE
REALTOR


Ceylon Herbal Tea
Tea 21
CINNAMON TEA
(cinnamomum zeylanicum)
Benefits of cinnamon tea..
• Positive effect on blood sugar.
• Aid weight loss and belly fat reduction.
• Helps to reduce menstrual discomfort and cramps.
CEYLON TEA
100% NATURAL
Tea 21
GREEN TEA
A cup of tea 21 green tea and a life long benefits…
• Helps to reduce cholesterol levels.
• Helps to loose weight.
• Prevent hair loss.
• Contains most amount of anti oxidant polyphenols.
• Skin care and many more...
Tea 21
HIBISCUS TEA
Benefits of drinking tea 21 hibiscus tea…
• Can prevent pre-cancerous cells from growing by inducing apoptosis.
• Good for heart diseases and diabetes.
• Protects liver
• Relief from cramps and menstrual pain and many more...
Tea 21
BLACK CUMIN SEEDS
LIVER FRIEND TEA
Benefits of drinking a cup of black cumin tea…
• Stimulates the energy of the body.
• Decrease fatigue and dispiritedness.
• Anti-hypertensive, carminative and anti-parasitic and many more...
Tea 21
BITTER GOURD TEA
(Bitter melon)
Benefits of tea 21 bitter gourd tea …
• Very low in calories.
• Helps to reduce blood glucose level.
Tea 21
GINGER TEA
(zingiber officinale)
Ginger tea has a lot of benefits such as…
• relieve stress.
• Fight against respiratory problems.
• Reduce inflammations and many more….
Imports by
S. N. S ENTERPRISES
Telphone : 416 890 9521


LAL LAW OFFICE
❖ Real Estate
❖ Mortgages
❖ Immigration Law
❖ Family Law
❖ Tax Law
Lal Handapangoda
Barrister & Solicitor
90 Kennedy Road South. Unit #7
Brampton, Ontario, L6W 3E7
Tel. 905.457.1025 | Fax 905.457.1045 | Cell 416.838.3966
Email: lallawfirm@gmail.com



13 කොටස

පියදාස වැලිකන්නගේ

# එයා හරි අපූරු ළමයෙක්

ඒ පැහැබර දිනයේ මම පස්සර මැදි විදුහලේ ශිෂ්‍යයෙකු ලෙස ඉගෙනීම පටන් ගතිමි. එහි හයේ 'ල ඊ හා ක යනුවෙන් හැඳින්වුණු පන්ති තුනක් විය. මා ඇතුළත් කරනු ලැබුවේ ක පන්තියටය. ක පන්තියට ඇතුළු කරනු ලැබුවේ මා මෙන්ම ඉංග්‍රීසි හෝඩියවත් හරිහැටි නොදත් සිසු සිසුවියන්ය.

මැදවෙලගම පාසලේ ඉංග්‍රීසි ගුරුවරයෙක් නොවීය. එහෙයින් ඉංග්‍රීසි හෝඩියේ අකුරවත් මම දැන නොසිටියෙමි. එය ලජ්ජාවට හේතුවක් නොවූයේ පන්තියේ සිටි සියල්ලන්ම මා වැන්නවුන් වූ නිසාය.

"ඉංග්‍රීසි ඉගෙන ගන්න එක එච්චර අමාරු වැඩක් නෙමෙයි. හැබැයි ටිකක් මහන්සි වෙන්න වෙයි" අපේ ඉංග්‍රීසි ගුරුතුමිය පළමුව ඉංග්‍රීසියෙන් කියා දෙවනුව සිංහලෙන් තේරුම් කර දුන්නාය.

ඇගේ කතා විලාශය අතිශයින් සිත් ගන්නා සුලු විය. රෝස පැහැති හැට්ටයක් සහ ඔසරියන් ඇඳ සිටි ඇය බෙහෙවින් කරුණාවන්ත යැයි මට සිතිණි. ඒ නිසාම මා තුළ වූ ආගන්තුක කුලෑටි ගතිය කෙමෙන් පහ වී යන්නාක් මෙන් මට දැනිණ. එදා වැඩිපුර ඉගැන්වූයේ ඉංග්‍රීසි හෝඩියය. කැපිටල් සහ සිම්පල් අකුරුවල වෙනසය. ඒ සඳහා ඇය ඉංග්‍රීසි හෝඩි පොත පමණක් නොව ඉංග්‍රීසි පුවත්පතක්ද උපයෝගී කොට ගත්තාය. ඒ අයුරින් ඉගැන්වීම පටන්ගත් ඇය ඉන්පසු සිසුන් හා සිසුවියන් එකිනෙකා තමන් වෙත කැඳවා What is your name? What is your father's name? What is your mother's name? යනුවෙන් ඉංග්‍රීසියෙන් ඇසුවාය. අනතුරුව ඒවා සිංහලෙන්ද ඇසුවාය. ඒ ප්‍රශ්නවලට ඉංග්‍රීසියෙන් උත්තර දෙන සැටිද කියාදුන්නාය. ළමයින් සියලු දෙනාගෙන්ම ඇසුවේ ඒ ප්‍රශ්න තුන පමණි. අපේ තොරතුරු දැනගැනීම සඳහා ඒ ප්‍රශ්න තුන ඇසුවත් අපට එය පාඩමක් විය. පන්තියේ සියලු දෙනාගෙන්ම ඒ ප්‍රශ්න තුන අසා නිමවෙන විට ඒ ප්‍රශ්න අසන සැටිත්, ඒවාට උත්තර දෙන සැටිත් අපට කට පාඩම් වී තිබිණ.

"දැන් ඔය ළමයින්ට පුළුවන් පන්තියේ ඉන්න අලුත් යාළුවන්ගෙන් ඒ ප්‍රශ්න අහන්න. එහෙම අහනකොට උත්තර දෙන්න ඕනැත් ඉංග්‍රීසියෙන්මයි" ඇය අවසානයේ සිනාසෙමින් කීවාය. පස්වෙනි පන්තිය සමත්වෙන තෙක් කවදාවත් ඉගෙන නොගත් ඉංග්‍රීසි එක දවසකින් ඉගෙන ගන්නට ලැබීම ගැන මම බෙහෙවින් සතුටට පත් වීමි. "ඉංග්‍රීසි ඉගෙන ගන්න එක හරි ලේසියි" යන හැඟීම මා තුළ ඇති විය.

එදා පාසල සවස පහ වෙන තෙක් පැවැත්වූයේ නැත. ඊට කලින් ඉගැන්වීමේ කටයුතු අවසන් කෙරිණ.

"අද හතරයි විස්සට වැඩ අවසන් කළාට හෙට ඉඳලා පහටයි ඉස්කෝලෙ අරින්නෙ" ගුරුතුමිය සිනාසෙමින් කීවාය.

අපි පාසලින් පිට වීමු. මට අවශ්‍ය වූයේ හැකි තරම් ඉක්මනින් ගෙදර යන්නටය. ඒ අවශ්‍යතාව බොහෝ ළමයින් තුළ ඇති බවක්ද පෙනිණ. පස්සර නගරයේ එක එක අතට විහිදුන පාරවල් ඔස්සේ ළමයින් ගමන් කරන්නට වීම නිසා 'එල්ටැබ්' වතුයායට අවතීර්ණ වී සිටියේ ළමයින් දහ දොළොස් දෙනෙකි. ඔවුන් අතර මගේ පන්තියේ ළමයි දෙදෙනෙක්ද සිටියහ. අප ගමන් කළේ එකටය. ඒ ළමයින් දෙදෙනාගෙන් එකෙකු වන වනසිංහගේ ගම අපේ ගමට කිට්ටුව පිහිටා ඇති බව දැනගන්නට ලැබීම මා තුළ ඇති කළේ මහත් සතුටකි. අනෙක් යහළුවා කුඩාබණ්ඩාය. ඔහුගේ ගමට පස්සර සිට ඇත්තේ සැතපුම් තුනකි. අපි අලුත් පාසලත්, උගන්වන්නට පැමිණි ගුරුතුමියත් ගැන බොහෝ දේ කතාකරමින් ගමන් කළෙමු.

"එයාට කියන්නෙ මැඩම් කියල"

"සිංහල උගන්වන්ට ආපු මහත්තයට කියන්නෙ සර් කියල"

"ලොකු මහත්තයට කියන්නෙ ප්‍රින්සිපල් කියල" අපි තුන්දෙනා තරගයට මෙන් කීවෙමු.

"ප්‍රින්සිපල් ටිකක් සැරයි වගේ නේද අප්පුහාමි" කුඩාබණ්ඩා හිටිහැටියේම මගෙන් ඇසීය.

"ඇයි උඹට සැර කළාද?"

"නෑ. එයා එනකොට ළමයි සෙල්ලම් කරන එකත් නැවැත්තුවා" වනසිංහ කීය.

"ඔව් එයාගේ අතේ වේවැලකුත් තිබුණා මං දැක්කා" මම කීවෙමි. එකෙණෙහිම මැදවෙලගම පාසලේ ලොකු මහත්තයාගෙන් කෑ වේවැල් පහරවල්ද මට සිහිවිය.

"මෙහෙදි නම් පරිස්සම් වෙන්ට ඕනෑ" මම මටම කියා ගතිමි.

"දැක්කද අයියල අක්කලා ඉංග්‍රීසියෙන් කතා කරන හැටි. එක අක්කා කෙනෙක් මට කිව්වා 'ඩෝං ගෝ දෙයා' කියලා. තවත් මොකක්දෝ එයා කිව්වා. මට ඒ එකක්වත් තේරුණේ නෑ. මං ආපහු හැරිලා දිව්වා" මම හඬ නඟා සිනාසෙමින් කීවෙමි.

"අඩේ අයියා කෙනෙක් මටත් එහෙම කිව්වා. මං බයවෙලා වගේ බැලුවාම පිරිමි ළමයි හුජ්ජ කරන තැන පෙන්නුවා. මං යන්න හදල තියෙන්නෙ ගෑනු ළමයි හුජ්ජ කරන තැනට" වනසිංහ කීවේ උඩ පැන පැන සිනාසෙමිනි.

සැතපුම් දෙකක් පමණ තාර පාර දිගේ පැමිණීමෙන් පසු තේ වත්තේ පහළට දිවෙන අඩි පාරක් ළඟ නැවතුණ කුඩාබණ්ඩා "මං යන්ට ඕනෑ මෙතැනින්" යි කීය.

"මෙතැන ඉඳලා උඹලගෙ ගමට කොච්චර විතර දුරද?" මම කුඩාබණ්ඩාගෙන් ඇසීමි.

"හැතැප්මක් විතර. ආං අර පේන්නෙ අපේ ගම" ඔහු සිය දකුණත දිගු කොට කන්ද පාමුල රුක් ගොමුවක් පෙන්නා කීවේය.

"මං දන්නවා ඔය අඩි පාර ගිහින් වැටෙන්නෙ වත්තෙ බොරලු පාරට නේද?"

"අන්න හරි. ඒ බොරලු පාර පැනල තවත් ටිකක් පහළට ගියාම අපේ ගම"

"ඒ බොරලු පාර යන්නෙ අපේ ගෙවල් ළඟින්. ඒ පාර දිගේ තමයි අපි පස්සර පොළට යන්නේ"




වනසිංහ සිය ගමට යන සැටි විස්තර කළේය.

"එහෙනම් උඹට පුළුවන්නෙ මාත් එක්ක මේ පාරෙන් එන්ට"

"ඔව් පුළුවන්. ඒත් අද මම අප්පුහාමිත් එක්ක තව ටික දුරක් ගිහින් පහළට බහිනවා"

"ඔය උඹලා යන පාර දිගේ පින්නලන්දට යන්ට බැරිද?"

"ඒත් පුළුවන්. හැබැයි අපේ ගම පහුකරලා යනකොට මිනී පිට්ටනියක් හම්බවෙනවා. ඒ හින්දා අපේ ගමෙන් එහාට මිනිස්සු වැඩිපුර යන්නෙ නෑ"

"තාර පාරෙන් යන එකද කිට්ටු. එහෙම නැත්තන් මිනී පිට්ටනිය ළඟින් යන එකද කිට්ටු?"

"ඒක නම් මං හරියට කියන්ට දන්නෙ නෑ. ඕනෑ නම් මට අප්පච්චිගෙන් අහලා කියන්ට පුළුවන්. ඇයි උඹ ඒ පාරෙන් යන්ටද?" වනසිංහ බිය රැඳි නෙතින් මා දෙස බලාගෙන ඇසීය.

"නෑ පාරවල් තොටවල් ගැන දැනගන්න එක කොයිකටත් හොඳයිනෙ" මම ඕනෑවට එපාවට මෙන් කීවෙමි.

වනසිංහ එදා ගමට යන අඩි පාරට හැරුණේ තවත් සැතපුමක් පමණ මා සමග ගමන් කිරීමෙන් පසුය.

"අප්පුහාමි මං මෙතැනින් යන්ට ඕනෑ. අර පේන්නේ අපේ ගම. අපේ ගෙවල් ඉස්සරහින් යන පාරත් මෙතෙන්ට පේනවා" ඔහු කන්ද පාමුල සාවියක් වෙත අතක් දිගු කරමින් කීවේය.

"අපේ ගෙවල් පහුකරලා ටික දුරක් යනකොට පොඩි කඳුගැටයක් හම්බ වෙනවා. මිනී පිට්ටනිය තියෙන්නේ ඒ කඳුගැටය මුදුනේ. ඒක පහුකරන් ගියාම උඹලෑ ගමට යන්ට පුළුවන්කම ඇති" මම මහත් ඕනෑකමින් ඔහු පෙන්වූ බිම්කඩ දෙස බලාගෙන සිටියෙමි.

"ඒ පාර කිට්ටු නම් මට පුළුවන් උදේ වරුවෙ වත්තෙ වැඩ කරලා ඉස්කෝලෙට ගිහින් හවස එනකොට ඒ පාරෙන් ගෙදර යන්ට" මම සිතින් මටම කියා ගතිමි.

"එහෙනම් මං යනවා" නිහඬ බව බිඳිමින් වනසිංහ කීවේය.

"හරි අපි හෙට හම්බවෙමු" මම කීවෙමි. වනසිංහ අඩිපාර දිගේ වේගයෙන් පහළට ඇදී යන සැටි මම මඳ වේලාවක් බලාගෙන සිටියෙමි. ඉන්පසු මම තාර පාර දිගේ දුවන්නට වීමි.

මා ගෙදර යන විට අම්මත් අක්කත් නංගිත් මිදුලට වී බලා සිටියහ. ඔවුන් වෙත ගිය සැටියේ මා අක්කාගෙන් ඇසුවේ "වට්ස් යුවර් නේම්" කියාය.

"අපෙ අප්පෝ මේකා සැන්ටර් එකට ගිය හැටියෙම සුද්දෙක් වෙලානේ" යි කියමින් ඇය මගේ උරපත්තට පහරක් ගැසුවාය. අම්මාගේ මූණ මත සිනා රැළි පිනුම් ගසන්නා සේ මට පෙනිණ. නංගීගේ නෙත් යොමු වී තිබුණේ මා ඇඳ සිටි ඇඳුම වෙතය.

"පුතේ උඹ ලොකු ගුරුන්නාන්සේ මහත්තයට පින් දෙන්ට ඕනෑ. ඒ ඇත්තා ගුරුන්නාන්සේ මහත්තයෙක් නෙවි. දෙවියෙක්"

"සෙනසුරාදා ලොකු මහත්තයා හම්බවෙන්ට යන්ට ඕනෑ අම්මේ" මම කීවෙමි.

එදින ගෙතුළ භූමිතෙල් ලාම්පුව දල්වන තෙක් අලුත් පාසලේ තොරතුරුත් එහි උගන්වන ගුරු මහත්ම මහත්මීන්ගේ තොරතුරුත් කියන්නට මට සිදුවිය. මා කොයිකත් කීවේ මහත් සතුටිනි. ආඩම්බරයෙනි. අම්මත් අක්කත් නංගිත් ඊට කන්දීගෙන සිටියේ මටත් වඩා සතුටින් හා ආඩම්බරයෙනැයි මට සිතිණ.

"ලොකු මල්ලියේ ඒ ඉස්කෝලෙට එන ළමයි සපත්තු දානවා නේද?"

"මං වගේ සපත්තු දාන්නෙ නැති ළමයිනුත් ඉන්නවා අක්කෙ. අපේ පන්තියෙම හත් අටදෙනෙක් ඉන්නවා"

"සපත්තු දාගෙන එන ළමයි සපත්තු දාගෙන එන්නෙ නැති ළමයින්ට මදි පුංචි කතා කියන්නෙ නැද්ද?"

"අනේ නැහැ"

"සරම් ඇඳගෙන එන ළමයි?"

"එහෙම ළමයි නම් නෑ. පිරිමි ළමයි ඔක්කොම කලිසම්. ගෑනු ළමයි ගවුම්"

"ලොකු ළමයින්ට හොඳට ඉංගිරිසියෙන් කතා කරන්ට පුළුවන්ද මල්ලියේ?"

"පුළුවන්. ඇයි මාත් උඹ එක්ක ඉංගිරිසියෙන් කතා කළේ" මම හඬ නගා සිනාසෙමින් කීවෙමි.

"අනේ උඹේ ඉංගිරිසි" මුළු ගෙයම සිනාවෙන් පිරී ඉතිරී යන්නට විය.

අම්මත් අක්කත් නංගිත් නින්දට යද්දී භූමිතෙල් ලාම්පුව

32 වන පිටුව බලන්න

# එයා හරි...

31 වන පිටුවෙන්

ළංකරගෙන මම ඉංග්‍රීසි හෝඩිය පාඩම් කරන්නට වීමි. කැපිටල් සිම්පල් අකුරුවල වෙනස තේරුම් ගැනීමට උත්සාහ කළෙමි.

අප්පච්චි ගෙදර පැමිණියේ මා පාඩම් කරමින් සිටියදීය. ඔහු මා කියවන ඉංග්‍රීසි හෝඩිය දෙස මඳක් පහත් වී බලාගෙන සිටියේ මහත් ඕනෑකමින් යැයි මට සිතිණ.

"උඹ අද පස්සර ඉස්කෝලෙට ගියාද?"

"ඔව් අප්පච්චි"

"උප්පැන්නෙ හදාගත්තද?"

"ලොකු මහත්තයා ඒක හදලා නංගි අතේ එවල තිබුණා" ඉන්පසු කිසිවක් නොඇසූ අප්පච්චි උඩු රැවුලේ කොනක් කරකවමින් ළිප ළඟට ගියේය.

පාන්දර සිට පැල් බැඳගෙන වසින වැස්සකට මිස අව්වට, සුළඟට හෝ සාමාන්‍ය වැස්සකට මගේ පාසල් ගමන නවතාලන්නට නොහැකි විය. තේ වත්තේ සොරඩි ගෑමට නොගියත්, මම පාසල් ගියෙමි. උදේ හතහමාරේ සිට එකොළහමාර වන තෙක් තේ වත්ත සොරඩි ගාන මම ලුණුගල කඳුවැටියේ සිට ගලා බසින දියපාරකට බැස ඇඟපත සෝදා ගනිමි. නැතහොත් නාමි. ඉන්පසු අම්මා විසින් ගෙන එනු ලබන අල, බතල, කොස්, දෙල් හෝ බත් කා පාසල් ඇඳුම ඇඟලා ගනිමි. උදේ එන විට ගෙනවුත් ගසක් මුල හෝ ගල් දෙබුක්කාවක තබන පොත් ටික ගෙන තාර පාර දිගේ හැල්මේ දුවන්නට පටන් ගනිමි. වංගුවෙන් මා නොපෙනී යන තෙක් අම්මා බලාගෙන සිටී. මා එතැන පසු කරන්නේ ආපසු හැරී ඇයට අත වැනීමෙන් පසුය. පාසල පටන් ගන්නට විනාඩි පහකට හෝ දහයකට කලින් මට පන්තියට යා හැක.



දෙසතියකට පමණ පසු එක් දිනෙක මිනී පිට්ටනිය පසුකර ගෙදර යන්නට මම තීරණය කළෙමි.

"තනියම ?" මගේ තීරණය දැනගත් සැටියේම වනසිංහ බියෙන් මෙන් ප්‍රශ්න කළේය.

"ඔය පාරෙ මිනිස්සු වැඩිපුර යන්නෙ එන්නෙ නැති හින්දා පාර පුරා කැළෑව නැගිලත් ඇති"

"එහෙමම නෑ. ගිය සෙනසුරාදා මං මිනී පිට්ටනිය ළඟට එනකම්ම ඇවිත් බැලුවා. යන්ට අමාරු නෑ"

"ඒ වුණාට හවසට නම් ඔය පාරෙ කවුරුත් යනවා මං දැකලා නෑ"

"ඒකට කමක් නෑ. හැතැක්ම හතක දුරක් හැතැක්ම පහෙන් ඉවර කරන්ට පුළුවන්නෙ" වනසිංහ කිසිවක් නොකීවේය. මම ඔහුත් සමග පල්ලම් බැස්සෙමි. එදින වෙනදාට වඩා කලින් මට ගෙදර යා හැකි විය.

"අද වේලාසනින් ඉස්කෝලෙ ඇරියද ලොකු මල්ලියේ ?" මා ගෙට ගොඩ වූ සැටියේම අක්කා ඇසුවාය.

"නෑ දුවගෙන ආවා"

"අනේ මන්දා දවල්ටත් දුවනවා. හවසටත් දුවනවා" අම්මා කුස්සියේ සිට කියනු මට ඇසිණ.

පාසල් ගොස් ඒ මග ඔස්සේ එමින් සිටි තෙවැනි දිනයේ එක් වැඩිහිටි කාන්තාවක් ගෙවත්තේ වැට ළඟට අවුත් "මං ඊයෙත් දැක්කා උඹ මේ පාරෙන් යනවා. කොහේ ඉඳලද එන්නෙ ?"

"ඉස්කෝලෙ ඉඳලා" මම ගත් කටටම කීවෙමි.

"ඉස්කෝලෙ ඉඳලා ?" එයම ප්‍රතිරාවය කළ ඇය මගේ හිසේ සිට දෙපා තෙක් පුදුමයෙන් මෙන් බැලුවාය.

"ඔහේ කොහෙද ඉස්කෝල තියෙන්නෙ ?"

"ඇයි පස්සර සෙන්ට්‍රල් එක"

"උඹ ඔය පස්සර ඉඳලද එන්නෙ ?"

"ඔව්"

"උඹේ ගම ?"

"පින්නලන්ද"

"දෙයියනේ තවත් හැතැක්මක් විතර යන්ට එපායැ. ඇඳිරි වැටෙන්න කලින් යන්ට පුළුවන්ද ?"

"පුළුවන්. කතා කර කර හිටියොත් නම් යන්ට බැරිවේවි" යි කී මම දුවන්නට වීමි. සෑහෙන තරම් දුරක් දුවගෙන ගොස් මම ආපසු හැරී බැලීමි. ඇය දෑත තුනටියට දීගෙන මා දෙස බලා සිටිනු මට පෙනිණ. මිනී පිට්ටනිය පසුකරගෙන තනිවම ඒම ඇයට ප්‍රශ්නයක් වී ඇති බව මම තේරුම් ගතිමි.

මුලින් යම්කිසි පමණකට නමුත් සිතෙහි පැවති චකිතය දින කීපයක් ඇතුළත සම්පූර්ණයෙන්ම බැහැර වූ සැටියක් මට දැනිණ. මා එන මග ඇති අනෙක් තැන්වලත්, මිනී පිට්ටනියත් අතර වෙනසකට මට පෙනුණේ මිනී පිට්ටනිය මැද ළඳු කැළෑවෙන් වට වූ කුඩා ගොඩනැගිල්ලක් හා පොළොවට ගිලා බැස ගිය මිනී වළවල් කීපයක් දක්නට ලැබීමත් සෙසු තැන්වල එවැනි කිසිවක් දක්නට නොලැබීමත් පමණි. එතැනට ඇතැමුන් එතරම් බියක් දක්වන්නේ මන්දැයි මට කෙසේවත් තේරුම් ගත නොහැකි විය.

මාත් මගේ ගමේ අදත් ගොවිතැන් කරමින් ජීවත් වෙන ජයතුරාලත් යකුන් හා පෙරේතයන් නොතකා ජීවත් වෙන්නට කුඩා කල සිටම පොළඹවනු ලැබුවේ අපේ නැති බැරිකම් විසින්ද, නොඑසේනම් එකල රට පුරා වසංගතයක් ලෙස ව්‍යාප්තව ගිය මැලේරියා රෝගය මර්ධනය කරන සැටි කියාදීම පිණිස පාසලට පැමිණි 'සැන්ටිපෝට්' මහතා විසින්ද?

**ලබන කලාපයෙන් තවත් කොටසක්**

BRISK INTERNATIONAL CARGO INC
Worldwide Movers
Any Document Shipping worldwide
DHL EXPRESS
AIR-SEA-LAND
Household Goods & Commercial Cargo
Packing / Relocation / Transport / Express delivery
DELIVERY SERVICE ALL PART OF SRI LANKA (GIFT PACK)

Warehouse In Colombo
LAKSIRI SEVA (PVT) Lid
66 New Nuge Road,Peliyagoda
Kelaniya
Tel: 11-257-4180

Kurunegala Warehouse
Laksiri Seva (PVT)Lid
118/96 Negombo Road
Malkaduwawa
Kurunegala
Tel : 037-2052-810

Warehouse In Batticaloa
LAKSIRI SEVA (PVT)Lid
26,Hmyl Lane
Main Street,Addapalam
Ninthavur
Tel : 0672051050

Toronto: - 416-321-0400
IAM
International Association Of Movers
Proud member of
CIMC
Canadian International Movers Club
Ajax / Whitby - Mr.Prasad,1-289-200-4288
Ottawa : Kannan -1-613-828-2221 Montreal: Uthayan -1-514-736-2525
Web:www.briskcargo.com Email: info@briskcargo.com
919 Ellesmere Road Suite # 306 M1P2W7



# ජීවිතයට හොඳ නරක ගෙනෙන සහ පෙන්වා දෙන හඳහන

## 2017 මාර්තු 01 දින සිට මාර්තු 31 වන දින දක්වා ලග්න අනුව ශුභාශුභ තත්ත්වය කෙසේද?

(මෙම ජ්‍යොතිෂ පලාපල සටහන් ලියැවෙන්නේ කැනඩාවට සුදුසුවන පරිදි ගණනය කිරීමෙනි)



### කුම්භ ලග්නය

ලග්නාධිපති ශනි 11 වැන්නේ ගමන් කිරීම ශුභයි. ආදායම් මාර්ග ශුභ වේ. දනට පිනට යොමු වේ. අධ්‍යාපන කටයුතුවලට ශුභයි. වෙළඳ ව්‍යාපාරවලින් රැකියාවෙන් ලාභ ලැබේ. සතුරු කරදර අඩු වේ.

### මීන ලග්නය

ලග්නාධිපති ගුරු 7 වැන්නේ ගමන් කරයි. තම මතයට වැඩ කරන සේ පෙනේ. සිතිවිලි අධික වේ. විනෝදයට බාහිර අලංකාරයට සිත් දේ. සුදුසු වයසේ නම් මංගල යෝග උදා වේ. ආදායම් මාර්ග ශුභ වේ. අධ්‍යාපනයට ශුභයි. අලුත් දේ ඉගෙනුමට සිත් දේ.

### මේෂ ලග්නය

ලග්නාධිපති කුජ උච්ච වී ලග්නයේ ගමන් කරයි. ශුභ කාලයකි. දිරිමත්ව තම වැඩකටයුතු සාර්ථකව කර ගැනීමේ හැකියාව ලැබේ. විනෝද කටයුතු, ගමන් බිමන් අධික වේ. අමතර ආදායම් මාර්ග ලැබීමේ අවස්ථා ඇත. රැකියාව, පදිංචිය වෙනස් විය හැකියි. ව්‍යාපාර කටයුතුවලටද ශුභ වේ. භූමි ලාභ ඇත. අධ්‍යාපන කටයුතු සාර්ථක වේ.

### වෘෂභ ලග්නය

ලග්නාධිපති සිකුරු 11 වැන්නේ උච්ච වී ගමන් කිරීම ශුභයි. ආදායම් මාර්ග සරු වේ. පිරිස් බලය ලැබේ. රැකිරක්ෂා දියුණුව සැලසේ. දුරබැහැර ගමන් බිමන් යාමට අවස්ථාව එළඹේ. ඉඩ-කඩම් ලාභ ඇත. පදිංචිය වෙනස් වීමට ඉඩ ඇත. අෂ්ටම ඒරාෂ්ටකය ලබා ඇති අතර සඳු ද 8 වැන්නේ නම් වඩාත් ප්‍රවේසම් විය යුතුය. අනතුරු පීඩා ඇති විය හැක. අධ්‍යාපන කටයුතුවලට ශුභයි.

### මිථුන ලග්නය

ලග්නාධිපති බුධ 9 වැන්නේ ගමන් කරයි. අධ්‍යා-පනයට ඉතා ශුභ වේ. රැකියා, ව්‍යාපාර කටයුතු දියුණු වේ. දේපළ ගැනීමට, උරුම හිමිකම් ලැබීමට භාග්‍යය ඇත. පිනට දහමට යොමු වේ. විදෙස් ගමන්, වන්දනා, අධ්‍යාපන චාරිකා යාමට අවස්ථාව එළඹිය හැක.

### මකර ලග්නය

ලග්නාධිපති ශනි 12 වැන්නේ ගමන් කරයි. උසස් අධ්‍යාපනය ලද හැක. තම අදහස් බලවත් වේ. ආදායම් මාර්ග සරු වේ. කලාව, සංගීතයට යොමු විය හැක. රැකියා කටයුතුවලට ශුභයි. පදිංචිය රැකියාව වෙනසක් ඇති වීමට පුළුවන. කීර්ති ප්‍රශංසා ලැබේ. පුණ්‍ය කටයුතුවලට යොමු වේ.

### කටක ලග්නය

ලග්නාධිපති සඳු 9 වැන්නේ සිට ගමන් ඇරඹීම ශුභයි. රැකියා තනතුරු ලැබීමට, දියුණුවට ශුභයි. රැකියා අපේක්ෂිත අයට රැකියාවන් ලැබීමටද භාග්‍යය ඇත. ගේ දොර වාසස්ථාන ලැබීමට පදිංචිය වෙනස් වීමට අවකාශ ඇත. අධ්‍යාපනයට ශුභ වේ.

### ධනු ලග්නය

ලග්නාධිපති ගුරු 10 වැන්නේ ගමන් කරයි. රැකියා ව්‍යාපාර කටයුතු වඩාත් දියුණු වේ. ගමන් බිමන්, විදෙස් සංචාර ගමන් යාමට අවස්ථාව එළඹේ. ගේ දොර ඉඩකඩම් ගැනීමේ භාග්‍යය ඇත. ආදායම් මාර්ග සරු වේ. අධ්‍යාපන කටයුතුවලට ශුභයි. මිතුරු ඇසුර, පිරිස් බලය ලැබේ. ලග්නයේ සඳු ඇත්නම් ජන්ම ඒරාෂ්ටකය ලබා ඇති මේ කාලයේ අනතුරු පීඩා ඇතිවීමට ඉඩ ඇති හෙයින් වඩා ප්‍රවේසම් විය යුතු වේ.

### සිංහ ලග්නය

ලග්නාධිපති රවි 7 වැන්නේ ගමන් කරයි. බාධක මැද ඉදිරියට යා යුතුය. පුණ්‍ය කටයුතුවල යෙදීම ශුභයි. ගමන් බිමන් අධික වේ. පිරිස් බලය ලැබේ. අධ්‍යාපනයට ශුභ වේ. අලුත් දේ කිරීමට සිත් දේ. රැකීරක්ෂා දියුණුව සැලසේ. ධන ලාභ සහිත කාලයකි.

### වෘශ්චික ලග්නය

ලග්නාධිපති කුජ 6 වැන්නේ උච්චක්ෂේත්‍ර වී ගමන් කරයි. සතුරු කරදර අඩුය. අධ්‍යාපන කටයුතුවලට ශුභ වේ. සංගීතය, කලා අංශය ආදියට යොමු වේ. ප්‍රේම සබඳතා ඇතිවීමට ඉඩ ඇත. ධන ලාභ සහිතයි. රැකියා කටයුතු දියුණුව සැලසේ. සඳු දෙවැන්නේ නම් අනතුරු පීඩා ඇතිවීමට ඉඩ ඇති හෙයින් වඩාත් ප්‍රවේසම් විය යුතු වේ.

### තුලා ලග්නය

ලග්නාධිපති සිකුරු 6 වැන්නේ ස්වක්ෂේත්‍රව ගමන් කරයි. රාජ්‍ය අංශයේ රැකියාවන් ලැබීමට අවස්ථාව ඇත. ව්‍යාපාරවලට ශුභ කාලයකි. අධ්‍යාපනයට ශුභයි. විභාග ජය ලැබේ. කුජ 7 වැන්නේ උච්චක්ෂේත්‍රව ඇත. අලුතෙන් ආරම්භ කරන කටයුතු සඵල වේ. ගේ දොර ගැනීමේ භාග්‍යය ඇත. දියුණුවට ශුභයි.

### කන්‍යා ලග්නය

ලග්නාධිපති බුධ 6 වැන්නේ ගමන් කරයි. රැකියා, ව්‍යාපාර කටයුතු දියුණුවට ශුභයි. හවුල් ව්‍යාපාර, කොටස් ව්‍යාපාරවලින් වාසි ලැබේ. විවාහ කටයුතුවලට ශුභ වේ. සතුරු කරදර අඩු වේ. අධ්‍යාපනට ශුභයි.

එම්. වයි. ධර්මවිජය
ජ්‍යොතිෂ ඩිප්ලෝමා, උසස් ඩිප්ලෝමා,
ජ්‍යොතිෂ ශිරෝමණී(රන්පදක්කම් ලාභී)
ඔබගේ සියලුම ජ්‍යොතිෂ කටයුතු සඳහා විමසන්න
දුරකථන අංක කැනඩාව: 01-905 990 2311
Email: ashawije18@yahoo.ca



**If you are Buying or Selling**
**For a Reliable Inspection**

## Yohan De Mel
Certified Home Inspector

TEL:
**416 885 4625**

E-Mail
nirhanhomeinspections@gmail.com

**Nirhan Property Inspection Services**



# Tutoring
## From Grade 08 to 12

| Mathematics<br>Physics<br>Programming<br>(Java, C#) | <u>Grade 12 Mathematics</u><br>Advance Functions<br>Limits<br>Calculus |
|---|---|

- Supporting for homework and tests
- Full attention for improving knowledge
- Home Visits possible

Experience and qualified teacher for excellent results

Contact
**Kithsiri Jayasinghe**
(BSc. , MSc.(UK) Mathematics & Comp. Science)

Email: jayakithsiri@hotmail.com
Phone: (416) 745-6675, (647) 705-1606



# 'ඇය පියමැන්නේ ..... සේද මාවතක නොවේ'



ස්වකීය අනන්‍යතාව, ප්‍රතිභාව පමණක් නොව සිය හඬෙහි පවත්නා ප්‍රබල හා සංවේදී ගති ලක්ෂණද මනා ලෙස හැඩ ගස්වා ගනිමින් සිංහල ගී කෙත පෝෂණය කළ ඇය ප්‍රතිභාපූර්ණ ගායන ශිල්පිනියකි. සංගීත අධ්‍යක්ෂවරියකි.

ඇගේ රසික රසිකාවියන් වෙනුවෙන් අප හා එක්වන ඒ රුවෙන් ගුණෙන් පිරි සෙනෙහෙවන්ත කලාකාරිනිය විශාරද නීලා වික්‍රමසිංහ.

**Q ඔබ මෙතෙක් ගායනා කළ ගීත දෙස බැලීමේදී අපට පෙනෙන විශේෂත්වය තමයි ඔබ විවිධ ශෛලීන්වලට ඒ කියන්නේ ජන, ශාස්ත්‍රීය, බටහිර වැනි ශෛලීන්වලට ගීත ගයා තිබෙනවා. හඬ හසුරුවා තිබෙනවා. ඒ සෑම ගීතයක්ම රසිකයාගේ හදවතේ සටහන් කරන්නට සමත් වෙලා තිබෙනවා. මෙය හැම කෙනෙකුටම කළ හැකි දෙයක් නොවෙයි. කොහොමද ඔබ එය අද දක්වාම පවත්වාගෙන ආවෙ? කුමක්ද එහි රහස? විවිධ ශෛලීන්වලින් ගීත ගැයීමේ හැකියාව කොහොමද ඔබට ලැබුණෙ....**

සෑම කෙනෙක්ම උපතින් දක්ෂතාවක් අරගෙන තමයි උපදින්නෙ. මට සහජයෙන්ම උරුම වුණේ මගේ කටහඬ. ඕනෑම ශෛලියක් සඳහා යොදාගන්නෙ එකම ස්වර. නමුත් එක් එක් ශෛලිය සඳහා එම ස්වර යොදාගන්නා ක්‍රමය වෙනස්. ඒ අනුව හඬ හැසිරවීම කළ යුතුයි. මම ඉතා හොඳින් ශාස්ත්‍රීය සංගීතය හදාරපු කෙනෙක්. ඒ නිසා ගායනයේ ඇති විවිධ හැඩතල හඳුනාගැනීම ඉතා පහසුයි. අනිත් කාරණය තමයි මම හිතන්නෙ 'ගීතය' තමයි මගේ ජීවිතය. ඒ නිසාවෙන්ම විවිධ ශෛලීන්වලින් නිර්මාණය වූ ගීතවලට සවන් දෙනවා. ඒ අනුව ගයමින් එක් ශෛලියකින් තවත් වෙනත් ශෛලියක් වෙනස් වන ක්‍රම හඳුනාග න්නවා. එක්වරක් හෝ දෙවරක් ඇසූ පමණින් ඒ සියල්ල මගේ මතකයේ රැඳෙන නිසා ඕනෑම ශෛලියක ගීතයක් ගැයීමේදී ඒ මතකය අවදිකර ගනිමින් හඬ හසුරවනව. මේ සියල්ලටම වඩා වැදගත් වන්නේ 'කැපවීම'. මා තුළ එය උපතින් තියෙනවා. අනිත් කාරණය තමයි ගීතයක් ගයන අවස්ථාවේදී මම ජීවත් වෙන්නෙ ඒ තුළ පමණක් නිසා ගීතයේ අර්ථය හොඳින් වටහාගෙන ඊට අදාළ නාද රටාව අනුව හඬ හසුරවමින් ගීතයට පණ දෙනවා. ඒ වගේම ඒ ඒ සංගීත ශෛලියට අනුව හඬෙහි බර බව අඩු වැඩි විය යුතුයි. මේ සියල්ල මා අතින් නිරායාසයෙන් සිදුවෙනවා. ඒ මා ගීතයට බොහෝ සෙයින් ආදරය කරන නිසා වෙන්න ඇති. එයයි එකම රහස.

**Q 70-80 දශකයේ ගීත අමරණීයයි. එම ගීතවල වටිනාකම දවසින් දවස වැඩි වෙනවා මිසක් අඩු වන්නේ නෑ. ඉතින් ඔබ ගැයූ ගීත සංරක්ෂණය කිරීමේ වැඩ පිළිවෙළක් දැනට තියෙනවද?**

සැබවින්ම ඔව්. දැනටමත් මා විසින් ගයන ලද ගීත මා එක්රැස් කරමින් ඉන්නවා. නවීන තාක්ෂණය උපයෝගී කර ගනිමින් එම ගීත සංරක්ෂණය කිරීම ඉතා කල්පනාකාරීව හානියක් නොවන ලෙස කළ යුතුයි. ඒ සඳහා තාක්ෂණය පිළිබඳව හොඳින් දන්නා අයගෙන් උපදෙස් ලබාගැනීමට මා බලාපොරොත්තු වෙනවා. මෙවැනි දේ සිදුවිය යුත්තේ 'රජය' මගින්. එයට හේතුව 'කලාකරුවා' කියන්නෙ රටක හදවත. අපේ රටෙහි කලාකරුවා සහ කලා නිර්මාණ රැක ගැනීම සඳහා කිසිවක් දියත් කොට නොමැති වීම ගැන කණගාටු වෙනවා. තනි තනිව හෝ අප විසින් නිර්මාණ සංරක්ෂණය කළ යුතු වෙනවා. මම ඒත් එක්කම සියලුම දත්තයන්ද එක්රැස් කරමින් ඉන්නවා මතු පරපුරට ජීවිතාබෝධය සඳහා දායාද කිරීමට.

**Q ඔබ ගැයූ ගීත අතරින් ඔබ වඩාත්ම ප්‍රිය කරන ගීත මොනවාද?**

මම හිතන්නෙ ඔබ මාව අපහසුතාවයකට පත් කළා කියල. අම්ම කෙනෙක්ගෙන් ඇහුවොත් දරුවන්ගෙන් වැඩිපුරම ආදරේ කාටද කියල අම්මට උත්තර දෙන්න බැහැ. ඒත් සමහරවිට ඇගේ යටි හිතේ වැඩි ඇල්මක් තියෙන්නෙ පොඩිම දරුවට වෙන්න පුළුවන්. එහෙත් නැත්තම් මවු පදවියට තමාව පත් කළ වැඩිමහල් දරුවට වෙන්න පුළුවන්. අන්න ඒ වගේ තමයි මා ගැයූ ගීත සෑම එකකටම වාගේ මම ප්‍රිය කරනවා. නමුත් පිළිතුරක් අවශ්‍යයිනෙ ඔබේ ප්‍රශ්නයට. ඒ නිසා මම වඩාත්ම කැමති ගීත තමයි මාස්ටර් සර් (චිත්‍රපටයක් සඳහා ගැයූ මුල්ම ඒකල ගීතය, චිත්‍රපටය - කළුදිය දහර), බෝධියේ විහාරයේ (මට ප්‍රථම සරසවි සම්මානය හිමිකර දුන් ගීතය. චිත්‍රපටය - ඈතින් ඈතට), පාරමී දම් පුරමු (ආදරයේ වියෝව දෙස වෙනත් ආකාරයකින් බැලීමක්), තුන් සිත දැහැන් ගත වෙනා (නළුවෙක් සහ ගායිකාවකගේ ජීවිතයේ සත්‍යය පෙන්නුම් කිරීමක්), වියෝ ගී ගැයෙනා හදේ (චිත්‍රපටය - ගැහැනු ළමයි), යෞවනයේදී අතිනත අල්ලා (බුදු දහම හා සසඳමින් ජීවිත යථාර්ථය පෙන්නුම් කරන ගීතයක්). මා වඩාත්ම ප්‍රිය කරන ගීතවලින් කිහිපයක් පමණයි මා මෙහි සඳහන් කළේ.

**Q ශ්‍රී ලංකාවේ නව පරපුර ගැන ඔබ හිතන්නෙ මොනවාද? සංගීත ක්ෂේත්‍රයට පිවිසි අය ගැන මම අදහස් කළේ....**

ඉතා හොඳ ප්‍රශ්නයක්. සංගීත ක්ෂේත්‍රය හරියට සුවඳවත්, වර්ණවත් මලින් පිරුණු උද්‍යානයක් ලෙසයි මම දකින්නෙ. එක මලක් පරවෙන කොට තව මලක් පිපෙන්න ඕන. එහෙම නූනොත් එය දිගින් දිගට පවත්වාගෙන යන්නට බැරි වෙනවා. අද ඒ උද්‍යානයේ මල් එකින් එක පරවී යනවා. ඒක තමයි ස්වභාවය. ඒත් පේන තෙක් මානයක මල් පොහොට්ටුවක්වත් නැහැ. ඒකට හේතුව ලෙස මා දකින්නෙ අද බොහෝ දෙනෙක් මේ ක්ෂේත්‍රයට පිවිසෙන්නෙ ක්ෂේත්‍රයට ආදරයකින් නොවෙයි. ඉතාමත් හොඳින් ගායනා කරන්න පුළුවන් අය ඉන්නවා. ඒත් ඔවුන්ව වාණිජ රැල්ලට හසුකර ගන්න පිරිසක් ඉන්නවා. ඒ නිසා ක්ෂේත්‍රයේ පැවැත්ම සඳහා නිර්මාණ කරන්න තියෙන අවස්ථා ගිලිහී යනවා. අනිත් කාරණය තමයි තමාට අනන්‍ය වූ කටහඬක් ඕනෑම කෙනෙකුට තියෙනවා. නමුත් ඔවුන් උත්සාහ කරන්නේ ප්‍රවීණයන්ගේ ගීත පමණක් නොවෙයි කටහඬ පවා අනුකරණය කරන්න. ඒ නිසා අලුත් හඬක් අපට අහන්න ලැබෙන්නෙ නැහැ. ඒ එක්කම බොහෝ නවකයින් උත්සාහ ගන්නේ ජනප්‍රිය වෙන්න මිසක් සාර්ථකත්වයට ළඟාවෙන්න නොවෙයි. මෙය අද පවතින කණගාටුදායක තත්ත්වයක්. ඒ නිසා නව පරපුරට කියන්න තියෙන්නෙ තමන්ට වගේම සංගීත ක්ෂේත්‍රයට සහ ජ්‍යෙෂ්ඨයන්ට ආදරය කරන්න. සාර්ථක නිර්මාණ ක්ෂේත්‍රයට දායාද කරන්න. ජනප්‍රියත්වය එවිට තමා පසුපස ඒවි. මේ ක්ෂේත්‍රයත් රැකගෙන බොහෝ දුර ගමනක් යන්නට ඔබට හැකිවෙන්නෙ එවිටයි.

**Q ගායනය හැරුණු කොට ගී පද රචනාවන්ද ක්ෂේත්‍රයේ පැවැත්මට මහඟු රුකුලක් වනවා නේද? ප්‍රවීණයන් වූ ප්‍රේමකීර්ති සහ අජන්තා රණසිංහ වැනි අයගේ අඩුව දැනෙනවා නේද?**

සත්තකින්ම. ප්‍රේම් අයියා සහ අජන්තා අයියා වැනි ප්‍රතිභාපූර්ණ කලාකරුවන්ගේ වියෝව අපේ සංගීත ක්ෂේත්‍රයට විශාල පාඩුවක්. ගීත සාහිත්‍යයේ පෝෂණය වෙනුවෙන් ඔවුන් අතින් වූ මෙහෙය කියා නිම කළ නොහැකියි. ඔවුන් අතින් සිත්තම් වුණේ අර්ථපූර්ණ, භාවපූර්ණ, රසපූර්ණ පද මාලා. ඔවුන්ගේ සෑම නිර්මාණයක් තුළම උකහා ගන්නට දෙයක් තිබුණා. ඉගෙන ගන්නට බොහෝ දේ තිබුණා. මගේ සංගීත දිවියේදී වැඩිම ගීත ගණනක් ගයා ඇත්තේ 'අජන්තා' අයියාගේ පද මාලා. අද දවසේ අපට අසන්නට ලැබෙන බොහෝ ගීතවල අර්ථයක්, රසයක් නැහැ. පදවල ගැලපීමක් නැහැ. ඒ නිසාම එම ගීතවල පැවැත්මකුත් නැහැ. ඒ වගේ වෙලාවට ප්‍රේමකීර්ති ද අල්විස් සහ අජන්තා රණසිංහ වැනි කලාකරුවන්ගේ වටිනාකම අපට තදින්ම දැනෙනවා.

**Q ඔබ ගුරුවෘත්තියේ නියැලුණු කලාකාරිනියක්.**

**ඇත්තටම ඔබ ගු**රු මවක ලෙස කටයුතු කළ බව අප දන්නවා. ළමා පරපුරට ඔබ සිදුකළ මෙහෙය ගැන සඳහන් කළොත්.... ඔබගේ ගෝලයන් කැනඩාවේත් සිටිනවා විය හැකියි.

අවුරුදු 23 ක් මා ගුරුවෘත්තියෙහි නියැලී සිටියා. පාසල් තුනක මා ගුරුවරියක් ලෙස සේවය කළා. මුල්ම පත්වීම ගාල්ල අහුංගල්ල රාජපක්ෂ මහා විද්‍යාලයට තමයි ලැබුණේ. මට එහිදී උගන්වන්නට ලැබුණේ සංගීතය විෂයය නොවුණත් එහි සිටි කාලය තුළ දරුවන් පාඨශාලාන්තර ගායන තරගවලට ඉදිරිපත් කරමින් පාසලට ජයග්‍රහණය අත්කර දෙන්නට හැකි වුණා. මාස තුනක කාලයක් තමයි මම එම පාසලේ සේවය කළේ. ඉන්පසුව මා මාරුවීමක් ලබාගත්තා බණ්ඩාරගම මධ්‍ය මහා විද්‍යාලයට. වසර 19 ක් එම විදුහලේ සේවය කර කොළඹ විසාකා විදුහලට මාරුවීමක් ලබාගත්තා. මම ගුරුමාතාවක් ලෙස ඉතා කැපවීමෙන් ගුරුවෘත්තියෙහි නියැලුණා. මම ගායන ක්ෂේත්‍රයටත් වඩා තෘප්තිමත් වෙනවා ගුරුවෘත්තිය පිළිබඳව. බණ්ඩාරගම මධ්‍ය මහා විද්‍යාලයේ මගෙන් ශාස්ත්‍රය හැදෑරූ සම්පත් ශ්‍රී චමින්ද ශිෂ්‍යයා තමයි කැනඩාවේ 'මාස්ටර් සර්' ප්‍රසංගය තාල තරංගවලින් හැඩ කරන්නෙ. මගේ ගෝලයන් සෞන්දර්ය විශ්වවිද්‍යාලයේ සහ ගුරු වෘත්තියේ නියැලී සිටිනවා. විසාකා විදුහලේ සේවය කරන කාලය තුළ ශිෂ්‍යාවන් දහසක් පමණ සහභාගි කරවමින් 'සිසු රැඟුම්' ඉදිරිපත් කරමින් දරුවන්ගේ දක්ෂතාවන්ට ඉඩ හසර ලබාදුන්නා. එවකට විසාකා විදුහලේ සේවය කළ සුනිලා ජයන්ති ලොකුමාන ගුරුමහත්මිය තමයි නර්තන විෂයය භාරව කටයුතු කළේ. අපේ එකමුතුවෙන් තමයි 'සිසු රැඟුම්' ආරම්භ කළේ. ඒ තුළින් සංගීතය සහ නැටුම් විෂයය හදාරන සිසුවියන්ට අමතරව ඕනෑම ශිෂ්‍යාවකට මේ සඳහා ඉදිරිපත් වන්නට ඉඩ කඩ ලබා දුන්නා. දරුවන් 280 ක් සමග 'බෝනික්කෝ' නමින් ඉතා සාර්ථක ප්‍රසංග යක් 'නෙළුම් පොකුණේ' දී පැවැත්වූවා. මම හිතන්නේ සෑම රටකම වගේ ප්‍රසංගවලට සහභාගි වුණාම මගේ ගෝලයන් මට හමුවෙනවා. කැනඩාවේත් මගේ ගෝලයන් බොහෝ දෙනෙක් සිටිනවා. ගුරුවරියක් ලෙසින් මගේ සේවය ඉතාම කැපවීමෙන් ඉටුකළ බව මගේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් හොඳින් දන්නවා. ඒ පිළිබඳව මට දැනෙන්නේ අප්‍රමාණ සතුටක්.

**Q ඔබගේ පෞද්ගලික තොරතුරු බිඳක් පැවසුවොත්....**

වැඩි යමක් නැහැ. අඩු වැඩි වශයෙන් ජීවිතයට එන ප්‍රශ්නවලට සතුටින් මුහුණ දෙමින් වෙහෙස වී තනාගත් අපේම කැදැල්ලේ 'කපිල' ත් මම සාර්ථක යුග දිවියක් ගත කරනවා. කාගේත් ලෙඩට දුකට පිහිට වෙමින් සැහැල්ලුවෙන් ජීවත් වෙනවා. විශේෂ බලාපොරොත්තු නැහැ. අපේ රසිකයන් වෙනුවෙන් නිර්මාණ කරමින් හැකිතාක් කල් ගීත ගයනවා.

**Q කැනඩාවේ පවත්වන 'මාස්ටර් සර්' ප්‍රසංගය ගැන ඔබට යමක් කියන්නට ඇති කියා මා විශ්වාස කරනවා.**

ඇත්තෙන්ම විශේෂිත වූ කාරණා කිහිපයක්ම තිබෙනවා. වසර විස්සකට පසුවයි මා කැනඩාවට පැමිණෙන්නෙ. අනිත් කාරණය තමයි මා මේ පියමං කරන්නේ මගේ සෞන්දර්ය චාරිකාවේ පනස්වෙනි වසරයි. මගේ ප්‍රසංගය හැඩ කිරීමට ලංකාවෙන් පැමිණෙනවා අතිදක්ෂ ශිල්පීන් සිවු දෙනෙක්. යුග ගායනයෙන් ප්‍රසංගය හැඩ කරන්නේ තරුණ පරපුරේ ගායන හා රංගන ශිල්පියෙක් වන කපිල. කපිල හේරත්. තාල තරංගයෙන් විශාරද සම්පත් ශ්‍රී චමින්දත් ගිටාරයෙන් මහේන්ද්‍ර පැස්කුවල් සොයුරාත් අතිමධුර වූ වාදනයෙන් ප්‍රසංගයට ආලෝකයක් ලබා දෙනවා. ඕගනයෙන් සත්සර හඬවමින් සංගීත අධ්‍යක්ෂණය කරමින් ප්‍රසංගය වර්ණවත් කරන්නේ තරුණ පරපුරේ සම්මානනීය සංගීත අධ්‍යක්ෂවරයකු වන සුරේෂ් මාලියැද්ද සොයුරායි.

වයස පරතරයකින් තොරව ඕනෑම කෙනෙකුට රස විඳිය හැකි අයුරිනුයි ගී පෙළ ගස්වා තිබෙන්නෙ. සජීවීව පවත්වන මේ ප්‍රසංගයෙන් පැය තුනකට ආසන්න කාලයක් අපගේ දයාබර රසික රසිකාවියන්ට උපරිම වින්දනයක් ලබා දීමට අපි බලාපොරොත්තු වෙනවා. ඒ නිසා මේ සජීවී අත්දැකීම විඳගන්නට අප හා එක්වන ලෙස ඔබට සෙනෙහසින් ඇරයුම් කරනවා.

'මාස්ටර් සර්' ප්‍රසංගය කැනඩාවේ එඩ්මන්ටන් සහ ටොරොන්ටෝ නගරවල පැවැත්වීම සඳහා උපරිම දායකත්වය ලබාදුන් 'විෂන් ආට් ලංකා' අධිපති සුදේශ් මුතු සොයුරාටත් ප්‍රසංගය සංවිධානය කරන 'ඔන්ටාරියෝ විසාකියන්ස්' ආදි ශිෂ්‍යාවන්ටත් මගේ රසික ඔබ සැම වෙනුවෙන් ගෞරවපූර්වක ස්තුතිය පුදකර සිටිනවා.

**සාකච්ඡාව මෙහෙයවීම සහ සැකසුම - ඩේනි / විශාඛා**

## කොහොම හරි දිග නිවාඩුවකට තාත්තේ මං ඔන්න ආවා !

පුහුණු වැඩමුළු ඔපිසියේ වැඩ
දවස ගානෙම මටත් වැටුණා
පංති පෙරහුරු විභාගයෙ වැඩ
පුංචි උන්ටත් නිතර තිබුණා
පෝය සති අග නිවාඩුවටත්
වැඩත් එක්කම ඔහේ උන්නා
උඹව අමතක වෙලා කියලත්
මතක නැතිවම දවස් ගෙවුනා

අලුත් අවුරුදු නිවාඩුවකට
නත්තලත් එන දවස් බලලා
අරය කුණු කුණු ගාන හින්දම
ගෙවුනෙ එහෙ මහ ගෙදර ඉඳලා
උඹට බෙහෙතක් අරන් දෙන්නට
එන්න හැදුවත් දමල ගහලා
බොසා බර බර ගෑව නිතරම
මගේ පහුවුණු වැඩත් ඇදලා

ගෙදර රට උළු වහල වැස්සට
අඬල අඬලම දිරල තිබුණා
මිදුලෙ අටපෙති ගහේ ඉඳහිට
මලක් තනියම පිපිල මැරුණා
බලල ඇවිදින් යන්න එනකන්
ලියපු ලියුමක හුස්ම වැටුණා
මඩමෙ වේවැල් පුටුවෙ ඉඳගෙන
උඹත් නියපොතු කාල තිබුණා

පරණ යාලුවො ඔපිසියෙ උන්
මටත් කලියෙන් ඇවිත් තිබුණා
බැනර් කටවුට්වලින් මම ගැන
උඹට වැඩියෙන් කැපිල පෙණුනා
පැටියො මහ ගේ හදල විකුණමු
ගෑනි කිව්වම පපුව පැළුණා
දැනුණ හිරිකිත කමට මන් ගැන
මටත් නොදැනිම හුඟක් ඇඩුණා

කඩපොළේ කුණු පාට කණුවල
ඉලව් කොළවල කොටු වෙලා
නුග ගහේ උඩ දාපු කොඩියක්
හුළං පාරට සෙලවුණා
පහුවෙලා හරි මං ආපු එක ගැන
සතුට වැඩිතැන හිනැහිලා
තාත්තේ උඹ බලන් ඉන්නැති
මල් වඩම් මැද තනි වෙලා

**ජනිත් විතාරණගේ**

## සතපසය

වළඳන්නේ
ගතසිත පරදන දේය
දවටන්නේ
සිරුරට නොකැපෙන දේය
වැජඹෙන්නේ
අග මුල නැත්තන් සේය
උපන් බිමට
අපි ආගන්තුක වීය

**ගාමිණී අබේරත්න**

## මතින් එන සැමියා වෙත...!

හදින් උණු වී
නෙතින් ගලනා
කඳුළු බිඳුවක්
පිස දමන්නට

හෙමින් ඉපදී
වතින් නැගෙනා
වේදනාවක්
කියා ගන්නට

සිතින් පැහැදී
බැතින් පිදෙනා
සෙනෙහෙ බිඳුවක්
ලබා ගන්නට

මතින් වෙන් වී
එන්න හිමියනි
ජීවිතේ බර
බෙදා ගන්නට

**කුසුමලතා මුණසිංහ**

## 48 න් පසු

කාසියක් උඩ දමා බලනව
ලබාගන්නට ඉල්ලමක්
නෝන වැටුණත් පොල්ල වැටුණත්
දකින්නේ එක සෙල්ලමක්

**ජනක මාරපන**

## (අ)සමත් සිසුවා

පොළේ ඉඳන් අව්වේ එළවලු විකුණන   කොට
ගණිත ගුරුතුමා ඇවිදින් හිටියා   එතනට
මතක කුරුල්ලා ඉගිලුනි විසිවස්   එපිටට
අදත් ගණන් වරදිනවා දැන දැන මේ   මට

එදා නොදැන වැරදුනාම පොත ගෙන විසි   කොට
එළවා දැම්මා මතකයි පන්තියෙනුත්   පිට
මං විසිවී ගියා පොතෙන් හුඟක්ම   ඈතට
කිලෝ එකයි කියනෙමි අද හත්සිය   පනහට

**ජී. ජී. නන්දනී**

## පියසිත දුක...

නොම්මර කිය කියාය අඬ ගසාය
දුම්බර මැණිකෙලා - නිලමෙල - ලෙසාය
ඉසිවර වගේ වෙදදුරු වැඩ වසාය
නොම්මර තුණ්ඩු ගැන මාගෙන් අසාය

මාස තුන-හතර-පහ-හය-හත-අටද
නානා ප්‍රමාණෙට ගැබ් දරනා නිබඳ
බිරිඳන් කැටිව එන සැමියන් මෙහි නොමඳ
ආඩම්බරකාර බැල්මත් ඇස පැළඳ

ඇත්තුන් සමග යන නිලමේලා සේමා
වස්තුව මොටද තව සම්පත් සැකසේමා
තිස්තුන් කෝටි දෙවියනි උත්තර ඕනෑ
මක්කද පාපෙ මට දරුවන් නැති වීමා

දහසක ගැබිනි රූ දැක දැක දවසේම
රහසෙම කඳුළු පිසලම්
නිදි නැති යාන
මහමෙර දුකෙක
මා ඇති බැව් නොතකාම
මහගේ නිදයි
යමරෙට - ගොරව ගොරවාම

**යමුනා මාලිනි පෙරේරා**

**(වරද සුන්දරය කාව්‍ය සංග්‍රහයෙන්)**

## ආයාචනය

දෙගුරුන්ට කීකරුව
විවා වී දුරු රටක
ළමා හුරතල් බලන
පෙම්වතිය අසනු මැන
දෙසවනට කොඳුරමින්
මා කියන මේ වදන

මා විවා වන දිනේ
මඟුල් පෝරුව අසල
සිනා කැන් සල සලා
බලාගෙන සිටිනු මැන

නොසැසඳෙන සිතැඟි ඇති
පතිනියක වුවොත් ඈ
පැමිණ ඉඳහිට දොඩා
ළසෝ ගිනි නිවනු මැන

කුළුඳුලේ මට උපන්
සිඟිත්තා වඩාගෙන
පෙර දිනක මට පිදූ
හාදුවක් පුදනු මැන

ප්‍රණය කලි කලහයෙන්
සිත් සතන් අවුල් වී
බීමත්ව සිටින විට
සිරස පිරිමදිනු මැන

ලෙඩ ඇඳේ පණ අදින
මා දුබල සිරුර දෙස
දෑස දල්වා බලා
වරක් ඉකි බිඳිනු මැන

**සුනිල් ආරියරත්න**

## විස්මය

කාට නම්
කළ හැකිද
මෙවන් වූ වික්‍රමය

අප්පච්චි
මොනතරම් සීරුවට
රිංගවා තියෙනවාද
කඳුළු ඩාදිය බිංදු
ගොයම් කරලක්
තුළට

**දඹේගොඩ ජිනදාස**

## හිතට හොරෙන්

හිතට හොරෙන් මගෙ හිත නුඹ දැන් හොරකම්   කරලා
මුවට හොරෙන් මගෙ මුවගට සිනහවකුත්   දීලා
ඇසට හොරෙන් නුඹෙ රුව නුඹ එහි සායම්   කරලා
සතුට හොරෙන් මගේ හිතට යළි ගෙනැවිත්   දීලා

අදත් හොරෙන් නුඹෙයි මගෙයි සිත් යළි   මුණගැහිලා
අපි නොදැනිම ඒ දෙහදම අලුත් ලොවක්   හදලා
හෙට දවසේ එක් වෙන්නට වෙන්වෙමු අද   කියලා
නුඹ කිව්වට මගෙ හිත නෑ ඔය හිත අත   ඇරලා

නුඹත් සමග පිය නගනා හෙට සිහිනෙන්   දැකලා
මට නුපුරුදු අලුත් ලොවක මේ හිත ගල්   ගැහිලා
නැවුම් සුවඳ පිරි ආදරයක් නුඹ මට   දීලා
අලුත් ඉරක් අද දවසේ ලොවම එකලු   කරලා

**පුබුදිතා අබයසිංහ - ලන්ඩන් ඔන්ටාරියෝ**

## මාතෘ විවරණය

සත් දිනක් ඔබ දරා උර තල
දිනූ දා ගොර බිරම් දළරල
පුතේ නුඹ මතු බුදු වෙයන් යයි
කියන තුරු අම්මේ
ලොව්තුරා බුදු පදවියක් ගැන
නොසිතුවෙම් අම්මේ ........

කල්ප සහසින් පෙරුම් පුරමින
එදා දීපංකර පාද මුල
මොක් පුරේ දොර විවර වූවද
නොවැඩියෙම් අම්මේ

සියල් සත් වග සසර කතරින්
මුදන ලෙද අම්මේ..........
මෙදා තුසිතයෙ මාතු දෙව්රජ
ලෙසින් අභිදම් සවන් දෙන සඳ
සිත් පුරා සම්බුදු පුතණු දැක
සැනසුනිද අම්මේ
ඔබයි බෝසත් වරුන් සතහට
පුද කලේ අම්මේ ...........

**මාලිනී සෙනෙවිරත්න**
**ටොරොන්ටෝ**

# FIRST TIME HOME BUYER SEMINAR

FOR SALE

## Learn What You Need to Know !

- The Current real eatate market
- The home buying process
- How to qualify and what loans are available
- How to get clear title and ensure clear title

**Presenters will include**

- *Real Estate Agent*
- *Mortgage Brokers*
- *Real Estate Attorney*

**Come join us for FREE First Time home buyer seminar !**

## April 2017 in Etobicoke

**Organized by**

**Gamini Abeysinghe.** ABR, CNE
Real Estate Sales Representative

**Please Register before 20 th March 2017**

For more info : 416 822 2789 shinko@rogers.com

RE/MAX DIAMOND REALTY INC, Brokerage, 1570 Kipling Ave, Toronto, ON, M9R 2Y1
Not intended as solicitation of sellers under listing contracts or buyers under buyer representation agreements

# AirCare Plus

ONE CALL WILL FIX IT ALL

Sales | Service | Repair | Installation

Line: 416.605.8300
Email: ashokdon@live.ca

**Heating & Air Conditioning**
*FAST, AFFORDABLE SERVICE*

## Ashok Hettege

Licensed H.V.A.C Technician



- Furnace
- Gas Piping
- Hot Water Tank
- Tankless Water Heater
- Humidifier
- Air Cleaner
- Air Conditioning

Dishwasher & Fridge Water Line Installation
Gas Stove and Gas Dryer Installation

ග්‍රීෂ්ම සමය නිමා විය.
ඔබේ නිවසේ තාපන යන්ත්‍රයේ (furnace)
නිසි ක්‍රියාකාරිත්වය පිළිබඳ
සැලකිලිමත් වන්න.
එහි අත්‍යවශ්‍ය නඩත්තු කඩයුතු අලුත්වැඩියා

A MEMBER OF CanLanka BUSINESS ASSOCIATION

2004-2014 10 CELEBRATING 10 YEARS IN BUSINESS

SATISFACTION 100% GUARANTEE







දසත Dasatha ඔබේ නිවසටම

සෑම මසකම දසත Dasatha පුවත්පත
ඔබේ නිවසටම තැපැල් මගින් ගෙන්වා
ගැනීමේ අවස්ථාව දැන් සලසා ඇත.

**දසත දායකත්ව ගාස්තු**
**Subscription Rates for Dasatha**

මාස හයක් සඳහා දායකත්ව ගාස්තුව - CAD $ 35
වසරක් සඳහා දායකත්ව ගාස්තුව - CAD $ 70

ඔබගේ නම සහ ලිපිනය සඳහන් කොට
පහත සඳහන් ලිපිනයට අදාළ චෙක්පත යොමු කරන්න.

Dasatha Publications, 114 Chatfield Dr.
Woodbridge L4H 0Z7. Ontario. Canada

Tell: 416 822 2789 Fax: 289 553 5668
Email: dasathainfo@gmail.com

Please make all Cheques payable to **Dasatha Publications**

www.dasatha.com


GET THE APP
WE'RE GONNA WOW you!
R. Indran
Sales Consultant
416.835.8147
indran.rajanathan@
performance.ca
SHOWING NEW AND PRE-OWNED VOLKSWAGEN MODELS
මෝටර් රථයක් මිල දී ගැනීමේදී විශ්වාසවන්ත කාර්යක්ෂම
සේවාවක් සඳහා හමුවන්න ඉන්ද්‍රා
Serving the community for 16 years with your Automotive needs
Don Valley Volkswagen
SATISFACTION 100% GUARANTEE
1695 Eglinton Avenue East, Toronto, ON M4A 1J6 • www.donvalley-vw.ca
GOLF • BEETLE • ALLTRACK • PASSAT • CC • JETTA • TIGUAN • TOUAREG | ATLAS - COMING SOON!


AKG WEB DESIGN
TAKE YOUR BUSINESS ONLINE!
✔ Professional Quality
✔ E-Commerce Features
✔ Fully Responsive
✔ Reliable Service
✔ 24/7 Support
FLEXIBLE PRICING
MONTHLY OR ONE TIME FEES
LET US CREATE FOR YOU
647-995-3391
LEARN MORE AT: http://webstore.danakg.ca

# විශිෂ්ටයන් දෙදෙනෙකු මැවූ ආදර දේවතාවිය

# වෛෂ්ණාවී



**ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස්ගේ කතා සංකල්පයක්**
**ටෝනි රණසිංහගේ තිර රචනයක්**
**සුමිත්‍රා පීරිස්ගේ අධ්‍යක්ෂණයක්**

■ **ප්‍රසාද් සමරතුංග**

සුරංගනා කතාවක හෝ ජනප්‍රවාදයක ජීවත් වූ දේවතාවියන් පිළිබඳ බොහෝ සුන්දර කතා අපි අසා ඇත්තෙමු. ඔවුන් ගැන මතකයන් අප සිත් තුළ තැන්පත්ව ඇත්තේ ආශ්වාදජනක අන්දමිනි. මේ කතාවටද පදනම්ව ඇත්තේ එවන් දේවතාවියකි. නමුත් ඇය මිහිකතට එන්නේ වෙනස්ම විලාශයකටය. ඇයගේ නමද අපූරු එකකි.

මේ දේවතාවියගේ රුව පළමුව සිතුවම් වන්නේ ශ්‍රේෂ්ටයකුගේ මනසේය. ඔහු ශ්‍රේෂ්ටයකු සේම සිනමාවේ අති විශිෂ්ටයෙකි. හෙළ සිනමා වංශ කතාව වෙනමම තැනකින් ලියන්නට පටන් ගත් මහා යුග පුරුෂයෙකි.

ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස් නම් අසහාය සිනමාවේදියාණන්ගේ සිත ඒ දේවතාවියගේ කතාව බිහි වූ තිඹිරි ගෙය වූවේය. එතුමාණන් ඇය ගැන තතු විත්ති ටෝනි රණසිංහයන්ට කීවේය. ඔහු එය මනසින් මනාව ග්‍රහණය කොට තිර පිටපතක් බවට පත් කළේය. ඒ සවිමත් සුසංයෝගයෙන් මැවූ දේවිතාවියගේ කතාව අධ්‍යක්ෂණය පැවරුණේද තවත් අග්‍රගණ්‍ය සිනමාවේ දියණියකටයි.

ඇය හෙළ සිනමාවෙ කිවිඳිය ලෙස විරුදාවලිය ලද සුමිත්‍රා පීරිස්ය. ඇය මේ සිනමා පබැඳුම තමාට අනන්‍ය ශෛලියෙන් කැමරාවෙහි සටහන් කර ගත්තීය.

සිනමාවේ විශිෂ්ටයන් තිදෙනකු එක්ව මැවූ මේ දේවතාවිය මේ සටහන නිමාවන භාගයේදී නොඅනුමානව ඔබට හමුවනු ඇත.

දේවතාවිය මෙලොවට ගෙන එන්නේ ඔසඳාය. ඔහු රූකඩ කර්මාන්තය තම ජීවිකාව කරගත් මාපිය සෙනෙහස අහිමි කාර්යශූර යෞවනයෙකි. පරම්පරාවෙන් ලැබුණු වෘත්තීයට අසාධාරණයක් නොකළ හෙතෙම සියුම්ව රූකඩ නෙළන ආකාරය විශ්මයජනකය. ඔසඳා රූකඩ සන්දර්ශනද පවත්වන අයකි. වැර වෑයමෙන් හරි හම්බ කරනා දෙයින් ඔහුත් ඔහුගේ එකම හිතෛෂියා වූ අත්තම්මාත් බත සරිකොට හැකි පරිදි ජීවත් වූවේය.

රුචිරා ඔසඳාගේ මාමණ්ඩියගේ දියණිය වූයේය. ඉඳහිට ඔසඳාගේ නිවසට ආගිය ඇය ඔසඳට දැක්වූයේ මෙතෙකැයි කියා කිව නොහැකි සෙනෙහසකි. ගමෙහි තනිකඩ තරුණ තරුණියන් පිළිබඳ උනන්දුවන කපුවකු ඔසඳාට විවාහ යෝජනාවක් ගෙන එන්නේ මේ අතරතුරය. ලක්ෂ්මී නම් වන ඔසඳාට යෝජනා වන තරුණියට පෙම්වතකු සිටින බව කිසිවකු දැන සිටියේ නැත.



ඇයට සහකරුවකු සොයන්නේ මවුපිය කැමැත්තටය. ලක්ෂ්මීගේ තත්ත්වය නොදැන ඇයට ඔසඳා කැමැත්ත ලබා දෙන්නේ කැමැත්තෙනි.

ඔහු ඇයට සිතින් ප්‍රේම කරන්නට පටන් ගනියි. දිනෙන් දින මෝරා වැඩෙන ඒ ආදරයට ඔසඳා ආදරය කරන්නේ ජීවිතය දෙවැනි කොටය. දින

සති මාස ගෙවී ගියේ වේගයෙනි. ඔසඳාට අභාග්‍ය සම්පන්න ආරංචියක් ලැබෙන්නේ සර්වාංගයම සළිත කරමිනි. ලක්ෂ්මී සිය පෙම්වතා සමඟ අතුරුදන් වී ඇත. ආදරය උපන් තැනම මිය ගොස් ඇති වග ඔහුට දැනුණේය.

ඔසඳා මොහොතක් අජීවී රූකඩ අතර තනි විය. තමාත් රූකඩත් අතර කිසිදු වෙනසක් නැති වග ඔහුට දැනිණ. අවට පිරික්සා රුක් අත්තන කොට කැබැල්ලක් අතට ගත් ඔසඳා එය දෙතුන් වරක් ඒ මේ අත පෙරළිය.

දෑතට හුරු කුඩා කියත සහ නියන අතට ගත් හෙතෙම එය නොහික්මුණ ලෙසින් කපන්නට පටන් ගත්තේය. ක්‍රම ක්‍රමයෙන් එයින් අරුම රුවක් මතු වෙමින් පැවතිණ. ඒ රුව ඔසඳාගේ සිතෙහි ඇති චිත්ත රූපයක් වන්නට පුළුවන. පැය ගණනක් ඔහු රුක් අත්තන කොටය සමඟ හරඹ කෙරුවේය. අවසන එයින් ඉස්මතු වූයේ රූ ශ්‍රියාවෙන් අනූන නාරි දේහයකි. එය ලක්ෂ්මීට අතිශය සමානය. එක්තරා මොහොතක ඒ අප්‍රාණික කාන්තා රුව කාමරයේ හුදකලා විය. ඒ අජීවි රුවට අපේ කතා නායිකාව වූ දේවතාවිය ආරූඪ වී මෙලොවට වඩින්නේ ඒ මොහොතේය. වෛෂ්ණාවී නම් වූ ඇය සිතූ පැතූ සම්පත් දෙන දේවතාවියකි.

තමා මැවූ රූකඩය ප්‍රාණියකු වූ බව දුටු ඔසඳා තිගැස්සෙන්නේ කුතුහලයෙනි. ඇයත් සමඟ වචනයෙන් ගනුදෙනු කරන හෙතෙම පියවරෙන් පියවර ඇයට සමීප වන්නේ ලක්ෂ්මී නොමැති වියෝව මඳක් හෝ පහ කර ගැනීමේ අටියෙනි. ඇවැස්ස මස්සිනා දේවිතාවියකට පෙම් බඳින වග දැන ගත් රුචිරාගේ සිත අප්‍රමාණ සංවේගයක පැටලෙයි. මෙතෙක් තම සිත් ඔසඳා වෙනුවෙන් ඉපදී තිබුණේ කුමන ආදරයක්දැයි රුචිරාට වැටහීමට පටන් ගනියි.

එතැන් සිට මේ සිත් අතර ඇතිවන කතාව අප සිනමා කිවිඳියගේ දොළොස් වැනි සිනමා කාව්‍ය ඔස්සේ ගලා යන්නේ සුනිමල ගඟක් පරිද්දෙනි.

වෛෂ්ණාවි වූ ඒ සොඳුරු නිර්මාණය කතුහලයත්, විශ්මයත්, අපූර්වත්වයත් කැටි වූ එකකි.

මෙහි වෛෂ්ණාවිය ඔබ හොඳින් හඳුනන යශෝධා විමලධර්ම නිරූපණය කරයි. රූකඩ තනන්නෙකු වශයෙන් ගැඹුරු අධ්‍යාත්මික රංගනයක යෙදෙන්නේ සම්මානනීය නළු තුමිඳු දොඩම්තැන්නයි. වෛෂ්ණාවී ඔස්සේ රිදී තිරයට අලුත් මුහුණක් හඳුන්වා දෙයි. පුංචි තිරයේ 'මලී' වූ ඇය සමාධි අරුණි ඡායා වේ.

මේ තරුණ ප්‍රධාන ත්‍රිත්ව රංගන ප්‍රතිභාව මැද ටෝනි රණසිංහ, අයිරාංගනී සේරසිංහ, ජයලත් මනෝරත්න, වසන්ති චතුරාණි, ක්ලීටස් මෙන්ඩිස්, රෝහණ බැද්දගේ, මහේන්ද්‍ර පෙරේරා, වැනි ප්‍රවීණයන්ද වෛෂ්ණාවී රංගනයෙන් විචිත්‍රණය කර තිබේ.

# මානව හිමිකම් සිනමා උළෙලට යන දැවෙන විහඟුන්



මාර්තු මස 10 වන දින සිට 19 වන දින දක්වා ස්විස්ටර්ලන්තයේ ජිනීවා හිදී පැවැත්වෙන අන්තර්ජාතික මානව හිමිකම් සිනමා උළෙලේ (International Film Festival and Forum on Human Rights in Geneva - FIFDH) හොඳම චිත්‍රපටය සඳහා වන තරගකාරි අංශයට ශ්‍රී ලංකාවේ චිත්‍රපටයක් තේරී තිබේ.

සංජීව පුෂ්පකුමාර විසින් අධ්‍යක්ෂණය කරන ලද 'දැවෙන විහඟුන්' චිත්‍රපටය මෙසේ තේරී පත්වී ඇති අතර මෙම අංශයෙන් තරග වැදීම සඳහා මෙවර චිත්‍රපට 7 ක් තෝරාගෙන ඇත. එම චිත්‍රපට 7 අතරට මෙවර ඔස්කාර් සම්මාන උළෙලේත්, ගෝල්ඩන් ග්ලෝබ් සම්මාන උළෙලේත් හොඳම චිත්‍රපටය ලෙස සම්මායට පාත්‍ර වූ Moonlight චිත්‍රපටයද ඇතුළත් වේ.

දැවෙන විහඟුන් චිත්‍රපටය ඉතාලියේ පැවැත්වෙන 27 වන අප්‍රිකා, ආසියා, ලතින් ඇමරිකානු සිනමා උළෙලෙහි තරගකාරී අංශයටද නිර්දේශ වී ඇත. ඉතාලියේ මිලානෝ නගරයේ පැවැත්වෙන මෙම උළෙල මාර්තු 19 වන දින සිට 27 වන දින දක්වා පැවැත්වේ.

සංජීව පුෂ්පකුමාර විසින් අධ්‍යක්ෂණය කරන ලද දෙවැනි චිත්‍රපටය වන මෙය ශ්‍රී ලංකා, ප්‍රංශ, දෝහා කටාර් සහ නෙදර්ලන්ත යන රටවල සම නිෂ්පාදනයකි.

මහේන්ද්‍ර පෙරේරා, සමනලී ෆොන්සේකා, අනෝමා ජනාදරී, චාන්දනී සෙනවිරත්න, ලියෝනි කොතලාවල, ශ්‍යාම් ප්‍රනාන්දු, දසුන් පතිරණ, පුබුදු චතුරංග, ධර්මප්‍රිය ඩයස්, තිස්ස බණ්ඩාරනායක, ප්‍රියංකා සමරවීර, දර්ශන් ධර්මරාජ්, සංජීව දිසානායක ඇතුළු නළු නිළියන් රැසක් මෙම චිත්‍රපටයට රඟපෑමෙන් දායක වී ඇත.

# එම්. එස්. ගේ සිංදු කියා දඩ කයි



ප්‍රවීණ ගායන ශිල්පි එම්. එස්. ප්‍රනාන්දු මහතාගේ ගීත නිසි අවසරයකින් තොරව වේදිකාවල ගායනා කර මුදල් ඉපයූ වරදට නවක ගායන ශිල්පී එම්. ජී. ධනුෂ්කට අධිකරණය විසින් දඩ මුදලක් නියම කොට ඇත. ඒ අනුව බුද්ධිමය දේපළ යටතේ ගැනෙන වැරැද්දක් සිදුකර ඇති එම්. ජී. ධනුෂ්ක විසින් එම්. එස්. ප්‍රනාන්දු මහතාගේ පවුලේ ඥාතීන්ට රුපියල් ලක්ෂ 03 ක වන්දියක් ගෙවීමට කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණය හමුවේ පොරොන්දු වී ඇත.

මෙම නඩුව කොළඹ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පවරා තිබූ අතර ධනුෂ්කගේ නීතිඥවරයා විසින් පොරොන්දු වූ ආකාරයට එම වන්දි මුදල ලබාගෙන නඩුව සමථයකට පත් කර ගැනීමට එකඟ වී ඇත.

නඩුවේ පැමිණිලි පාර්ශ්වය නියෝජනය කර ඇත්තේ එම්. එස්. ප්‍රනාන්දු මහතාගේ පුතුන් වන සරත් ප්‍රනාන්දු, සුසිල් ප්‍රනාන්දු, ශානික ප්‍රනාන්දු යන පිරිසයි.




# ඔස්කාර් උළෙලේ ජරමර

# වැරදුණාද? වැරැද්දුවාද?

**ඔස්කාර් ප්‍රධාන සම්මාන කිහිපයක් මෙසේ හිමි වීය**

හොඳම චිත්‍රපටය - Moonlight
හොඳම නළුවා - Casey Affleck - Manchester by the Sea
හොඳම නිළිය - Emma Stone - La La Land
හොඳම සහාය නළුවා - Mahershala Ali - Moonlight
හොඳම සහාය නිළිය - Viola Davis - Fences
හොඳම අධ්‍යක්ෂ - Damien Chazelle - La La Land
හොඳම සජීවීකරණ වෘතාන්ත චිත්‍රපටය - Zootopia
හොඳම සජීවීකරණ කෙටි චිත්‍රපටය - Piper
හොඳම අනුවර්තිත තිරනාටකය - Moonlight - by Barry Jenkins, Tarell Alvin McCraney
හොඳම ස්වීය තිරනාටකය - Manchester by the Sea - by Kenneth Lonergan
හොඳම කැමරාකරණය - Linus Sandgren- La La Land
හොඳම වාර්තා චිත්‍රපටය - OJ: Made in America
හොඳම සංස්කරණය - John Gilbert - Hacksaw Ridge
හොඳම ගීතය - City of Stars - La La Land
හොඳම සංගීත නිර්මාණය - Justin Hurwitz -La La Land"
හොඳම විදෙස් චිත්‍රපටය - The Salesman - Iran

■ **චමරි අබේසිංහ**

ඇස රැදෙන රැදෙන තැන තරුවකි. අහසේ තරු කැළම පොළවට පැමිණියා සේය. ඉස්තරම්ම ඇඳුම් ආයිත්තම්වලින් සැරසුණු මේ තරු පිරිවර රැඳී සිටින ඩොල්බි නෘත්‍යාගාරය විහිදුවන්නේද ඇස් නිලංකාර කරවන දිස්නයකි. සිනමාවේ මහා මංගල්‍යය ලෙස හැඳින්වෙන ඔස්කාර් සිනමා සම්මාන උළෙලේ (Academy Awards) සිරි අසිරියෙන් බිඳකි අප ඔබට ඒ පැවසුවේ.

ඉකුත් පෙබරවාරි 26 වෙනි දින සන්ධ්‍යා කාලයේ හොලිවුඩ්හි ඩොල්බි තියටරයෙහි පැවැත්වුණු 89 වෙනි ඔස්කාර් සිනමා සම්මාන උළෙල මෙවර නිමාව දුටුවේ 'පිටින් ඔපේ යටින් හපේ' යන අපේ ගැමි කියමන සිහිපත් කරමිනි. බාහිර අලංකාරයෙන් කොතරම් ඔප මට්ටම් වී තිබුණත් මූලිකම ඉලක්කය අනාගත් අවස්ථාවක් ලෙස මෙවර උළෙල හැඳින්විය හැකිය.

ඔස්කාර් ඉතිහාසයෙහි ලොකුම වරද ලෙස සැලකිය හැකි මෙය සිදුවූයේ හොඳම චිත්‍රපටය සඳහා සම්මාන ප්‍රදානය සිදුකරන අවස්ථාවේදීය. එම අවස්ථාව නිවේදනය කිරීම සඳහා ආරාධනා ලැබ සහභාගි වී සිටියේ ඔස්කාර්, ගෝල්ඩන් ග්ලෝබ්ස් ඇතුළු සිනමා සම්මාන රැසකින් පුද ලැබූ ප්‍රවීණ සිනමා නිළි Faye Dunaway සහ ඒ ආකාරයෙන්ම සම්මානිත ප්‍රවීණ සිනමා නළුවකු සහ සිනමාවේදියකු වූ Warren Beatty ය. වේදිකාවට පැමිණි ඒ දෙදෙනා අතර සිදුකෙරුණු සුපුරුදු ආගිය තොරතුරු කතාබහෙන් පසු මෙවර නිර්දේශිත චිත්‍රපට 9 ප්‍රකාශයට පත් කෙරුණි. ඉන් අනතුරුව ඔස්කාර් සම්මානිත චිත්‍රපටයෙහි නම සඳහන් වූ ලියුම් කවරය විවෘත කිරීමේ අවස්ථාව වොරන් බීටි හට හිමි විය. ඔහු එය හැර බැලුව මුත් නම ප්‍රකාශ නොකර මොහොතක් ළතැවුණු අතර එය උදුරාගත් ෆේ ඩනවේ මෙවර ජයග්‍රාහී චිත්‍රපටයෙහි නම La La Land ලෙස ප්‍රකාශයට පත් කරන්නට යෙදුණි. නෘත්‍ය ශාලාවේ සියල්ලන්ම නැගිට සිට දුන් අත්පොළසන් නාදයත් සුභ පැතුමුත් මධ්‍යයේ ලා ලා ලෑන්ඩ් චිත්‍රපට කණ්ඩායම වේදිකාව මතට දිව ආවේ මහත් ප්‍රමෝදයෙනි. ඒ වන විටත් ඔස්කාර් ඉතිහාසයෙහි වැඩිම සම්මාන ප්‍රමාණයකට (සම්මාන 14 ක් සඳහා) නිර්දේශ වූ චිත්‍රපටය ලෙස වාර්තාගත වී එයිනුත් සම්මාන 6 ක් හිමිකරගෙන සිටි ලා ලා ලෑන්ඩ් සිනමා කණ්ඩායම එවර වේදිකාවට පිවිස හොඳම චිත්‍රපටය සඳහා වන සිය 7 වෙනි සම්මානයද ලබා ගති. නමුත් ගත වූයේ මොහොතකි. හොඳම චිත්‍රපටය ප්‍රකාශයට පත් කිරීමේදී අත්වැරැද්දක් සිදුවී ඇති බවත් මෙවර හොඳම චිත්‍රපටය Moonlight බවත් ප්‍රකාශයට පත් කෙරුණි. එතෙක් වේදිකාව පාමුල සිට දෑස් දල්වා බලා සිටි මූන්ලයිට් කණ්ඩායම වහාම වේදිකාව මතට දිව ආ අතර ලා ලා ලෑන්ඩ් කණ්ඩායම විසින් ඉතාමත් නිහතමානීව එතෙක් තමන් අත තිබූ හොඳම චිත්‍රපටයට හිමි ඔස්කාර් සම්මානය මූන්ලයිට් චිත්‍රපට කණ්ඩායමට පිරිනමනු ලැබුණි.

ඩොල්බි තියටරය තුළ සිට මෙන්ම ලොව පුරා රූපවාහිනී මගින් මෙම සිදුවීම දෙස බලා සිටි බොහෝ දෙනෙකුට සිදුවූයේ කුමක්දැයි යන්න තෝරා බේරා ගත නොහැකි විය. සැබෑවක්ද එසේ නොමැති නම් උළෙලෙහි තවත් එක් විශේෂිත මායා අංගයක්ද යන්න සිතාගත නොහැකි විය. එහෙත් පසුව ඒ පිළිබඳව කරුණු සොයා බැලීමේදී අනාවරණය වූයේ හොඳම චිත්‍රපටය නිවේදනය කිරීම සඳහා පැමිණි ජ්‍යෙෂ්ඨ නළු නිළි දෙපළ වෙත වැරදි ලියුම් කවරයක් ලබාදීමෙන් මේ අවුල හටගත් බවයි.

එහෙත් මෙය සිදුවිය හැක්කක්ද? කෝටි ගණනින් වියදම් කරමින්, අති මහත් කාර්ය මණ්ඩලයකගේ සේවය ලබාගනිමින්, වරක් නොව කිහිප වතාවක් අධීක්ෂණය කරමින් සිදුකෙරෙන, ලොව පුරා බහුතරයකගේ අවධානය යොමු වුණු මෙවැනි උළෙලකදී සිදු නොවිය යුතු අන්දමේ පටලැවිල්ලකි. නමුත් එය එසේ සිදු විය. සිදුවූ වරදට ඔස්කාර් සංවිධායකවරුන් ලා ලා ලෑන්ඩ් කණ්ඩායමෙනුත් මූන්ලයිට් කණ්ඩායමෙනුත් සමාව ඉල්ලීය.

එසේම මෙවැනි වරදක් සිදුවූයේ කෙසේද යන්න පිළිබඳවද පරීක්ෂණ ඇරඹුනි. එහිදී අනාවරණය වී ඇත්තේ වැරදි ලියුම් කවරය ලබා දීමේ වගකීම Fairfax Media PricewaterhouseCoopers ගණකාධිවරුන් දෙපළක් වන Brian Cullinan සහ Martha Ruiz විසින් ගත යුතු බවයි. කලබලය මධ්‍යයේ බ්‍රයන් කලිනන් විසින් බීටී සහ ඩනවේ දෙපළ වෙත ලබා දී ඇත්තේ හොඳම චිත්‍රපටයේ නම සඳහන් ලියුම් කවරය නොව හොඳම නිළියගේ නම සඳහන් ලියුම් කවරයයි. තමන් අතින් සිදුවූ මේ පටලැවිල්ල ගැන කලිනන් විසින් ට්විටර් වෙබ් අඩවියේද අදහස් දක්වා තිබූ නමුත් පසුව එය ඉවත් කොටගෙන තිබුණි.

වසර 4 ක කාලයක් පුරා ඔස්කාර් චිත්‍රපට උළෙලේ සියලු වගකීම් ඉතාමත් මැනවින් ඉටුකළ මේ කෘතහස්ත ගණකාධිකාරිවරයා අතින් මෙවර සිදුවූයේ මෙවැනි උළෙලකදී සිදුවිය හැකි විශාලතම වරදකි.

මෙම සිදුවීම සම්බන්ධයෙන් හාස්‍යජනක කතාද නිර්මාණය වී ඇති අතර 75 වෙනි වියද පසුකර සිටින නිවේදන කටයුතු කළ ජ්‍යෙෂ්ඨ නළු නිළි දෙපළ කණ්ණාඩි නොපළඳවා වයස සැඟවීමට ගත් උත්සාහය නිසා මෙවැනි වරදක් වූ බව එම විසුළු පුවත්වල සඳහන් විය.

## ඔස්කාර් වර්ණභේදය

ඔස්කාර් සම්මාන උළෙලේදී කළු ජාතිකයන්ට තැනක් නොදෙන බවට වූ චෝදනාව කලෙක සිටම එල්ල වූවකි. සැබවින්ම සිදුවූයේද එයයි. කොතරම් දක්ෂතා පෙන්වූවද ඔවුන්ගේ නමක් හෝ නිර්දේශ නොවූ අවස්ථා කොතෙකුත් දක්නට ලැබුණි. එහෙත් මෙවර එම තත්ත්වය බැහැර කරමින් ඔස්කාර් ප්‍රධාන සම්මාන රැසක් සඳහා කළු ජාතිකයින්ගේ නම් විශාල වශයෙන් නිර්දේශ වී තිබුණි. එපමණක් නොව, මෙවර උළෙල කළු ජාතිකයින් වැඩිම පිරිසක් සම්මාන ගත් උළෙල ලෙසද වාර්තාගත වී ඇත. විශේෂයෙන්ම සියලුම රංගන ප්‍රවර්ග යටතේ කළු ජාතිකයන් නියෝජනය කළ පළමු ඔස්කාර් උළෙල මෙය විය.

ඇකඩමි සම්මාන උළෙල තුළ කළු-සුදු බේදය දුරු කර මෙවැනි තත්ත්වයක් ඇති කිරීම සඳහා සමාජ ජාල වෙබ් අඩවි ඇතුළු ප්‍රසිද්ධ මාධ්‍ය විශාල මෙහෙවරක් සිදුකොට තිබුණි. එහිදී #oscarssowhite වැනි ට්විටර් හෑෂ්ටැග් පිටු හරහා ඔස්කාර් කළු-සුදු බේදයට දැඩි ප්‍රහාර එල්ල කොට තිබුණි. ඒ සඳහා ලෝක පූජිත සිනමා ශිල්පීන් වන ස්පිල්බර්ග්, ස්පයික් ලී, විල් ස්මිත්, මැට් ඩෙමන්, මයිකල් මුවර් වැන්නන් විසිනු නැගූ හඬද ප්‍රබලව බලපා තිබුණි.

ඔස්කාර් ඉතිහාසයේ කළු ඇමරිකානුවකු විසින් දිනාගත් පළවෙනි සම්මානය වාර්තා වන්නේ 1940 දීය. ඒ Gone with the Wind චිත්‍රපටය සඳහා Hattie McDaniel හොඳම සහාය නිළියට හිමි සම්මානය හිමිකර ගැනීමයි. නමුත් ඉන්පසුව කැපී පෙනෙන ලෙස කළු ජාතිකයකු සම්මානයට පාත්‍ර වූ අවස්ථාවන් එතරම් නොවූ අතර පසුගිය වසර දෙක තුළදී කිසිදු කළු ජාතිකයකු ඒ සඳහා නිර්දේශ වී හෝ නොතිබුණි. එහෙත් ඒ සියල්ලම පිරිමැසීමට මෙන් මෙවර හොඳම අධ්‍යක්ෂ ලෙසත්, හොඳම තිර නාටක රචකයා ලෙසත් හොඳම සහාය නළුවා සහ නිළිය ලෙසත් හොඳම වාර්තා චිත්‍රපටය ලෙසත් හොඳම චිත්‍රපටය ලෙසත් වන සියලුම සම්මාන හිමිකර ගනු ලැබුවේ කළු ජාතිකයන් විසිනි.

මෙවර ඔස්කාර් කළු නියෝජනය පිළිබඳව සමාජ ජාල ඇතුළු ප්‍රසිද්ධ මාධ්‍ය මගින් විවිධ අදහස් පළ කෙරෙන අතර කළු ජාතිකයන් පමණක්ම රඟපාන 'මූන්ලයිට්' චිත්‍රපටය නිසා එවැනි වැඩි නියෝජනයක් සිදුවී ඇති බවට අදහස් දක්වන්නෝද ඒ අතර වෙති.

## ඇමරිකානු ජාතිවාදය

ඔස්කාර් සිනමා උළෙලේ ලෝක අවධානය වැඩියෙන්ම යොමු වන අංගය 'අන්තර්ජාතික සිනමා නිර්දේශ' අංශයයි. මේ සඳහා සෑම වසරකම ලෝකයේ ප්‍රකට සිනමා නිර්මාණ ශිල්පීන්ගේ චිත්‍රපට ඉදිරිපත් කෙරෙන අතර මේ වසරේදී එම අංශය නියෝජනය කරමින් චිත්‍රපට 5 ක් ඉදිරිපත් වී තිබුණි. මෙවර ඒ සඳහා නිර්දේශ වූ චිත්‍රපට ඉදිරිපත් කළ රටවල් වූයේ ජර්මනිය, ඉරානය, ස්විඩනය, ඕස්ට්‍රේලියාව හා ඩෙන්මාර්කයයි. එහිදී සුප්‍රකට ඉරාන සිනමාවේදියකු වන අෂ්ගාර් ෆර්හාදි විසින් ඉදිරිපත් කරන ලද The Salesman චිත්‍රපටය හොඳම විදේශ චිත්‍රපටය ලෙස සම්මාන හිමිකර ගනු ලැබුණි.

එහෙත් එම සිනමා අධ්‍යක්ෂවරයා ඔස්කාර් සම්මාන උළෙල වර්ජනය කරනු ලැබූ අතර ඔහුගේ පණිවිඩයක් ඔස්කාර් උළෙලේදී කියවනු ලැබුණි. ඇමරිකානු ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් විසින් ඉරානය ඇතුළු මුස්ලිම් රටවල් කීපයකට වීසා සම්බාධක පනවමින් කරනු ලැබූ ක්‍රියාවට විරෝධය දැක්වීම සඳහා ඔහු මෙම පියවර ගෙන තිබුණි.

මේ අතර ඔස්කාර් සම්මාන සඳහා නම් කෙරුණු වාර්තා චිත්‍රපටයකට දායක වූ සිරියානු සිනමාවේදියකුට උළෙලට සහභාගි වීමට බාධා පැමිණවී තිබුණි. Khaled Khatib නම් වූ මොහුට වීසා ලබා දී තිබුණද ඇමරිකාව බලා එන ගුවන් යානයට ඇතුළු වීමට අවසර ලබා දී නැත. මෙහිදී ඇමරිකානු බලධාරීන් පවසා ඇත්තේ මොහු රහසිගත චරිතයක් ඇත්තෙකු බවයි.

මෙවර සම්මාන උළෙලේදී ඇමරිකානු ජනාධිපතිවරයාව දැඩිව විවේචනය කෙරුණු අතර මුස්ලිම් ජාතික සංක්‍රමණිකයන්ට එරෙහිව ඔහු විසින් සිදුකරන කටයුතුවලට විරෝධය පෑම සඳහා බොහෝ දෙනෙකු නිල් පැහැ රිබන් පටි පැළඳ සිටින ආකාරයක් දක්නට ලැබුණි.

## ඔස්කාර් සම්මාන හිමි වූවෝ

දශක ගණනක් සිනමා ක්ෂේත්‍රයට ලබාදුන් දායකත්වය වෙනුවෙන් ජ්‍යෙෂ්ඨ සිනමා ශිල්පීන් හතර දෙනෙකු විශේෂ ඇගයුමට ලක් වූ අතර හොංකොං ජාතික චිත්‍රපට අධ්‍යක්ෂවරයෙකු, නළුවකු, නිෂ්පාදකයකු හා ගායකයෙකු වූ ජැකී චෑන්, බ්‍රිතාන්‍ය ජාතික චිත්‍රපට සංස්කරණ ශිල්පිනි ඈනී වී. කෝට්ස්, ලීන් ස්ටීල්මාස්ටර් සහ අමෙරිකානු සිනමාකරු ෆෙඩ්‍රික් වයිස්මාන් එසේ ගෞරව සම්මානයන් පිදුම් ලැබූවන් විය.





# කැනඩා සිංහල සංගමයේ මහා සභා රැස්වීම

**හිතවත් සාමාජික මහත්මයාණෙනි, මහත්මියණී,**

**කැනඩා සිංහල සංගමයේ 19 වෙනි මහා සභා රැස්වීම 2017 මාර්තු මස 25 වැනි සෙනසුරාදා සවස 6.00 පහත සඳහන් ස්ථානයේදී පැවැත්වේ. ඒ සඳහා ඔබ සැමගේ පැමිණීම ගෞරවයෙන් අපේක්ෂා කරමු.**

**දිනය: 2017 මාර්තු 25 වෙනි සෙනසුරාදා සවස 6:00 සිට (මහා සභා රැස්වීම සවස 6 ට ආරම්භ වේ)**

**ස්ථානය: La Victoria Banquet Hall & Convention Center, 69 Milvan Drive, Toronto, ON, M9L 1Y8**

**සභා වාරය අවසානයේ පැවැත්වෙන රාත්‍රී භෝජන සංග්‍රහයට සහ සංගීත සැඳෑවටද ඔබට සහභාගි විය හැක.**
(සංගීත සැඳෑවේ ගීත ගායනා ඉදිරිපත් කිරීමට ඔබ අදහස් කරන්නේ නම් කරුණාකර පහත ඊ-මේල් ලිපිනයට 2017 මාර්තු 10 දාට පෙර දැනුම් දෙන්න)

**යසන්ත නවරත්න**
ලේකම්, කැනඩා සිංහල සංගමය
sinhala.sangamaya@gmail.com

## NOTICE FOR THE ANNUAL GENERAL MEETING OF THE SINHALESE ASSOCIATION OF CANADA

**Dear Members,**
Notice is hereby given to all members that the Annual General Meeting of the Sinhalese Association of Canada will be held on 2017 March 25 Saturday at 6:00pm at La Victoria Banquet Hall & Convention Center, 69 Milvan Drive, Toronto, ON, M9L 1Y8

Please note:
- The meeting will start at 6:00pm sharp followed by dinner and a cultural evening (Members who wish to take part in the cultural event please email secretary before March 10th for registration and further information)
- Amendments to the constitution may be proposed at the meeting.
- Final date to receive proxy will be March 22th 2017 via email (Please contact the Secretary for proxy form)

**Yasantha Nawaratne**
Secretary, Sinhalese Association of Canada
sinhala.sangamaya@gmail.com

Why Pay More?
1% Are You Planning to Sell a Property?
Listing Commission*
BUY or SELL through us and get an amazing chance to
WIN 1 of 10 GREAT PRIZES INCLUDING 2016 HONDA CIVIC






I will guide you through the process in a professional, friendly and accountable manner
Call for more information
Nishantha 416 417 0763
Century 21
Nishantha Donsiyambalapitiyage Sales Representative Email:nishan.don@gmail.com
Innovative Realty Inc. 2250 Markham Road Unit 3 Toronto ON M1B2W4. Office: 416 417 0763

# මන්නාරම් බස් එක



කෙටි කතාව

■ අනුරුද්ධ වැලිගමගේ

මන්නාරම් බස් එක පිළිබඳ කතාවට වසර දහයකටත් වඩා පැරණි ඉතිහාසයක් ඇති බව වරුණට තවමත් හිතාගන්නටවත් බැරිය. අනුරාධපුරයේ සේවය කරන සමයේ දෙසතියකට වරක් ගෙදර එන්නට සූදානම් වන විට එය හිස කකියන මතකයක් වූයේ ගමනට ගතවන කාලය ගැන හිතන විටය. සිකුරාදාට අනුරාධපුරයෙන් ගෙදර එන්නට ඇති ප්‍රවාහන පහසුකම් අල්ප වූ බැවින් බොහෝවිට ඔවුන් කළේ ටිකක් කලියෙන් කන්තෝරුවෙන් පිටවීමය. කොළඹ සිට රට මැද පිහිටි අනුරාධපුරයට යාම් ඊම් සඳහා ප්‍රධාන මාර්ග 3 ක්ම තිබුණත් පොදු ප්‍රවාහන මාධ්‍යයකින් යන්නේ නම් ඒ සඳහා අඩුම තරමේ පැය 6 ක් වත් ගතවන්නේය.

පුත්තලම මාර්ගයෙන් කොළඹට යන මන්නාරම් බස් එකට වරුණ ඇතුළු පිරිස හුරු වූයේ එය කෙසේ හෝ පැය 5 කින් කොළඹට එන නිසාය. වෙලාව ඉතිරි කරගැනීම සඳහා මන්නාරම් බස් එකේ රියැදුරු රාජා අයියා කළේ නගරවල ප්‍රධාන බස් නැවතුම්පල හා ජනාකීර්ණ මාර්ග මග හැර යාමය. එහෙත් පුරුදු කාරයින් රැස් කකා බලා සිටි බැවින් මගීන් පිළිබද ගැටලුවක් ඔහුට තිබුණේ නැත.

වරුණ ඇතුළු පිරිස යාපනය හන්දියේදී ඔහුට පෙනෙන්නට ඈතට වී බලා හිඳින්නේ තෙල් සංස්ථාව ඉදිරිපිට වංගුවෙන් කහ සහ කළු ඉරි ඇති කඟවේණා මතුවන තුරුය. ඔවුන් එයට හුරු වූ අනෙක් කාරණාව වූයේ එහි කොන්දොස්තර දෙපළ ආසන ලබාගැනීමට උදව් කළ නිසාය. “වරුණ මහත්තයා අර කොළ පාට සාරිය ඇඳලා ඉන්න කෙනා නොච්චියාග මින් බහිනවා”.

ගැස්සෙන පැද්දෙන විදුලි වේගයෙන් කෙත්බිම්, වනරොද පසු කරන රත්න එක්ස්ප්‍රස් තුළ අනුරාධපුරයේ සිට කොළඹට හිටගෙන යාමේ අමාරුව අත්විඳි ඔවුනට ඒ වචන දහස් ගණනක් වටින්නේය. අඩුම තරමේ එක ආසනයක්වත් ලැබුනොත් වරුණටත්, සපුමල්ටත් මාරුවෙන් මාරුවට හිඳගෙන යා හැකිය.

මේ කතාන්තරය වරුණට හදිසියේ මතක් වූයේ ළඟදී දවසක සපුමල් මුහුණු පොතට එක්කර තිබූ පැරණි සේයා රූ ගොන්නක් නිසාය. නිශාදි, සපුමල්, අකිල, උදිත, අනුෂා ඇතුළු මිතුරු පිරිසක් මිහින්තලයේදී ගත් පින්තූර කිහිපයක් එහි වූයේ ගෙදර යන්නට බැරුව සෙනසුරාදා වැඩ වැටුණු සති අන්තවල කළ සංචාරයන් සිහි ගන්වමිනි.

අද මෙන් දියුණු කැමරා සහිත ජංගම දුරකථන නොතිබූ එකල බොහෝ විට සේයාරූ ගැනුණේ කැමරාවක් මගින් මිලිමීටර් 35 හේ සේයා පටලයකටය. පසුව චිත්‍රාගාරයකට ගොස් ඒවා මුද්‍රණය කරගත යුතුය. එබැවින් වරුණ දුටු මිහින්තලා ගමන වැනි ගමන් කිහිපයක් පමණක් සේයාරූවලට නැගී ඇත. එහෙත් ඒ කාලයේ වරුණ සහ පිරිස සංචාරය කළ ඉසව් අතරින් සේයාරූ ඉතිරිව ඇත්තේ මිහින්තලය ඇතුළු තැන් කිහිපයක පමණි. මතකය අවදි කළ වරුණට සිහියට නැගුනේ නාච්චාදුව, රිටිගල, අවුකන, රැස්වෙහෙර පමණක් නොව තන්තිරිමලයටද කණ්ඩායම එක් දින සංචාර සදහා ගිය බවය. වයසත් සමග ජීවිත වෙනස් වී ඇතත් ඒ තුළ රැඳි සුන්දර මතකයත්, ත්‍රාසජනක අත්දැකීම් රැසත් කණ්ඩායමේ සැමටම සිහියට නගා ගත හැකි වෙතැයි වරුණට සිතිණි.

මන්නාරම් බස් එක සපුමල්ට නිශාදිව මුණ ගස්වන්නටත්, අකිලට පළමු පෙම අහිමි කරන්නටත් හේතු වූ බව වරුණගේ කණ්ඩායම පමණක් නොව රාජා අයියා පවා දැන සිටියේය. නිශාදි මැදවච්චියට ආසන්න පාසැලක ගුරුවරියක්ව පත්වීම් ලබන්නට වුයේ වරුණ ඇතුළු පිරිස මන්නාරම් බස් එකට හුරු වී ටික කලකට පසුවය. හලාවත පදිංචි ඇය රබෑවේ නවාතැන් පළක ලැගුම් ගෙන සිටියාය. නිශාදි දුටු මුල් දිනයේම සපුමල්ගේ නොසන්සුන්කම කාටත් තේරෙන්නට වුවත් කාටත් කලියෙන් කට ඉස්සර කළේ කොන්දොස්තර කොලුවාය. “මහත්තය රබෑවෙන් නැග්ගේ. මං හිතන්නේ ටීචර් නෝනා කෙනෙක්”

රටේ පැවති යුධමය වාතාවරණය නිසා ප්‍රධාන නගර හා හමුදා කඳවුරු ආශ්‍රිතව හමුදා පිරික්සුම් පොළ රැසක් පිහිටුවා තිබුණි. අනුරාධපුරය සිට පුත්තලම දක්වා මාර්ගය වැටී තිබුණේ විල්පත්තුව වනෝද්‍යාන මායිම හරහාය. වැසි වැටෙන කාලයට පිරී ඉතිරී යන තබ්බෝව වැව වියළිව, කේඩෑරිව තිබු ගස් වැල් ප්‍රමණයෙන් පුම්බා, විල්ලු ජලයෙන් පුරවාගෙන මහත් අසිරියක් මවන්නේය. ඉදහිට දිනෙක වල් අලින් පාර මාරුවෙනු දකින්නටද පුළුවන. එවන් දිනෙක වෙලාව අරගෙන පාර පනින ඔවුන් දිහා බල සිටින රත්න අයියා ඒ වෙලාව අල්ලන්නේ තේ බොන වෙලාව අඩු කිරීමෙනි.

නිවෙස්වල සිට දිනපතා තම සේවා මුරපොලට යන එන පොලිස් හා හමුදා නිලධාරීන්ද මන්නාරම් බස් එකේ යාවජීව සාමාජිකයන් වූ බැවින් මුරපොලවලදී එක්ස්ප්‍රස් සේවාවක් මන්නාරම බස් එකට ලැබී තිබීම ගමන් කාලය අඩු කරන අතුරු වාසියක්ද වී තිබුණි. එහෙත් නිශාදි ආ පළමු දිනයේ වෙනස් යමක් සිදුවී තිබුණි. ඒ විල්පත්තු වනය හරහා විත් පුත්තලම හමුදා කඳවුරට ත්‍රස්තවාදී ප්‍රහාරයක් එල්ල කරන බවට ඔත්තුවක් ලැබී තිබීමය. ඒ හේතුවෙන් එම මාර්ගයේ ගමන් ගන්නා සියලු රථවාහන දැඩි පරීක්ෂාවට ලක් කරන්නට ආරක්ෂක අංශ පියවර ගෙන තිබුණි. බස් රථවල අමතර ටයර සහ බැටරි පවා පරීක්ෂාවට ලක් කෙරුණු බැවින් පුත්තලමේ බොහෝ වේලා රස්තියාදු වන්නට සිදුවිය. වරුණට නම සිහිපත් නොවන කොන්දොස්තර මල්ලී සපුමල්ගේ ඉටු දෙවියා වූයේ ඔහු නිශාදිගේ ආරක්ෂකයින් ලෙස සපුමල් සහ වරුණ රෙකමදාරු කල බැවිනි. බස් එකේ කතාබස් සහ කෙටි පණිවුඩ ඔස්සේ ළං කළ නිශාදි සහ සපුමල් දැන් දරු දෙදෙනෙකුගේ මාපිය යුවලක්ව ඇත්තේය.

බොහෝ පෞද්ගලික බස්රථ රියැදුරන්ගේ නොමනා ක්‍රියා හේතුවෙන් ක්ෂේත්‍රයම ගැරහුමට ලක් වුවත්, සේවාවක් ලෙසින් සමාජ ක්‍රමය අහිමි කළ දුම්රිය සහ ලංගම බස් රථ මගී දුෂ්කරතාවලට විකල්පයක් ලෙසින් රාජා අයියා නියෝජනය කළ දුර ගමන් බස් සේවා කළ මෙහෙය අති මහත්ය.

මන්නාරම බස් එකේ රාජා අයියා තවමත් රූට් එකේ දුවන්නේද වරුණ දන්නේ නැත. මීගමුවේ මුහුදු මාළු සුවඳට හුරු සපුමල් හලාවත මුතු කුමරියට පෙම් බැද අනුරාධපුරයේම කැදැල්ලක් තැනුවාය. සේවා කාලය නිමවීමෙන් අගනුවරට මාරුවූ වරුණ දුරු රටකට පියමන් විණි. අකිලගේ කෙටි කාලීන පෙම් පුවත මතකයෙන් ඈතට ගියේ ඔහුටත් නොදැනීය. කාලය කෙමෙන් ගෙවී දශකයක්ම ඉක්ම ගොසිනි.

සිත් පිත් නැති යකඩ ගොඩක් වුවද මන්නාරම් බස් එක වරුණ හා පිරිස අතර බැඳියාව අමතක කළ නොහැකි මිහිරි මතකයක්ව ඇත්තේය. එක්විටම තෙල් සංස්ථා වංගුවෙන් මතුවන මන්නාරම් බස් එක රාජා අය්යාගේ හැඩි දැඩි දෑත්වල තෙරපී වරුණ ඇතුළු පිරිස ගෙන යන්නට එන අයුරු වරුණට අදද මැවී පෙනෙන්නේ එබැවිනි.

# අවමංගල්‍ය සංගීතයේ රිද්මය

■ මනොජ් අලවතුකොටුව

සංගීතය වනාහි නාදය මාධ්‍යය කොටගෙන බිහිවූ කලාංගයකි. සංගීතයේ කාර්යය වන්නේ මිනිසාගේ ප්‍රකාශනයන් කලාත්මකව හා භාවාත්මකව ඉදිරිපත් කිරීමයි. ලොවෙහි ඕනෑම රටකට එම රටෙහි සංස්කෘතිය හා බැඳි ශාස්ත්‍රීය හෝ ජන සංගීත පද්ධතියක් තිබිය හැකිය. ලොවෙහි පවතින මහා සාම්ප්‍රදායික සංගීත පද්ධති දෙකකි. එනම් බටහිර ශාස්ත්‍රීය සංගීත පද්ධතිය හා භාරතීය ශාස්ත්‍රීය සංගීත පද්ධතියයි. ශාස්ත්‍රීය සංගීත පද්ධතීන්හිදී සංගීතය පිළිබඳව ප්‍රායෝග කව හා න්‍යායාත්මක වශයෙන් අධ්‍යයනය කරනු ලැබේ. මේ සඳහා දීර්ඝ කාලයක් තිස්සේ වර්ධනය වූ විධිමත් ව්‍යාකරණයක් තිබේ. ජන සංගීත පද්ධතීන් එක් එක් ජාතීන්ට ආවේණික පරිදි හා එම රටාවට, සංස්කෘතියට අනුරූපීව හැඩ ගැසී පවතී.

ජන සංගීතවේදය, සමාජ විද්‍යාව හා මානව විද්‍යාව සමග සම්බන්ධව වර්ධනය වූ විෂයකි. මෙම විෂය ක්ෂේත්‍රය තුළදී සංගීතය පිළිබඳව හදාරනු ලබන්නේ ශාස්ත්‍රීය සංගීත පද්ධතීන්හි හෝ ජන සංගීත පද්ධතීන්හිදී සංගීතය පිළිබඳව හදාරනු ලබන දෘෂ්ඨි කෝණයෙන් නොවේ. සංගීතය යන්න නිර්වචනය වන්නේ ‘ක්‍රමවත් වූ නාද මාධ්‍යයෙන් මිනිසාගේ හැඟීම් ප්‍රකාශ කිරීමේ කලාව වශයෙනි’. ජන සංගීතවේදයේදී මෙවැනි ක්‍රමවත් වූ හා නිසි අයුරින් සංවිධානය වූ නාදයන් පිළිබඳව පමණක් අවධානය යොමු නොවේ. ක්‍රමවත්ව සංවිධානය නොවූ නාද රටාවන් ආශ්‍රයෙන් වුවද මානව හැඟීම් ප්‍රකාශ කිරීමේ හැකියාවක් පවතී. මෙවැනි ක්‍රමවත් වූ හා ක්‍රමවත් නොවූ නාද රටාවන් ඔස්සේ බිහිවන සංගීතය හා සමාජ සංස්ථාවන් අතර පවතින සම්බන්ධතාව අධ්‍යයනය කිරීම ජන සංගීත වේදයේත්, ජන සංගීත වේදියාගේත් කාර්යය වේ. මෙම විෂය කෙෂ්ත්‍රයේදී සමාජ විද්‍යාත්මක, මනෝ විද්‍යාත්මක හා මානව විද්‍යාත්මක පදනම මත සංගීතයේ ඓතිහාසික පරිණාමය හා ධ්වනි විද්‍යාව වැනි කෙෂ්ත්‍රයන් පිළිබඳව විමර්ශනාත්මකව සාකච්ඡා කරනු ලැබේ.

## බිහිවීම

මෙම විෂය බිහිවූයේ බටහිර ලෝකය කේන්ද්‍ර කොටගෙන වුවද ඒ සඳහා බලපෑ මූලිකම සාධකය වූයේ යටත් විජිතවාදයයි. ජන සංගීතවේදී පර්යේෂණයන් සඳහා මුලින්ම දායක වූයේ මානව විද්‍යාඥයන්ය. මුල් කාලීනව බටහිර සංගීතයේ ශාස්ත්‍රීය ලක්ෂණ මත හා බටහිර සංස්කෘතිය පදනම් කොටගෙන ලොවෙහි පවතින අන්‍ය සංගීත ක්‍රම පිළිබඳව විග්‍රහ කිරීම සිදු වුවද මෙම විෂයේ වර්ධනයත් සමඟම ඒ ඒ රටාව, සංස්කෘතික ලකෂණ අනුව සංගීත ක්‍රම පිළිබඳව පර්යේෂණ සිදු කරන ලදී. මුල්කාලීනව ජන සංගීතවේදාත්මක පර්යේෂණයන්හි මූලිකත්වය ගෙන ක්‍රියා කළවුන් අතර ප්‍රධාන ස්ථානය හිමි වන්නේ මානව විද්‍යාඥයන්, මානව වංශ විද්‍යාඥයන් හා සමාජ විද්‍යාඥයන්ටය.

බටහිර රටවලට සාපේක්ෂව ආසියාතික රටවල හා අග්නිදිග ආසියාතික රටවල දීර්ඝ පරිණාමයක් අනුව වර්ධනය වූ සංගීත ක්‍රම පවතින බව ඔවුන්ගේ පර්යේෂණ මගින් අනාවරණය විය. ඒ අතර භාරතය, අරාබි, චීන, ඉන්දුනීසියානු ගැමිලැන් ආදි සංගීත පද්ධතීන් සම්බන්ධව පර්යේෂණ සිදුකර ඇත. මෙවැනි සංගීත ක්‍රම පිළිබඳව හා එම සංගීත ක්‍රම පවතින සංස්කෘතින් ආශ්‍රයෙන් ආරම්භ වූ සංගීත පර්යේෂණ විද්‍යාව මානව සංගීත පර්යේෂණ විද්‍යාව හෙවත් ‘ජන සංගීතවේදය’ නමින් හැඳින්වේ.

ශ්‍රී ලංකාවේ ජන සංගීතය පිළිබඳව ජන සංගීතවේදාත්මක දෘෂ්ඨියෙන් පර්යේෂණ සිදුකර ඇත්තේ අල්ප වශයෙනි. ශ්‍රී ලංකාවේ විවිධ උත්සව අවස්ථාවන් හා බැඳි සංගීත ක්‍රම රැසක් වන අතර එම උත්සව අවස්ථා හා බැඳි නාද රටාවන්ගේ භාවිතයෙහි අභිප්‍රේතාර්ථයන් හා සංස්කෘතිය අතර පවතින සම්බන්ධතාව පිළිබඳව සමාජ විද්‍යාත්මක, මානව විද්‍යාත්මක හා මනෝ විද්‍යාත්මක දෘෂ්ඨිකෝණයෙන් විග්‍රහ කිරීම කාලීන වශයෙන් වැදගත් වේ.

ශ්‍රී ලාංකිකයන්ගේ උත්සව අවස්ථා හා බැඳී පවත්නා සංගීතය පවතින සන්දර්භය අනුව ආගමික උත්සව, මංගල උත්සව හා අවමංගල්‍ය උත්සව හා බැඳි සංගීතය වශයෙන් ප්‍රධාන කොටස් තුනක් යටතේ විග්‍රහ කළ හැකි වේ.

ශ්‍රී ලංකාවේ වෙසෙන ජන වර්ගයන්ගේ සංස්කෘති සමග බද්ධ වූ අවමංගල්‍ය සංගීතය ඒ ඒ ජාතීන්ගේ අනන්‍යතාව පිළිබිඹු වන පරිදි හැඩ ගැසී තිබේ. ද්‍රවිඩ ජාතීන්ගේ අවමංගල්‍යය සංගීතයේ අන්තර්ගත ‘ඔප්පාරි කීම, සක් පිඹීම, තප්පු ගැසීම’ වැනි ගායන වාදන අංග වේ. අවමංගල්‍ය ගීතිකා ගායනය හා අවමංගල්‍ය තූර්ය වාදන පැවැත්වීම තුළ ක්‍රිස්තියානි ආගමික අවමංගල්‍ය සංගීතයේ අනන්‍යතාව පිළබිඹු කෙරේ. ‘කුර් ආන් පාඨ’ ගායනය මුස්ලිම්වරුන්ගේ අවමංගල්‍ය සංගීත ක්‍රමයෙහි පෙනෙන ප්‍රධාන සංගීත අංගය වේ. මෙම ගායන හා වාදන අංගයන්හි පවතින සංගීතමය ලක්ෂණ වර්ධිත තත්ත්වයේ නොපැවතුනද ඒ හා බැඳි සමාජ විද්‍යාත්මක, මනෝ විද්‍යාත්මක හා මානව විද්‍යාත්මක සංකල්ප රැසක් පිළිබඳව අධ්‍යයනය කළ හැක.

සිංහලයන්ගේ අවමංගල්‍ය සංගීත ක්‍රමයෙහි අන්තර්ගත නාද රටා ප්‍රධාන වශයෙන් ගායනය හා වාදනය යනුවෙන් ප්‍රධාන කොටස් දෙකක් යටතේ වර්ගීකරණය කළ හැකිය. එමෙන්ම මෙම සංගීතය හා බැඳි සංස්කෘතිය තුළ අන්තර්ගත ඇදහිලි, විශ්වාස හා ජන ශ්‍රැති පිළිබඳවද විමර්ශනය කළ හැකි වේ.

## මළ බෙර වැයීම

සිංහල බෞද්ධයන්ගේ අවමංගල්‍ය සංගීතයේ වාදන අංග අතර මළ බෙර වාදනයට ප්‍රධාන ස්ථානයක් හිමි වේ. අවමඟුල් ගෙදරවල මළබෙර වැයීම අතීතයේ සිට පැවත එන චාරිත්‍රයක් වේ. මළබෙර වාදනයේ ආරම්භය ලෙස ජනප්‍රවාදයේ සඳහන් වන්නේ ශ්‍රී මහා බෝධියේ ශාඛාවක් මියගිය විටදී පැවැත්වූ ආදාහනය සඳහා මළබෙර වැයූ අවස්ථාවයි. මෙම බෝධි ශාඛාව ආදාහනය කිරීමේදී ශෝකය ප්‍රකාශ කිරීමත්, ඒ පිළිබඳ පුවත සන්නිවේදනය කිරීම සඳහාත් මළබෙර වාදනය කර ඇත. කාලයාගේ අවෑමෙන් රජවරුන්ගේ

48 වන පිටුව බලන්න

දසත Dasatha

# තුන් හෙළය පළාත්වලට බෙදුනේ මෙහෙමයි!

■ එච්. එම්. කල්දේරා

ශ්‍රී ලංකාව පුරාණයේ පාලනයේ පහසුව සඳහා බෙදී තිබුණේ රුහුණු, මායා, පිහිටි වශයෙනි. ශ්‍රී ලංකාවේ දකුණු මැද පෙදෙසේ කඳු රාශියක් පිහිටා තිබුණ අතර අඩි 8292 ක් උසැති පිදුරුතලාගල ඒවායින් උසම කන්ද විය. මේ වන විට උඩරට නමින් හඳුන්වනු ලබන මේ අති විශාල කඳුකර ප්‍රදේශය, සුවදායක, ශීතල දේශගුණයකින්ද යුක්ත විය. ස්වභාවයෙන්ම හැම කල්හිම දිය පිරුණු ගංගා හා ඇළදොළ, නිසා මේ ප්‍රදේශයේ ජලය සුලබය. මේ ගංගා තැන් තැන් වල විසිතුරු දිය ඇලි ලෙසින් පහළට ගලනු දැකීම උඩරට ප්‍රදේශයටම ආවේනික දසුනක් විය. මුළුමහත් කඳුකර ප්‍රදේශයම සරුවට වැඩුණු වෘක්ෂකලතාවන්ගෙන්ද, ස්වාභාවික සුන්දරත්වයෙන්ද, අනූනය. මේ සෞන්දර්ය උඩරට පිහිටි කඳුවලද මැනවින් දැකගත හැකිය. කඳුකර පෙදෙසේ සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය අඟල් 80 සිට 125 දක්වාද වෙයි. රම්බොඩ හා නකල්ස් පෙදෙස අවට මහවැලි ගඟේ ඉහළ නිම්නයේ වාර්ෂික වර්ෂාපතනය අඟල් 140 සිට 200 දක්වා වෙයි. අනෙක් ප්‍රදේශවලට වඩා විශාල ස්වභාවයකින් යුක්ත ඌව කඳුකරයේ හා නැගෙනහිර කඳුකරයේ වාර්ෂික වර්ෂාපතනය අඟල් 65 සිට 100 දක්වා පවතී. මේ පුරාණ කන්ද උඩරට අසිරියෙන් බිඳකි. සිංහල රජවරුන්ගේ අන්තිම බලකොටුව වූයේ කඳුවලින් වටවූ උඩරට රාජ්‍යයි. යුරෝපීය සතුරන් පහත රට අල්ලාගෙන සිටියදී නිදහස ආරක්ෂා වී තිබුණේ මේ කන්ද උඩරට රාජ්‍යයේය.

මහවැලි ගඟට නැගෙනහිරින් පිහිටි මුළු පෙදෙසද, පහළ ඌවද, හම්බන්තොට, ගාලු, මාතර, දිස්ත්‍රික්කද ඇතුළත් වූ රුහුණු රටේ අගනුවර වූයේ මහගම හෙවත් මාගමය. දැන් මාගම හඳුන්වන්නේ තිස්සමහාරාමය ලෙසය.

රජරට ගැන සඳහනක් 9 වැනි සියවස දක්වාම වංශකතාවල සඳහන් නොවන නමුත් ක්‍රි. පූ. 161 වැන්නේදී දුටුගැමුණු මහ රජතුමා ලංකාව එක්සේසත් කිරීමට පෙරාතුව විසූ රජවරුන් අනුරාධපුරය රාජධානිය කරගෙන රජකම් කළ රජරට ප්‍රධාන දිසා හතරකට අනුව නම් කරනු ලැබූ ප්‍රදේශ හතරකට බෙදා තිබුණේය. මෙයින් ඉහළ වැදගත්කමක් ලැබී තිබුණේ 66 වැනි සියවසේ අවසානයේ පටන් දකුණු දේශයටය. දකුණු දේශය පාලනය කරන ලද්දේ උප රාජයකු විසින්ය. දොළොස් වැනි සියවසේ අග භාගය වන විට මේ නම්වල වෙනසක් ඇති වී රජරට පිහිටි රට යනුවෙන් හැඳින්වීම ඇරඹිණි. දකුණු දේශය හා මලය දේශය එක්කොට මහයා රට යනුවෙන් හැඳින්වීම ඇරැඹිණි. මායා රට යනුවෙන් හැඳින්වූයේ එය මායා හෙවත් මායාගේ ප්‍රදේශය යන අර්ථයෙනි.

වෙනසකට භාජන නොවූ රුහුණු රට හෙවත් රෝහණ දේශයත් මායා රටත් එක්කොට ත්‍රිසිංහල රාජ්‍යය හෝ තුන් රාජ්‍ය වශයෙන් හැඳින්විය.

රජරටත් රුහුණත් එකිනෙකින් වෙන් කරන ලද්දේ මහවැලි ගඟෙනි. මහවැලි ගඟ යට කී රාජ්‍ය දෙකට රැකවරණ ලබාදුන් බාධක ගංඟාවක් විය. ක්‍රි. පූ. දෙවැනි සියවසේදී දුටුගැමුණු කුමරු විසින් මෙහෙයවූ යුද්ධයේදීත්, දොළොස්වැනි සියවසේදී පරාක්‍රමබාහු රජු සහ මානාභරණ රජු අතර පැවැති අභ්‍යන්තර යුද්ධයේදීත් මහවැලි ගඟ අසල බොහෝ සටන් පැවති බව සඳහන් වේ. ගඟ දිගේ පිහිටි තොටුපොළවලට රැකවරණය පතා පිහිටුවන ලද බළ කොටු රාශියකට විජිත නගර නමැති මහ බළකොටුවෙන් උදව් ලැබී ඇත. දොළොස්වැනි සියවසේ පොළොන්නරුව යනුවෙන් හැඳින්වෙන්නේ මේ බල කොටුවයි. පොළොන්නරුව යුද්ධෝපක්‍රමික අතින් වැදගත් විය. රුහුණෙන් සිදුවන ආක්‍රමණවලින් රජරට රැකුණේ පොළොන්නරුවෙන් ලැබුණ ආරක්ෂාව නිසාය. එසේම ආක්‍රමණිකයන්ගෙන් තර්ජන එල්ල වූ හැම විටම එයට එරෙහිව ලහි ලහියේ ආරක්ෂාව සංවිධාන කිරීමට හා අවශ්‍ය වූ විටෙක රුහුණු පාලකයන්ට පළා යෑමට සුදුසු තැනක් වූයේද පොළොන්නරුවයි.

පුරාණ යුගයේ රට බෙදා තිබුණු පිළිවෙළ ගැන හෝ එබඳු කොටස් පාලනය කළ ආකාරය ගැන හෝ මෙතෙක් ලැබී ඇත්තේ තොරතුරු ස්වල්පයක් පමණකි. එසේ වුවද 8 වැනි සියවසේ සිට 12 වැනි සියවස දක්වා කාලය එනම් මධ්‍යතන යුගයේ පාලනය කරන ලද ආකාරය පිළිබඳ තොරතුරු රාශියක් (ක්‍රි ව. 1187 - 1196 ) කාලයේ රජ කළ නිශ්ශංකමල්ල රජු විසින් කරවන ලද ටැම් ලිපියක සඳහන් වේ. එහි 'තුන් හෙළය' (රුහුණු, පිහිටි, මායා) ගැන කියවේ.

පහතරට වියළි ප්‍රදේශය සිංහල සභ්‍යත්වයේ මුල් බිමය. ඒ හේතුවෙන් එම ප්‍රදේශය ඉතිහාසයේ වැදගත්ම ප්‍රදේශයයි. ශ්‍රී ලංකාවේ භූමි ප්‍රමාණයෙන් සියයට හැත්තෑවක් පමණ වන මේ ප්‍රදේශයට වයඹ, උතුර, ඊසාන, උතුරු මැද, නැගෙනහිර, ගිණිකොණ යන මේ කොටස් ඇතුළත්ය. ඔක්තෝබරයේ සිට අප්‍රේල් දක්වා පමණක් වැසි ලැබෙන නිසාත් (ඊසාන මෝසම්) මැයි සිට සැප්තැම්බර් දක්වා නියඟ ඇතිවන නිසාත් (නිරිත මෝසම්) මේ ප්‍රදේශ වියළි කලාපය යනුවෙන් හැඳින්වෙයි.




## පරිපාලන දිස්ත්‍රික්ක වෙන් කිරීම

ප්‍රධාන වශයෙන් යුරෝපීය ජාතීන් තුනක් සමග නිරන්තරයෙන් පැවති අරගල අවසානයේ 1815 මාර්තු 02 දින උඩරට ගිවිසුම අත්සන් කිරීමෙන් පසුව රටේ පාලනයට ඉංග්‍රීසීන් අවතීර්ණ වීමත් සමගම, එතෙක් පැවති පාලන ක්‍රමයද වෙනස්වීම ඇරැඹිණිඩ් ඒ අනුව ලංකාවේ පාලන තන්ත්‍රය පරීක්ෂා කිරීම සඳහා බ්‍රිතාන්‍ය රජය විලියම් කෝල්බෲක් සාමිවරයා පත්කරනු ලැබ 1824 අප්‍රේල් මාසයේදී අවශ්‍ය කටයුතු සඳහා ලංකාවට පැමිණියේය. දිවයිනේ විවිධ ප්‍රදේශවල සංචාරය කරමින් විවිධ පුද්ගලයන්, සමිති සමාගම් හමුවෙමින් එක් රැස්කර ගත් කරුණු පදනම් කොටගෙන පරිපාලනය පිළිබඳ විශාල වෙනස්කම් සිදුවිය යුතු බවට නිර්දේශ ඉදිරිපත් කරමින් 1832 මාර්තු මාසයේදී ඔහු සිය වාර්තාව බ්‍රිතාන්‍ය රජයට ඉදිරිපත් කළේය.

මේ වනවිට උඩරට පහතරට යනුවෙන් ක්‍රියාත්මක වූ පාලන ක්‍රමය එක්කරමින් එකම පාලනයක් බවට පත්කළ යුතු බව කෝල්බෲක් හා කැමරන් නිර්දේශයන් වූ අතර දිවයිනම පරිපාලන පළාත් පහකට වෙන් කිරීම තවත් එක් නිර්දේශයක් විය.

යාපනය අගනගරය කරමින් උතුරු පළාත, ගාල්ල අගනුවර කරමින් දකුණු පළාත, ත්‍රිකුණාමලය අගනුවර කරමින් නැගෙනහිර පළාත, කොළඹ අගනුවර කරමින් බස්නාහිර පළාත හා මහනුවර අගනගරය කරමින් මධ්‍යම පළාත ඉහත කී නිර්දේශය අනුව පිහිටුවන ලැබූ පළාත් පහයි.

එක් පළාතක ප්‍රධාන රට කරවන නිලධාරියා ආණ්ඩුවේ ඒජන්ත වශයෙන් හැඳින්විය. ආණ්ඩුවේ ඒජන්තවරු පස්දෙනකුට සීමා වීම අනුව ආණ්ඩුවේ මුදල් විශාල ප්‍රමාණයක් අඩුකර ගැනීමට හැකි වීම ඉහත කී නිර්දේශයේ එක් වැදගත් අංගයක් විය. මේ පළාත් බෙදී යෑම කිසිදු ඓතිහාසික හෝ ස්වාභාවික හෝ දේශපාලන සම්බන්ධකම් ගැන සැලකිල්ලක් දක්වා කරන ලද්දක් නොවන බව සඳහන් වේ. මුළු රටෙන් 1/5 ක් පමණ විශාල වූ කොටසක් එක් පළාතකට වෙන්වීම, මේ පළාත් බෙදීමේ ප්‍රධාන දුර්වලකමක් වශයෙන් හැඳින්වෙන අතර ගමනාගමන දුෂ්කරතා බෙහෙවින් බලපැවැත්වූ එකල තම පාලනය අදාළ පළාතේ බොහෝ කොටස් ආණ්ඩුවේ ඒජන්තවරයාගේ අවධානයෙන් ගිලිහී යෑම හේතුකොට ගෙන ජනතාවට මහත්වූ දුෂ්කරතාවන්ට මුහුණදීමට සිදුවිය.

ආරම්භයේ 1834 දී පළාත් පහක් වශයෙන් පැවතියද, ශ්‍රීමත් කොලින් කැම්බල් ආණ්ඩුකාරයා (1841 - 1847) 1845 දී හලාවත, පුත්තලම හා සත්කෝරළය එක්කොට, 'පුත්තලම' අගනුවර ලෙස පවත්වමින්, වයඹ පළාත බිහිකළේය. 1856 දී නැවත වරක් වයඹ පළාතේ අගනුවර 'කුරුණෑගල' බවට පත්කරන ලදී. 1870 දී නැගෙනහිර පළාතේ අගනුවර වශයෙන් පැවති ත්‍රිණකුණාමලය වෙනුවට 'මඩකලපුව' තෝරා ගන්නා ලදී.

1872 සිට 1877 දක්වා වසර පහක් ආණ්ඩුකාරධූරය දැරූ ශ්‍රීමන් විලියම් හෙන්ද්‍රිතුමාට, නුවර කලාපයේ හා තමන්කඩුවේ කළ සංචාරයකදී වැටහී ගිය පරිදි යාපනය දිසාපතිවරයාට ඈත සිංහල ගම් දනව් වෙනුවෙන් කටයුතු කිරීමේ දුෂ්කරතාවය පෙනී ගියෙන් 1873 දී 'අනුරාධපුරය' අගනගරය කරමින් උතුරු පළාතට අයත්කොට තිබූ නුවර කළාපයත්, නැගෙනහිර පළාතට එක්කොට තිබූ තමන්කඩුවත් එක්කොට උතුරු මැද පළාත පිහිටුවීය.

එක්දාස් අටසීය අනූව පමණ වන විට මොණරාගල, වැලිමඩ හා බදුල්ල ප්‍රදේශවල වතු වගාව සීඝ්‍රයෙන් වර්ධනය වන්නට විය. මේ වනවිටත් මෙකී ප්‍රදේශද මහනුවර අගනුවර කොට ගෙන පිහිටුවා තිබුණත් මහනුවර ඒජන්තගේ අවධානය යොමු වීම අපහසු කටයුත්තක් විය.

මේ දුර බැහැර ප්‍රදේශ තනි පළාතක් යටතට ගැනීම පාලන කටයුතුවලටද පහසුවක් විය හැකි බව සලකා ශ්‍රීමත් ආතර් හැමිල්ටන් ගෝර්ඩන් ආණ්ඩුකාර තුමා මධ්‍ය පළාතට අයත්ව තිබූ බින්තැන්න, වියලුව, වෙල්ලස්ස, උඩුකිඳ, යටිකිඳ, කොටස්ද දකුණු පළාතට අයත්ව තිබූ වැල්ලවාය, බුත්තල යන පෙදෙස්ද එක්කොට 'බදුල්ල' අගනුවර කරමින් ඌව පළාත බිහි කළේය.

එසේම කුකුළු කෝරළය, කොළොන්න කෝරළය, වැනි ප්‍රදේශවල දියුණුවට කටයුතු කිරීම අපහසු බව පෙනී ගියෙන් 1889 දී ගෝර්ඩන් ආණ්ඩුකාරතුමා විසින් එතෙක් පිහිටුවා තිබුණු පළාත් අට තවදුරටත් පුළුල් කරමින් 'රත්නපුරය' අගනුවර කරමින්, සබරගමුව ශ්‍රී ලංකාවේ නවවෙනි පළාත ලෙස නම් කළේය.

රුහුණු, මායා, පිහිටි වශයෙන් ක්‍රියාත්මක වූ තුන් හෙළය රටට සුදු අලියෙක් වෙමින් දැනට ක්‍රියාත්මක වන පළාත් නවයක් ලෙස බිහි වූයේ ඔය ආකාරයටය.

මෙයින් කෙටි කළකින්ම පරිපාලන කටයුතු ශීඝ්‍රයෙන් පුළුල් වන්නට විය. පළාත පාලනය කළ ඒජන්ත තැනට රාජකාරි කටයුතු බහුල වන්නට වූයෙන් , පළාත් දිස්ත්‍රික්කවලට බෙදිණි.

බස්නාහිර පළාත කොළඹ, කළුතර, ගම්පහ වශයෙන්ද, දකුණු පළාත ගාල්ල, මාතර, හම්බන්තොට වශයෙන්ද, මධ්‍යම පළාත මහනුවර හා මාතලේ ලෙසද, ඌව පළාත බදුල්ල හා මොනරාගල යනුවෙන් හා අනෙකුත් සියලුම පළාත්ද දිස්ත්‍රික්ක වශයෙන් කොටස් දෙක තුන වන සේ බෙදී වෙන්විණි.

# WANT TO BE A DOCTOR?

*THEN CONSIDER*

## ALL SAINTS UNIVERSITY
SCHOOL OF MEDICINE

**416-839-6461**




LAST 2 YEARS **(CLINICAL ROTATIONS)** OF EDUCATION COMPLETED AT TEACHING HOSPITALS IN **USA & CANADA**

2 CAMPUSES TO CHOOSE: **DOMINICA ST. VINCENT**

PROVISIONAL ADMISSION WITH MIDTERM MARKS









NOW **ENTER DIRECTLY FROM HIGH SCHOOL TO MEDICAL SCHOOL**



**STUDY MEDICINE AT ALL SAINTS UNIVERSITY**

**CALL TO REGISTER:**
**1-866-602-9555 or 416-743-9222**

**For our 10th Anniversary in operation, All Saints University will offer 50% tuition fee scholarship plus an additional 25% interest free loan, which is payable at the end of the program. MCAT preparatory classes in Toronto will be of one year duration only (three semesters)**

Saliroo Creations

All Your Publishing Needs
under one roof

Graphics
Illustrations, Logos,
Banners, Mags, Books, Brochures, Ads, Flyers.....

Web Sites
Web Design, Website Development, Webhosting (Linux & Windows), Shopping Cart Systems.....

Computer Repairs
Laptops, Netbooks & Desktop Computors, Replace LCD Screens, Software Installations

ඔබගේ සියලු ප්‍රකාශන අවශ්‍යතා සහ පරිගණක අලුත්වැඩියාවන් සඳහා
Tel : 416 201 0628

French Tutoring

Individual and small group classes for French learners'French reading, writing, and conversing'Any grade from grade 1-12, university minors and French Immersion

Kumudu Abeywardena, B.A
(Modern Languages), Dip (AFC)
T.P - 647 824 1897

MARRIAGE PROPOSALS

Sinhalese buddhist 5"3, 30 yr beautiful and kind heart lady. working for Sri Lanka airline. Seeking for a Sinhalese buddhist suitor 35-40 yr single and has education, responsible man from a decent family.

Contact:647 262 7193

# පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා

## ඉංග්‍රීසි බැහැ

STOP යන පදය මාර්ගයේ විදුලි සංඥා පුවරුවේ සඳහන්ව තිබියදී එය නොතකා මෝටර් රථය ධාවනය කිරීමේ චෝදනාව යටතේ අධිකරණය හමුවට පමුණුවන ලද රියදුරෙකි. ඔහුගේ වාහනයේ අංකය CY 367 වේ.

විනිසුරු - තමා STOP කියා සංඥා කර තිබියදී වාහනය නතර නොකොට ධාවනය කළේ ඇයි?

රියදුරු - අනේ ස්වාමීනි.... මම ඉංග්‍රීසි දන්නෙ නැහැ.

විනිසුරු - තමාට ඉංග්‍රීසි පොඩ්ඩක්වත් බැරිද?

රියදුරු - ස්වාමීනි.... මම ඉංග්‍රීසි අකුරක්වත් දන්නේ නැහැ.

විනිසුරු - එහෙනම් කියනවා බලන්න තමාගේ වාහනේ අංකය.

රියදුරු - බිංදුවෙන් භාගයයි කැටපොල් කරුවයි තුන්සිය හැටහතයි හාමුදුරුවනේ.

## ඉබ්බන්වල හන්දිය

කොළඹට තරමක් ඈතින් වූ වගුරු පෙදෙසක වළක ඉබ්බෝ වූහ. එක්තරා නියං සමයක වතුර සිඳී යෑම නිසා එහි වළක සිටි ඉබ්බෙක් මහත් වූ අපහසු තත්ත්වයකට පත්ව සිටියේය. මේ දැක දුක් වූ කොක්කු දෙන්නෙක් බේරේ වැවට ගෙන ගොස් දැමීමට ඉබ්බාව කැමති කරවා ගත්හ.

කෝටුවක් ගෙන එහි මැද්දෙන් කටින් එල්ලෙන්න කියා කෝටුව දෙකෙළවරින් හොටින් ගෙන බේරේ වැව දෙසට ඉගිල ගියෝය. අහසින් යන ඉබ්බා දුටු පිටියක ක්‍රීඩා කරමින් සිටි පිරිසක් මහත් හඬින් කෑකෝ ගසමින් උඩ පැන්නෝය. ඔවුනට බැණවැදීමට කට ඇරි ඉබ්බා බිම වැටී මිය ගියේය.

තවත් නියං සමයක ඉහත කී ප්‍රදේශයේ දිය සිඳුනු වළක කලින් බේරේ වැවට ගිය ඉබ්බාගේ ලොකු මල්ලී මහත් අපහසුතාවෙන් සිටී. පුරුදු කොකුන් දෙදෙනාද පැමිණ අයියාට සිදුවූ දෙය විස්තර කර දී කට පරිස්සම් කරගැනීමට හැකි නම් බේරේ වැවට ගෙන ගිය හැකි බව පැවසූහ. ඉබ්බා තරයේ පොරොන්දු විය. කෝටුවක මැදින් එල්ලුන ඉබ්බාවද රැගෙන කොක්කු දෙදෙනා බේරේ වැව බලා ඉගිල ගියහ. අහසින් යන ඉබ්බා දුටු පිරිස් සුපුරුදු පරිදිම කෑකෝ ගසන්නට වූහ. එහෙත් ඉබ්බා කට ඇරියේ නැත. මේ බව දුටු එක් කොකෙක් මූ නම් මාර ඉබ්බෙක් යැයි කීමට කට ඇරියේය. කොකාගේ කටින් කෝටුව අතහැරී ගොස් ඉබ්බා බිම වැටී මළේය.

මේත් එවන් නියං සමයකි. කලින්ම බේරේ වැවට ගිය ඉබ්බාගේ බාල මල්ලීය. කොකුන් දෙදෙනාද සුපුරුදු අයමය. කරුණු තරයේ පැහැදිලි කරදී ඉතා ප්‍රවේශම්ව ඉබ්බාද රැගෙන බේරේ වැව දෙසට ඉගිල ගියහ. කෑකෝ ගැසීම් වෙනදා මෙන්මය. එහෙත් වඩාත් කල්පනාකාරී වූ කොකෙක් දෙවන වතාවේ කළ වරද නොකරනසේ අනෙකාට අවවාද දීමට කට ඇරියේය. ඉබ්බා තදින් එල්ලී සිටී. කොනක් අතහැරුනු කෝටුව සමබරතාව නැතුව අනෙක් කොකාත් ඉබ්බාත් සමඟ වේගයෙන් පහතට ඇදී එන්නට විය. වහා ක්‍රියාත්මක වූ කෝටුව අතහැරුන කොකා වේගයෙන් පහතට පියාඹා කෝටුවේ කෙළවර හොටින් ගෙන ඉහළට පියාඹන්නට විය. ඉතාමත් ත්‍රාසජනක අන්දමින් මරණයෙන් ගැලවී ප්‍රීතියට පත් ඉබ්බා දක්ෂකම කළ කොකාට "තෑන්ක් යූ" කීවේය. ඌත් බිම වැටී මළේය.

පුදුමය නම් මේ ඉබ්බන් තුන්දෙනාම වැටුණේ එකම පෙදෙසකටය. මෙසේ ඉබ්බන් මළ හන්දිය පසුව ඉබ්බන්වල හන්දිය වුණේලු. ඇත්තටම සිදුවිය හැකිද? භාෂාවේ ව්‍යාකරණ රීතීන්ට අනුව නම් එසේ විය හැකිය.

(ප්‍රබන්ධයක් පමණි)

**කේ. ඩී. සිරිපාල**

## විශ්වාසය

ඉන්දියාවේ එක්තරා ඇමැතිවරයෙකුට රාජකාරි කටයුත්තක් සඳහා වෙනත් රටකට යෑමට සිදුවිය. එහිදී ඔහුට ගැටලුව වූයේ ඔහු විසින් රැස් කරන ලද විශාල මුදල් ප්‍රමාණයක් සුරක්ෂිතව තබා යෑමයි. මේ සඳහා ඉතා සුදුසුම පුද්ගලයා අගමැතිතුමා යැයි සිතූ ඇමැතිවරයා මුදල් බෑගයද රැගෙන අගමැති වෙත ගියේය.

"මුදල් කටයුතුවලදී සමහරවිට වරදවා තේරුම් ගන්න පුළුවන්. ඒ නිසා මුදල් භාර ගැනීමේදී සාක්ෂිකරුවන් දෙන්නෙක්වත් හිටියොත් වඩා හොඳයි නේද?" පැවසූ අගමැතිවරයා ඔහුගේ උපදේශකවරුන් දෙදෙනෙක් ගෙන්වා ඔවුන් ඉදිරියේ මුදල් භාර ගත්තේය.

රාජකාරි කටයුත්ත නිමවා සිය රට පැමිණි ඇමැතිවරයා අගමැති වෙත ගොස් මුදල් බෑගය ආපසු ඉල්ලූ විට "කුමන මුදල්ද?" යි අගමැති විමසීය.

"ඇයි ඔබතුමාට මම දීල ගියේ අර අහවල් උපදේශකවරුන් දෙදෙනත් සිටියනේ"

"එසේනම් අහල බලමු" යි වහාම එකී උපදේශකයන් දෙදෙනා ගෙන්වා

"මේ ඇමැතිතුමා කියනවා ඔබලා දෙන්නා ඉදිරියේදී මුදල් බෑගයක් ආරක්ෂා කරන්න මට දුන්නා කියල. මට නම් මතකයක් නැහැ"

"නෑ සර් එහෙම එකක් දුන්නේ නැහැනේ" එක උපදේශකයෙක් පැවසීය.

"කිසිම මුදලක් ඔබතුමා විසින් අගමැතිතුමාට අප ඉදිරියේදී නම් දුන්නේ නැහැ" අනිත් උපදේශකතුමාද දැන්වීය.

ඔවුන් දෙදෙනා ගිය පසු සේප්පුව විවෘත කළ අගමැතිවරයා මුදල් බෑගය ඇමැතිවරයාට භාර දුන්නේය.

"එහෙනම් ඇයි ඔබතුමා ඉස්සෙල්ල මුදල් නැහැ කිව්වේ"

"මට ඕනෑ වුණා මා ගාව ඉන්න උපදේශකවරු කොයි වගේ අයදැයි ඔබට වටහා දෙන්න" අගමැතිතුමා පිළිවදන් දුනි.

## මුවා-ච

කුඹියෙක් හා අලියෙක් අතර දැඩි මිත්‍රත්වයක් විය. කුඹියා නිරන්තරයෙන් ගමන් බිමන් ගියේ අලියාගේ පිට උඩින්ය. කැළේ බොහෝ දෙනෙක් අලියා සමග එතරම් හොඳ නැත. එම නිසා කුඹියා වැන්නකු සමග මිතුරු වීමට අලියාද කැමති විය.

මේ අතර දිනක් ඝන වනාන්තරය මැදින් යනවිට කොටි රංචුවක් අලියාට පහර දීමට වට කළේය. එදා නම් ගැලවීමක් නැති බව අලි නුවණට කල්පනා විය. එහෙත් සටන් කිරීමට වඩා බේරී යාම ගුණ බව අලියා නොසිතුවා නොවේ.

තම පිට උඩ සිටින කුඹියාට අලියා මේ බව කීවේ තරමක තැති ගැන්මකිනි.

"අද නං බං වැඩේ ඉවරයි වගෙ" අලියා කුඹියාට ඇසෙන සේ කීවේය. අලියාගේ පිටෙන් බැස ගත් කුඹියා මෙසේ කීය.

"මචං... මට මුවා වෙයන්..."

පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි

# ශ්‍රී ලංකාවේ බර්ගර් ජනයා



■ සුනිල කුමාරසිංහ අතුකෝරල

පළමුවැනි විමලධර්මසූරිය රජු ගොඩබිම් සටන්වලදී දක්ෂ ලෙස පෘතුගීසීන්ගේ වෙඩි උණ්ඩයට එරෙහිව සටන් වැදුණිද නෞකා බලයක් නොමැතිවීම හේතු කොටගෙන පෘතුගීසීන් මුහුදින් එතෙරට පලවා හැරීමට අසමත් විය. පෘතුගීසීන්ගේ නාවුක බලය ඉහළ මට්ටමක පැවතුණිද ශ්‍රී ලංකාවේ පිහිටීම අනුව (ගිරි දුර්ග, වන දුර්ග, ඇළ දොළ, ගංගා) හා දුනු ඊ, ගල් කුළු, සිංහලයන්ගේ විවිධ උපක්‍රම පෘතුගීසීන්ගේ වෙඩි බලයට මුහුණදිය හැකි ආකාරයෙන් සැකසුණි. කෙසේ වුවද පෘතුගීසීන් පලවා හැරීමට නම් නාවික බලය ඇති වෙනත් ජාතියක ආධාර ලැබිය යුතු බව සිංහල රජුගේ අපේක්ෂාව විය. මේ යුගයේ ලන්දේසී පෙරදිග රටවල වාණිජ කටයුතු පිළිබඳව මහත් උනන්දුවකින් කටයුතු කළහ. එහි ප්‍රතිඵලයක් ලෙස වෙළඳ වාණිජ කටයුතු සිදුකළ හැකි රටවලට ගොස් වෙළෙඳ සමාගමක් යටතේ ඔවුන්ගේ කටයුතු ඉදිරියට ගෙන ගියේය. එනම් බලකොටු ඉදි කිරීම, යුද්ධ හමුදා තබා ගැනීම, යටත් විජිත පිහිටුවීම, ඒවායේ පාලනය සඳහා ආණ්ඩුකාරවරුන් පත්කිරීම යුද හා අධිකරණ නිලධාරින් පත්කිරීම, ප්‍රාදේශීය පාලකයන් සමග ගිවිසුම් ඇතිකර ගැනීම වැනි රාජ්‍ය බලතල ඊට හිමිවී තිබුණි. ඒ සම්බන්ධයෙන් තව දුරටත් විස්තර කරන්නේ නම්,

වාණිජ කටයුතු සම්බන්ධයෙන් උද්යෝගයෙන් කටයුතු කළ නෙදර්ලන්තය පෙරදිග රටවල් සමග වෙළෙඳාම් කිරීම සඳහා ඕලන්ද පෙරදිග ඉන්දියා වෙළෙඳ සමාගම යන නමින් වාණිජමය ව්‍යාපාරයක් ක්‍රි. ව. 1600 දී පිහිටුවා ගත්තේය. වාණිජ කටයුතුවලින් විශාල ලාභ අත්කර ගත හැකි බව අත්දුටු ලන්දේසීහු විශාල නැව් තනා දියත් කළහ. ඕලන්දයට අයත් ප්‍රදේශ 13 වෙනුවෙන් පෙනී සිටි අධ්‍යක්ෂකවරුන් දහතුන් දෙනකු විසින් මෙම සමාගම් පාලනය කරන ලදී. මෙම සමාගම් හරහා ඔවුන් රැස්කළ ධන සම්භාරය විසින් ඕලන්දය යුරෝපයේ බලවත්ම ජාතිය බවට පත් කරන ලදී. මීට අනුව ශ්‍රී ලංකාවට පළමුවෙන්ම පැමිණි ලන්දේසි නැව්පතියා වන්නේ, ජෝරිස් ෆන් ස්පිල්බර්ජන්ය.

ලක්දිව පෘතුගීසි ජාතිකයන් 1602 වනවිට ව්‍යාප්ත වී සිටි නමුත්, උඩරට ස්වාධීන රාජ්‍යයක් ඇති බවත්, නැගෙනහිර වෙරළ ඔවුන් ගේ වාණිජ කටයුතු පවත්වාගෙන යෑමට සුදුසු ප්‍රදේශයක් ලෙසත් ලන්දේසි වෙළෙඳ සමාගම තේරුම් ගත්හ. මුතු මැණික්, ඇත්දත් සහ කුරුඳු ගැන එකල ලක්දිව ලබා තිබූ කීර්තිය, මෙම වෙළෙඳ සමාග මේ අවධානය යොමුවීමට ප්‍රබල හේතුවක් විය. මෙය ලන්දේසීන්ගේ ආගමනයට මූලික ලෙස බලපා ඇත.

බර්ගර්, (බර්ග්හර්) වචනය බර්ගර් යන ලන්දේසි වචනයේ නිරුක්තියකි. එහි තේරුම 'බර්ග්බරෝ' නැතහොත් 'නගර වැසියා' යන්නයි. ශ්‍රී ලංකාවේ නැගෙනහිර වෙරළේ පිහිටි මඩකලපුව වරාය වෙත 1602 දී ගොඩ බසින ලද, අද්මිරාල් ජොරිස්වෑන් ස්පිල්බර්ග්ගේ සම්ප්‍රාප්තියත් සමග මෙරට ලන්දේසීන් සමග සම්බන්ධය ආරම්භ විය. 1638 වර්ෂයේදී පෘතුගීසි බලකොටුවක් යටත් කරගැනීමත් සමග ශ්‍රී ලංකාවේ ලන්දේසි ආක්‍රමණ ආරම්භ විය. (මේ අවදියේ සිංහල රජු වූයේ, දෙවන රාජසිංහය. මොහු පෘතුගීසීන්ට විරුද්ධ බලවේගයක් ලෙස ලන්දේසීන් හා මිත්‍රව කටයුතු කළහ) ලන්දේසීහු සිංහල දමිළ ස්ත්‍රීන් සමග මෙන්ම පෘතුගීසීන් පලවා හැරීමෙන් පසු දිවයින තුළ රැඳුන ඉන්දු, පෘතුගීසි ස්ත්‍රීන් සමගද විවාහ වූහ.

විමලධර්මසූරිය, සෙනරත්, දෙවන රාජසිංහ, දෙවන විමලධර්මසූරිය, නරේන්ද්‍රසිංහ, ශ්‍රී විජයරාජසිංහ, කීර්ති ශ්‍රී රාජසිංහ යනාදී රජවරුන්ගේ රාජ්‍ය අවදීන් තුළ ලන්දේසීහු විවිධ උපක්‍රම යොදමින් ශ්‍රී ලංකාව තුළ සිය බලය තහවුරු කර ගත්හ. එසේම සිංහල රජුන් සමග එළැඹි එකඟතා නිසි පරිදි ක්‍රියාත්මක නොකළ ලන්දේසීන්, පෘතුගීසීන්ට වඩා කාර්යක්ෂම ලෙස පසු කාලයේ සිය පාලන කටයුතු මෙහෙයවන ලදී. දේශීය සම්පත් මංකොල්ලයෙහි යෙදුණ අපරදිග වැසියන් අතර ලන්දේසීන්ට අද්විතීය තැනක් හිමිවෙයි. රොබට් නොක්ස්ගේ වාර්තා සඳහන් කරන්නේ ලක් පොළොවෙන් හතරෙන් එකක් පමණ භූමි ප්‍රදේශයක් ලන්දේසින් අත්පත් කර ගෙන සිටි බවයි. කොළඹ, ගාල්ල, මාතර සහ යාපනය යන දිසාවන්ද කල්පිටිය, මන්නාරම, ත්‍රිකුණාමලය, මඩකලපුව යන දිස්ත්‍රික්කද ඉතිරි මුහුදුබඩ බිම් තීරයේ ගව්වක් පළල කොටසක්ද ලන්දේසීන්ට නතුව ඇති බව, වර්ෂ 1766 ක් වූ පෙබරවාරි මස 14 වැනි දින කීර්ති ශ්‍රී රාජසිංහ රජු ලන්දේසීන් සමග අත්සන් තබන ලද වගන්ති 25 ක් සහිත වූ ගිවිසුමේ එක් සඳහනකි.

ව්‍යාපාරික හෝ පෞද්ගලික ගනුදෙනු සඳහා ස්වාධීනව පැමිණි ඕලන්ද සමූහයා වෙළෙඳ සමාගම් නිල පත්වීම් ලද පිරිසක් නොවන ලෙස සළකා බර්ගර්වරු හෝ නිදහස් බර්ගර්වරු ලෙස හැඳින්විණි. ලන්දේසි සමයේදී බර්ගර් සහතිකය ඔවුන්ට නගරවල විසීමටත් නියත සිවිල් අයිතිවාසිකම් බුක්ති විඳීමටත් සුදුසුකම් ලබා දුනී. එය ලන්දේසි නොවන අයටද නිකුත් කරන ලදී. (1759 වර්ෂයේදී රික්ස් ඩොලර් 15 ක් ගෙවීම් කළ ධීවර කුලයේ ඇන්ට්‍රියස්වාස් නමැති අයෙකුට බර්ගර් සහතිකයක් ලැබී ඇත).

'ලක් වැස්සෝ රටේ මුල් වැසියෝය, මෙහි පදිංචි වූ විදේශිකයෝය යැයි ප්‍රධාන කොටස් දෙකකට බෙදෙති. සිංහලයෝ පළමුවැනි ගණයට අයත්ය. සිංහලේ සහ ලංකාවේ නිරිතදිග පෙදෙස් වැස්සෝ සම්පූර්ණයෙන්ම පාහේ මොවුහුය. දෙවැනි ගණයට මලබාර්වරු සහ මරක්කලයෝ අයත්ය. මලබාර්වරු ප්‍රධාන වශයෙන් උතුරු සහ නැගෙනහිර මුහුදුබඩ පළාත්වල වාසය කරති. විශේෂ පළාතකට සීමා නොවන මරක්කලයෝ යුරෝපයෙහි යුදෙව්වන් මෙන් රට හැම තැනම විසිරී ජීවත් වෙති. ඇතැම් කරුණුවලින් මොවුහු යුදෙව්වන්ට සමාන වෙත්., - ඩේවි දුටු ලංකාව

## රුපියල

කාසි අතුරින් පෘතුගීසීන්ට වඩා වැඩි දක්ෂතාවක් ලන්දේසීන් විසින් පෙන්වා දී ඇත. 1656 - 1802 ලන්දේසි සමය තුළ නිකුත් කළ කාසි දෙකොටසකට බෙදා දැක්විය හැකිය. එනම් ලන්දේසි කාසි සහ වී.ඕ.සී. කාසි යනුවෙනි. බ්‍රිතාන්‍ය යුගයේ ශ්‍රී ලංකාවේ භාවිතා කළේ 'රික්ස්' ඩොලරයයි. 1825 පමණ පටන් සෑම යටත්විජිත රටක්ම 'ස්ටාලින්'මුදල් භාවිත කළහ. ශ්‍රී ලංකාවේ එකල රිදී කාසි භාවිතා වුවද බ්‍රිතාන්‍යයන් 1871 අගෝස්තු මස 23 වැනි දින අපේ මුදල් ක්‍රමයේ පදනම 'රුපියල' බව තීරණය කරන ලදී. 1872 ජනවාරි මාසයේ පළමුවැනිදා ශතය, ශතපහ, ශත භාගය, ශත කාල මෙරටට ඔවුන් හඳුන්වා දෙන ලදී. මෙම කාසියේ එක් පසෙක පොල් ගසද අනෙක් පස රැජිනගේ රූපයද විය. මෙයින් බොහෝ කලක් යන තුරු බ්‍රිතාන්‍ය රජ පවුලේ පිංතූර දකින්නට ලැබුණිද 1963 න් පසු ශ්‍රී ලංකාවේ කාසිවල පසුපස වූයේ ශ්‍රී ලාංකීක රාජ්‍ය ලාංඡනයයි. 1972 වර්ෂයෙන් පසු නැවත ඒ තැන ගත්තේ ජනරජ ලාංඡනයයි.

පෘතුගීසීන් ගේ මහා විනාශකාරී පාලනයෙන් පසු ලන්දේසීන්ගේ පාලනය ආරම්භ විය. තමන් සන්තක ප්‍රදේශ ස්වයංපෝෂිත කළයුතු බව තේරුම්ගත් ඔවුහු කෘෂිකර්මය දියුණු කිරීම සඳහා දකුණු ඉන්දියාවෙන් වහලුන් පවා ගෙන්වා ගත්හ. රට තුළ සාමය සුරක්ෂිත කර ගැනීමට ඔවුන් මහත් උනන්දුවක් දැක්වූ බවද සඳහන් වෙයි. මාතර සිට මන්නාරම දක්වා මුහුදුබඩින් පාරක් තැනීමත් ගංගා ඔයවල් හරහා තොටුපළවල් පිහිටුවීමත් භාණ්ඩ ප්‍රවාහනය සඳහා ඇළවල් කැප්පවීමත් ඔවුන් විසින් කරවන ලදී.

කුරුඳු වගාව හැරුණු විට මුතු කිමිදීම, කෝපි වැවීම, පුවක් වෙළෙඳාම, අලි ඇතුන් ඔවුන්ගේ ආදායම් මාර්ග බවට පත්ව තිබුණි. එවක සුප්‍රකට කුරුවේ මුදලි තැන මෙන්ම වන්නියාර්වරුන් ලෙස ප්‍රකට වූවන් පිළිවෙළින් වසරකට අලි ඇතුන් 39 ක් හා 80 ක් භාරදීමට බැඳී සිටි බව ඉතිහාස සටහන්වල වෙයි. මෙසේ භාර දෙන ලද අලි ඇත්තු මුහුදුබඩ මාර්ගය ඔස්සේ එල්ෆන්ට්පාස් ස්ථානයෙන් යාපනය කළපුවෙන් එගොඩකොට කයිට්ස් නැව් තොටේදී වෙන්දේසි කරන ලදුව ඉන්දියාවෙන් පැමිණි වෙළෙඳුන් ඔවුන් මිල දී ගෙන ඇත. මෙය ඔවුන්ට විශාල ලාබ ගෙන දුන් ව්‍යාපාරයක් බවට ඉතිහාසඥයන් පෙන්වා දෙයි.

## බර්ගර් නම්

ශ්‍රී ලංකාවේ උපන් පෘතුගීසි හා වෙනත් යුරෝපීය ජාතීන්ගෙන් පැවතෙන්නන් හට බර්ගර් නාමය අයත් වෙයි. ස්ත්‍රියගේ දෙමව්පියන් කවරෙකු හෝ වුවත් පිරිමි පාර්ශ්වයේ ආදිතමයා ලන්දේසි, පෘතුගීසි හෝ වෙනත් යුරෝපීය ජාතිකයකු හෝ වීද නම් දෙමවුපියන් විවාහ වී සිටියේ නම් දූ දරුවෝ බර්ගර් වෙති. එමෙන්ම බර්ගර් හෝ සිංහල ගැහැනියක විවාහ කරගත් ඕනෑම යුරෝපීයයකුගේ දරුවන් බර්ගර්වරුන් ලෙස පිළිගන්නා ලදී. ඒ කාලයේදීම පෘතුග "සි සහ ස්වදේශී ස්ත්‍රීන්ගෙ න් පැවතෙන්නන්ද බර්ගර්වරුන් ලෙස පිළිගැනිණි.

ලන්දේසී හෙවත් ඩච්, පෘතුගීසි, බ්‍රිටිෂ් යනුවෙන් බර්ගර්වරුන් හඳුන්වා ගතහැකි වන අතර ඔවුන්ගේ ව්‍යවහාර නම්, ආගම් ආදි වශයෙන් විවිධ වෙයි. භාවිත නමේ අගට 'වැන්කියුලන්ඩ් බර්ග්' යනුවෙන් යෙදෙන්නේ, ලන්දේසී බර්ගර්වරුන්ටය. තවද, පෙරෙයිරා, රොසයිරෝ, අල්මේදා වැනි නම් අගට යෙදෙන්නේ පෘතුගීසීන්ගෙන් පැවතෙන බර්ගර්වරුන්ටය. තවද, සිල්වා, බර්තෝලමියුස් ආදි වශයෙන් බ්‍රිටිෂ් හෙවත් ඉංග්‍රීසීන්ගෙ න් පැවත එන බර්ගර්වරුන්ට යෙදෙයි. ආගම් ඇදහීමේදී ලන්දේසි බර්ගර්වරුන් රෙපරමාදු ආගමත්, පෘතුගීසි සහ ඉංග්‍රීසීන්ගෙන් පැවත එන බර්ගර්වරුන් කැතලික්වරුන් ලෙසත් ආගමික වශයෙන් වෙන්ව හඳුනා ගැනීමක් කළ හැකි වුවද, ජන සමාජයේ මිශ්‍රවීම හේතුකොටගෙන මේ තත්ත්වය මේ වනවිට වෙනස් වී ඇති බව සමාජය විමර්ශනය කිරීමෙන් පැහැදිලි වෙයි.

ලන්දේසීන්ගේ කෲරත්වයෙන් මිදීම සඳහා සිංහල රජු ඉංග්‍රීසින්ගේ සහාය පැතූහ, එය 'ඉඟුරු දී මිරිස්' ගැනීමකට සමාන යැයි ප්‍රකටව ඇතත් ඇතැම් විද්වතුන් පෙන්වා දෙන්නේ එය එතරම් සැලකිය යුතු ගිවිසුමක් නොවන බවකි. එනම් මුහුදුබඩ තීරය ගව්වක් පමණ පළලින් යුතුව තිබූ පටු සීමාවන්, ලන්දේසී සිංහල ගිවිසුම අකුරට ක්‍රියාත්මක නොවීමත් යන කරුණු සැලකිල්ලට ගැනීමෙනි. කෙසේ වුවද ක්‍රි. වර්ෂ 1776 පෙබරවාරි මස 14 වැනි දින කොළඹ නගරයට ළඟාවීමට ප්‍රථම ඉංග්‍රීසීන් ත්‍රිකුණාමළය, මඩකලපුව, පේදුරුතුඩුව, යාපනය, මුලතිව්, මන්නාරම, කල්පිටිය, මීගමුව යන නගරවල ඉංග්‍රීසි ධජ ඔසවා අවසන්ය. කොළඹ අත්පත්කර ගැනීම සඳහා මදුරාසියෙන් අතිරේක හැටපන් දහසක ඉංග්‍රීසි හා සිපොයි හමුදාවක් ගෙන්වාගෙන ඇත.

1796 වර්ෂයේදී බ්‍රිතාන්‍ය විසින් සිදු කරන ලද ආක්‍රමණය, ලන්දේසීන්ගෙන් පැවත ආ බර්ගර්වරුන්ට අශුභ ලක්ෂණ ගෙන ආවත් ඔවුන්ගේ අනාගතය සුරක්ෂිත කරගැනීමට, ඔවුන් ඉංග්‍රීසි භාෂාව ඉගෙන ගැනීමට පෙළඹුණි. ඒ සඳහා ඔවුන්ට 1835 වර්ෂයේදී මෙහි පිහිටවූ කොළඹ ඇකඩමිය මනා පිටු බලයක් ලබා දුනි. මෙම ඇකඩමියේ ඔවුන්ගේ වර්ධනය කොතෙක්ද කිවහොත් 1850 වන විට එහි ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 65% ක් දෙනා බර්ගර්වරුන් විය. ඉතිරිය වූයේ වංශවතුන් සේ සැලකූ සිංහලයන්, කොළඹ හෙට්ටින් හා දමිළ සුළු පිරිසක්ය.

## බර්ගර් පුවත්පත්

1850-1852 අවධියේ ප්‍රකාශිත තරුණ ලංකා බර්ගර් ප්‍රකාශනය මෙරට පැවති ප්‍රධානම සාහිත්‍ය සඟරාව විය. බර්ගර් පුවත්පතක් ලෙස පිළිගත්, 'දි සිලෝන් ඉන්ඩිපෙන්ඩන්' පත්‍රයේ අයිතිකරු ශ්‍රීමත් හෙක්ටර්වෑන් කියුලන් බර්ග්, ලන්දේසි බර්ගර් සංගමය පිහිටුවීමෙහි ලා සැලකූ පුද්ගලයෙකු ලෙස සමාජ අවධානයට ලක්විය.

1940 දශකය ආරම්භ වනවිට බර්ගර්වරුන් බොහෝ දෙනා රටින් බැහැරව ඔස්ට්‍රේලියාව වැනි රටවල් සොයා පදිංචියට පිටත් විය. ඒ වනවිට ඔවුන් පෙළීමට සිදුවූ කරුණු ලෙස වර්ගවාදයේ නැගීම, ක්‍රිස්තියානියට හා බටහිර ජීවන රටාවට එරෙහි ආකල්ප වැඩිවීම, ඔවුන්ගේ දරුවන්ගේ අධ්‍යාපන හා සුබ සාධනයට පැවතුනා වූ බාධක වගේම ඔවුන් බුද්ධාගම, සිංහල භාෂාව, සංස්කෘතිය කෙරෙහි අනුකූලතාවක් නොදැක්වීම නිසා සමාජානුයෝජනයේ දුර්වලතා සහ අනෙකුත් ජන කොටස් සමග මනා අනුකූලතාවක් නොදැක්වීම ආදී වශයෙනි. මේ සියවස ආරම්භයේදී ජනගහනයෙන් 7% ක් වූ බර්ගර්වරුන් 1981 වනවිට 30,000 ක් ලෙස වාර්තා වී තිබුණි. එය මිලියන 15 ක් වූ මුළු ජන සංයුතියෙන් 0.25 ක් වෙයි. බර්ගර් ජනතාව ශ්‍රී ලංකාවේ අනෙකුත් ජනවර්ග සමග සහයෝගිතා පදනමෙන් කටයුතු කළේ නම් ශ්‍රී ලංකාවේ අනාගත අභිවෘද්ධිය උදෙසා ඉමහත් මෙහෙවරක් ඔවුන්ට කළ හැකිව තිබුණි.

# අවමංගල්‍ය...

43 වන පිටුවෙන්

හා බිසෝවරුන්ගේ අභාවයන් දැනුම් දීම පිණිසද අනතුරුව භික්ෂූන් වහන්සේගේ අභාවයන් දැනුම් දීම පිණිසද මළබෙර වැයූ බව සඳහන් වේ. මළබෙර වාදනය කිරීමේ මූලික පරමාර්ථය වූයේ ශෝකය ප්‍රකාශ කිරීමත් සන්නිවේදනයත්ය.

මුල් කාලයේ මේ සඳහා දවුල යොදා ගනු ලැබුවද පසුකාලීනව දවුලත් සමඟ තම්මැට්ටම හා හොරණෑව වාදනය කරනු ලැබීය. මෙම සංගීත භාණ්ඩයන් දේශීය සංගීත භාණ්ඩ වර්ගීකරණය අනුව 'පංචතූර්ය වාදන භාණ්ඩ' ගණයට අයත් වේ. අවමංගල්‍ය උත්සව සඳහා දවුල හා තම්මැට්ටම වාදනය කිරීමේදී සුදු රෙදිවලින් ආවරණය කිරීම සිරිතක් වේ. එසේ කරනු ලබන්නේ මෙම සංගීත භාණ්ඩ කිල්ලට හෙවත් අපවිත්‍රභාවයට හසුවේය යන විශ්වාසය මතය. පංචතූර්ය භාණ්ඩ අතර දවුල තම්ටැට්ටම වැනි අවනද්ධ භාණ්ඩ 'විශ්වකර්ම දිව්‍ය පුත්‍රයා' විසින් නිර්මාණය කරනු ලැබුයේ යැයි විශ්වාසයක් වාදකයන් අතරේ පවතී. මෙම අදහස් හින්දු දේවවාදී සංකල්ප සමඟ සම්බන්ධව පොදු ජනයාගේ විශ්වාස පද්ධතියට ඇතුළු වී ඇත. එබැවින් මෙම භාණ්ඩ දේවත්වයෙන් සැලකීමට හුදී ජනයා පුරුදුවී සිටී. එනිසා මළබෙර වැයීමේදී සුදුරෙදි කඩකින් මෙම භාණ්ඩ ආවරණය කොට වාදනය කිරීම සිරිතයි. සංගීතවේදාත්මක දෘෂ්ඨියෙන් මේ පිළිබඳව සලකා බැලීමේදී පිළබිඹු වන්නේ එම අවස්ථාව හා බැඳි ශෝකී ශබ්ද ධ්වනිය උත්පාදනය කිරීමටද එය පිටිවහලක් වන බවයි.

මළබෙර වයනු ලබන්නේ විලම්භ ලයෙනි. ඊට හිමි බෙර පදය මාත්‍රා 16 කට බෙදෙන සේ විලම්භ ලයට අනුව වාදනය කරනු ලැබේ.

මෙම බෙර පද සාමාන්‍ය ජනයා අතරේ ව්‍යවහාර වන්නේ ඊට ආදේශ කොට ඇති ජනශ්‍රැති ආශ්‍රයෙනි. බෙර පද වැයීමේදී එය ශ්‍රවණය වන ආකාරය අනුව හා රිද්ම රටාවට ගැලපෙන පරිදි මෙම ජයශ්‍රැති නිර්මාණය කර තිබේ. මෙම ජනශ්‍රැති ජන කාව්‍යවලට සමානත්වයක් දරයි. උදාහරණයක් ලෙස,

රන් කඳ රන් කඳ මොනව කරන්නද
දැන් යමු දැන් යමු පාලු කනත්තට

මෙවැනි ජන ශ්‍රැතීන් අන්‍ය බෙර වාදන සඳහාද පාදක වී තිබේ. පිරිත් දේශනයන් සඳහා සංඝරත්නය වැඩම වීමට හා පිරිතට ආරාධනය කිරීමට හේවිසි වැයීමේදී ඒ හා බැඳි බෙර පදයටද මෙවැනි ජන ශ්‍රැතීන් වේ.

බෙර පදය - ජේංග තරිකිට ජේං කතක්ක
ජනශ්‍රැතිය - මහ පිරිතට දැන් වඩින්න

මළ ගෙදරකදී වයනු ලබන මළබෙර පද පන්සලෙහි හේවිසිය සඳහා වාදනය කරනු නොලැබේ. එසේම අවමංගල්‍ය පෙරහැර ගමන් කරන විටදී එය විහාරස්ථානයක් අසලින් ගමන් කරන්නේ නම් එවිටද මළබෙර වයනු නොලැබේ. එය ආගමට කරනු ලබන නින්දාවක් ලෙස සැලකීම ඊට හේතුවයි. මළබෙර වාදනයේදී දවුලට ප්‍රධාන ස්ථානය හිමිවන අතර පහතරට ප්‍රදේශවලදී පද පිරීම හෙවත් පද වැයීම ආරම්භ කරනු ලබන්නේ දවුලෙනි. උඩරට ප්‍රදේශයේදී තම්මැට්ටමට ප්‍රධාන ස්ථානය ලැබෙන අතර පද පිරීම කරනු ලබන්නේ තම්මැට්ටමෙනි.

වර්තමානයේ වුවද පහතරට ප්‍රදේශවලදී මළබෙර වැයීම අනිවාර්ය අංගයක් වේ. අවමංගල්‍යයේ අවසාන දිනයේ මළබෙර වැයීම විවිධාකාරයෙන් සිදුවේ. එදිනට තෙවරක් බැගින් මළබෙර වැයීම දක්නට ලැබේ. මධ්‍යාහ්නයේ ප්‍රථම වතාවටද මිණිය එසවීමත් සමග දෙවන වතාවටද වශයෙන් මළබෙර වයනු ලැබේ. මිණිය එසවූ තැන් සිට මිණිය වළ මත තැබීමත් සමග දවුල් වාදනය නතර කිරීම ඇතැම් ප්‍රදේශවල සිරිත වේ. මිණිය ආදාහනය කරනු ලබන්නේ නම් එය දැවී අළු වී යන තෙක් බෙර වැයීම සිදු කෙරේ. මළබෙර වාදනය හා සම්බන්ධ වූ සංගීතයේ මූලික ලක්ෂණය නම් සන්නිවේදනයයි. සංගීතය හා සන්නිවේදනය අතර සම්බන්ධය ඒ තුළින් පිළිබිඹු වේ.

## කුලයට අනුව

අවමංගල්‍යය සංගීත ක්‍රමය තුළ කුලය නමැති සමාජ සාධකයටද ප්‍රධාන ස්ථානයක් හිමි වේ. මෙය විශේෂයෙන්ම සංගීතය බිහිකරනු ලබන ශිල්පීන්ගේ සමාජ තත්ත්වය හා සංගීතය අපේක්ෂා කරනු ලබන පුද්ගලයන්ගේ සමාජ තත්ත්වය වශයෙන් කොටස් දෙකක් යටතේ විග්‍රහ කළ හැකිය. සංගීතය බිහිකරනු ලබන ශිල්පීන් පාරම්පරිකව පැවත එන බෙරවා කුලයේ සාමාජිකයින් වේ. සාමාන්‍ය සමාජයේදී මොවුන්ට සැලකීම් කරනු ලබන පරිදීම අවමංගල්‍ය උත්සව ආශ්‍රිත සමාජ සන්දර්භය තුළදීද සැලකීම් කරනු ලැබේ. ඇතැම් ප්‍රදේශවලදී මළබෙර වැයීම සඳහා අවමංගල්‍ය කටයුතු පැවැත්වෙන නිවසේම පැත්තකින් කුඩා ලැගුම් ගෙයක් තනවා දෙන අතර එයට සහභාගි වන ශිල්පීන්ට සංග්‍රහ කිරීම හා ඔවුන්ගේ වෙහෙස මහන්සිය නිවා ගැනීම මෙහිදී සිදුකරනු ලබයි. එසේම මෙම ශිල්පීන්ට සංග්‍රහ කිරීමේදී යොදාගනු ලබන පිඟන් කෝප්ප වැනි ද්‍රව්‍යයද නැවත භාවිතයට නොගනී. මළබෙර වැයීම හා සම්බන්ධ සංගීත නිෂ්පාදනය බෙරවා කුලයට පමණක් සීමා වුවද ඇතැම් ප්‍රදේශවලදී ගොවිගම කුලයේ පිරිස් විසින්ද එම කාර්යය ඉටු කරනු ලබන බව පෙනේ.

අවමංගල්‍ය සඳහා මළබෙර වැයූවන්ට අතීතයේදී තනතුරු නාමද හිමි වී තිබේ. ශ්‍රී මහා බෝධි ශාඛාවේ ආදාහන උළෙලේදී බෙර වැයූවන් 'වෙල්ලීවරු' නමින් හඳුන්වා ඇත. ඔවුන්ගේ කාර්යය වූයේ මළබෙර වැයීම හා අවමංගල්‍යය පෙරහරේ කොඩි සේසත් රැගෙන යාමය.

## භාරතීය සංගීතය හා මුසු වූ අවමංගල්‍ය සංගීතය

ශ්‍රී ලංකාවේ අවමංගල්‍ය අවස්ථාවන්හිදී යොදාගනු ලබන සංගීත ක්‍රම අතර භාරතීය ශාස්ත්‍රීය සංගීතයටද ප්‍රධාන හා වැදගත් ස්ථානයක් හිමි වේ. භාරතීය ශාස්ත්‍රීය සංගීතය හින්දූන් විසින් දේවත්වයෙහි ලා සලකනු ලබයි. සංගීතයේ මුල් අවස්ථාව දේව වන්දනය මත පදනම්ව විකාශය වූයේය. හින්දුස්ථානි සංගීතයේ ප්‍රධාන අංගය වන්නේ 'රාග' නම් ශාස්ත්‍රීය සංගීත කෘති විශේෂයයි. රාගයක් යනු 'සිත් රංජනය කිරීමට සමත් ස්වර හා වර්ණයන්ගෙන් යුත් සංගීතමය කෘතියකි'. ඉන්දීය සංස්කෘතිය තුළ දේව වන්දනය මත පදනම්ව වර්ධනය වූ රාගධාරී සංගීතය පසුකාලීනව කලාවක් වශයෙන් ප්‍රබල ස්ථානයක් හිමිකරගන්නා ලදී. ශ්‍රී ලංකාව තුළද භාරතීය ශාස්ත්‍රීය සංගීතයට ප්‍රධාන ස්ථානයක් හිමි වේ. එසේ වුවද එය භාවිත වන සමාජ සන්දර්භය අනුව විටෙක එය අවමංගල්‍ය සංගීත ක්‍රමයක් බවටද පත්වේ. භාරතීය සංස්කෘතිය තුළ අවමංගල්‍ය අවස්ථාවන් සඳහා ශාස්ත්‍රීය සංගීතය යොදා නොගැණුනද ශ්‍රී ලාංකීය සමාජයේදී අවමංගල්‍ය උත්සව සඳහා භාරතීය ශාස්ත්‍රීය සංගීතය යොදා ගැනේ. සමාජ විද්‍යාත්මකව සලකා බැලීමේදී විද්‍යමාන වන්නේ පුද්ගලයාට හිමි සමාජ තත්ත්වය මත භාරතීය ශාස්ත්‍රීය සංගීතය භාවිතයට ගනු ලබන බවයි. දේශපාලන නායකයන්ගේ අවමංගල්‍ය අවස්ථාවන්වලදී ශාස්ත්‍රීය සංගීතයට ලැබෙන්නේ ප්‍රධාන ස්ථානයකි. ශෝක ප්‍රකාශ ඉදිරිපත් කිරීමේදී පසුබිම් සංගීත ක්‍රමයක් ලෙස ශාස්ත්‍රීය සංගීතය යොදා ගනී. ශෝක දින ප්‍රකාශයට පත් කිරීමේදී අවමංගල්‍ය කටයුතු නිම වෙන තෙක් සේවා කාලය තුළ ශාස්ත්‍රීය සංගීතය විසුරුවා හැරීම කරනු ලබයි. මෙකී සන්දර්භය ආශ්‍රයෙන් විසුරුවා හැරීම කරනු ලබන්නේ ගම්භීර නාදයක් දනවනු ලබන හින්දුස්ථානි රාගයන්ය. ඒ අතර 'භෛරවී, මාර්වා' වැනි රාග ප්‍රධාන වේ. ඇතැම් විටදී මේ පිළිබඳ නොදත් මාධ්‍යකරුවන් එම අවස්ථා හා සම්බන්ධ කොට 'පිළු' වැනි ශෘංගාරාත්මක රාගද වාදනය කරන අවස්ථා ඇත. මෙවැනි ශෘංගාරාත්මක රාග වාදනය කිරීම අවමංගල්‍ය අවස්ථා හා නොගැලපේ. අවමංගල්‍ය උත්සව හා සම්බන්ධ වන රාගධාරී සංගීතයේදී ප්‍රධාන ස්ථානය හිමිවන්නේ වාද්‍ය සංගීතයටයි. ඒ අතර 'සිතාර්, සාරංගි, එස්රාජ්, බටනලා, ෂෙනායි' වැනි සංගීත භාණ්ඩ මගින් වයනු ලබන ශාස්ත්‍රීය වාදනවලට ප්‍රමුඛත්වය දෙනු ලැබේ. මෙම සංගීත භාණ්ඩවල ධ්වනි ගුණය ඊට හේතු වේ. අවමංගල්‍ය උත්සවය හා බැඳුණු ශෝකාකූලත්වය ජනිතවනාකාරයේ නාදයක් නිපදවීම නිසා මෙම භාණ්ඩවලින් වාදනය කරනු ලබන ශාස්ත්‍රීය වාදන සඳහා එම සන්දර්භය ආශ්‍රයේදී ප්‍රධාන ස්ථානය ලැබී ඇත.

එසේම බටහිර වාද්‍ය භාණ්ඩ හා බටහිර නාද රටා ආශ්‍රයෙන් නිපදවනු ලබන අවමංගල්‍ය සංගීත ක්‍රමයක් යුද හමුදා තූර්ය වාදන කණ්ඩායම අතර ප්‍රචලිතය. මේ සඳහා 'ට්‍රම්පට්, ට්‍රම්බෝන්' වැනි සංගීත භාණ්ඩ වැඩි වශයෙන් උපයෝගි කොට ගැනේ. නිලධාරීන්ගේ නිල තත්ත්වයෙහි ධූරාවලිය මත මෙම නාද රටා සහ සංගීතය යොදා ගැනීමේ පිළිවෙළෙහි විවිධත්වයක් පිළිබිඹු වේ. මෙම සංගීතය ක්‍රිස්තියානි ආගම මුල්ව බෞද්ධාගමට සම්බන්ධ වූ සංගීත ක්‍රමයක් වශයෙන් හැඳින්වීමට පිළිවන. අවමංගල්‍ය උත්සව හා බැඳුනු සංගීතයෙහි ගායනයටද විශේෂිත ස්ථානයක් හිමි වේ. ඒ අතර වැලපුම් ගී ගැයීම හා අවසාන දිනයේදී පැවැත්වෙන පැන් වැඩීමේ චාරිත්‍රය සඳහා ගයනු ලබන ආගමික ගාථා පාඨ ගායන අංග වශයෙන් සඳහන් කළ හැකිවේ. අවමංගල්‍ය නිවසක ඇති පාලු බව දුරු කිරීම සඳහා රාත්‍රිය මුළුල්ලේ වැළපුම් ගී ගයනු ලැබේ. වෙස්සන්තර ජාතක කාව්‍යය වැළපුම් ගායනා සඳහා යොදා ගැනේ. මෙම ගායනාවන් ඉදිරිපත් කරනු ලබන්නේ කරුණා රසය මතුවන අන්දමේ ගායනා ලාලිත්‍යයන් අනුවය. එසේම ගායනය අතරතුර ඉකි ගැසීම හා හැඬුමේ ස්වභාවයද නාද ලාලිත්‍යයන් වශයෙන් භාවිතයට ගනු ලැබේ. උස් හඬින් ගායනා කිරීමද විශේෂ ලක්ෂණයක් ලෙස සඳහන් කළ හැකිය. මෙම ගී ගායනයේදී කෝමල ස්වර යොදා ගැනීම නිසා කරුණා රසය ජනිත වේ. බොහෝ ප්‍රදේශවල තනි තනිව ගයනු ලබන වැළපුම් ගීත තවත් ප්‍රදේශයක කණ්ඩායම් වශයෙන් සැදී ගායනා කිරීම දක්නට ලැබේ. මීට අමතරව බණ පොත්, ජාතක කථා පොත් වැනි ධර්ම ග්‍රන්ථ සැහැලි ගායනා ක්‍රමයට අනුව හඬ නගා කියවීමද අසන්නට ලැබේ.

භික්ෂූන් වහන්සේ විසින් ඉටු කරනු ලබන ආගමික වතාවත්වලදී ගයනු ලබන ආගමික ගාථා පාඨයන්ද සංගීතමය ලක්ෂණයන්ගෙන් සමන්විතය. ආගමික වතාවත් ඉටුකිරීමෙන් පසුව ගයනු ලබන ගාථා පාඨ සහ පැන් වැඩීම සඳහා ගයනු ලබන 'යථාවාරි වහාපූරා.....' වැනි ගාථා අවමංගල්‍ය සඳහා පමණක් යොදා ගනු ලබන බෞද්ධ ගාථාවන්ය. මෙම ගායනාවල නාදයද අන්‍ය බෞද්ධාගමික නාද රටා හා බැඳුණු නාදයට සමානත්වයක් දරයි. එසේම සමූහ ගායනා ක්‍රමයක්ද වේ. මේ සඳහා පිරිත් සජ්ඣායනයේ නාදය බලපා ඇති බව පෙනේ.

ජන සංගීතවේදී පර්යේෂණයකදී ඕනෑම නාද ක්‍රමයක් ආශ්‍රිත සන්දර්භය තුළ වර්ගීකරණය කෙරේ. එම නාදය හා මානව ක්‍රියාකාරකම් අතර සම්බන්ධයක්ද දක්නට ලැබීම ඊට හේතුවයි.

අවමංගල්‍ය අවස්ථාවන්හිදී අසන්නට ලැබෙන නාද රටා අතර හැඬීම වැලපීමද ජන සංගීතවේදයේදී ගායන අංගයක් වශයෙන් හැඳින්වීමට හැකි වේ. මිනිස් සිතෙහි ඇතිවන කිසියම් භාවයක් විශෝධනය කිරීමට එම නාදය උපයෝගී වේ. බොහෝ අවස්ථාවන්හිදී නාදයම පමණක් (ඉකිගැසීම) අසන්නට ලැබෙන අතර තවත් විටෙක ඉකි ගැසීමට අනුරූපව වචන උච්චාරණය කරමින් හැඬීම් පවා පුද්ගල තත්ත්වය මත විවිධ වේ. මෙම නාද නිෂ්පාදනය ඇතැම් පුද්ගලයන් විසින් හඬ නගා ඉදිරිපත් කිරීමත් සමාජ තත්ත්වය මත නාදය උස් පහත් භාවයක් සිදුවීමත් දක්නට ලැබේ.

වර්තමානයේ පවා ඇතැම් ග්‍රාමීය පෙදෙස්වලදී මළ ගිය ඥාතියාට තම නෑදෑයන් විසින් දක්වන සැලකීම පවා අන්‍ය වැසියන් විසින් තීරණය කරනු ලබන්නේ වැළපීම මතය. එසේම රටෙහි පිළිගත් ජන නායකයන්ගේ හා ප්‍රභූන්ගේ අවමගුල් අවස්ථාවන්හිදී තමන්ගේ තත්ත්වය රැක ගැනීම පිණිස මෙම වැළපීමේ ක්‍රියාවලියෙහි වෙනසක් දක්නට ලැබේ. එසේ වන්නේ මිය ගිය ඥාතියා කෙරෙහි දැක්වූ නොසැලකිල්ල නිසා නොවන අතර තමන්ගේ තත්ත්වය රැකගැනීමට දරනු ලබන උත්සාහයයි. වර්තමාන සමාජය තුළ හැඬීම් හා ඉකිගැසීම් වැනි කාර්යයන් මුදලට ඉටු කරනු ලබන කොටස් වේ. විශේෂයෙන්ම මෙය කාන්තාවන් හා සම්බන්ධ වූ ක්‍රියාවක් ලෙස හැඳින්විය හැකිය. මීගමුව වැනි ප්‍රදේශවල කුළියට හඬනු ලබන කාන්තාවෝ සිටිති.

සංගීතය නාදය මාධ්‍ය කොටගත් කලාවක් වුවද එමගින් නාදය බිහිවන සංස්කෘතිය හා සමාජ තුළ සමාජ තත්ත්වය හා ධූරාවලි පිළිබඳ විග්‍රහ කිරීමෙහි හැකියාවක් පවතී. මෙහිදී සෑම සමාජ සංකල්පයක්ම බිහිවන්නේ සංගීතය කේන්ද්‍ර කොටගෙනය. සංගීතය නිර්මාණය කරනු ලබන පුද්ගලයන් හා එකී සංගීතයේ අවශ්‍යතාව අපේක්ෂා කරන පිරිස වශයෙන් සමාජය තුළ පිරිස් දෙකොටසක් අතර පවතින සමාජ සම්බන්ධතා ඔවුන්ගේ කුලය, පන්තිය, ස්ත්‍රී පුරුෂ භාවය වැනි සමාජ ස්ථර සාධක මත පදනම් වේ.

එසේම ලිංග භේදයටද මේ තුළ ස්ථානයක් හිමිව තිබේ. මේ සෑම සංගීත අංගයක්ම ඉදිරිපත් කරනු ලබන්නේ පුරුෂයන් විසිනි. මෙම කර්තව්‍යයේදී කාන්තාවන් උදෙසා පවතින ස්ථානය සීමා වී තිබේ. මළබෙර වාදනය, වැලපුම්, කාව්‍ය ගායනය, පාංශකූලය වැනි සෑම කටයුත්තක්ම පුරුෂ පක්ෂයට හා පූජ්‍ය පක්ෂයට හිමි වී තිබේ. එසේ වුවද වර්තමාන සමාජය තුළ ආර්ථික වටිනාකමක් උදෙසා නාද බිහි කිරීමේ විශේෂ ස්ථානයක් කාන්තාවන්ට හිමි වී තිබෙන බව පෙනේ. මෙය විශේෂයෙන්ම සමාජ වෙනස් වීම නිසා හිමි වූ තත්ත්වයක් ලෙස හැඳින්විය හැකිය. ඉහත සඳහන් කළ පරිදි මීගමුව වැනි නගරවල මුදලට හැඬීමට ඉදිරිපත් වන කාන්තාවන් සිටින අතර ජනසංගීතවේදයට අනුව එහිදී සංගීතය හා ආර්ථිකය අතර අන්‍යෝන්‍ය සම්බන්ධයක් පවතී. මෙම කුලියට හැඬීම කරනු ලබන කාන්තාවන්ට හිමි කාර්යය වන්නේ පුද්ගලයන්ගේ සමාජ තත්ත්වය අනුව නාද ඉස්මතු කිරීමය. මේ අනුව එක් එක් පුද්ගලයාට හිමි සමාජ තත්ත්වය හා ඊට අයත් කාර්ය කොටසෙහි ස්වභාවය සංගීතය නිර්මාණය කරනු ලබන සමාජය හා සංගීතය අපේක්ෂා කරනු ලබන සමාජය අනුව විවිධත්වයක් ගන්නා බව පෙනේ. එසේම සමාජ වෙනස්වීම තුළ එක් එක් පුද්ගයාට හිමි කාර්යයන්හි වෙනසත්, එතෙක් පැවති සමාජ සම්බන්ධතා උඩු යටිකුරු වීමේ ස්වභාවයත් සමාජ සංස්ථාවක් වන කලාව තුළින්ද ප්‍රතීය මාන වන බව පෙනේ.

(ආචාර්ය දයා අමරසේකර හා රෝහිත දසනායක විසින් සංස්කරණය කරන ලද ඉඳුවර පර්යේෂණාත්මක ලේඛන සංග්‍රහයෙනි)

# PRIMERICA®



Primerica originated the “Buy Term and Invest the Difference” philosophy which encourages families to purchase affordable term life insurance so they can get the protection they need at a price they can afford and have more money to invest in their family's future.

In 2010, Primerica became a newly independent company and is traded on the New York Stock Exchange under PRI. As the largest independent financial services marketing organization in North America, our goal is to dominate the changing financial services landscape for Main Street North America.

Today's families face major financial challenges. They're being forced to downsize their goals and dreams — to settle for less. Primerica shows them how they can change their life. We are the one company focused on the middle market and helping Main Street families get the financial help they need.

We help Main Street families get the protection they need at a price they can afford, invest for the future and get out of debt. We teach families fundamental financial principles that aren't taught in school and we give them an opportunity to build a business and transform their life.

Primerica is proud to do business with some of the most recognized and respected names in the industry. Whether it's through our affiliations with organizations like the Better Business Bureau, or offering products from respected and well-known companies like Pioneer Investments, Primerica is committed to doing what's best for our clients and maintaining a reputation that we can be proud of.

We offer a variety of products and services designed to help people to achieve their financial goals. The financial need analysis provides solutions in these areas,

***Savings** ***Debt Elimination** ***Income Protection**

***Income Management** ***PPLS Legal Service**

For further information or discuss your financial solution contact :

**Chaminda Yapa – Representative. Tel no- 647 772 3403**

**Primerica Financial services Ltd.**

**100 Dynamic Drive, Unit 201**

**Scarborough, ON. M1V 5C4**

**cyapa@primerica.com**

**Website: www.primerica.com/chamindayapa**

PRIMERICA®

# HELP WANTED

## FULL -TIME AND PART -TIME

We are looking for key people to expand our financial services business in Ontario

Experience not necessary. Training provided

**Contact: CHAMINDA YAPA 647 772 3403**

**Office - Primerica Financial services Ltd.**

**100 Dynamic Drive, Unit 201**

**Scarborough, ON. M1V 5C4**

**cyapa@primerica.com**

**Website: www.primerica.com/chamindayapa**




ඔබගේ සියලුම සංචාරක කටයුතු සඳහා

VMS TRAVELS AND TOURS හි

රාජ් අමතන්න

416 567 5104



VMS TRAVELS & TOURS INC.

3351, Markham Road, Unit 137A, Toronto Ont, M1X 0A6

416 293 5800 | 1 888 655 5575 www.flytrips.ca

48 A , Dr. Lester James Peries Mawatha (Dickmans Road) Colombo 5

94 11 250 21 98

info@vmstravels.ca | www.flytrips.ca

# තිලක අබේසිංහ ඒකපුද්ගල චිත්‍ර ප්‍රදර්ශනය

# Exhibition of Paintings by Tilake Abeysinghe






# BEYOND YOUR EXPECTATIONS !

## Residential & Commercial Real Estate

proud sponsor of Children's Miracle Network



**BUY or SELL your HOME with me**

**For Buyers**

**I will pay your first months mortgage***

*Limited to $300.00 for Each $100,000 Mortgage

**For Sellers**

**My commission for your listing will be 0% when you Sell & buy a home with me.****

**Sellers when buying will not receive the 'first month mortgage on me' rebate in combination with the '0% commission for me' rebate for listing, however the Seller will have the choice of either or.

**5% down payment? No problem!**

I will guide you through obtaining your DREAM HOME through my proven system!

# Gamini Abeysinghe. ABR, CNE

## Real Estate Sales Representative

100% Club Award 2014, 2013, 2011, 2010

Platinum Club Award 2015, 2012

ABR ACCREDITED BUYER REPRESENTATIVE

CNE CERTIFIED NEGOTIATION EXPERT

RE/MAX HALL OF FAME

RE/MAX Diamond Realty Inc., Brokerage

A member of CanLanka Business Association

*With me as your agent, your dreams of finding the perfect home can be made a reality!*

**New to Canada, First time Buyers, lack of down payment, Credit problems ?**

## Call me Today !

I will be happy to guide you through the process in a professional, friendly and accountable manner.

Join the many happy home owners I've helped and find the perfect home for you!

E-mail : shinko@rogers.com Office - 416 235 2500 Fax - 416 235 2828

1570 Kipling Ave(N of Eglinton) Toronto. ON M9R 2Y1

**Toll Free: 1-800 611 2882 Ext 102**

# Mobile : 416 822 2789

## www.gaminiabeysinghe.com

● Some conditions apply. Please feel free to contact me for further details ** ● Not intended as solicitation of sellers under listing contracts or buyers under buyer representation agreements